Administration report of the Director of Health Services / [Ceylon].

Contributors

Ceylon. Department of Health.

Publication/Creation

[Colombo?] : [Government Press?], [1961]

Persistent URL

https://wellcomecollection.org/works/xqbcytq2

License and attribution

This work has been identified as being free of known restrictions under copyright law, including all related and neighbouring rights and is being made available under the Creative Commons, Public Domain Mark.

You can copy, modify, distribute and perform the work, even for commercial purposes, without asking permission.

wellcome collection

Wellcome Collection
183 Euston Road
London NW1 2BE UK
T +44 (0)20 7611 8722
E library@wellcomecollection.org
https://wellcomecollection.org

IV කොටස—අධ්‍යාපන, විද්‍ය සහ කලා (B)

1961-62 වර්ෂය පිළිබඳ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ පාලන වාර්තාව

පෙබරවාරි, 1964

වෛද්‍යවාර්ය ඩබ්ලිව්. ඒ. කරුණාරත්න

PART IV—EDUCATION, SCIENCE AND ART (B)

Administration Report of the Director of Health Services for the Year 1961-62

February, 1964

Dr. W. A. Karunaratne

ලංකාවේ මාලවේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ආණ්ඩුවේ නියමයෙන් ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි.

කොළඹ මහ ලේකම් ගොඩනැගිල්ලේ පිහිටි තැ. පෙ. අංක 500 දරන රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබා ගත හැක.

PRINTED ON THE ORDERS OF GOVERNMENT AT THE GOVERNMENT PRESS, CEYLON, ON PAPER MANUFACTURED AT THE EASTERN PAPER MILLS CORPORATION, VALAICHCHENAI, CEYLON.

TO BE PURCHASED AT THE GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. BOX 500, SECRETARIAT, COLOMBO

මිල *Price:* 9/50 තැපැල් ගාස්තුව *Postage:* -/75

කෙටුම් පත ලැබුණ දිනය Copy Received	*1963. 9. 4*
ශුඛි යත්‍ර යැවූ දිනය Proof Sent	*1963. 12. 9*
ශුඛි පත්‍ර ආපසු ලැබුණ දිනය Proof Returned	*1963. 11. 6*
ප්‍රසිද්ධ කල දිනය Published	*1964. 2. 27*

WELLCOME INSTITUTE LIBRARY

Coll.	wellMOmec
Call No.	AnnRep WA28 .JS8 C42 1961-62

22501399554

පටුන

පිටුව

	හැඳින්වීම	9
I	ජීවිත සංඛ්‍යා ලේඛන	21
II	වෛද්‍යාරක්ෂාව	22
	(අ) නේවාසික රෝගීන්	22
	(ආ) විශේෂඥතා සේවා	23
	(ඇ) බාහිර රෝගී සේවාවන්	24
III	වෛද්‍යමය දේ සැපයීම	24
IV	ජන සෞඛ්‍ය සේවා	27
	(අ) මාතෘ සහ ළමා සෞඛ්‍ය	27
	(ආ) පාඨශාලා සෞඛ්‍ය සේවය	31
	(ඇ) පෝෂණය	31
V	වසංගත රෝග විද්‍යාව	33
VI	විශේෂ සේවා	44
	(අ) ක්ෂය රෝග මර්දනය	44
	(ආ) මැලේරියා මර්දනය	49
	(ඇ) බරවා රෝග මර්දනය	56
	(ඈ) ලාදුරු රෝග මර්දනය	59
	(ඉ) සමාජරෝග මර්දනය	62
	(ඊ) මානසික සෞඛ්‍යය	64
	(උ) නීති වෛද්‍ය කටයුතු	67
	(ඌ) පිළිකා රෝගය	71
VII	වෛද්‍ය පර්යේෂණායතනය	75
VIII	පාරිසරික සෞඛ්‍ය සංරක්ෂණය	83
IX	මහජන සෞඛ්‍ය අධ්‍යාපනය	87
X	අභ්‍යාස පරිපාටි	101
XI	පාලනය හා සේවක සංඛ්‍යාව	103
XII	සෞඛ්‍ය සහාව	105
XIII	ප්‍රවාහන සේවය	106
XIV	ජාත්‍යන්තර සම්මේලන	106
XV	සුභ සාධනය	108
XVI	ගොඩනැගිලි	109
XVII	මිල මුදල්	110

සටහන් ලේඛනය

පිටුව

ජීවිත සංඛ්‍යා ලේඛන

i වැනි සටහන—උපත් හා මරණ—1946 සිට 1961 දක්වා 119

ii වැනි සටහන—ලංකාවේ සහ වෙනත් සමහර රටවල බිළිදු මරණ ප්‍රමාණය ... 119

iii වැනි සටහන—අනුපැතික මරණ ප්‍රමාණය 122

වෛද්‍ය රක්ෂාව

iv වැනි සටහන—වර්ෂ අනුව ප්‍රාදේශික රෝහල්වලට ඇතුළුවී ප්‍රතිකාර ලත් රෝගීන්ගේ සංඛ්‍යාව 122

v වැනි සටහන—වර්ෂ අනුව මධ්‍ය වාර්ෂික ජනගහනය සහ ප්‍රතිකාර ලත් රෝගීන් ... 123

vi වැනි සටහන—ආරෝග්‍යශාලාවලට ඇතුළු වී ප්‍රතිකාර ලත් රෝගීන්ගේ සංඛ්‍යාව, වර්ගය සහ පළාත් අනුව 124

vii වැනි සටහන—ආරෝග්‍යශාලාවට ඇතුළුව ප්‍රතිකාර ලත් රෝගීන් සංඛ්‍යාව පළාත් හා දිස්ත්‍රික්ක අනුව 126

viii වැනි සටහන—රජයේ සියලුම වර්ගවලට අයත් ආරෝග්‍යශාලාවල දී ප්‍රතිකාර ලැබූ හා මිය ගිය රෝගීන්ගේ ගණන 127

ix වැනි සටහන—රජයේ වෛද්‍යායතනවලින් වලක්වා ගතහැකි රෝග සඳහා ප්‍රතිකාර ලැබූ හා ඒවායින් මියගිය රෝගීන් පිළිබඳ සංක්ෂෙප වාර්තාව 285

x වැනි සටහන—සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශ අනුව රජයේ වෛද්‍යායතන ... 142

xi වැනි සටහන—වෛද්‍ය ආයතනවල ඇති ඇඳන් සංඛ්‍යාව 143

xii වැනි සටහන—ජනගහණයෙන්, 1,000 ට ඇති ඇඳන් සංඛ්‍යාව 145

xiii වැනි සටහන—කොළඹ ආරෝග්‍යශාලා මණ්ඩලය, ප්‍රාදේශිය ආරෝග්‍යශාලා සහ මූලික ආරෝග්‍යශාලාවල පවතින තැබෑදය දක්වෙන වාර්තාව ... 146

xiv වැනි සටහන—දිස්ත්‍රික් ආරෝග්‍යශාලාවල පවතින තැබෑදය දක්වෙන වාර්තාව ... 147

xv වැනි සටහන—විශේෂිත රෝග පිළිබඳව ආරෝග්‍යශාලාවල පවත්නා තැබෑදය පිළිබඳ වාර්තාව 150

xvi වැනි සටහන—පෞද්ගලික ආරෝග්‍යශාලාවල ඇති ඇඳන් ගණන 151

xvii වැනි සටහන—නොයෙකුත් විශේෂිත පුහුණු ලැබූ වෛද්‍ය නිලධාරීන් 151

xviii වැනි සටහන—විශේෂිත සුදුසුකම් ලබා ගැනීම සඳහා එතර ගිය වෛද්‍ය නිලධාරීන් ... 152

xix වැනි සටහන—කොළඹ ආරෝග්‍යශාලා මණ්ඩලයේ සහ ප්‍රාදේශිය ආරෝග්‍යශාලාවල කරන රසායනාගාර කටයුතු 152

පිටුව

xx වැනි සටහන—ආරෝග්‍යශාලාවල පැවැත්වූ චිත්සාගාරවල පැමිණීම 158

xxi වැනි සටහන—ආණ්ඩුවේ ආරෝග්‍යශාලාවල බාහිර රෝගීන්ගේ සංඛ්‍යාව ... 159

පෞද්ගලික සෞඛ්‍ය සේවා

xxii වැනි සටහන—මාතෘ හා දරක සෞඛ්‍ය වැඩ 159

xxiii වැනි සටහන—මව්වරුන්ගේ ඇඳන් 160

xxiv වැනි සටහන—ආරෝග්‍යශාලාවල ප්‍රසූත හා මාතෘ මරණ 160

xxv වැනි සටහන—පාසැල් භෙදියන් විසින් කළ වැඩ 161

xxvi වැනි සටහන—පාසල් හා ළමයින්ගේ පරීක්ෂණ 161

xxvii වැනි සටහන—විශේෂ දුර්වලතාවන් හරිගැස්වීම 161

xxviii වැනි සටහන—නොමිලයේ කිරි බෙදදෙන මධ්‍යස්ථාන 162

වසංගත රෝග

xxix වැනි සටහන—ස්ත්‍රීපුරුෂ භාවය සහ වයස් අනුව බාලකපක්ෂඝාත රෝගය (පෝලියෝ මයිලයිටිස්) 162

xxx වැනි සටහන—සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශ අනුව ස්ථිර වශයෙන් ම සොයාගන්නා ලද අංශභාග රෝගය (පැරලිටික් පෝලියෝ මයිලයිටිස්) 163

xxxi වැනි සටහන—බල්ලන්ගේ සහ වෙනත් සතුන්ගේ නිස්මොළ, පිස්සු බලුරෝගය සඳහා පරීක්ෂා කර බැලීම 163

xxxii වැනි සටහන—පිස්සු බලු රෝගය 164

ක්ෂය රෝගය මර්දනය

xxxiii වැනි සටහන—ළය රෝහල් ලය සහ ක්ෂය රෝග සඳහා වාට්ටු 164

xxxiv වැනි සටහන—ළය චිත්සාගාර සහ ශාඛාළය චිත්සාගාර 165

මැලේරියා මර්දනය

xxxv වැනි සටහන—මැලේරියා රෝගීන් සංඛ්‍යාව රජයේ රෝහල් දී සහ වතුකරයේ බෙහෙත්හල් වල දී අනාවරණය වූ රෝගීන් සංඛ්‍යාව 167

xxxvi වැනි සටහන—රුධිරය එකතු කළ, මාඛි හා නිස්චිත රෝගීන් 168

xxxvii වැනි සටහන—1961–62 වර්ෂය තුලදී ඒ ඒ පළාත් වල හා දිස්ත්‍රික්ක වල ආයතන මගින් හා ක්ෂේත්‍ර මගින් පරීක්ෂා කරන ලද ලේ නඟුඩු සංඛ්‍යාව හා ඒවායේ තත්වය 169

xxxviii වැනි සටහන—රෝගය පවතින බවට නිගමනය වූ රෝගීන් මාසික වශයෙන් පළාත් සහ දිස්ත්‍රික්ක අනුව 170

xxxix වැනි සටහන—බෙහෙත් ඉසීම 171

xl වැනි සටහන—බෙහෙත් ඉසීම සඳහා දැරීමට සිදුවූ වියදම—සටහනේ ප්‍රදේශ අනුව දක්වා ඇති අයුරින් 171

xli වැනි සටහන—මැලේරියාරෝගය නාශක ක්‍රමය යටතේ දැරීමට සිදුවූ සම්පූර්ණ වියදම ... 172

බරවා රෝගය

xlii වැනි සටහන—පරපීවය සහිත බරවා රෝගීන් සහ පරපීවය රහිත චිත්සාගාර රෝගීන් 1958 වර්ෂයේ සිට 1962 දක්වා 175

xliii වැනි සටහන—1958–1962 දක්වා පරපීවය සහිත බරවා රෝගීන්ගේ ප්‍රමාණය ... 175

xliv වැනි සටහන—පරපීවය රහිත චිකිත්සාගාර රෝගීන් වර්ග කිරීම 175

ලාදුරු රෝගය

xlv වැනි සටහන—ලක්දිව ලාදුරු රෝගය වැළදී ඇති රෝගීන් සංඛ්‍යාව 176

xlvi වැනි සටහන—සම්පූර්ණ ලාදුරු රෝගීන් සංඛ්‍යාව වයස, ස්ත්‍රී පුරුෂ භාවය ආදිය අනුව ... 176

xlvii වැනි සටහන—සම්පූර්ණ ලාදුරු රෝගීන් සංඛ්‍යාව—පළාත් ස්ත්‍රී පුරුෂ භාවය ආදිය අනුව... 177

xlviii වැනි සටහන—වෙන්කර නැඹූ රෝගීන් හෝ වෙන්කර තුබූ රෝගී ස්පර්ශකයන්ගේ සම්පූර්ණ සංඛ්‍යාව 177

xlix වැනි සටහන—අලුතෙන් සොයා ගන්නා ලද රෝගීන්ගේ සංඛ්‍යාව—වයස් ප්‍රමාණ සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව 178

රති රෝගය මර්දනය

l වැනි සටහන—අළුතෙන් ප්‍රතිකාර ලැබුවන්ගේ සංඛ්‍යාව 178

li වැනි සටහන—උපදංශ රෝගය සඳහා කරන ලද පරීක්ෂණ වර්ගකිරීම (අළුතෙන් සොයා ගන්නා ලද රෝගීන්) 179

lii වැනි සටහන—රසායනාගාර වැඩ 180

පාරිසරික සෞඛ්‍යාරක්ෂය

liii වැනි සටහන—ආහාර සැම්පල් විග්‍රහකිරීම 180

liv වැනි සටහන—ආහාර පිළිබඳ සිසාරා 181

පිටුව

ප්‍රස්ථාර සටහන, සිතියම් සහ උපග්‍රන්ථ ලේඛනය

1 වැනි ප්‍රස්ථාර සටහන—වර්ෂ අනුව උපත් සහ මරණ සංඛ්‍යාව 120

2 වැනි ප්‍රස්ථාර සටහන—සිදුවූ බිළිදු සහ මාතෘ මරණ සංඛ්‍යාව වර්ෂ අනුව 121

1 වැනි සිතියම—බී. සී. ජී. ව්‍යාපාරය, තුන් අවුරුදු ක්‍රමය 166

2 වැනි සිතියම—මැලේරියා මර්දන ව්‍යාපාරයේ වාර්තාවල් 173

3 වැනි සිතියම—නියත රෝගීන්ගේ විසිරීම 174

1 වැනි උප ග්‍රන්ථය—කිරිවතු ලබන ලද ප්‍රකාශ දන්වීම් සහ පුවත්පත් (ඉංග්‍රීසියෙන් පමණි) ... 182

2 වැනි උප ග්‍රන්ථය—ගෙඩිනැගිලි, කසල බැහැර කිරීම සහ ජල සම්පාදනය පිළිබඳ වැඩ කෙරී ඇති අයුරු දක්වෙන සටහන (ඉංග්‍රීසියෙන් පමණි) 183

3 වැනි උප ග්‍රන්ථය—විමධ්‍යගත කොට්ඨාශ සහ ඒ ඒ කොට්ඨාශවල ඇති ආයතන දක්වෙන සටහන (ඉංග්‍රීසියෙන් පමණි) 287

1961-62 වර්ෂය පිළිබඳ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ පාලන වාර්තාව

හැඳින්වීම

මෙම වාර්තාව මෙයට කලින් පාලන වාර්තා සැකසුණු පරිදි, ලිත් වර්ෂය අනුව සැකැසුණේ නොවෙයි. භාණ්ඩාගාරයෙන් නොබෝදා නිකුත් වූ නියෝගයක් අනුව පාලන වාර්තා සකස් කළ යුත්තේ මුදල් වර්ෂය අළලාය. එහෙයින් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මෙම පාලන වාර්තාව පළමුවරට 1961 ඔක්තෝබර 1 වැනි දා සිට 1962 සැප්තැම්බර් මස 30 වැනි දා දක්වා වූ මුදල් වර්ෂය සඳහා පිළියෙළ කර ඇත. එහෙයින් 1961 පාලන වාර්තාවේ අවසාන කාර්තුවට අයත් ඇතැම් කරුණු සම්හරක් මෙම වාර්තාවේ ද සඳහන් වී ඇත. මෙහි දක්වෙන සංඛ්‍යා ලේඛන එම හේතුව නිසා ඊට පළමු වර්ෂය සඳහා වූ වාර්තාවල දක්වෙන සංඛ්‍යා ලේඛන හා සැසඳීම් නො කළ හැකි ය.

වැය

1961/62 මුදල් වර්ෂය තුළ දී දිවයිනේ සෞඛ්‍ය සේවාවන් සඳහා කරන ලද මුළු වියදම රුපියල් කෝටි 14.29ක් විය. මෙම වියදම ගිය වර්ෂයේ දී ඒ සඳහා වැය කළ මුදලට බෙහෙවින් සමානය. මුළු වියදමෙන් විශාල කොටසක් වන රුපියල් 10,86,46,084 ක් ම වැය කරන ලද්දේ වෛද්‍ය සේවාවන් සම්බන්ධ කටයුතු සඳහාය. දෙලොස් අයුරකින් ලැබුණු ආධාර මුදල් ප්‍රමාණය රුපියල් 1,47,07,050 ක් විය. දෙපාර්තමේන්තු මගින් උපයන ලද මුදල් ප්‍රමාණය වූ රුපියල් 26,30,859 ඊට පළමු වර්ෂයේ ආදායමට වැඩිවිය. ඊට පළමු වර්ෂයේ ලැබූ ආදායම රුපියල් 18,93,520 කි.

පාලන ඇටළු

පුහුණුවූ නිලධාරීන් හා උපකරණ විරලත්වය රාජ්‍ය භාෂාවෙන් කටයුතු කිරීම පිළිබඳ දියුණුවට බාධාවක්ව තිබියදී රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අතින් මහත් දියුණුවක් ලබා ඇත.

සෞඛ්‍ය සේවා අධිකාරිවරුන් හා ආරෝග්‍යශාලා ලේකම්වරුන් සඳහා පාලනමය අභ්‍යාස පාඨ මාර්ගයක් භාණ්ඩාගාරයේ සංවිධාන හා ක්‍රම අංශය මගින් පවත්වන ලදි. ඒ පාඨමාර්ගයට අයත් ප්‍රධාන විෂයයන් වූයේ පාලනය පිළිබඳ මූලික අවශ්‍යතාවයන්, මානුෂික සම්බන්ධතාවයන් හා පාලන කටයුතු යනාදියයි. මෙම පාඨමාලීය සාර්ථක ප්‍රතිඵල ලබා දෙන්නක් ලෙස වැටහී ගිය හෙයින් ජ්‍යෙෂ්ඨ පාලකයන් සඳහා ද නුදුරු අනාගතයේ දී පාඨ මාලීයක් සංවිධානය කිරීමට අදහස් කර ඇත.

වෘත්තීය සංගම්වලින් කරන ලද ඉල්ලීම් ඉක්මණින් සලකා බැලීමට හැකිවීම නිසා නියමිත වැඩ පිළිවෙලක් ඇති කෙරිණ. මේ ක්‍රමය යටතේ සමථයකට පත් කළ යුතු කරුණු සම්බන්ධයෙන් විමධ්‍යගත ආයතනවල දීම තීරණවලට එළැඹීමට පහසු වන සේ විමධ්‍යගත ආයතන ප්‍රධානීන් හා වෘත්තීය සමිති නියෝජිතයින් අතර සාකච්ඡා පැවැත්වීම සඳහා සෑම සතියකටම වරුවක් බැගින් වෙන් කරන ලදී. එවැනි සාකච්ඡාවලින් සතුටුදායක ප්‍රතිඵල නොලැබුණේ නම් එම ප්‍රශ්න නිරාකරණය සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලය ක්‍රියා කරන ලදී. මේ ක්‍රමය නිසා වෘත්තීය සමිති හා විමධ්‍යගත ආයතනවල ප්‍රධානීන් අතර නිරන්තර සාකච්ඡා පැවැත්වීමට රුකුලක් ලැබිණ.

සමාලෝචනයට භාජනයවී ඇති වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යාව 31,805 දෙනෙකුගෙන් සමන්විත විය. මෙයින් 24,610 දෙනෙක් වෛද්‍ය සේවා අංශයට ද 5,565 දෙනෙක් මහජන සෞඛ්‍ය සේවා අංශයට ද ඉතිරි සංඛ්‍යාව රසායනාගාර හා එකාබද්ධ සේවාවකට ද අයත් වූහ.

ජීවිත සංඛ්‍යා

දැනට ලබා ගත හැකි අළුත් ම ජීවිත සංඛ්‍යා ලේඛන 1961 වර්ෂය සඳහා වූ ඒවා බැවින් මෙහි ඇති අදහස් ප්‍රකාශ කිරීම් 1961 වර්ෂය සඳහා වූ සංඛ්‍යාවලට සීමා කිරීමට සිදුවිය.

1959 වර්ෂයේ දී උපත් අනුපාතය 38.2ක් වූ නමුත්, එය 1961 වර්ෂයේදී උපත් අනුපාතය ජනගහනයෙන් 1000 කට 35.8 දක්වා පහත බැස ඇති අතර මරණ අනුපාතය ඉතා පහත් ප්‍රමාණයක් වන ජනගහනයෙන් 1000 කට 8.0ක් විය. මේ මරණ අනුපාතය ලෝකයේ ඕනෑම රටක සංඛ්‍යා හා මැනවින් ගැලපේ.

1960 වර්ෂයේ සජීව උපත් 1000 කට 3ක් වූ මාතෘ මරණ සංඛ්‍යාව මේ වර්ෂයේ දී 2.6 ක් වීමෙන් එම අනුපාතය ද සීඝ්‍රව පහත බැස තිබෙන බැව් පෙනේ.

1960 වර්ෂයේ දී සජීව උපත් 1000කට 57ක් වූ බිළිඳු මරණ අනුපාතය මේ වර්ෂයේ දී 52 වීමෙන් එහි සැලකිය යුතු පහත බැසීමක් ඇතිවී තිබේ. මෙය දිරිගන්වන සුළුවා පමණක් නොව මේ නිසා දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කරන ලද මාතෘ හා බිළිඳු සංරක්ෂණ වැඩ කටයුතුවල සාර්ථක භාවය පිළිබිඹු වේ. මෙම මිනුම් දණ්ඩ මහජන සෞඛ්‍ය පිළිබඳ අඛණ්ඩ දියුණුවක් විදහා දක්වයි.

රෝගීන් රැක බලා ගැනීම

ආරෝග්‍යශාලාවල තදබදයත් බාහිර රෝගීන්ගේ අංශයන් ගෙන් ප්‍රතිකාර ගැනීමට මහජනයා ගලාගෙන ඒමත් ඊට පළමු වර්ෂයේ දී මෙන් ම පැවතිණ. බාහිර රෝගීන්ගේ අංශවල පවත්නා තදබදය මගහැරවීම සඳහා රෝගීන් පරීක්ෂා කිරීමේ කාලවේලාවන් සුදුසු ලෙස පිළියෙල කරන ලද නමුත් ඇතැම් ආයතනවල සේවක සංඛ්‍යාව අඩුවීම නිසා ඒ ක්‍රමය සාර්ථක නොවූ අතර බාහිර රෝගීන්ගේ අංශවල සේවය කළ නිලධාරීන්ගේ නොසැලකිල්ල හා ඔවුන් කලට වේලාවට නො පැමිණීම එම ආයතනවල මෙම ක්‍රමය සාර්ථක නොවීමේ හේතුව විය.

වෛද්‍ය ආයතනවල තදබදය පැවතුණ ද ප්‍රධාන වශයෙන් රෝහල්වලට වැඩිපුර ඇදන් එකතු කිරීම නිසා, මේ තත්ත්වය තරමක් දුරට සැහැල්ලු වූ බැව් දක්නට ලැබීම සතුටට කරුණකි. ප්‍රාදේශීය රෝහල්වල තදබද වීමේ සාමාන්‍ය අංකය 128 සිට 121 දක්වාත් දිස්ත්‍රික් රෝහල්වල තදබදය 126 සිට 117 දක්වාත් පහත බැස්සේය. 208ක් ව පැවති කොළඹ ඇස් රෝහලේ පැවති තදබදය වඩා ඉඩකඩ සහිත නව ඇස් රෝහලට ගෙවදීමෙන් පසු 84 දක්වා අඩු විය.

විශේෂිත වෛද්‍ය අංශයන් සංවර්ධනය කිරීම

පස් අවුරුදු සැලැස්ම අනුව ආයතනවල විශේෂිත වෛද අංශයන් සංවර්ධනය කිරීම සේවක මණ්ඩලයන් ලැබුණ පරිදි කරගෙන යන ලදී.

විශේෂිත ශල්‍යාංශයක් සංවර්ධනය කිරීමට ඇතිවූ ප්‍රධාන බාධකයව පවත්නේ නිර්වින්දකයන්ගේ හිඟයයි. මෙම අංශය පිළිබඳ විශෙෂඥවරයන් වීම සඳහා

කොතෙක් ශිෂ්‍යත්ව ප්‍රදානය කළ ද මේ සේවාවන් මෙහෙයවීම සඳහා අවශ්‍ය පමණ නිලධාරීන් පොළඹවා ගැනීම ඉතාමත් දුෂ්කර කාර්යයක් විය. මෙහි ප්‍රතිඵල යක් වශයෙන් පැවති ශල්‍ය සේවාවන්ට පවා විටින් විට බාධා පැමිණියේ ය.

වෛද්‍ය කටයුතු සඳහා අවශ්‍ය සැපයීම්

රජයේ ඖෂධ ගබඩාවට අයත් නා නා අංශයන් තැනින් තැන විසිරී තිබීම නිසා ඒ ඒ අංශයන්ගේ පරිපාලන කටයුතු කාර්යක්ෂම අන්දමින් කිරීම අපහසුවිය. මෙම දුෂ්කරතාවය මැඩ ලනු පිණිස රජයේ ඖෂධ ගබඩාවට අයත් සියලුම අංශ එකම බිමක පිහිටුවීමේ අභිලාෂයෙන් අක්කර 6ක ඉඩමක් වැලිසරින් ලබාගන්නා ලදි. මෙම යෝජනා ක්‍රමය සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය සැලසුසුම් රජයේ වැඩ දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරගෙන යනු ලැබේ.

වෛද්‍ය ආයතන හා කොට්ඨාශයන් මගින් එක් වර්ෂයක් සඳහා අවශ්‍ය වන ඖෂධ ඇනවුම් කිරීම තවමත් නිවැරදි ලෙස නොකෙරේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඖෂධ හිඟය පිළිබඳ චෝදනා කෙරෙනු නිතර නිතර දක්නට ලැබිණ. අවශ්‍ය සියලුම ඖෂධ වර්ගයන් සපයා දීමේ හැකියාවක් රජයේ ඖෂධ ගබඩාවට තිබිය දී මෙවැනි තත්ත්වයක් උද්ගතවීම එම වෛද්‍ය ආයතනවල හා කොට්ඨාශවල ගෞරවයට හේතු වන්නෙක් නොවේ. මෙම ප්‍රශ්නය ඇතිවීමට මුළු මනින් ම හේතු වූයේ අවශ්‍ය ඖෂධ ප්‍රමාණයන් නිවැරදි ලෙස ඇස්තමේන්තු නොකිරීමය.

අලුත් වෛද්‍ය ආයතන හා දැනට ඇති ආස්ථානවලට අලුතෙන් සැදු අංශ එක සිය අටක් සඳහා රුපියල් 14,40,000ක් වටිනා උපකරණ සපයා දෙන ලදී. රෝහල්වල පවත්නා තදබදය අඩු කිරීමේ අදහසින් අලුත් ඇඳන් 1,375ක් සැපයින. මෙම ඇඳන් තැබීම සඳහා අවශ්‍ය වූ ඉඩ ප්‍රමාණය සොයා ගනු ලැබූ යේ එක් ඇඳක මැද සිට අනෙක් ඇදේ මැද තෙක් පවති අඩි හතක දුර ප්‍රමාණය අඩි පහ දක්වා අඩු කිරීමෙනි. විදයුත්-වෛද්‍ය ඉන්ජිනේරු අංශය මගින් අළුත් වැඩියා කිරීමේ කටයුතු සඳහා කරන ලද ඉල්ලීම් 2,569ක් ඉටු කරන ලදී. මෙයින් ඉල්ලීම් 877 ක් පිට පළාත්වලින් කරන ලද ඒවා විය.

ජන සෞඛ්‍ය කටයුතු

මාතෘ හා ළමා සෞඛ්‍ය සේවාවන් ප්‍රතිසංවිධානය කරනු සඳහා නිර්දේශ කිරීමට පත් කරන ලද විශේෂ කමිටුවේ වාර්තාව ඉදිරිපත් කෙරිණ. එහි ප්‍රධාන නිර්දේශ වූයේ එම කටයුතු වඩා ප්‍රබලවත් අන්දමින් කිරීම සඳහා පූර්ණ කාලීන වෛද්‍ය නිලධාරියකු පත් කිරීම ය.

ඒ අතරතුර දී ලෝක සෞඛ්‍ය සංවිධානයේ සමාජසීය ළමා රෝග පිළිබඳ විශේෂඥ වරිය විසින් තෝරා ගනු ලැබූ ප්‍රදේශවලට අයත් ආයතනික හා ක්ෂේත්‍ර කටයුතු ඒකාබද්ධ කිරීමට උත්සාහයක් දරන ලදි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඒ කර්තව්‍යය ක්‍රියාත්මක කළ හැකි බැව් අනාවරණය වී ඇත.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් සපයා දෙන ලද පුහුණුවූ නිලධාරීන්ගේ සහාය ඇතිව ආයතනවලදී මෙන්ම නිවෙස්වල දී ද ප්‍රසූති 2,26,463ක් මෙහෙයවන ලදී.

පවුල් සංවිධානය යටතේ ලංකා ස්ත්‍රීඛන පවුල් සංවිධාන යෝජනා ක්‍රමය මගින් මෙහෙයවන ලද කටයුතු අලුත් ප්‍රදේශයක් වන පේදුරු තුඩුවෙහි ද ඇරඹිණ. පවුල් සංවිධාන කටයුතු දැනට කරගෙන යනු ලබන්නේ මාතෘ හා ළමා සෞඛ්‍ය වැඩ සටහනක් ලෙසිනි. එය ප්‍රධාන වශයෙන් මෙහෙයවනු ලබන්නේ මාතෘ හා ළමා සෞඛ්‍ය සංවර්ධනය අරමුණ කොට ගෙනය.

වර්ෂය අවසාන වන විට පාඨශාලා දන්ත චිකිත්සාගාර 39ක් ක්‍රියාත්මක වූ අතර එම චිකිත්සාගාරවලට පැමිණියවුන්ගේ වාර ගණන 1,22,673 කි.

පාඨශාලා සෞඛ්‍ය පරීක්ෂණ පාසල් 2834ක පැවැත්විණ. තම පරීක්ෂණවලට භාජනවූ මුලු ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සංඛ්‍යාව 1,60,613කි. මෙම පරීක්ෂණවල දී සොයා ගන්නා ලද අඩුපාඩු කම්, මෙතෙක් වාර්තාවූ අඩුම සංඛ්‍යාව විය. මෙයින් පිළිඹිබු වන්නේ දූනට ක්‍රියාත්මක වන පාඨශාලා සෞඛ්‍ය වැඩසටහන්වල සාර්ථක භාවයයි. පාසැල් ළමුන් අතර ඇති ඌණ පෝෂණ අනුපාතයත් ඊට වඩා තරමක් අඩුවූ මන්ද පෝෂණයත් නොවෙනස්ව පැවතින.

ජාතික කිරි බෙදාදීමේ ව්‍යාපාරය යටතේ කිරි පයින්ට් 78,90,235ක් බෙදාදුන් අතර, "ඇදිහැස" යෝජනා ක්‍රමය යටතේ පිටි කිරි රාත්තල් 13,86,726ක් බෙදා දෙන ලදී.

වසංගත රෝග

මෙරට වසංගත රෝග පිළිබඳ ව ඇතිවූ විශාලතම සිද්ධිය නම් නොබෝදා පැතිර ගිය මහා පෝලියෝ රෝග වසංගතය සාර්ථක ලෙස මර්දනය කිරීමයි. අවුරුද්දේ මුල් කාර්තුව තුළ දී රෝගීන් මහත් සංඛ්‍යාවක් ඇති කරමින් පැනනැඟුණු පෝලියෝ රෝගය ක්‍රමයෙන් වැඩිවී රට පුරා පැතිර ගිය වසංගතයක් බවට පත්විය.

කොළඹ නගරයේ සිට පැතිරගිය පෝලියෝ වසංගතය මර්දනය කිරීම සඳහා නොපමාව විධි විධාන යොදන ලදී. මෙම ප්‍රහාරය සඳහා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට හැකි සෑම උත්සාහයක් ම දරණ ලදි. රෝග ග්‍රස්ත ප්‍රදේශවල සිටි රෝගයට පහසුවෙන් ගොදුරුවිය හැකි වයස් සීමාවට අයත් (මාස තුන සිට අවුරුදු 15 දක්වා) ළමයින් ප්‍රතිශක්ති කරණය කිරීමේ මහා ව්‍යාපාරයක් වහා අරඹන ලදි. මෙම ව්‍යාපාරයේ දී වයස අවුරුදු පහට අඩු ළමයින් පිළිබඳව ප්‍රමුඛත්වය දෙන ලදි.

ඒ සමගම කොළඹ ළමා රෝහලේ දීත් සෑම ප්‍රාදේශීය රෝහලකදීත් පෝලියෝ රෝගයට ගොදුරු වූ ළමයින් භාරගෙන ප්‍රතිකාර කිරීම සඳහා විශේෂ පහසුකම් සලස්වන ලදී.

ළමා චිකිත්සාගාර, සෞඛ්‍ය ඒකක, පර්යන්ත වෛද්‍ය ආයතන, පාඨශාලා හා බෙන්ත් විශේෂිත මධ්‍යස්ථානවල දී ප්‍රතිශක්ති කරන කටයුතු කෙරිණ. මේ ව්‍යාපාරය සඳහා මහජන සෞඛ්‍ය සේවාවට අයත් සියලුම සේවක සේවිකාවන් යොදවන ලදී. මෙම වැඩ සටහන වරින් වර සමාලෝචනය කරමින් ඒ පිළිබඳ කිසියම් වෙනසක් සිදුකිරීමට ඇත්නම් ඒ බැව් වෛද්‍ය නිලධාරින්ට හා මහජන සෞඛ්‍ය නිලධාරීන්ට දන්වනු පිණිස විශේෂ විමර්ෂණ විධි විධාන යොදවන ලදී.

සේබින් වර්ගයට අයත් සජීව වයිරස මුඛ එන්නත් වේල් තිස් ලක්ෂයක් ළමයින් දස ලක්ෂ 1 ½ කට දෙමින් සැප්තැම්බර් මාසය වන විට 1,778 දෙනකු ගිලන් කරන ලද පෝලියෝ වසංගතය මැඩ පවත්වන ලදී. මෙම එන්නතෙන් කොටසක් සෝවියට් සමාජවාදී සමූහ ආණ්ඩුව, අමෙරිකා එක්සත් ජනපද රාජ්‍යය, එක්සත් රාජධානිය හා කැනඩා රජය මගින් පරිත්‍යාග කෙරිණි.

වසංගතය ඇතිවූ ආකාරය හා එහි ස්වරූපය පිළිබඳ සම්පූර්ණ විස්තර මෙම වාර්තාවේ ඊට අදාල පරිච්ඡේදයෙන් දක්වා ඇත.

වසංගත රෝග විද්‍යාත්මක වැදගත්කම් ඇති සෙසු සිදුවීම් නම්, කුරුණෑගල, කෑගල්ල හා කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරී කොට්ඨාශවල සුළු වශයෙන් පැතිර ගිය වසූරිය වසංගතයි. මේ වසංගතවලදී රෝගයට ගොදුරු වුවන්ගේ මුළු ගණන 66 දෙනකු වූ අතර ඔවුන්ගෙන් 12 දෙනෙක් මිය ගියහ. බොහෝ විට වසූරි රෝගය පිළිබඳව සිදුවන්නාක් මෙන් ම, මෙම වසංගතය කුමන මාර්ගයකින් සිදුවූයේ ද යනු සොයා ගැනීම දුෂ්කර විය.

මෙම රෝගය මැඩලීමේ ප්‍රතිශක්තිකරණ ව්‍යාපාරයේ දී 3,75,599 දෙනෙක් ප්‍රාථමික එන්නත් කරනයට ද 18,56,130 දෙනෙක් ද්විතීය එන්නත් කරනයට භාජන කරන ලදහ.

කරන ලද තවත් වැදගත් කාර්‍යයක් වූයේ අතීසාර රෝග පිළිබඳ හැදෑරීම සඳහා සමීක්ෂණයක් පැවැත්වීමයි. මේ සමීක්ෂණයට ලෝක සෞඛ්‍ය සංවිධානයේ උප දේශකවරු කණ්ඩායමක් ද සහභාගි විය. සැප්තැම්බර මාසයේ දී අවසන් කළ මෙම සමීක්ෂණ වාර්තාවෙන් එම රෝග මර්දනයෙහි ලා ගත යුතු පියවර කුමක් ද යනු අනාවරණය කෙරේ.

මෙම වර්ෂය තුළ දී අධ්‍යක්ෂවරුන්ගේ උපදෙස් නොතකා, නිරෝධායන හා ජාත්‍යන්තර සෞඛ්‍ය පිළිබඳ සහකාර අධ්‍යක්ෂවරයාගේ තනතුර නැතිකර දමන ලදි. මෙම නිලධාරිවරයාගේ රාජකාරි වූයේ නිරෝධානය හා ජාත්‍යන්තර සෞඛ්‍ය කටයුතු පිළිබඳව කරුණුවල නිරතවීමය. මෙම තනතුර නැතිකර දැමීමේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම අංශයේ කටයුතුවලට බාධා පැමුණුනි. මෙම තනතුර ඉක්මනින් නැවත ඇති කරනු ඇතැයි අපෙක්ෂා කෙරේ.

විශේෂ සේවා

මැලේරියාව, බරවා රෝගය, ක්ෂය රෝගය, ලාදුරු රෝගය හා සමාජ රෝග වැනි බෝවන රෝග මර්දනය කිරීම සඳහා විශේෂ වැඩ කටයුතු එම රෝගමර්දන වැඩ සටහන් භාරව ක්‍රියා කරන විශේෂඥ නිලධාරීන් විසින් මෙහෙයවන ලදි. මීට අමතර වශයෙන් මානසික සෞඛ්‍ය සංවර්ධනය, පිළිකා රෝගීන් කල් ඇතිව සොයා ගන ප්‍රතිකාර කිරීම හා අධිකරණ වෛද්‍ය කටයුතු සම්බන්ධයෙන් විශේෂ විධි විධාන යෙදිණ.

ක්ෂය රෝගය

ක්ෂය රෝගයේ පැතිරීම අඩුවී ඇද්ද, නත්නම් වැඩි වී ඇද්ද, යන ප්‍රශ්නය කෙරෙහි සැලකිල්ලක් යොමු විය. මෙය ඇත්තෙන්ම සැලකිල්ලට භාජනවිය යුතු ප්‍රශ්නයෙකි. එහෙත් මේ සඳහා රෝගය පිළිබඳ වසංගත විද්‍යාත්මක කරුණු සහ රෝගය පැතිර යන අන්දම අවුරුදු ගණනක් තුළ විද්‍යාත්මක අයුරින් අධ්‍යයන කිරීම යටත් පිරිසෙයින් අවශ්‍ය වන හෙයින් මෙය විසඳීම අපහසු ය. එවැනි අධ්‍යයනයක් මෑතක් වනතුරු ම ඇරඹී නොමැති බැවින් රෝගය අඩු වී තිබේද නැත්නම් වැඩි වී තිබේ ද යනු නියත වශයෙන් ප්‍රකාශ කිරීමට තව කලක් ගතවනු ඇත.

කිසියම් වර්ෂයක දී හෝ වර්ෂ කිපයක දී නිවේදනය කරන ලද ක්ෂය රෝගීන්ගේ සංඛ්‍යාව අධික වීමෙන් රෝගය වැඩිවී තිබෙන බවක් ප්‍රකාශ නොවන බැව් සිහිකට යුතු ය. මෙවැනි වැඩිවීමක් රෝගීන් සොයා ගැනීමේ කටයුතු වඩා ප්‍රබල අයුරින් කිරීමේ හේතුවෙන් ද නිවේදනය කරන ලද සංඛ්‍යාව අඩුවීමක් රෝගීන් සොයා බැලීමේ කටයුතු පිළිබඳව උනන්දුවක් නොදැක්වීමේ හේතුවෙන් ද සිදුවිය හැකිය.

එපමණක් ද නොව කරුණු රාශියක් හේතු කොට ගෙන රෝගය වැළඳුන මුල් වැඩී යේ දී ම ඔවුන් සොයා ගෙන නිවේදනය කිරීමට අපහසු වේ.

මෙය බටහිර වෛද්‍ය කර්මය හැරුණු විට වෙනත් වෛද්‍ය ක්‍රම ඇති ලංකාවේ විශේෂයෙන් දක්නට ලැබෙන තත්ත්වයක බොහෝ විට බටහිර වෛද්‍ය පහසුකම් ලබා ගැනීමට රෝගීන් පැමිණෙන්නේ වෙනත් වෛද්‍ය ක්‍රමවල පිහිට සෙවීමෙන් පසු වය. වෛද්‍ය වෘත්තියෙහි නියුක්ත සෑම කෙනෙකුම ක්ෂය රෝගීන් ගැන නිවේදනය කිරීමේ අවශ්‍ය තාවයක් ඇතත් මේ දක්වා එම රෝගීන් ගැන නිවේදනය වී ඇත්තේ අපරදිග වෙදකම වෘත්තියක් කොටගත් වෛද්‍යවරුන් විසින් පමණක් වීම කණගාටු වට කරුණකි.

මීට පළමුවෙන් නිකුත් කරන ලද වාර්තාවල සඳහන් කර ඇති පරිදි ක්ෂය රෝගය ඇතිවීමට ආධාරවන කරුණු නො දියුණු රටවල හා දියුණුවෙමින් පවත්නා රටවල සුලභය. රෝගය මර්දනය කිරීමේ සාර්ථක භාවය බොහෝ සෙයින් ඊට හේතුවන කරුණු පිටුදැකීම මත රඳා පවතී.

වර්ෂය අවසාන වන විට ප්‍රධාන ලේඛනයේ ලියා පදිංචි වී සිටි ක්ෂය රෝගීන්ගේ සංඛ්‍යාව 39,874 දෙනෙකි. 1950 වර්ෂයේ දී මේ ලේඛනයේ ලියා පදිංචි වූ වෝ 17,714 දෙනෙක් වූහ. රෝගීන් සොයා ගැනීම පිළිබඳ ව යොදන ලද විධි විධාන තර කර ඇති බව මෙයින් මැනවින් පෙනී යයි.

මැලේරියාව

මැලේරියාව සමූලඝාතනය කිරීමේ පස් අවුරුදු වැඩ සටහනේ ප්‍රගතිය ඉතා සතුටුදායක ලෙස වාර්තා විය. මෙම වැඩ සටහනේ අවසාන පියවර 1963 වර්ෂයේ දී ඇරඹේ. වර්ෂය තුළ දී මුළු රෝග ග්‍රස්ත ප්‍රදේශය තුළ ම මැලේරියා රෝග පැතිරීම නැවති තිබුණි. වර්ෂය තුළ දී සොයා ගනු ලැබුවේ එක් මැලේරියා සංක්‍රමණයක් පමණකි. එය වූ කලී පෙබරවාරි මාසයේ දී රෝග ග්‍රස්ත උතුරු ප්‍රදේශයේ ය. මෙය වහා මැඩ ලනු හැකි විය.

ඊ ළඟ පියවර වනුයේ කෘමි නාශක ඖෂධ ඉසීම නවතා දමා රෝග සංක්‍රමණ ඇත්දැයි සොයා ගනු සඳහා ප්‍රධාන වශයෙන් නිරීක්ෂණත් එම රෝග සංක්‍රමණ වහා නැති කර දැමීම සඳහා අවශ්‍ය විධි විධාන යෙදීමත් ය.

පරපෝෂිත විද්‍යානුකූලව තීරණය කරනු ලැබූ මැලේරියා රෝගීන් සොයා ගත හැකි වූයේ 47 දෙනෙකු පමණි. එහෙත් 1961 වර්ෂයේ දී මෙසේ සොයා ගනු ලැබ රෝගීන්ගේ සංඛ්‍යාව 110 ක් විය. 1962 ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ සොයා ගනු ලැබූයේ මැලේරියා රෝගීන් 31 දෙනෙකු පමණකි. මොවුන් අතුරින් රෝගීන් දෙදෙනෙක් මාලදිවයින්හි සිට පැමිණියෝ වූහ. පිටරටින් මෙරටට රෝගය ආගමනය වීම වැලැක්වීම සඳහා සෑක කටයුතු රෝගීන් සියලු දෙනාගේ ම රුධිරය මැලේරියා රෝගය සඳහා පරීක්ෂා කරවීමට දැන් විධි විධාන යොදා ඇත.

බරවා රෝගය

නිරිත දිග මුහුදු බඩ ප්‍රදේශයෙහි මුල් බැසගෙන ඇති නාගරික වර්ගයට අයත් බරවා රෝග ප්‍රශ්නය එසේම පැවතුණ නමුත්, එයට බාහිරව රෝගය පැතිරෙන අළුත් ප්‍රදේශ සොයා ගත නොහැකි විය. රුධිර පරීක්ෂාවට භාජනය කරන ලද 1,26,892 දෙනකු අතුරින් 4,378 දෙනෙකු තුළ බරවා පරජීවයන් පවත්නා බව සොයා ගත හැකි විය. මේ අනුව බරවා රෝග ග්‍රස්තයන්ගේ සංඛ්‍යාව සියයට 3.45 ක් විය. රෝග ලක්ෂණ අනුව බරවා රෝගීන් යැයි විනිශ්චිත අයගේ සංඛ්‍යාව 2,718 දෙනෙකි.

මෙම රෝගය මර්දනය කිරීමේ කටයුතු ප්‍රබල කිරීම සඳහා මෙහෙයවනු ලබන ව්‍යාපාරයේ ප්‍රථම පියවර ක්‍රියාත්මක කිරීම රජය මගින් පිළිගැනීමෙන් පසු ඊට අවශ්‍ය නිලධාරීන් හා උපකරණ සැපයීම පිණිස 1962-63 වර්ෂයේ ඇස්තමේන්තුවලින් මුදල් වෙන්කරවා ගැනීමට ක්‍රියා කරන ලදි.

පරපෝෂිත විද්‍යානුකූල පර්යේෂණ නොකඩවා පවත්වන ලදී. මේ සම්බන්ධයෙන් පැවැත්වූ සංඛ්‍යා ලේඛනමය විශ්ලේෂණයක දී ප්‍රතිකාර ලැබීමෙන් පසුව ගනු ලැබූ ලේ සැම්පල 8,704කින් 1,268ක් (සියයට 14.5ක්) බරවා පරජීවය සහිත වූ බැව් අනාවරණය විය. මේ අන්දමින් අධික ලෙස පරජීවය සහිත වූවන් සිටියේ අම්බලන්ගොඩ (21.5), ගාල්ල (21.6), මාතර (19.3), දෙහිවල (18.2), හා කෝට්ටේ (16.7) යන නගර වලය. ප්‍රතිකාර ලැබූවන් තුළ මෙපමණ ප්‍රමාණයක් බරවා පරපෝෂිතයන් වූයේ නියමිත ප්‍රතිකාරයන් නිසි පරිදි නොගැනීම නිසා බැව් පැහැදිලි විය. පරපෝෂිත විද්‍යානුකූල පරීක්ෂණවලින් අනාවරණය වී ඇති තවත් වැදගත් කරුණු නම් රුධිරය තුළ පරජීවයන් සිටි අයගෙන් වැඩි සංඛ්‍යාවක් සොයා ගත හැකි වූයේ සෙසු අය ඇසුරු කළ අයට වඩා ක්ෂුද්‍ර ජීවයන් සහිත රෝගීන් ඇසුරු කළ අය අතුරින්වීමත් ශායනික රෝගීන් ඇසුරු කළ අය ගේ රුධිරය තුළ පැවති බරවා පරජීව අනුපාතය ද අඩු බවත් ය. ප්‍රතිකාර වලින් උසස්ම ප්‍රතිඵල ලැබී ඇත්තේ ශායනික රෝගීන්ට හා ඔවුන් ගේ ඇසුරු කරන්නන්ට ය.

ලාදුරු රෝගය

දිවයින පුරා කරන ලද සමීක්ෂණවල ප්‍රතිඵලයක් වශයෙන් සොයාගත් රෝගීන් හා රජයේ රෝහල් මගින් ද පෞද්ගලික වෛද්‍ය වරුන් හා සෞඛ්‍ය නිලධාරීන් විසින් ද එවන ලද රෝගීන් ඇතුළු අලුත් රෝගීන් 309 දෙනෙක් වාර්තා ගත කරන ලදහ.

අළුතෙන් වාර්තා ගත කරනු ලැබූ රෝගීන් සම්බන්ධයෙන් කරන ලද විශ්ලේෂණයකින් රෝගය අධික ලෙස වැළදී තිබෙන්නේ අවුරුදු 20ත් 29ටත් හා 30ත් 39ත් අතර වයස් සීමාවලට අයත් වූවනට බැව් අණාවරණය වී ඇත. එසේ වුව ද අවුරුදු 20 ට වඩා අඩු වයස් සීමාව තුළ වූ රෝගීන් 45 දෙනෙක් ද වූහ. වැඩිම රෝගීන් සංඛ්‍යාව (153) සොයා ගෙන ඇත්තේ බස්නාහිර පළාතෙනි. මොවුන් ගෙන් 33 දෙනෙකු කොළඹ නගර සීමාවට අයත් වූවන් ය. රෝගීන් 40 දෙනෙක් දකුණු පළාතට අයත් වූවෝය. අළුතෙන් සොයා ගත් රෝගීන්ගෙන් 106 දෙනෙක් බෝවන ලාදුරු රෝගීන් වූ අතර 203 දෙනෙක් බෝ නොවන තත්ත්වයේ රෝගීන් වූහ. මේ සංඛ්‍යාව ගැහැණු පිරිමි වශයෙන් ගත් කල ගැහැණු 77 දෙනෙක් හා පිරිමි 232 දෙනෙක් වෙති.

අළුත් ලාදුරු රෝගීන් ද ඇතුළත් කළ විට දැනට සොයා ගෙන ඇති මුළු රෝගීන්ගේ සංඛ්‍යාව 3,966 දෙනෙකි.

දැනට වෙන්කර ප්‍රතිකාර කරනු ලබන රෝගීන් 853 දෙනා සඳහා කරන ලද වියදම රුපියල් 16,37,661කි. ඒ අනුව එක් රෝගියකු සඳහා රුපියල් 1,920ක් වැය වී ඇත.

ආඛාර මුදල් දීමේ ක්‍රමය යටතේ පිට කර යවනු ලැබූ බෝ නොවන තත්ත්වයේ ලාදුරු රෝගීන් ගේ සංඛ්‍යාව 397 දෙනෙක් වුයෙන්, ඔවුන් සඳහා කෙරෙන වියදම රුපියල් 1,98,367ක් විය. මෙම ක්‍රමය යටතේ තවත් රුපියල් 52,000ක් ලබා ගැනීම සඳහා ක්‍රියා කර ඇත.

සමාජ රෝග

සමාජ රෝග නාශක ව්‍යාපාර කටයුතුවල දී දක්නට ලැබුණු ඉතාමත් දිරිගන්වන සුළු ලක්ෂණයක් නම්, බෝවන සුළු උපදංශයේ මුල් අවස්ථාවේ දී ම එම රෝගීන් ගෙන් සියයට 80ක් පමණ ස්වේච්ඡන්දයෙන් හෝ ස්පර්ෂක විමර්ශන නිසා හෝ චිකිත්සාගාරවලට පැමිණීමයි. මෙම දියුණුව නිසා පිළිබිඹු වන ප්‍රධාන කරුණක් වනුයේ දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවනු ලබන මහජන අධ්‍යාපන කටයුතුවලින් ප්‍රතිඵල ලැබෙන බව යි.

ගත වූ තෙවස තුළ බෝවන තත්ත්වයේ උපදංශ හා සුද බිංදුම රෝගීන් ප්‍රතිකාර සඳහා පැමිණීමට දක්වන ලැදියාව වැඩිවනු පෙනී ගියේ ය. එම වැඩිවීම මේ වර්ෂයේ දී ද එසේම පැවතින. සුද බිංදුම රෝගීන්ගේ වැඩිවීම මේ රෝගය බටහිර රටවල පවතින තත්ත්වයට අනුකූල වන සේ පෙනේ. කිසියම්, ප්‍රතික්ෂේධක ක්‍රමයක් සොයා ගන්නා තුරු මේ රෝගය මර්දනය කිරීම කිසිසේත් අපහසු බැව් මේ තත්ත්වය අනුව පැහැදිලි වේ.

කොළඹ ප්‍රධාන චිකිත්සාගාරයේ වාර්තා ගතවී ඇති සංඛ්‍යා ලේඛන අනුව සමාජ රෝග වැඩි වශයෙන් පවතින්නේ කම්කරුවන් අතර ය. මෙම කොටස අතර සියයට 42 උපදංශයත් 34 ක් සුද බිංදුමත් පැවතිණි.

සියලුම සංක්‍රමික උපදංශ රෝගීන් සම්බන්ධයෙන් වසංගත රෝග විද්‍යාත්මක විමර්ෂණ සිරිත් පරිදි කොට ස්පර්ශකයින් ප්‍රතිකාර සඳහා කැඳවා ගන්නා ලදි. ඒ අතර බන්ධනාගාරවලට හා රිමාන්ඩ් සිරගෙවලට ඇතුළු වූ සෑම කෙනෙකුගේ ම රුධිරය මේ රෝගය සඳහා පරීක්ෂා කරන ලදී.

පෙනිසිලින් ප්‍රතිකාරය දීමට පළමු සෑම රෝගියකුම පෙනිසිලින්වලට සංවේදී දැයි නිශ්චය කිරීමේ පරීක්ෂණයට භාජන කිරීමට තීරණය කර ඇත.

මානසික සෞඛ්‍යය

මෙම වර්ෂයේ දී දක්වන ලද වැදගත් සිදුවීමක් වූයේ මනෝචිකිත්සා හෙද සේවය පිළිබඳ පශ්චාත්-මූලික පාඨමාලාවක් ආරම්භ කිරීම ය. අගෝස්තු මාසයේ දී ඇරඹුන මෙම පාඨමාලාව පිළිබඳ ව දැනටමත් සෑහෙන උනන්දුවක් ඇති වී තිබේ.

මනෝ ගෝචර ඖෂධ වර්ග යොදමින් 1954 වර්ෂයේ දී ඇරඹුණ නව ප්‍රතිකාර ක්‍රමයන් නිසා මානසික රෝග පිළිබඳ පැවති දර්ශනයේ විප්ලවයක් ඇති වී තිබෙන බව පැහැදිලිව පෙනේ. මෙහි ප්‍රතිඵල වශයෙන් මානසික රෝගීන් ගේ වාර්ධවල සහයෝගය දැක්වීමද ගණන් ගත හැක. වර්ෂය තුළ දී ප්‍රතිකාර සඳහා බිරන්තන මානසික රෝගීන් වඩ වඩා ඇතුළු කරගන්නා ලද අතර, චිරන්තක මානසික රෝග වලට ඖෂධීය ප්‍රතිකාර කිරීමෙන් හොඳ ප්‍රතිඵල ලැබිය හැකි බැව් දක්නා ලදී.

වෘත්තීය ප්‍රතිකාර අංශයේ ඇ දක්නා ලද වැදගත් සිදුවීමක් නම්, අර්ධ කාලීන උපදේශකයකු පත් කරමින් පේෂකාර්මික අංශය නැවත විවෘත කිරීමයි. ඒ අතරම කුඹල් හා සම් කර්මාන්ත සඳහා උපදේශකයින් බඳවා ගැනීම සඳහා මුදල් ද වෙන්කර ඇත. මුල්ලේරියාවේ පිහිටි රෝහලේ වෘත්තීය අංශය පිහිටුවමින් එහි කාර්මික ක්‍රියා කාරිත්වය වැඩි දියුණු කැරිණි. මෙය දැන් මනෝ චිකිත්සා හෙද සේවය හදාරන්නාවූ සිසු හෙද හෙදියනට ශාසනික කටයුතු පුහුණු කරනු ලබන අංශයක් වශයෙන් ද යොදා ගෙන ඇත.

කිරිපට්ටි ඇති කිරීම සම්බන්ධයෙන්, කෘෂි කර්මය හා සත්ත්වපාලනය පිළිබඳ අධ්‍යක්ෂවරයා විසින් පත් කරන ලද කමිටුව මගින් කරන ලද නිර්දේශයන් හැකි අයුරින් ක්‍රියාත්මක කෙරිණ. මේ නිර්දේශයන් තවදුරටත් ක්‍රියාත්මක කිරීමෙන් ලැබෙන කිරි ප්‍රමාණය වැඩි වෙතයි බලාපොරොත්තු විය හැක.

පිළිකා රෝගය

එය මහරගම පිළිකා රෝග ආයතනය පිහිටවූ දිනයේ සිට පැවැති ඇඳන් 216 මේ වර්ෂයේ දී ඇඳන් 254ක් දක්වා වැඩි කරන ලදී. මේ ඇඳන් ගණන වැඩි කරන ලද්දේ එවෙනක් වාර්ධවල තුබුණ ඇඳන් අතර පරතරය අඩු කිරීමෙනි.

මෙම ආයතනයේ සෑම අංශයකදීම කරන ලද වැඩ සෑහෙන ප්‍රමාණයකින් අධික විය. රශ්මි චිකිත්සා අංශයෙන් රෝගීන් 2,175 දෙනෙක් ප්‍රතිකාර ලැබූහ. මොවුන් අතුරින් 522කට "කෝබෝල්ට්" ප්‍රතිකාරයත් 73කට රේඩියෝ අයිසටොප් ප්‍රතිකාරයත් 1,055කට "ඩිප්රේ" ප්‍රතිකාරයත් ලබා දී ඇත. ඉතා බහුල ලෙස පාවිච්චි කරන ලද "අයිසටෝපය" වූයේ විද්‍යුත් ක්‍රියාකාරී අයඩින් ය.

වෛද්‍ය පර්යේෂණ

වසූරිය වසංගත සහ පෝලියෝ වසංගතය හා සම්බන්ධවූ වැඩ සම්භාරයක් පැවැතුණ ද වෛද්‍ය පර්යේෂණ අතින් මෙය නොයෙක් සිදුවීම් ගහණ වර්ෂයක් විය.

ශාකවිද්‍යය යටතේ කරන ලද විශෙෂ කාර්‍යයක් වූයේ පූයජනක ආවෘතිදැහය වැළදී මියගිය රෝගියකුගෙන් ඉතා දුර්ලභ ගණයේ ජීවානුවක් වන "ලිස්ටීරියා මොනොසයිටජීන්" ජීවානුව ලංකාවේ ප්‍රථමවරට වෙන්කර ගැනීමය.

කිට වේදය අතින් වැදගත් තැනක් ගන්නා කාර්‍යයක් වූයේ මැන්සෝනියා යුනිෆෙපාමිස්" වර්ගයේ මදුරුවන් ගේ විදීමේ ගති හා වයස් ප්‍රමාණය යන කරුණු පිළිබඳ සවිමත් ක්ෂණයක් පැවැත්වීම යි. මෙම සමීක්ෂණයේ දී බැසගත හැකි සාමාන්‍ය තීරණය වූයේ ඔවුන් වැඩි වශයෙන් විදිනු ලබන්නේ පස්වරු 7 සිට 8 දක්වාත්

පෙරවරු 2 සිට 3 දක්වා කාලය තුළත් බවය. මේ අයුරින් විදින්නන් නොමේරූ ගෑහැණු මදුරුවන් හා දින දහයක් දක්වා වයස් වූ ගෑහැණු මදුරුවන්ය. වයස් ගතවූ ගෑහැණු මදුරුවන් ලේ ඉරීමට කැමැත්ත දක්වූයේ රාත්‍රියේ මුල් යාමයේ දී ය.

කෘමීන් කෘමිනාශක ඖෂධවලට සංවේදී වන ප්‍රමාණය පරීක්ෂා කර බැලීම සඳහා "ඒ හෙස් ඉජිප්ටි" හා "ඔමෙස් ඩිම්ප්ටෙරස්" නමැති ඇද මකුණන් රසායනාගාරයේ දී බෝ කරන ලදී. මෙහි අදහස වූයේ දැනට පාවිච්චි කරනු ලබන සම්මත කෘමිනාශකයන්ට මේ සත්ත්ව වර්ගයන් සංවේදීවන ප්‍රමාණය පිළිබඳ මූලික මිම්මක් සොයා ගැනීම ය.

පෝෂණ විද්‍යා අංශය යටතේ කළ වැදගත් කාර්‍යයක් නම්, ප්‍රජා සංවර්ධනා කටයුතු කිරීමෙන් පසුව, ඇතිවන වැඩිදුර වෙනස්කම් මැන බැලීම සඳහා උපයෝගි කරගත හැකි මූලික මිම්මක් ඇති කරනු සඳහා ගම් දෙකකට අයත් ළමයින් පිළිබඳ සමීක්ෂණයක් පැවැත්වීමය.

ආරෝග්‍යශාලා භෝජනය පිළිබඳ වාර්තා කිරීම සඳහා පත් කරන ලද විශේෂ කමිටුවට මග පෙන්වීම සඳහා එම භෝජනවල වට්නාකම් පූනර්විශ්ලේෂණය කිරීම අරඹන ලදී.

ධමනී දෘඪතාවය ඇතිවීමට "මාස්ටි සෛලය" ආධාරවන ආකාරය සොයා බැලීම සඳහා ව්‍යවසථාවේදීය අධ්‍යයනයන් මෙහෙයවන ලදී. ඒ අතර ම ජලා-අන්තෝශ්ජද බාධක ද්‍රව්‍යයන් මාස්ටි සෛලයේ ක්‍රියා කාරිත්වය කෙරෙහි බලපාන ආකාරය නිශ්චය කිරීම සඳහා ද විමර්ශන පවත්වන ලදී. මෙම විමර්ශන මගින් එම අංශයේ කටයුතුවලට වැදගත් පිටුවහලක් ලැබෙනු ඇත.

ප්‍රථම වරට වූ තවත් වැදගත් සිදුවීමක් නම්, "සැල්මොනෙල්ලා" වර්ග හයක් වෙන්කර ගැනීම ය. මේවා යේ නම් මෙම වාර්තාවේ ඊට අදාළ පරිවෙජ්දයේ දක්වා ඇත. ගතවූ වර්ෂයේ ද ජාතික ෆේජ් වර්ග කාරක මධ්‍යස්ථානයක් අරඹා එමගින් සැල්මොනෙල්ලා ජීවානු 651 වර්ගයක් වර්ග කරන ලදී. මේවාසින් වර්ග 319 ක් නියත වශයෙන් ම හඳුනාගන්නට යෙදුනි.

පාරිසරික සෞඛ්‍යය

අයහපත් පරිසරය නිසා රෝග වැළඳෙන නිසාත් විශේෂයෙන් ම පාසල්වියට නොපිවිසි ළමුන් අතර රෝග පැතිරෙන නිසාත් මෙම අයහපත් පාරිසරික තත්ත්වයන් සකස් කර දීම සඳහා වැඩි අවධානයකින් යුක්තව කටයුතු කරන ලදී.

ජනගහණයෙන් වැඩි කොටසක් ජලය ලබා ගන්නේ අනාරක්ෂිත ජල මාර්ගවලින් බැවින් ගංගා ජල සම්පාදනයන්ගේ තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා ආධාර දීමේ ක්‍රමයක් ඇති කිරීමට තීරණය කැරිණ. මෙම ක්‍රමය යටතේ වර්ෂය තුළ දී රුපියල් 3,80,000 ක් පමණ වැය කරනු ලැබී ය.

අනතුරු වැළැක්වීම පිළිබඳ අන්තර් දෙපාර්තමේන්තු කමිටුව සිය කටයුතු දිගටම කරගෙන ගියාය. මෙම කමිටුවේ නිර්දේශයක් වන මෝටර් බයිසිකල් කරුවන්ගේ "ආරක්ෂක හිස්වැසුම්" ගෙන්වීම පිළිබඳ තීරු ගාස්තු අඩු කිරීම රජය විසින් පිළිගනු ලැබිය. අනතුරුවලට භාජනවන මෝටර් බයිසිකල් පදවන්නන් ගෙන් වැඩි සංඛ්‍යාවක් ජීවිතක්ෂයට පත්වන්නේ හිස තුවාලවීම නිසා බැවින්, සෑම මෝටර් බයිසිකල් පදවන්නකු විසින් ම මෙම වර්ගයේ හෙල්මට් පැළඳිය යුතු යයි බල කරන ලෙස කමිටුව මගින් තරයේ ඉල්ලා ඇත.

ආහාර හා ඖෂධ පිළිබඳ නිර්දේශ කමිටුව විසින් ඖෂධ දේශීයව නිෂ්පාදනය කිරීම, ඇසිරීම හා විකිණීම හා සම්බන්ධ නීතිරීති සකස් කර අවසන් කරන ලදී. 1962 ජූනි මාසයේ දී 1961 කේ අංක 8 දරණ ආහාර හා ඖෂධ නීතිය ක්‍රියාවට නැඟිනා.

දෙපාර්තමේන්තුව මගින් නොවැළැක්විය හැකි හේතූන් නිසා මහජන සෞඛ්‍ය ඉන්ජිනේරු අංශයේ වැඩවලට තරමක් බාධා පැමුණුනි. ඇබෑර්තු පිරවීම සඳහා

කොතෙක් උත්සාහ කළ ද ඉන්ජිනේරු හා සහාය කාර්මික නිලධාරීන් හිඟයක් පැවතුණේය. මෙම තනතුරු සඳහා අයදුම් පත් කැඳවනු ලැබුවද සුදුසු කම් ඇති අයදුම් කරුවෝ නොවූහ.

සෞඛ්‍ය අධ්‍යාපනය

ජාතික සෞඛ්‍ය අධ්‍යාපන ක්‍රමයේ ප්‍රගතිය තවදුරටත් වර්ධනය විය. දැනට ඇති වැඩසටහන් ස්ථාවර කරන ලද අතර අළුත් වැඩ කටයුතු රාශියක් ඇරඹිණ.

ඉඛම් සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් ජාතික සේවා අංශය සමග එකමුතුව කටයුතු කිරීම ද ඉන් එක් කාර්යයකි. නෙළුම, වදුරුස්ස හා පැලවත්ත යන ජාතික සේවා නියමු යෝජනා ක්‍රමවලට සහභාගි වීමට මේ එකමුතු කම නිසා මංසැලැසින. තවද මෙවැනි ම පාසල් වැඩ සටහනක් යටතේ පාඨශාලාවල හා ප්‍රජාවතුළ පාරිසරික සෞඛ්‍ය සංවර්ධනයෙහි ලා පාඨශාලීය ස්වේච්ඡා සේවකයෝ සංවිධානය කළ වැඩ කඳවුරුවලට ද සහභාගි වූහ.

වර්ෂය තුළ දී අරඹන ලද වැදගත් කාර්යයන් වූයේ සෞඛ්‍ය අධ්‍යාපන කටයුතු මේ ආයතනවල සංවිධානය කර එම කටයුතු සියලුම ප්‍රධාන ආරෝග්‍යශාලාවලට ද පතල කර හැරීමය.

සෞඛ්‍ය අධ්‍යාපන කටයුතුවල ද ප්‍රජා සංවිධාන ක්‍රම වඩ වඩා ප්‍රයෝජනයට ගනු ලැබිය. වැඩ කඳවුරුදු ක්‍රමය යටතේ වැසිකිළි තැනීම කැළිකසළ බැහැර කිරීම, වල්බිහිවී ඇති තැන් එළිපෙහෙලි කිරීම, ජලය රඳන ස්ථාන හා ගොහොරු බිම් ගොඩ කිරීම යන ආදි කටයුතු ඉතා ඉක්මණින් කැරිණ.

නගරයේ සිටින බරවා රෝගහාරක මදුරුවන් වද කිරීම සඳහා මාතර රාහුල විද්‍යාලයේ දී ශ්‍රමදාන ව්‍යාපාරයක් ඇරඹීම සඳහන් කළ යුතු වැදගත් සිද්ධියකි. මෙම ව්‍යාපාරයට සහභාගිවූ ස්වේච්ඡා සේවක ශිෂ්‍ය ආචාර්ය සංඛ්‍යාව 500කට අධික විය. බතිගම, දික්වැල්ල, අතුරලිය හා මිරිස්ස යන ස්ථානවල ශ්‍රමදාන වැඩ කඳවුරු පවත්වන ලද්දේ එම ප්‍රදේශවල සෞඛ්‍ය තත්ත්වය වැඩි දියුණු කිරීම පිණිස වූ නොයෙක් පරමාර්ථයන් හේතුකොට ගෙන ය.

ප්‍රජා සෞඛ්‍ය වැඩසටහන්වල දී මූලික ස්ථානයක් ගෙන කටයුතු කිරීමට ඉඩ සලසනු වස් රත්මලානේ පිහිටි ප්‍රධානාභික්ෂූ අභ්‍යාස විද්‍යාලයේ දී විශේෂ සෞඛ්‍ය අධ්‍යාපන අභ්‍යාස පාඨ මාර්ගයක් ක්‍රියාත්මක කරන ලදි.

සමස්ත ලංකා සෞඛ්‍ය සතිය ප්‍රධාන වශයෙන් මහජන කායීයක් ම වූ හෙයින් එය "මහජන සෞඛ්‍ය සතිය" යනුවෙන් යළි නම් කරන ලදි. මුළු පවුලේ ම සෞඛ්‍යය හා සැපත ළංකර දීමේ අභිලාෂයෙන් සතියේ කටයුතු "පවුලේ සෞඛ්‍ය හා සුභසාධනය" යන මාතෘ පාඨය යටතේ සංවිධානය කරන ලදි.

සෞඛ්‍යයට අදාළ කටයුතු වල නිරතවන ස්වෙච්ඡා සංවිධාන රාශියකට වැඩි වැඩියෙන් ආධාර දෙන ලදි.

ප්‍රවාහන සේවා

ෙපෝක්ස්වාගන් ගිලන් රථ 28ක්, ජංගම ඇක්ස් කිරණ ඒකක දෙකක් හා ලැන්ඩ් රෝවර් රථ 10 ක් ද ඇතුළු අලුත් රථ 51 ක් එකතු කිරීමෙන් දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන සේවය ප්‍රබල කරන ලදි. මේ අළුත් රථ එකතුවීම නිසා වඩා උසස් සේවයක් සංවිධානය කළ හැකි විය.

දෙපාර්තමේන්තුවට අයත් සියලුම රියැදුරන්ගේ රිය පැදවීමේ ප්‍රවීණත්වයත් මාර්ග නීති රීති පිළිබඳ දැනීමත් පරීක්ෂා කර බලා වාර්තා කිරීමට පොලිස් දෙපාර්තමේන්තුව සමග විධි විධාන යෙදීමෙන් වැඩි සුරක්ෂිත භාවයක් ඇති කරන ලදි. රථවාහන නිසි පරිදි භාවිතය හා බලාගැනීම පිළිබඳව අභ්‍යාස පංති රියැදුරන් සඳහා පවත්වන ලෙස නිෂ්පාදකයන් ගේ නියෝජිතවරුන්ගෙන් ඉල්ලන ලදි.

මනා සංවිධානයෙන් යුතු ප්‍රවාහන සේවයක් බොහෝ සෙයින් රදා පවත්නේ එම රථ වාහන රියැදුරන් විසින් ආරක්ෂා සහිතව භාවිත කිරීම හා පවත්වා ගෙන යාම මතය. ඔවුන් ලවා එසේ කරවීමට සෑම උත්සාහයක් ම ගන්නා ලදි.

ජාත්‍යන්තර සම්මන්ත්‍රණ

ජාත්‍යන්තර සෞඛ්‍ය සම්මේලනයන්ගේ ප්‍රධානතම ස්ථානය ගන්නා ලෝක සෞඛ්‍ය සම්මේලනයේ දී එක්සත් රාජධානියේ ලංකා කොමසාරිස්වර අතිගරු ආර්. ඇස්. ඇස්. ගුණවර්ධන මහතා හා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඒ. කරුණාරත්න මහතා විසින් ලංකාව නියෝජනය කරන ලදි.

මෙම සම්මේලනයේ දී සාකච්ඡා කරන ලද ප්‍රධාන මාතෘකාව වූයේ "මහජන සෞඛ්‍ය සැලසුම් යටතේ මානසික සෞඛ්‍ය වැඩසටහන් පිළියෙල කිරීමය". මෙම විෂය (සාමාජිකයින් 160 දෙනෙකු සහභාගිවූ) කණ්ඩායම් 8ක් විසින් සාකච්ඡාවට භාජන කරන ලද අතර මෙයින් එක් කණ්ඩායමක සභාපතිත්වය වෛද්‍යාචාර්ය කරුණාරත්න මහතා දැරුවේ ය. තවත් වැදගත් කාරණයක් නම්, කෘත්‍ය විධායක මණ්ඩලයට සාමාජිකයකු යැවීමට ඉඩ ඇති රටක් වශයෙන් ලංකාවද තෝරා ගැනීමය. මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් ඡන්දය පාවිච්චි කරන ලද රටවල් 102න් 96ක්ම ලංකාව තෝරා ගැනීමට කැමැත්ත පළ කළහ.

ලෝක සෞඛ්‍ය සංවිධානය (අග්නි දිග ආසියාව) විසින් නව දිල්ලියේ දී පැවැත්වූ දිශා කමිටු රැස්වීම් වාරයේ දී නියෝජ්‍ය (මහජන සෞඛ්‍ය සේවා) අධ්‍යක්ෂ වෛද්‍යාචාර්ය පී. රාජසිංහම් මහතාත් ජලසම්පාදනය හා පල්දෝරු ක්‍රම පිළිබඳ අධ්‍යක්ෂ සී. රාසයියා මහතාත් විසින් ලංකාව නියෝජනය කරනු ලැබිය.

ලංකාව සහභාගි වූ ජාත්‍යන්තර සම්මේලන වාර ගණන හතකි. මෙම සංඛ්‍යාවට මොස්කව්හි පැවැත්වූ පිළිකා රෝග පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනයේ දී 8 වැනි රැස්වීම් වාරයත් ලෝක සෞඛ්‍ය සංවිධානයේ අනුග්‍රහයෙන් හයිද්‍රබාද්හි පැවැත්වූ අග්නිදිග ආසියාතික පෝෂණ කමිටුවේ 5 වැනි රැස්වීමේ වාරයත් ඇතුළු විය.

සුභ සාධනය

නොයෙක් ආයතනවලට අයත් සුභසාධක කමිටු රාශියකින් මෙහෙයවනු ලබන දෙපාර්තමේන්තුවේ සුභසාධක සංවිධානය වඩාත් සීර පදනමකට පත් කරන ලදි.

රජය මගින් රුපියල් 40,000ක් වෙන්කර දීම නිසා නිලධාරීන්ට වැඩි පහසුකම් සපයා දෙන ලද අතර නව ඒකකයන් සඳහා අවශ්‍ය සියලු උපකරණ හා බඩු බාහිරාදිය සපයන ලදි. ඒ අතර සමිති 50කට අවශ්‍ය සියලුම දේ සැපයිණ.

කාසල් වීදියේ පිහිටි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් ක්‍රීඩා සමාජයත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සකසුරුවම් හා සුභසාධක සමිතියත් නිසා සාමාජිකයන්ට ප්‍රයෝජන ලැබිණ. මින් පළමු වැන්නෙන් නා නා විධ විනෝද ක්‍රීඩා පහසු කම් රාශියක් සැලසුන අතර දෙවැන්නෙන් සාමාජිකයන්ගේ සකසුරුකම් දියුණු කිරීමත් ආපදාවල දී පිහිටවීමත් කෙරිණ.

අභ්‍යාස ක්‍රම

නොයෙක් වර්ගවලට අයත් නිලධාරීන් පුහුණු කිරීමේ කටයුතු වඩා පුළුල්වූත් අංග සම්පූර්ණවූත් අන්දමින් පවත්වා ගෙන යන ලදි.

දෙපාර්තමේන්තුවේ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ යෝජනා ක්‍රමය යටතේ විවිධ විශේෂඥතාවයන් සඳහා පිටරට පුහුණුව ලබා දීම සඳහා වෛද්‍ය නිලධාරීන් 16 දෙනෙක් ද පශ්චාත් උපාධි යෝජනා ක්‍රමය යටතේ විශේෂඥ පුහුණුව ලබා දීම සඳහා නිලධාරීන් 11 දෙනෙක් ද තෝරා ගනු ලැබූහ.

හෙදි අභ්‍යාස විද්‍යාලයවල පුහුණුව සඳහා නව ශිෂ්‍යාවන් 446 දෙනෙක් බඳවා ගනු ලැබූ අතර පුහුණුව ලත් හෙදියන් 356 දෙනෙක් නා නා ආයතනවලට පත් කර යවන ලදහ. මෙම කාලසීමාව තුළ දීම පුහුණුව සඳහා ආධාර හෙද ශිෂ්‍යාවන් 435 දෙනෙක් ද බඳවා ගන්නා ලදහ.

පුහුණුව සඳහා බඳවා ගන්නා ලද සෙසු අය අතර ඇපෝතිකරි ශිෂ්‍ය ශිෂ්‍යාවන් 64 දෙනෙක් ද, හෙසජ්ජක ශිෂ්‍ය ශිෂ්‍යාවන් 24 දෙනෙක් ද, වෛද්‍ය රස.යනාගාර කාර්මික ශිෂ්‍ය ශිෂ්‍යාවන් 24 දෙනෙක් ද මහජන සෞඛ්‍ය ආධුනිකයන් 40 දෙනෙක් ද ආධුනික රශ්මි ශිල්පින් 5 දෙනෙක් හා කායික වෛද්‍ය ශිෂ්‍ය ශිෂ්‍යාවන් 20ක් ද වූහ.

පුවත් පත්

මීට කලින් පළ කරන ලද පාලන වාර්තා කිපයෙක සඳහන් කළ පරිදි සඳෙස්වූත් නොමහ යවන සුළුවූත් ප්‍රවෘත්ති ප්ළ කිරීම දිනපතා පළවෙන පුවත් පත් මගින් දිගටම කරගෙන යන ලදි. මහජනයාට නිවැරදි අවබෝධයක් ලබා දීම සඳහා විවිධ ඉද්ධීන් පිළිබඳ නියම තොරතුරු පළ කිරීම පුවත් පත් කලාවෙන් මුළු ලොවම අපෙක්ෂා කරන මූලික අවශ්‍යතාවයකි. මෙම අත්‍යවශ්‍යතාවය ඉටු නොවන මහක පිහිටා කටයුතු කිරීම ගර්හා කටයුතු අයුක්ති සහගත දෙයකි.

ස්තුතිය

මෙම වාර්තාව මධ්‍යම පරිපාලනයට අයත් නිලධාරීන් සංඛ්‍යාවකගේ උත්සාහයන් ගොනු කිරීමකි. ඇත්ත වශයෙන්, සවකිය අංශ පිළිබඳ වාර්තා සැකසීම සම්බන්ධ තම වගකීම නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් සතු ය. කෙසේ හෝ වේවා අවාසනාවකට මෙන් වෛද්‍ය සේවා අංශය පිළිබඳ වාර්තාව පිළියෙල කිරීම සැලකිය යුතු ප්‍රමාණයකින් ප්‍රමාදවිය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් අවසාන වාර්තාව පිළියෙල කිරීම තෙමසකටත් වඩා ප්‍රමාද වී ඇත.

මෙම වාර්තාව පිළියෙල කිරීමේ දී වෙහෙසී කටයුතු කළ සියලුම නිලධාරීන්ට මගේ හෘදයාංගම ස්තුතිය පිරිනමන අතර ඔවුන්ගෙන් ලැබුණු සහාය කෘතඥ පූර්වකව අගය කරනු කැමැත්තෙමි.

ඩී. අ. කරුණාරත්න,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

1963 ජූනි මස 14 වන දා,
කොළඹ, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
කාර්යාලයේ දී ය.

I වැනි පරිවෙජදය

ජීවිත සංඛ්‍යා ලේඛන

යම්කිසි වකවානුවක දී ජාතියට සෞඛ්‍ය තත්ත්වය මැනගැනීමට උපත් හා මරණ පිළිබඳ තොරතුරු මහෝපකාරීවන්නේ ය. නානා සෞඛ්‍ය අංශ ලබා ඇති තත්ත්වය මැනීමේ මිනුම් දණ්ඩක් වශයෙන් මාතෘ මරණ ප්‍රමාණය සහ බිළිදු මරණ ප්‍රමාණය උපකාරීවේ.

1961-62 වර්ෂය සඳහා වාර්තාව පිළියෙළ කරන අවස්ථාවේ දී රෙජිස්ට්‍රාර් ජනරාල් ගෙන් ලැබුණු සංඛ්‍යා 1961 ලිත් වර්ෂයට අදාල වේ. පහත දක්වා ඇති අදහස් 1961 වර්ෂය සඳහා වේ :—

(අ) **ජනගහනය.**—98,96,000ක මධ්‍ය වාර්ෂික ජනගහණයක් තිබූ 1960 වර්ෂයට වඩා සියයට 2.7කින් වැඩිවූ මෙම වර්ෂයේ මධ්‍ය වාර්ෂික ජනගහනය 10,168,000ක් බැව් ගණන් බලා තිබුණි.

(ආ) **උපත්.**—2,63,377ක් ලියා පදිංචි කර ඇති අතර උත්පත්ති ප්‍රමාණය සිශ්‍ර යෙන් අඩුවී ඇත. මේවනතුරු වැඩිම ප්‍රමාණයක් වූ 1959 වර්ෂයේ 38.2 සිට 1960 වර්ෂයේ දී 36.6 දක්වා ද 1961 වර්ෂයේ දී 35.8 දක්වා ද අඩුවීමෙන් 1958 වර්ෂයේ දී තිබූ ප්‍රමාණයට ම ආසන්නවිය.

(ඇ) **මරණ.**—ගණන් තබා ඇති මරණ සංඛ්‍යාව 81,653කි. 1960 වර්ෂයේ දී සිදුවූ 8.6 1960 වෂීයේදී 8.0 දක්වා අඩුවිය. මෙය මේතාක් වූ අඩුම ප්‍රමාණය වේ. 1946 සිට 1961 දක්වා සිදුවූ උපත් සහ මරණ සංඛ්‍යාව 1 වැනි සටහනින් පෙන්වා ඇති අතර 1 වැනි ඉරි ඇඳි පතෙන් සවිස්තරව දක්වා ඇත.

(ඈ) **බිළිදු මරණ.**—වාර්තා කර ඇති බිළිදු මරණ සංඛ්‍යාව 18,941කි. 1959 වර්ෂයේ සජීව උපත් 1,000ට සිදුවූ බිළිදු මරණ 57, 1961 වෂීයේ දී සජීව උපත් 1,000ට 52 දක්වා අඩුවිය. දියුණු රටවල් ලෙස සැලකිය හැකි ස්විඩනයේ 1931-35 දක්වා කාලය තුළත් එංගලන්තය සහ වේල්ස්, කැනඩාව සහ නෙදර්ලන්තය යනාදි රටවල 1941-45 දක්වා කාලය තුළත් සිදුවූ ප්‍රමාණ යට මෙකී සංඛ්‍යාව සමාන වන්නේ ය. ලක්දිව බිළිදු මරණ ප්‍රමාණය අනිකුත් රටවල් සමග සසඳා දක්වමින් II වැනි සටහනින් පෙන්වා ඇත.

(ඉ) මාතෘ මරණ.—සජීව උපත්, 1,000 ට මාතෘ මරණ 2.6 ක් වන ලෙස මේ වර්ෂයේ දී මාතෘ මරණ 949 ක් සිදුවිය. එය මෙතෙක් වාර්තාවී ඇති අඩුම සංඛ්‍යාව වේ. මාතෘ මරණ ප්‍රමාණය සහ බිළිදු මරණ ප්‍රමාණය රේඛා ආධාරයෙන් 2 වැනි ප්‍රස්තාර සටහනේ දක්වා ඇත.

ප්‍රාදේශිය සංඛ්‍යාව

ජාතියක සෞඛ්‍ය තත්ත්වයේ දියුණුව මැනගැනීමට මරණ ප්‍රමාණය මෙන්ම අනුපාතික මරණ ප්‍රමාණය ද උපයෝගි කරගනු ලැබේ. මරණ ප්‍රමාණය 42.5 ලෙස දක්වමින් වයස 50 සහ ඊට වැඩි වයස්වල මරණ 34,672ක් 1961 වර්ෂයේ දී සිදුවූ බැව් පෙනේ. වයස 50 සහ ඊට වැඩි වයස් මරණ ප්‍රමාණය III වැනි සටහනෙහි දක්වා ඇත. 1952 වර්ෂයේ 31. 1. ක්වූ මරණ ප්‍රමාණය 1961 වර්ෂය වන විට සිශ්‍ර යෙන් 42. 5 දක්වා වැඩිවී ගියේ ය. මෙයින් පෙනී යන්නේ වයස 50ට අඩු මරණ ප්‍රමාණය සියයට 11.4 කින් අඩුවී ඇති බවයි.

ලංකාවේ පුවත්පත් මගින් දක්වා ඇති දොෂාරෝපනාත්මක විවේචන සම්පූර්ණ යෙන්ම අසත්‍ය බවත් යුක්ති සහගත නොවන බවත් ලංකා ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය 1961 වර්ෂයේ දී ඕශ්‍රයෙන් දියුණුවූ බවත් ඉහත දැක්වෙන උපත් හා මරණ ප්‍රමාණයන් සුපරීක්ෂාකාරීව බලන කළ මොනවට පැහැදිලි වනවා ඇත.

II වැනි පරිවෙජ්දය

වෛද්‍යරක්ෂාව

(අ) නේවාසික රෝගීන්

1. සාමාන්‍ය :

රජයේ රෝහල්වල ප්‍රතිකාර කරනු ලැබූ නේවාසික රෝගීන්ගේ සංඛ්‍යාව තව දුරට තර විය. මේ වර්ෂය, තුළ දී නේවාසික රෝගීන් 16,60,939ක් ප්‍රතිකාර කරනු ලැබූහ. පසුගිය ලිත් වසර තුළ දී ප්‍රතිකාර ලැබූ රෝගීන්ගේ සංඛ්‍යාව 14,35,605කි. IV වැනි සටහන බලන්න.

VI වැනි සටහනින් කොට්ඨාශ හා ආයතන වර්ග අනුව ප්‍රතිකාර කළ රෝගීන් හා ලේඛන ගත වී ඇති මරණ සංඛ්‍යාව බෙදී ඇති අයුරු දැක්වෙන අතර VII වැනි සටහනින් දැක්වෙනුයේ ප්‍රදේශයන් හා දිස්ත්‍රික්ක අනුව එම රෝගීන් හා මරණ සංඛ්‍යාව බෙදී ඇති අයුරුය.

රෝගීන්ගේ ඉහළම සංඛ්‍යාව වන 1,89,414 කොළඹ කොට්ඨාශයේ ප්‍රතිකාර කරනු ලැබූ අතර, පහළම සංඛ්‍යාව වන 29,018 ලේඛනගත වී ඇත්තේ වවුනියා කොට්ඨාශයේ ය.

කොළඹ මණ්ඩලීය රෝහල්වල ප්‍රතිකාර කරනු ලැබූ නේවාසික රෝගීන්ගේ සංඛ්‍යාව 1,73,736 කි. මෙයින් හතරෙන් එක් කොටසකට වැඩි සංඛ්‍යාව වන 44,463 ද සොයිසා කාන්තා රෝහලට හා කාසල් වීදියේ කාන්තා රෝහලට ඇතුළත් කරනු ලැබිය. කොළඹ රෝහල් මංඩලයේ ලේඛනගත වී ඇති මරණ ගණන 5,154කි.

මානසික රෝහලේ සිටි රෝගීන්ගේ සංඛ්‍යාව 12,542ක් වූ අතර බෝවෙන රෝග රෝහලේ සිටි මුළු ගණන, 5,695 කි. ළය රෝහල්වල සිටි සංඛ්‍යාව 7,092 වූ අතර පිළිකා රෝහලේ සිටි සංඛ්‍යාව, 2,968කි. ළමා රෝහලේ අභ්‍යන්තර ප්‍රතිකාර ලබා ගැනීම් තව දුරටත් වැඩි වන්නට විය.

2. රෝහල් :

වෛද්‍ය ආයතන 781 ක් තිබිණි. මෙයින් 266ක් මධ්‍යම බෙහෙත් ශාලාවූ අතර 118ක් මාතෘ රෝහල් විය. කොළඹ රෝහල් මංඩලය ඇතුළත් ප්‍රාදේශීය ගණයට අයත් රෝහල් 11ක් ද, මූලික රෝහල් 12ක් ද, දිස්ත්‍රික්ක රෝහල් 90ක් ද විය. මෙම ආයතනවල ගණන, වර්ගය හා ඒවා පිහිටි ස්ථාන X වැනි සටහනින් දැක්වේ.

3. ඇඳන් සංඛ්‍යාව හා ජනගහන අනුපාතය

වර්ෂය තුළ දී තිබූ ඇඳන්වල මුළු ගණන 32,813කි. වර්ග කරනු ලැබූ රෝහල් හා සෞඛ්‍ය සේවා අධිකාරින්ගේ කොට්ඨාශ අනුව මෙම ඇඳන් බෙදී ඇති පිළිවෙල පිළිබඳ ව විස්තරාත්මක වර්ග කිරීම XI වැනි සටහනින් දැක්වේ. ජනගහනය අනුව ඇති ඇඳන් ප්‍රමාණය නොවෙනස්ව පවතී. ඇඳන් ප්‍රමාණය වැඩිවීම වැඩිවන ජනගහණයෙන් හිලව්වේ. සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කොට්ඨාශ අනුව ජන ගහණයෙන් එක් එක් 1,000ට සැපයිය හැකි ඇඳන් ප්‍රමාණය XII වැනි සටහනින් දැක්වේ. මෙම අනුපාතය ඉහළින් ම ඇති වූයේ කොළඹ රෝහල් මංඩලයේ හා කොළඹ කොට්ඨාශයේ ය. මෙහි 1000ක ජනගහණයට ඇඳන් 5.6ක් තිබිණි. අඩුම අනුපාතය ඇති වූයේ කෑගල්ල කොට්ඨාශයේ ය. මෙහි 1000ක ජනගහණයකට ඇඳන් 1.7ක් තිබිණි.

4. රෝහල්වල නදබදවීම :

ඒ ඒ වෛද්‍ය ආයතනවල නදබද වීමේ තත්ත්වය XIII, XIV, XV වැනි සටහන් වලින් දැක්වේ.

තදබද වීම පිළිබඳ සියයට ගණන විදහාපාන තීරුවල සියයට වැඩියෙන් දැක්වෙන සංඛ්‍යාව තදබදවීමේ ප්‍රමාණය දක්වන අතර සියයට පහළ සංඛ්‍යා පාවිච්චි කළ ඇඳන් ප්‍රමාණය දක්වයි.

පසුගිය ලිත් වසරේ තද බදවීම පිළිබඳ 208ක අනුපාතකයක් පෙන්වූ ඇස් රෝහල 84ක අනුපාතය දක්වා පහළ බැස ඇත. ප්‍රාදේශීය වර්ගයේ රෝහල්වල අනුපාතය 128 සිට 121 දක්වා ද මූලික රෝහල්වල 126 සිට 117 දක්වා ද බැස තිබේ. කුඩා හා ලොකු දිස්ත්‍රික්ක රෝහල්වල සංඛ්‍යාවන්ගේ වෙනස්වීමක් නැත.

5. පෞද්ගලික අංශය

පෞද්ගලික වෛද්‍ය ආයතනවල ඇඳන් 4,389ක් තිබිණි. එබැවින් මෙම රටේ වෛද්‍ය ප්‍රතිකාරය සඳහා සැපයීමට තිබූ මුළු ඇඳන් ගණන 37,202කි. මෙයින් 32,813ක් ම සපයා ඇත්තේ රජයේ ආයතනවල ය.

පෞද්ගලික වෛද්‍ය ආයතනවල ඇඳන් ප්‍රමාණය පිළිබඳ විස්තරාත්මක තොරතුරු VI වැනි සටහනෙහි දක්වේ.

(ආ) විශේෂඥතා සේවා

ප්‍රාදේශීය වර්ගයේ රෝහල්වල සියළුම ඉහළ විශේෂඥතාවයන් දියුණු කිරීමේ හා මූලික රෝහල්වල හා සමහර විශාල දිස්ත්‍රික් රෝහල්වල මූලික විශේෂඥතාවන් දියුණු කිරීමේ ප්‍රතිපත්තිය තවදුරටත් අනුගමනය කරන ලදි. වර්ෂය තුළ දී නිලධාරීන් 14 දෙනෙක් විශේෂඥතා සුදුසුකම් අත්කර ගෙන පෙරළා දිවයිනට පැමිණියහ. පස් අවුරුදු ක්‍රමයේ විධි විධාන සීමාවලට අනුකූලව සුදුසුකම් ලබා පෙරළා පැමිණි විශේෂඥයිනට ආධාර පහසුකම් සැලකිය යුතු ප්‍රමාණයක් සැලැස්වීම තවදුරටත් කරන ලදි.

එතෙර සිට පෙරළා පැමිණි නිලධාරීන් 14 දෙනාට වැඩි මනත් වශයෙන් නිලධාරීන් 5 දෙනෙක් දෙපාර්තමේන්තුව මගින් යළි සේවයට බඳවා ගත් විශේෂඥයින් වූහ. මේ අයගෙන් 3 දෙනෙක් වෛද්‍ය විද්‍යාඥයින් වූ අතර දෙදෙනෙක් ශල්‍ය වෛද්‍ය වරුන් වූහ.

ඉකුත් වර්ෂය ඇතුළත නිලධාරීන් 15 දෙනෙක් තවදුරටත් සුදුසුකම් අත්කර ගැනීම් වස් එතෙර ගියහ. XVIII වැනි සටහන බලන්න.

2. වෙනත් විශේෂඥයෝ

නුවර හා බදුල්ලේ අළුතින් විකලාංග අංශයන් පිහිටුවන ලදි. දෙවැනි ඇස් අංශයක් නුවර විවෘත කරනු ලැබූ අතර අනුරාධපුරයේ හා මඩකලපුවේ කන් නසා උගුරු අංශයන් එක බැගින් පිහිටුවන ලදි.

3. රසායනාගාර සේවය

කොළඹ රෝහල් මණ්ඩලයේ ද සියළුම ප්‍රාදේශීය රෝහල්වල ද විශේෂඥතා ව්‍යාපාරයන්ගි හා මූලික හා දිස්ත්‍රික්ක රෝහල් බොහොමයක ද පිහිටුවනු ලැබූ රසායනාගාරවල වැඩ පිළිබඳ ව මෙහෙයවන ලද පරීක්ෂණවල ගණන හා වර්ගය XIX වැනි සටහනින් දැක්වේ.

4. වෙනත් සේවාවන්

ඉකුත් වර්ෂය අවසානයේ දී වෛද්‍යවරුන් ගේ සේවක සංඛ්‍යාව 1,311ක් විය.

(ඇ) බාහිර රෝගී සේවාවන්

රෝහල්වල මෙහෙයවන ලද චිකිත්සාගාරවල පැමිණීමේ සංඛ්‍යාව 29,33,577ට නැඟුනි. එහෙත් කොළඹ රෝහල් මණ්ඩලයේ චිකිත්සාගාරවල රෝගීන්ගේ පැමිණීමේ සංඛ්‍යාව 8,46,507 කි. ගිය වසරේ ලේඛන ගතවී ඇති සංඛ්‍යාවට වඩා මෙය ඉතාම අඩුවිය. මෙයට හේතු වශයෙන් රටේ අනෙක් රෝහල්වල පහසුකම් දියුණු කිරීම හා විශේෂඥතාවයන් වර්ධනය කිරීම ගෙන හැර පෑ හැකිය. මේ පිළිබඳ විස්තර XX වැනි සටහනේ දී ඇත.

මේ අතරතුර, වෛද්‍ය ප්‍රතිකාරය සඳහා රජයේ වෛද්‍ය ආයතනවලට ලෙඛුන්ගේ පැමිණීමේ මුළු ගණන 3,26,20,461කි. වතු කම්කරුවන්ගේ පැමිණීම් ද මෙයට ඇතුලත්ය. පළමු වරට පැමිණීමේ හා පලාත් අනුව පැමිණීම්වල මුළු ගණන XXI වැනි සටහනෙන් දැක්වේ.

III වැනි පරිවෙජදය

වෛද්‍යමයදේ සැපයීම

(අ) රජයේ ඖෂධ ගබඩාව

ඉඩකඩ

අවසාන වරට පදිංචිව සිටි කරදාසි සංයුක්ත මණ්ඩලය, වැවසියර් ගොඩනැගිලිවලින් විශාල කොටසකින් අස්ව යාමෙන් පසු දකුණු කොළඹ රෝහලේ ගබඩාකර තිබුණු ඖෂධ වර්ග එම ගොඩනැගිලිවලට ගෙනයන ලදි. එහෙත් රජයේ ඖෂධ ගබඩාවේ කොටස් නා නා තැන්වල පිහිටුවීමට සිදුවීම නිසා එහි පරිපාලනය සාර්ථකව පවත්වා ගැනීමේ කාර්යය දුෂ්කර වී ඇතිවා පමණක් නොව නා නා අංශ පාලනය නිසි අයුරින් කිරීම ද දුෂ්කර වී ඇත. නව රජයේ ඖෂධ ගබඩාවක් වැලිසර පිහිටුවීමට විධි විධාන යොදා ඇත. මේ සඳහා අක්කර හයක භූමි භාගයක් වෙන්කර ඇති අතර ඒ සඳහා සියලුම ගොඩනැගිලි එහි ඉදිකිරීමෙන් පසු මුළු ඖෂධ ගබඩාවම එකම භූමියක පිහිටුවනු ඇත. මේ යෝජනා ක්‍රමය සඳහා අවශ්‍ය සැලැස්ම රජයේ වැඩ දෙපාර්තමේන්තුව මගින් පිළියෙල කරගෙන යනු ලැබේ.

කරන ලද වැඩ

එක් ආයතනයකට වර්ෂයක් සඳහා සැහෙන පරිදි පිළියෙල කළ ඇස්තමේන්තු අනුව ඖෂධ ඉල්ලුම් කිරීම් හා බෙදාහැරීමේ ක්‍රමය තවදුරටත් පවත්වා ගෙන යන ලදි. එක් එක් ආයතනය සඳහා හෝ ප්‍රදේශය සඳහා අවශ්‍ය නිවැරදි ඖෂධ ප්‍රමාණය නිශ්චය කිරීමේ දී ආයතන මගින් හෝ ප්‍රාදේශිය කාර්යාල මගින් හෝ සැහෙන පමණ පරීක්ෂාකාරී නොවන බැව් පෙනේ. මේ නිසා සකස් කරන ලද ඖෂධ ඇස්තමේන්තු අඩු වීමේ හෝ අධික වීමේ හෝ ප්‍රතිඵලයක් වශයෙන් ඇතැම් ආයතනයක ඖෂධ හිඟවීම හෝ ඇතැම් ආයතනයක ඖෂධ වැඩිවීම හෝ සිදුවේ.

ඖෂධ සංග්‍රහ කමිටුව සෑම දෙසතියකට වරක් රැස්වීමෙන් ඖෂධ සංග්‍රහයට ඇතුළත් නොවූ ඖෂධ සමහරක් ඊට ඇතුළු කිරීම සඳහා සොයා බැලීය. අස්කරන ලද ඖෂධ වර්ග හා එකතු කරන ලද ඖෂධ වර්ග ඇතුළත් නව ඖෂධ සංග්‍රහය ප්‍රසිද්ධ කිරීමට සූදානම් කෙරෙමින් පවතී. මෑතක දී සිට ඇති කරන ලද ආනයනය පාලනය සීමා කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඖෂධ සංග්‍රහ කමිටුවේ කාර්ය භාරය අධික විය.

අත්‍යවශ්‍ය නිශ්පාදන වශයෙන් ආනයන පාලන අධිකාරින්ට උපදෙස් දීම සඳහා ඖෂධ වර්ග හා බලපත්‍රයකින් ආරක්ෂිත ඖෂධ වර්ග සිය ගණනක් පිළිබඳ ව සමාලෝචනය කිරීමට ඖෂධ සංග්‍රහ කමිටුවට සිදු විය. තවද මෙම කමිටුව මගින් "තත්ත්ව සම්මත රසායනාගාරයක්" පිහිටුවීම ගැන ද පරීක්ෂා කරගෙන යනු ලැබේ.

ගිනුම්

1960 සැප්තැම්බර් මස හා 1961 සැප්තැම්බර් මස දී කරන ලද වාර්ෂික හරි වැරදි බැලීම්වල දී පිළිඹිබු වූ ගිණුම් තත්ත්වය මෙසේ ය:—

වර්ෂය		බදු නොගවල වටිනාකම			ගිගවූ බදුවල වටිනාකම			අධික බදුවල වටිනාකම	
		රු.	ශ.		රු.	ශ.		රු.	ශ.
1959/60	...	1,21,97,956	54	...	1,25,476	7	...	3,84,256	10
1960/61	...	1,10,22,438	38	...	1,94,810	8	...	4,76,217	97

1961-62 වර්ෂය තුළ දී සිදු වී ඇති අධිකවීම් ගැන විමර්ශනය කරගෙන යනු ලැබේ.

1960-61 වර්ෂය තුළ දී පරීක්ෂණ සෝදිසි 105ක් පවත්වන ලදි.

නිලධාරි මණ්ඩලය

අධිකාරි තැන්පත් ඩී. ඒ. ඒ. මුණසිංහ මහතා ලෝක සෞඛ්‍ය සංවිධානයේ හා කොළඹ ක්‍රමය මගින් ප්‍රදානය කරන ලද ශිෂ්‍යත්වයක් යටතේ 1961 ඔක්තෝබර් මස 16 වැනිදා එක්සත් රාජධානිය වෙත ගොස් 1962 අප්‍රේල් මස 30 වැනිදා පෙරලා පැමිණියේ ය. මේ කාලය තුළ දී ඇස්. ආරුමුගම් මහතා අධිකාරි තනතුරේ වැඩ බැලීය. ඉන්ඩෙන්ට් නිලධාරියාගේ තනතුර තවමත් හිස්ව පවතී.

(ආ) නව ආයතනවලට උපකරණ සැපයීම

ඇස්තමේන්තුවලින් සමාලෝචනයට භාජනව ඇති මුදල් වර්ෂයට අදාළ වූ නව වෛද්‍ය ආයතනවලට උපකරණ සැපයීම සඳහා කෙරෙන විය හියදම් වශයෙන් රුපියල් 15,00,000ක් වෙන් කරන ලදී. ඊ ළඟ වර්ෂවල දී ගෙවීමට සිදුවන බැරකම් සඳහා තවත් රුපියල් 10,00,000 ක් ද වෙන් කරන ලදි. ඇස්තමේන්තුවලින් වෙන්කර දෙන ලද මුළු මුදල සඳහා අවශ්‍ය නා නා උපකරණ රජයේ බඩු ගබඩාවෙන් කම්හල් ඉන්ජිනේරුවරයාගෙන් හා රාජ්‍ය නියෝජිතයන්ගෙන් ඇණවුම් කළ නමුදු වර්ෂය තුළ දී වැය වූයේ රුපියල් 12,75,000කි. 1960/61 වර්ෂ වල දී මේ සඳහා රුපියල් 11,81,000ක් වැය කරන ලදි. කරන ලද වියදම් අඩුවීමට හේතු වූයේ ඉල්ලා යවන ලද උපකරණ ඇතැම් ආයතන මගින් වර්ෂය තුළ දී නොසැපයීමේ හේතුවෙනි.

(ඉ) ආයතනවලට විශේෂ උපකරණ සැපයීම

විශේෂ උපකරණ සඳහා ඇස්තමේන්තුවලින් වෙන් කර දෙන ලද මුළු මුදල වන රුපියල් 3,00,000 දැනට ඇති ඇක්ස්රේ හා වෙනත් ප්‍රතිකාරමය උපකරණ වැනි විශේෂ උපකරණවලට අමතර කොටස් මිලදී ගැනීම සඳහා වෙන් කර තබන ලදි. මෙසේ කරන ලද්දේ මෙම උප ශීර්ෂය යටතේ මුදල් හිඟ බැවින් අළුතින් උපකරණ මිල දී ගන්නවාට වඩා දැනට තිබෙන උපකරණ යථා ක්‍රියාකාරී තත්ත්වයෙන් පවත්වා ගැනීම නුවණට හුරු බැවිනි. දැනට ඇති ආයතන සඳහා වහා අවශ්‍ය විශේෂ උපකරණ සඳහා රුපියල් 7,50,000ක මුදලක් භාණ්ඩාගාරය ලවා ආරෝග්‍යශාලා ලොතරැයි අරමුදලින් වෙන් කරවා ගන්නා ලදි. මෙම මුදල් වෙන් කිරීම යටතේ නොයෙක් වර්ගවලට අයත් වෛද්‍ය ආයතන සඳහා අවශ්‍ය ඇඳන් 1,375ක් මිලයට ගන්නා ලදි. මෙම ඇඳන් තැබීමට අවශ්‍ය ඉඩ ප්‍රමාණය සොයා ගනු ලැබුයේ ඇඳන් දෙකක් අතර අඩි 7ක් වූ දුර ප්‍රමාණය අඩි 5 දක්වා අඩු කිරීමෙනි.

ඇක්ස්රේ උපකරණ, ශීතකර ටැංකි, අධිපිඩන ජීවානු හරණයන් හා ශීතකරයන් යකඩ පෙණහලු, දන්ත පුටු, ශල්‍යාගාර මේස හා විදුලිමය දන්ත ඒකකයන් ඇතුළු විද්‍යුත් වෛද්‍යමය උපකරණ මනා තත්ත්වයෙන් පවත්වා ගැනීමත් ප්‍රතිසංස්කරණය කිරීමත් විද්‍යුත් වෛද්‍ය ඉංජිනේරු අංශය මගින් කරගෙන යන ලදි. මීට අමතර වශයෙන් දූනට ඇති විශේෂ උපකරණ සඳහා අවශ්‍ය අමතර කොටස්, දෙපාර්තමේන්තුවට මෙම උප ශීර්ෂය යටතේ වෙන්කර දී ඇති මුදලට සීමාවන පරිදි ප්‍රධාන කාර්යාලයේ අවසරය ඇතුව, මිල දී ගැනීමේ වගකීම ද පවරා දෙන ලදි.

අමතර කොටස් මිල දී ගැනීම සඳහා රුපියල් 2,10,000 වැය කරන ලදි. වියදම අඩු වී තිබෙන්නේ දෙපාර්තමේන්තුව විසින් ඇනවුම් කරන ලද අමතර කොටස් සැපයීමට රාජ්‍ය නියෝජිතයින් අසමත් වීම නිසා ය.

1961/62 වර්ෂය තුළ දී විද්‍යුත් වෛද්‍ය ඉංජිනේරු අංශය මගින් උපකරණ ක්‍රියා විරහිත වීම් 2,569ක් සම්බන්ධයෙන් ක්‍රියා කර ඇත. මේවායින් 877ක් පිට පළාත් වලින් පැමිණි කැඳවීම් ය. මේ අංශය සඳහා මිලයට ගනු ලැබූ රථ තුන පිටපළාත්වල ඇති උපකරණ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා යොදවන ලදි. මෙම වැඩ පළේ ඇති උපකරණ සියල්ලම නිපදවීම්, වැල්ඩිං කිරීම, තින්ත ඉසීම හා අනෙකුත් කාර්මික වැඩ සඳහා යොදවා ඇත. සේවක මණ්ඩලය ප්‍රමාණවත් වූ විට දෙපාර්තමේන්තුවට අයත් විද්‍යුත් වෛද්‍ය උපකරණ සියල්ලම මනා ක්‍රියා කාරිත්වයෙන් පවත්වා ගැනීම මෙම අංශය විසින් බාර ගනු ඇත.

අළුත් ඇක්ස්රේ උපකරණයක් මෙම අංශයේ සේවක මණ්ඩලය මගින් සවිකරණ ලදි. අළුත් අධි පිඩන ජීවානුහරණයන් කුරුණෑගල හා මහනුවර යන ප්‍රාදේශීය රෝහල්වල හා කොළඹ නව ඇස් රෝහලේ ද සවිකරන ලදි.

IV වැනි පරිවෙජදය

ජන සෞඛ්‍ය සේවා

අ—මාතෘ හා ළමා සෞඛ්‍යය

1. හැටලුව

(අ) මාතෘ හා ළමා සෞඛ්‍ය කටයුතු ප්‍රතිසංවිධානය අධ්‍යයනය කළ විශේෂ කමිටුව විසින් සිය වාර්තාව ඉදිරිපත් කරන ලදි. මාතෘ හා ළමා සෞඛ්‍ය කටයුතු පෘථුල කිරීම සඳහා පූර්ණ කාලීන වෛද්‍ය නිලධාරියකු පත් කිරීම එහි වූ ප්‍රධාන නිර්දේශවලින් එකකි. මාතෘ හා ළමා සෞඛ්‍ය උපදේශක කමිටුව මගින් කරන ලද වැදගත් නිර්දේශ යන් ගෙන් සමහරක් මෙහි පහත පළවේ :—

1. මහජන සෞඛ්‍යය පිළිබඳ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා යටතේ මාතෘ හා ළමා සෞඛ්‍ය කටයුතු භාරව ප්‍රධාන කාර්යාලයේ සේවය කරන විශේෂ නිලධාරියකු සිටිය යුතු ය.

   ළමා චිකිත්සා පිළිබඳ පළපුරුද්දක් ඇති පූර්ණ කාලීන ප්‍රධාන සහායකයකු පත් කළ යුතු ය.

2. ළමා සුභ සාධක චිකිත්සාගාර භාරව කටයුතු කරන ඇපෝතිකරිවරයකුට යටත් පිරිසෙසින්, ළමා චිකිත්සා වාට්ටුවක දෙමසක පුහුණුවක් තිබිය යුතු ය.

3. ප්‍රධාන පාලන අංශයට සහාය වීම සඳහා මාතෘ හා ළමා සුභ සාධක උපදේශක කමිටුවක් පත් කළ යුතු ය.

4. මාතෘ හා ළමා සෞඛ්‍ය කටයුතු ඩී. සී. එච්. හෝ ඇම්. සී. එච්. උපාධි දරන්නන් විසින් සහ ඇම්. ආර්. සී. පී. හෝ ඊට සමාන උපාධි ධාරීන් විසින් කළ යුතු ය.

5. මහජන සෞඛ්‍ය හෙදියෝ

ජනගහනය පදනම් කරගත් විට මහජන සෞඛ්‍ය හෙදියන් 1,000ක් සිටිය යුතු ය. ඒ ජනගහනයෙන් 8,000 කට 1 හෙදියක් වශයෙනි. අවුරුදු 3 ක පළපුරුද්දක් ඇති මින්නඹු සේවිකාවන්ට දෙවසක මහජන සෞඛ්‍ය හෙදි පුහුණුවක් දිය යුතු ය. ඔවුන් විසින් අඩුම වාර්තා සංඛ්‍යාවක් තබාගත යුතු ය. ඔවුන් විසින් උණසන්නිපාතය, ගලපටලය, කක්කල් කැස්ස, පිටගැස්ම, පෝලියෝව, ක්ෂය රෝගය හා වසූරිය යන රෝග නිවාරක එන්නත් දිය යුතු ය.

6. මින්නඹු සේවිකාවෝ

(අ) වාර්තා ප්‍රතිශෝධනය කළ යුතු ය.

(ආ) සෑම විෂයයක් සඳහාම සංස්කරණ පාඨමාර්ග පැවැත්විය යුතු ය.

(ඇ) ක්ෂේත්‍ර පුහුණුව කෙරෙන කාලයේ දී ඔවුන්ට වර්ෂයක පුහුණුවක් දිය යුතු ය.

(ඈ) මින්නඹු සේවිකාවන්ගේ කැඳවීම් සඳහා වහා යා හැකි වෛද්‍ය සේවාවන් ප්‍රාදේශිය රෝහල්වල තිබිය යුතු ය.

(ඉ) රුධිර පීඩනය ස්පර්ශ කිරීමේ ක්‍රමයෙන් පරීක්ෂා කර සුදුසු පරිදි ක්‍රියා කළ යුතු ය.

(ඊ) හදිසි අවස්ථාවල දී ජීවිතාරක්ෂක ක්‍රියා මාර්ගයක් වශයෙන් ඔවුන් විසින් හා මහජන සෞඛ්‍ය හෙදියන් අත්තෑපේශිය නික්ඡේපණයන් දිය යුතු ය.

7. පරිපාලන මින්නඹු සේවිකාවන්ගේ වැටුප් මින්නඹු සේවිකාවන්ගේ වැටුපට වැඩි විය යුතු ය.

8. වෛද්‍ය හා හෙද ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සෞඛ්‍ය අධ්‍යාපනය පිළිබඳ දැනුමක් ඔවුන් පුහුණුව ලබන කාලයේ දී දිය යුතු ය.

9. මුදල් තිබේ නම්, ගෘහාධාර සේවාවක් ඇරඹිය යුතු ය.

10. මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් ප්‍රහුණු කිරීමේ කාලසීමාව 9 මසක් දක්වා දීර්ඝ කර ඔවුන්ගේ පාඨ මාර්ගයට මාතෘ හා ළමා පෝෂණය ද විෂයයක් වශයෙන් එකතු කළ යුතු ය.

11. පූර්ව-ප්‍රසව චිකිත්සාගාර වෛද්‍ය නිලධාරීන් විසින් නොව ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරීන් විසින් පැවැත්විය යුතු ය. වෛද්‍ය නිලධාරීන්, ඇපෝතිකරිවරුන් හා මහජන සෞඛ්‍ය හෙදියන් සඳහා සාකච්ඡා සම්මේලන පැවැත්විය යුතු ය.

12. පූර්ව-ප්‍රසව හා ළමා සුභසාධක වාර්තා එකටම පැවතිය යුතු ය. පෝල්ඛර ක්‍රමයක් නිර්දේශ කරනු ලැබේ.

13. මව්වරුන්ට නිකුත් කෙරෙන වියළි කිරි පිටි යෝග්‍ය නොවන අයට යෑම වැළැක්වීම සඳහා විධි විධාන යෙදිය යුතු ය.

14. චිකිත්සාගාරවල දී පහසුවෙන් ශරීරයට උරාගන්නා යකඩ හා කැල්සියම් වර්ග පාවිච්චි කළ යුතු ය.

15. (අ) පූර්ව-ප්‍රසව ආරක්ෂාවේ ඇති වැදගත් කම පිළිබඳ අවධාරණය කළ යුත්තේ සම බර ආහාරයේ ඇති වැදගත් කම ගැන අවධාරණය කිරීමෙනි.

(ආ) රැකියාවල යෙදී ඇති මව්වරුන්ට දෙන සම්පූර්ණ පඩි පිට නිවාඩු කාලසීමාව වැඩි කිරීම.

(ඉ) පවුල් සංවිධාන කටයුතුවලට සහ පරතරය තබා ගැනීම ගැන ඔවා දීම සඳහා පහසුකම් සහ කාර්ය මණ්ඩල සකසීම.

16. ළදරුවන්ට කිරි දීමේ නිවැරදි ක්‍රමය යනාදිය ගැන මව්වරුන්ට නිසි උවදෙස් දීම පිණිස ළදරු සුභසාධක චිකිත්සාගාර.

ජ.සෞ. සංවිධානයෙන් ලැබුණ සමාජීය ළමා රෝග විද්‍යාඥ තෙමේ, මාතෘ සහ ළමා සෞඛ්‍ය කටයුතු සම්බන්ධයෙන් ආයතනික සහ පිට වැඩ කටයුතු ඒකාබද්ධ කිරීම අත්හදා බැලීමෙන් පසුව, එම වැඩ පිළිවෙල ක්‍රියාවේ යෙදවිය හැකි බැව් දිටි. ජාතික පදනමක් පිට මාතෘ සහ ළමා සෞඛ්‍ය පිළිබඳ ව්‍යාප්ත වැඩ පිළිවෙලක් සම්පාදනය කරනු පිණිස, ප්‍රසව වෛද්‍ය කරණය සහ ළමා රෝග විද්‍යාව යන දෙකෙන් ම දැනුමක් ඇති නිසි විශාරදයෙකු ලබා ගත යුතු යයි, උවදෙස් කමිටුව විසින් ද යෝජනා කොට ඇත.

(අ) විශේෂයෙන් ම වෛද්‍ය සහ තදානුබද්ධ සේවා වර්ගවලට අයත් කාර්ය මණ්ඩල හීනවීම සහ ගමන් වියදම් දීමනා ඕමා කිරීම හේතු කොට ගෙන ගැබිනි මව්වරුන්ගේ සහ සූතිකා මව්වරුන්ගේ ආරක්ෂාව පිළිබඳ කටයුතුවලට පහරක් එල්ල වී ඇත.

(ඉ) පාසල් යාමට පෙරාතු වයසේ ළමුන් බලාගැනීම ගැන විශේෂ සැලකිල්ලක් දක්විණ. පාසල් යාමට පෙරාතු වයසේ ළමුන් පිළිබඳ සෝදිසියක් පානදුරේ සෞඛ්‍ය පේරුවේ දී මෙහෙයවන ලදුව, ඉන් අනතුරුව, ලංකා මහජන සෞඛ්‍ය සංගමයේ මෙහෙයිමෙන් "පාසල් යාමට පෙරාතු ළමයා" යන මැයෙන් ශාස්ත්‍රීය සාකච්ඡාවක් විය. එම ශාස්ත්‍රීය සාකච්ඡාවේ නිර්දේශ, නිසි කටයුතු සඳහා සලකා බලනු ඇත.

2. සංවිධානය

කොළඹ, මහනුවර සහ ගාල්ල යන නගර සභාවල හැරෙන්නට, මාතෘ සහ ළමා සෞඛ්‍ය පිටියේ සියළු ම කටයුතු දෙපාර්තමේන්තුවේ සේවක-සේවිකාවන් අතින් ම ඉටු වෙයි. එසේ ද වුවත්, චිකිත්සාගාර පැවැත්ම සඳහා ගොඩනැගිලි, උපකරණ, කිරි ආහාර යනා දිය සලසා දීමෙන් පළාත් පාලන ආයතනවලින් ද සහාය ලැබෙයි. කිරි

ආහාර යනාදිය බෙදා දීමට උදව් දීමෙන් මෙම චිකිත්සාගාරවලට ඔය කැමැත්තෙන් ඉදිරිපත් වී සහාය වීම පිණිස, ශ්‍රමදාන ව්‍යාපාරයේ (නිදහස් ජාතික සේවා ව්‍යාපාරයේ) සේවය ලබා ගැනීමට වැයමක් කරන ලදී.

යටකී නගර සභාවල ඒ ඒ පළාත් පාලන බලධාරීන් විසින් එම වැඩ කටයුතු කර ගෙන යනු ලැබේ. එහෙත්, පාසල් සෞඛ්‍ය වැඩ කටයුතු කරනු ලබන්නේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසිනි.

වර්ෂය තුළ දී මහජන සෞඛ්‍ය හෙදියන් සහ මහ ජන සෞඛ්‍ය වින්නඹුවන් විසින්, මාතෘ සහ ළමා සෞඛ්‍ය පිළිබඳ නව ලේඛන පාවිච්චි කරන ලදි. මෙකී නව ලේඛනවල ප්‍රකාර මාතෘ සහ ළමා සෞඛ්‍ය කටයුතුවලට අදාළ සංඛ්‍යා-ලේඛන ද එකතු කර ගන්නා ලදුව, පවත්වා ගනු ලැබිය. එසේ හෙයින්, මේ වර්ෂයේ ඉදිරිපත් කැරෙන සංඛ්‍යා-ලේඛන වක්‍ර පසු ගිය වර්ෂවල වක්‍ර දියුණු කරලීමෙන් ලත් ඒවා බව පෙනෙනවා ඇත.

3. වැඩ කටයුතු

(අ) ක්ෂේත්‍රය

ගැබිනි මව්වරුන් සහ සූතිකා මව්වරුන් බලාගැනීම පිළිබඳ පිටියේ වැඩ කටයුතු ප්‍රධාන වශයෙන් මහජන සෞඛ්‍ය වින්නඹුවන් විසින් කරන ලද අතර, ඉපිද දින 10ක් පසු වූ ළදරුවන්, පාසැල් නොයන වයසේ දරුවන් සහ පාසල් යන දරුවන් පිළිබඳ වැඩ කටයුතු මහජන සෞඛ්‍ය හෙදියන් විසින් කරන ලදී. මේ අයට ගෙදර-දොරේ දී මෙන් ම චිකිත්සාගාරවල දී ද සැලකිල්ල දක්වන ලදි. සාමාන්‍ය සිරිත වී ඇත්තේ, ගෙදර පිළිවෙල සතුටුදායක තත්ත්වයක තිබේ නම් ප්‍රකෘති දරු ප්‍රසූති මහජන සෞඛ්‍ය වින්නඹුවන් විසින් ගෙවල්වල දී ම ගැනීමත්, සෙසු අය ආයතනවලට යැවීමත් ය. වර්ෂය තුළ දී, ක්ෂේත්‍ර වින්නඹුවෝ දරු ප්‍රසූති 56,334ක් මෙහෙය වූහ.

චිකිත්සාගාරවලට පැමිණෙන සංඛ්‍යාව ඉතාමත් විශාල නිසා සෞඛ්‍ය අධ්‍යාපන කටයුතු සඳහා චිකිත්සාගාර අයෝග්‍ය වී ගෙන එන හෙයින්, ගෙවල්වලට යන අවස්ථාවල දී සෞඛ්‍ය අධ්‍යාපනය ගැන අවධාරණයෙන් කටයුතු කරන ලදි. පිටියේ වින්නඹුවන් අතින් මෙහෙයවෙන දරු ප්‍රසූති ගණන අවුරුද්දෙන් අවුරුද්ද පහත බසින හෙයින්, ඔවුන්ට දැන් මේ ගැන වැඩි වැඩියෙන් කාලය මිඩංගු කිරීමට නිදහස තිබේ.

මාතෘ සහ ළමා සෞඛ්‍ය කටයුතු සමග, පවුල් සංවිධාන කටයුතු ඒකාබද්ධ කරන ලදුව, පවුල් සුභ සිද්ධි චිකිත්සාගාරවල පශ්චාත්-ප්‍රසූති සැලකිල්ල සමග කරන ලදි. (12 වන සටහනේ සංඛ්‍යා-ලේඛන දක්වේ.)

(ආ) ආයතන බද

මව්වරුන්ගේ සහ දරුවන්ගේ සෞඛ්‍ය පිළිබඳ ආයතන බද සහ පිටියේ වැඩ කටයුතු එතට ඇඳා ගැනීමක් දුරට දියුණු වියැ. විශාල ආයතනවලැ ප්‍රසව වෛද්‍යයින් සහ ළමා රෝග විද්‍යාඥයින් විසින් පූර්ව-ප්‍රසව සහ පශ්චාත්-ප්‍රසව සහ ළමා සුභ සාධක චිකිත්සාගාර නිතිපතා මෙහෙයවන ලදි. ලේ අඩු මව්වරුන් (එනම් ඕයෙට 40කට අඩු රක්ත රංජක ප්‍රමාණයක් ඇති අය) වෛද්‍ය ආයතනවලට ඇතුළත් කරවා ගෙන ප්‍රතිකාර කිරීමට හැම ප්‍රයත්නයක් ම දරන ලදි. මව්වරුන්ගේ ඇඳන් ගණන, ප්‍රසව ගණන සහ මරණ ගණන, පිළිවෙලින් xxiii වන සහ xxiv වන සටහන් වලැ දක්වේ.

(ඒ) අධ්‍යාපනය

සෞඛ්‍ය අධ්‍යාපන ඉතාමත් වැදගත් කටයුත්තක් වූ අතර, ක්ෂේත්‍ර නිලධාරීන්ට ක්‍රමික සංස්කරණ සම්මේලන හා සාකච්ඡා සභාවලට සහභාගි වී මේ පිළිබඳව මැනක දී ඔදවුණු දියුණුව ගැන අවබෝධයක් ලබාගැනීමට හැකිවිය. බෙදාහැරීම් සඳහා පත්‍රිකා හා දැන්වීම් නිලධාරීන්ට ලබා දෙන ලදි.

4. මාතෘ හා ළදරු මරණ පරීක්ෂණ

මාතෘ හා ළදරු මරණ පරීක්ෂණය සම්බන්ධයෙන් පත් කරන ලද විශේෂ කම්‌ටුව මගින් මෙම මරණ පරීක්ෂා පවත්වන නිලධාරීන් විසින් ප්‍රයෝජනයට ගත යුතු විශේෂ ආකෘති පත්‍ර පිළියෙල කර තිබුණු අතර, මෙම පිළිවෙල තවදුරටත් කරගෙන යන ලදි.

5. ජංගම සේවය

"ඇදිහැස" ආයතනය මගින් ප්‍රදානය කරන ලද වැන්‌රිය දෙකක් මුළු දිවයින පුරාම සංචාරය කරමින් සෑම මාසයක් තුල දී සාමාන්‍ය වශයෙන් ළමයින් 5,235 දෙනෙකුට ප්‍රතිකාර කරන ලදි.

6. පාසැල් දන්ත වෛද්‍ය සේවය

පාසැල් දන්ත චිකිත්සාගාර 19ක් අළුතෙන් පිහිටුවීම සඳහා මුදල් අනුමත කරනු ඇතැයි බලාපොරොත්තුවේ. මෙම වසර තුල දී පහත දැක්වෙන චිකිත්සාගාර අළුතෙන් අරඹන ලදි.

ඒ. **කුදුවමුල්ල මධ්‍ය මහා විද්‍යාලය**

බී. **වෙනත් ආයතන**:—(i) සෞඛ්‍ය අංශය, පානදුර, වෛද්‍ය නිලධාරී තැනගේ සමාජ සේවා චිකිත්සාගාර ගොඩනැගිල්ල.

(ii) **සෞඛ්‍ය අංශය—මොරටුව**:—සුළු නගර සභාව මගින් ස්ථානයක් සපයන ලදි.

(iii) **දෙහිවල සෞඛ්‍ය අංශය**:—නගර සභාව මගින් ස්ථානයක් සපයන ලදි.

(iv) **පස්වෙනි ජෝර්ජ් රාජ චිකිත්සාගාරය**:—මීගමුව, නගර සභාව මගින් ස්ථානයක් සපයන ලදි.

(v) **ජීන්තුපිටිය හා මෝදර බෙහෙත් ශාලාව**—නගර සභාව මගින් ස්ථානයක් සපයන ලදි.

වර්ෂය අගදී පාසැල් දන්ත චිකිත්සාගාර 39ක් වූ අතර, එයින් 34ක් කොළඹද, දෙකක් කළුතරද, එකක් කෑගල්ලේද, මහනුවර ප්‍රදේශයේ දෙකක්ද වුහ. පාසැල් දත් හෙදියන්ගේ වැඩ ගැන xxv වෙනි සටහන බලන්න.

7. පවුල් සංවිධානය

ලංකා-ස්වීඩන් පවුල් සංවිධාන ක්‍රමය යටතේ වැඩ කටයුතු යාපනේ අර්ධ ද්වීපයේ පේදුරු තුඩුව දක්වා දීර්ඝ කරන ලදි. මෙයින් මෙහි වැඩ කටයුතුවලට තුන්වැනි ප්‍රදේශයක් ද, ආරම්භ වීය. ලංකා-ස්වීඩන් පවුල් සංවිධාන ක්‍රම ගිවිසුම ද තවත් අවුරුදු දෙකකින් දීර්ඝ කරන ලදී. මෙරටේ පවුල් සංවිධානය වාර්තා හා දාරක සෞඛ්‍ය වැඩ පිළිවෙලේ අංශයක් වී ඇති අතර, එහි කටයුතු මවගේ හා ළදරුවාගේ සෞඛ්‍ය තත්ත්වය නොවරදිනසේ සකස් කර ගැනීමට ම සීමාවීය. ලංකා පවුල් සංවිධාන සංගමය ස්වේච්ඡා ආයතනයක් වන අතර එහි වැඩකටයුතු කරගෙන යෑම සඳහා 75,000ක දීමනාවක් දෙන ලදි. කොළඹ උතුරු රෝහලට අයත් ප්‍රසව වෛද්‍ය විශේෂඥයා, පවුල් සංවිධාන සංගමය වෙනුවෙන්, ප්‍රතිසංධිය වැලකීම පිළිබඳ ව පර්යේෂණ පවත්වන ලදි. සෞඛ්‍ය අධ්‍යාපනය පිළිබඳ කටයුතු විධිමත් ලෙස කර ගෙන යනු ලබන පවුල් සංවිධාන සංගමය, වතුකරයේ පවුල් සංවිධාන වැඩ පිළිවෙලක් පුළුල් ලෙස ආරම්භ‌මට ද කටයුතු කරයි. මෙම වර්ෂය තුල දී වෛද්‍ය නිලධාරීන් 28 දෙනෙකුට පවුල් සංවිධාන වැඩ ගැන පුහුණුවක් ලබා දෙන ලදි.

8. **විශේෂ පාඩම් මාලා සමාලෝචනය කිරීම හා පර්යේෂණ**

"පින්කස්" පෙති පාවිච්චිය සම්බන්ධ අධ්‍යයනය මෙම වසර තුල දී තවදුරටත් කරගෙන ගිය අතර මෙහි මූලික ප්‍රතිඵල වැදගත් ලෙස පෙනිණි.

9. **අන්තර් ජාතික ආධාර**

කළුතර දී අරඹන ලද ග්‍රාමීය සෞඛ්‍ය වැඩ පිළිවෙල ලෝක සෞඛ්‍ය සංවිධානයේ විශේෂඥයා විසින් මෙම වර්ෂය තුල දී, දිවයිනේ වෙනත් පලාත්වලට ද ව්‍යාප්ත කරන ලදි.

හෙදියක වන ටී. බී. රොබින්සන් මහත්මිය ඇගේ සේවා කාලය අවසන් කිරීමෙන් පසුව දිවයිනෙන් බැහැර යන ලදි. කොළඹ ක්‍රමය යටතේ ලංකාවේ සිටි දත් හෙදි පරීක්ෂිකාවන් දෙදෙනාගෙන්, එක් පරීක්ෂිකාවකගේ සේවා කාලය දික් කරන ලදි. පාසැල් දන්ත චිකිත්සාගාර ඇති කිරීම හා පවත්වා ගෙන යෑම සඳහා, මහරගමදී පාසැල් දත් හෙදියන් පුහුණු කරවීම සඳහා ද ඈ උපකාරී වූවා ය.

(ආ) පාසැල් සෞඛ්‍ය කටයුතු සංවිධානය

වෛද්‍ය නිලධාරීන්ගේ හිඟය නිසා පාසැල් සෞඛ්‍ය කටයුතු කරගෙන යෑමට ඇති වී ඇති බාධකය මග හරවා ගැනීම සඳහා මෙම වර්ෂය තුල දී තවත් ඇපෝතිකරිවරුන් තුන් දෙනෙකු පුහුණු කර පත්වීම් දෙන ලදි.

2. **කටයුතු :** සාමාන්‍ය ක්‍රියා පිළිවෙලට අමතරව, පාසැල් සෞඛ්‍ය වාර්තා ප්‍රතිසංශෝධනය කරන ලදි.

(i) **සෞඛ්‍යාරක්ෂාව.**—රු. 25 ක සහනාධාර මුදලක් ලබා ගෙන පාසැල් ගුරු දෙගුරු සමිතිවලින් වැසිකිලි තැනීම මෙම වර්ෂය තුල දී ද කරගෙන යන ලදි.

(ii) **සෞඛ්‍ය පරීක්ෂණ හා අඩුපාඩු හරිගැස්වීම**

පාසැල් 2,834 ක සෞඛ්‍ය පරීක්ෂණ පවත්වන ලද අතර පාසැල් ශිෂ්‍යයින් 1,60,613 දෙනෙක් පරීක්ෂා කරන ලදි. අනාවරණය වූ අඩුපාඩු සංඛ්‍යාව මෑත වර්ෂවලදී සොයා ගත් පහත්ම අනුපාතයයි. එය දැනට විධිමත් ලෙස ක්‍රියාත්මකවන පාසැල් සෞඛ්‍ය වැඩපිළිවෙල හේතුකොට ගෙන බැව් නිශ්චය වශයෙන් දැක්විය හැකිය. පරීක්ෂා කරන ලද පාසැල් ගණන හා ලමයින්ගේ ගණන ද XXVI වෙනි සටහනින් දැක්වෙන අතර XXVII වෙනි සටහනින් විශේෂ අඩුපාඩු හා හරිගස්වන ලද අඩුපාඩු ගණන ද දැක්වේ.

ඉ—පෝෂණය

1. **හැටළු**

මරණයට ගොදුරුවූ සහ රෝගී වූ ප්‍රමාණය, පාසැල් නොයන වයසේ ළමුන් අතර බහුල වැ තිබිණ.

මන්ද පෝෂණයට ගොදුරු වූ ප්‍රමාණයත්, **දුර්පෝෂණයට** ගොදුරුවූ ප්‍රමාණය තරමක් අඩුවෙනුත්, පාසල් ළමුන් අතර නොවෙනස් වැ පැවතිණ.

රෝහවලින් සංකූල නොවූ ලේ මදකම නිසා මරණයට ගොදුරුවූ මව්වරුන් සංඛ්‍යාවෙන් සැලකිය යුතු දියුණුවක් නො පෙනේ.

2. **විශේෂ සමීක්ෂණ සහ පර්යේෂණ**

පානදුර දේශ වාසී පාසැල් නොයන වයසේ ළමුන් ගේ සෞඛ්‍යයෙහි හැම පැත්තක් ගැන මෑ විශේෂ හදාරුවක් කරන ලදි. හොරපේ සහ කෝට්ටේ ගම් වැසි බිළිඳුන්ගේ සහ පාසැල් නොයන වයසේ ළමුන්ගේ පොෂණය මත පාවන රෝග බලපවත්වනා අයුරු පිළිබඳව ජ. සෞ. සං. සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හවුලේ තතු විමසා බලන ලදුව, එහි ප්‍රතිඵල දැන් බලාපොරොත්තු වනු ලැබේ.

3. **පෝෂ්‍යදායකත්වයට අදාල ක්‍රියා මාර්ග**

ඒ. දිවා ආහාර පිළිබඳ වැඩ පිළිවෙල පෙර සේම පාසැල්වල අනුගමනය කරන ලදි.

බී. පෝෂ්‍යදායකත්වය පිළිබඳව අධ්‍යාපනය—ක්ෂේත්‍රයේ

විශේෂයෙන් ම මව්වරුන්ටත්, ඔවුන්ගේ ළදරුවන්ටත් පාසැල් නොයන වයසේ පසුවන ළමයින්ටත් කෑම ලබාදීම පිළිබඳව පිළියෙල කරන ලද විස්තර පත්‍රිකා තුන් ආකාරයකින් බෙදා හරින ලදි. ඒවා මෙසේ බෙදා හරින ලද්දේ මුළු දිවයින පුරාම විසිර යනයේ වඩාත් හොඳ ක්‍රමයක් සොයා ගැනීමට යි.

සී. නොමිලයේ කිරි බෙදාහැරීම

දෙපාර්තමේන්තුව මගින් ක්‍රම දෙකක් යටතේ කිරි සපයන ලදි. ඒවා ජාතික කිරි බෙදාහැරීමේ ක්‍රමය හා ඇදිහැස කිරි බෙදාහැරීමේ ක්‍රමයක් වෙති.

1. **ජාතික කිරි බෙදාහැරීමේ ක්‍රමය**

මන්ද පෝෂණය ගැබිණි මව්වරුන්ගේ ලේ හිඟවීමට ප්‍රධාන හේතුව විය. පිරිසිදු කිරි හා යොදය ඉවත් කරන ලද කිරි, ගැබිණි මව්වරුන්, කිරි මව්වරුන් හා පාසැල් නොයන වියසේ පසුවන ළමයින් අතරේ ද බෙදාහරින ලදි. කිරි මණ්ඩලයෙන් හා සමූපාකාර කිරි පරිවිවලින් මිලට ගත් පිරිසිදු කිරි මධ්‍යස්ථාන 1,720 කින් බෙදාහරින ලද අතර, ආහාර කොමසාරිස්වරයාගෙන් මිලට ගත් යොදය ඉවත් කළ කිරි රාත්තල් 4,39,040ක් මධ්‍යස්ථාන 1,341 කින් බෙදාහරින ලදි. මෙම ක්‍රමය යටතේ පසින්වී 78,90,235ක් වර්ෂය තුල දී උපකාර ලබාගත් අයට ලැබිණි.

කිරි බෙදාහැරීමේ මධ්‍යස්ථානවල පරීක්ෂණ පවත්වා නෙත යන ලද්දේ දිස්ත්‍රික් පරීක්ෂකවරු, සෞඛ්‍ය පරීක්ෂකවරු හා මහජන සෞඛ්‍ය විත්තඛුවරුන්ය. ළමයින් නියත වශයෙන් ම කිරි මධ්‍යස්ථානවලට පැමිණෙන්නේ ද යන්න සොයා බැලීමට පැමිණීමට කැමති කරවා ගැනීමට ද ඔවුන්ට දන්වන ලදි.

තවත් කිරි මධ්‍යස්ථාන බොහොමයක් මෙම වර්ෂය තුල දී ස්වේච්ඡා ආයතනවලට භාරදෙන ලදි. මෙම ආයතනවලින් වැඩිහරියක් ම කිරි බෙදාදෙන ලද්දේ ස්වේච්ඡා ක්‍රමයක් උඩය. කිරි බෙදාහැරීම පිළිබඳව විස්තර සටහනෙහි දැක්වේ. සෞඛ්‍ය අධිකාරීන් 9 දෙනෙකු යටතේ, සෞඛ්‍ය සේවා කොට්ඨාශවල තිබුණු යොදය ඉවත් කළ කිරි බෙදාහැරීමේ මධ්‍යස්ථාන 367ක් කිරි මණ්ඩලයේ පිරිසිදු කිරි පසින්වී 800ක් බෙදාහැරීම සඳහා පරිවර්තනය කරන ලදි.

කිරි මධ්‍යස්ථානවල වැඩ කරගෙන යනු ලබන ආකාරය ගැන කරුණු සොයා බලා මේවා, තවත් කාර්යක්ෂම කළ හැකි අයුරුද, පලාතේ ළමයින් වැඩි දෙනෙකුට බොහෝ දුර පසින් යෑමක් නොකර තමන්ට අයිති කිරි ප්‍රමාණය ලබා ගත හැකි වන අයුරු ද දක්වා, ඇමති මණ්ඩලයට සන්දේශයක් ඉදිරිපත් කිරීමට ආහාර, සෞඛ්‍ය හා පලාත් පාලන අමාත්‍යාංශවල නිලධාරීන්ගෙන් සමන්විත වූ කමිටුවක් පත් කර තිබේ.

2. **ඇදිහැස කිරි ව්‍යාපාරය**

"ඇදිහැස" සංවිධානය මගින් ලංකාවට ප්‍රදානය කරන ලද කිරි, පාසැල් නොයන වයසේ පසුවන ළමයින්, ගැබිනියන් හා කිරිමව්වරුන්, ක්ෂය රෝගීන් හා ලාදුරු රෝගීන්ටද, ඔවුන් ස්පර්ශවූවන් අතරේද බෙදා හරින ලදි. පෙර මෙන්ම මෙය බෙදා හරින ලද්දේ මහජන සෞඛ්‍යය සේවාව යටතේ විවෘත කර ඇති මාතෘ විකිත්සාගාර හා ළමා ශුශ්‍රූෂාධක විකිත්සාගාර මගිනි. "ඇදිහැස" සංවිධානය මගින් එලෙස කිරි රාත්තල් 13,80,726ක් මධ්‍යස්ථාන 315කින් බෙදාහරින ලදි.

V වැනි පරිවෙජදය

වසංගත රෝග විද්‍යාව

1. ගැටළු

අවුරුද්දක් තුළ දී වසූරි රෝගය තෙවරක් ම කඩා වැදුන අතර, උග්‍ර පූර්වගත බාලක පක්ෂඝාත රෝගය ද, ඉතා දරුණු ලෙස හටගති. වසූරි රෝ බිය කැගල්ල, කුරුණෑගල සහ කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරි වසම් තුළ හටගත් අතර, අනෙකුත් පෙදෙස්වලට වඩා ඇතැම් පෙදෙස් තුළ බහුලව පැවැතියත් දිවයින පුරාම පාහේ බාලකපක්ෂඝාත රෝගය තදින් පැවතුණි.

(අ) වසූරිය රෝ බිය හට ගැනීම

(i) **කුරුණෑගල සෞ. සේ. අධිකාරිය**

වසූරිය හටගත් මේ වතාවේ දී පළමු රෝගියා සොයා ගන්නා ලද්දේ, කුලියාපිටිය සෞඛ්‍ය වසම තුළ අනුක්කාන පළාතේ උඩගොරක නම් ගමෙහි ඔක්තෝබර මාසයේ දී ය. මේ ගැන කරුණු සෝදිසි කරගෙන යද්දී දැන ගන්ට ලැබුණේ, පළමු හටගැනීම 61.8.19 වනදා සිදුවූ බවත්, ඊට ගොදුරුවූ තැනැත්තා 61.8.30 වනදා මිය ගිය බවත් ය. කුලියාපිටිය සහ වාරියපොල සෞඛ්‍ය වසම් තුළ ඇතිවූ අනෙකුත් රෝගීන්ට රෝගය බෝවීමේ මාර්ගය වූයේ මෙම රෝගියා ය. මුළු රෝගීන් ගේ ගණන 14 විය. එයින් 10 දෙනෙක් කුලියාපිටියෙන් ද අනෙක් 4 දෙනා වාරියපොලෙන් ද වූහ. මුළු මරණ ගණන 5කි. පළමු රෝගියාට රෝගය බෝවූ මාර්ගය ලෙස දැන ගන්ට ලැබී ඇත්තේ, පැපොල යයි හඳුනා ගනු ලැබූ පලු සහිත රෝගියෙකු රඹුක්කනින් පැමිණ ගිලන් ව වැදහොත් කුරුණෑගල මහරෝහලේ ඇස් වාට්ටුවයි. එම රෝගියා, කැගල්ල වසමෙහි ඇතිවූ රෝ බිය හට ගැනීමට ගොදුරුවූ දෙවැන්නා විය.

(ii) **කැගල්ල සෞ. සේ අධිකාරිය**

රෝගය පැවැති පෙදෙස් නම්, මාවනැල්ල සෞඛ්‍ය වසමට අයත් නැටියාපානත්, කැගල්ල සෞඛ්‍ය වසමට අයත් දෙබත් ගමත් විය. මුලින් ම දැනගන්නට ලැබුණ අවස්ථාව නම්, පලු සහිත රෝගියෙකු නොවැම්බර් 20 වනදා නැටියපාන ගමෙහි මිය යාමයි. පශ්චාත්-මරණ පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසුව, "වයිරෝ" විද්‍යානුකූල පරීක්ෂණ සඳහා වෛද්‍ය පර්යේෂණ ආයතනයට යවන ලද නිදර්ශකවලින් එය වසූරි රෝගය බව තහවුරු විය. අනතුරුව මේ ගැන කරන ලද විමර්ශන වල දී නිසැකවම පෙනී ගියේ, රෝ බිය හටගත් මෙම අවස්ථාවට අයත් පළමු රෝගියාට රෝගය වැළඳුනේ ජූලි මාසයේ දී බව යි. කැගල්ලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි වසම තුළ පිහිටි නැටියාපාන, කඩිගමුව සහ දෙබත්ගම යන පෙදෙස්වල සිටි මුළු රෝගීන් ගණන 30ක් වූ අතර, ඔවුනතුරෙන් තිදෙනෙක් මිය ගියහ.

(iii) **කොළඹ සෞ. සේ. අධිකාරිය**

දැන ගන්ට ලැබුණු පළමු රෝගියා නම්, කොළොන්නාව නගර සභා පෙදෙස තුළ විසූ අවුරුදු 1කුත් මාස 2ක් වයසැති ළමයෙකි. එය දන්වා එවන ලද්දේ පැපොල රෝගියෙකු බවට යි, එහෙත් පසුව ළමයා මිය ගිය හෙයින්, ඉක්බිති පවත්වන ලද පශ්චාත්-මරණ රසායනාගාර විමර්ශන වලදී එළිදරව් වූයේ, ඒ ළමයා වසූරි රෝගියෙකු වූ බවයි. 1961.10.27 වනදා සිට වැල්ලම්පිටියේ වසූරි රෝගය හටගත් බව පසුව විමර්ශනවල දී හෙළි විය. සොයා ගත හැකි පළමු රෝගියා 17 හැවිරිදි තරුණයෙක් විය. රෝගය බෝවීමට මුල සොයා ගත නොහැකි වූ නමුත්, එවකදීම

කුලියාපිටියේ සහ රඹුක්කන දී පැවති රෝ බිය කඩා වැදීම මිට මුල විය හැකි යැයි අනුමාන වශයෙන් සලකනු ලැබේ. සියල්ලම එකතුව රෝගීන් 22 දෙනෙක් වූ අතර, මරණ 4ක් සිදුවිය. එය මතු සඳහන් පෙදෙස් අතරේ මෙසේ බෙදී යයි:

	රෝගීන්	මරණ
කොළොන්නාව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වසම	18 ...	3
කොළඹ මහ නගර සභා සීමාවට අයත් ප්‍රධාන සෞ. වෛ. නිලධාරී වසම ...	1 ...	—
හෝමාගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වසම	3 ...	—

1962 ජනවාරි අවසානය දක්වා රෝඛිය පැවතුනි.

රෝගය පැනිරී ගිය පෙදෙස්, බෝවෙන රෝග ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලදි. අංගොඩ උණ රෝහලේ දී රෝගීහු වෙන් කොට තබනු ලැබූහ. රෝගීන් සමග ගැවසුන අය, ගෘහී රෝහලකත්, පාසැල් දෙකකත්, උණ රෝහලේත් වෙන් කොට රඳවනු ලැබූහ. වෛද්‍ය නිලධාරීන් සහ පරිපාලක මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් විශේෂ පිරිසක් සේවයට යොදවා, විශාල සංඛ්‍යාවක් එන්නත් කිරීම කරගෙන යන ලද අතර, රෝග බෝවීමේ මූල සොයා ගැනීම පිණිස වසංගත රෝග විද්‍යානුකූල විමර්ශන ද මෙහෙයවන ලදි.

රෝඛිය හටගැනීම් තුන පිළිබඳ ව කරුණු සෙවීමේ දී, මතු සඳහන් විශේෂ අංග අනාවරණය විය.

(1) මහජන සෞඛ්‍ය නිලධාරීන් විසින් කලින් සිටි රෝගීන් බලන ලද මුත්, පලුවල අවිශේෂ සවභාවය සහ ළාමක තත්ත්වය හේතු කොට ගෙන, එය පැපොල රෝගයැයි වරදවා තේරුම් ගන්නා ලදි.

(2) රෝගයට ගොදුරුවූ සියළු දෙනාම, ඉතාමත් ළඟින් ඇසුරු කළ නෑ-හිත-මිතුරන් අතරේ වූහ.

(3) කොළඹ රෝ බිය හටගත් අවස්ථාවේ දී, ඉමහත් ජනගහනයක් අතරෙහි රෝගීන් සිටිය ද, රෝගයට ගොදුරුවූ පිරිස අතලොස්සකි.

(4) කුලියාපිටියේ මාස 2ක් යන තෙක් ද, රඹුක්කන මාස 3කට කිට්ටු කාලයක් යන තෙක් ද, කොළඹ මාස 2ක් යන තෙක් ද, රෝගය මැඩ පැවැත්වීම උදෙසා කිසිවක් නොකරන ලද මුත්, ජනයා නිදහසේ එහා මෙහා ගිය සැටි කල්පනා කර බලන කල රෝගයට ගොදුරුවූ පිරිස අතලොස්සකි.

(5) ප්‍රතිශක්තිය අතින් හීනවී යන පුද්ගලයින් අතර, එනම් මහළු වයසේ අය සහ එන්නත් නොකරන ලද දරුවන් අතර, මරණ සිදුවිය.

(6) රෝ බිය හටගත් වෙනත් අවස්ථාවල දී මිය ගිය ප්‍රමාණය සියයට 30ක් වන මුත්, මේ අවස්ථාවේ දී මිය ගිය ප්‍රමාණය සියයට 18කි.

(7) රෝ බිය හටගැන්මේ මූල හරියේ දීත්, විශාල සංඛ්‍යාවක් එන්නත් කිරීමෙන් පසුවත්, රෝග විනිශ්චය කිරීමේ අසිරුකම් ඇතිවිය. එන්නත් කරන ලද උදවිය අතර පේශීමය පැපුලමය පලු හටගැනීමේ විශාල ගණනක් ඇති විය.

(ආ) බාලක පක්ෂාඝාත රෝගය

වර්ෂය තුළ දී ප්‍රධාන ගැටළුවක් ලෙස බාලක පක්ෂාඝාත රෝගය මතු වූයේ ය. කලිනුත් රෝගීන් සිටි බව දැන ගන්ට ලැබුණ මුත්, රෝගීන් විශාල වශයෙන් ඉස්මතු වීමට පටන් ගත්තේ II වන ලෝක සංග්‍රාමයට පසුව ය. මෙම රෝගය, දැනුම් දිය යුතු රෝගයක් බවට 1944 දී නම් කරන ලද අතර, එම අවුරුද්දේ දී රෝගීන් සය දෙනෙකු ගැන සෞඛ්‍ය බලධාරීන්ට දන්වන ලදී. 1945 දී රෝගීන් සිව් දෙනෙකු ගැන

දන්වන ලද මුත්, 1948 දී රෝගීන් 301 ක් වූහ. මරණ 37ක් ද වී ය. 1951, 1952 සහ 1957 වැනි ඇතැම් වර්ෂවල දී රෝගය තදින් ම මුල් බැසගෙන තිබෙන බවට ලකුණු දක්නා ලදි.

(i) බාලක පක්ෂාගත රෝ බිය ඇතිවීම

රෝබිය හටගත් විශාලතම අවස්ථාව මෙහි ඇළලෙන වර්ෂයට අඩංගු වීය. කොළඹ ළමා රෝහලට ඇතුළත් කරන ලද රෝගීන් ගණනෙහි වැඩිවීමක් පෙබරවාරි දෙවන සතියේ දී පෙනෙන්ට තිබුණි. ජනවාරි මාසයේ දී වාර්තා කරන ලද පළමු රෝගීන් කිහිප දෙනා පැමිණියේ, කොළඹට තදාසන්න පෙදෙස්වලිනි. ජනවාරියේ දී 13ක් ද, පෙබරවාරියේ දී 52 ක් ද, යනුවෙන් වූ ඇතුළත් කර ගන්නා ලද සංඛ්‍යාව, මාර්තු මාසයේ දී කැපී පෙනෙන පරිදි වැඩි වුණ බව දක්නා ලදි. එවක් පටන් දිවයිනේ අනෙකුත් පෙදෙස්වලින් ද රෝගීන් ගැන වාර්තා විය. දිවයිනේ සියළු ම පෙදෙස් අඩු වශයෙන් හෝ වැඩි වශයෙන් හෝ රෝ බිය පැතිරීමට ගොදුරු වීය. ඒ ඒ සෞ. සේ. අධිකාරි කොට්ඨාශවලින් දන්වා එවන ලද බාලක පක්ෂාගත රෝගීන් ගණන සහ 1,00,000 ක ජනගහනයකට වැටෙන වාර්ෂික ප්‍රමාණය, XXX වන සටහනෙහි දැක් වේ. ඉහළම ප්‍රමාණය මෙසේ දක්නා ලදි:—

වවුනියා සෞ. සේ. අධිකාරිය — ජනගහනයෙන් 1,00,000කට 77.22 බැගින්
යාපනේ සෞ. සේ. අධිකාරිය — ජනගහනයෙන් 1,00,000කට 59.36 බැගින්
කොළඹ සෞ. සේ. අධිකාරිය — ජනගහනයෙන් 1,00,000කට 22.1 බැගින්
රත්නපුර සෞ. සේ. අධිකාරිය — ජනගහනයෙන් 1,00,000කට 22.7 බැගින්
කෑගල්ල සෞ. සේ. අධිකාරිය — ජනගහනයෙන් 1,00,000කට 17.3 බැගින්

පහළම ප්‍රමාණය මේ පෙදෙස්වල දක්නා ලදී:—

බදුල්ල සෞ. සේ. අධිකාරිය — ජනගහනයෙන් 1,00,000කට 2.1 බැගින්
කළුතර සෞ. සේ. අධිකාරිය — ජනගහනයෙන් 1,00,000කට 7.4 බැගින්
අනුරාධපුර සෞ. සේ. අධිකාරිය — ජනගහනයෙන් 1,00,000කට 8.5 බැගින්

රෝගය බහුලව පැවැති එක් එක් ප්‍රදේශ රෝ බිය බලපැවැත්වූ මුදුන් පෙත්තට ළඟා වූයේ මෙසේ ය:—

කොළඹ සෞ. සේ. අධිකාරිය — අප්‍රේල්
වවුනියා සෞ. සේ. අධිකාරිය — ජූනි
රත්නපුර සෞ. සේ. අධිකාරිය — ජූනි
යාපනේ සෞ. සේ. අධිකාරිය — ජූලි
කෑගල්ලේ සෞ. සේ. අධිකාරිය — ජූලි

(ii) රෝ බිය පැතිර යාම

බෝවීමේ තරංගය කොළඹ දිස්ත්‍රික්කයේ සිට දිවයිනේ අනෙකුත් පෙදෙස්වලට පැතිර ගොස් තිබෙන බව පෙනේ. වඩා දුර බැහැර පෙදෙස් රෝගයට ගොදුරුවූ සංඛ්‍යාවෙහි මුදුන් පෙත්තට මාසයෙන් මාසයේ දී එළඹීමෙන් මෙය මොනවට දැක් වේ. මුළු දිවයින ම එක් කොට ගත් කල, මුදුන් පෙත්ත එළඹියේ 1962 අප්‍රේල් මාසයේ දීය. 1962 සැප්තැම්බර් වන විට රෝගයට ගොදුරුවූ සංඛ්‍යාව සැහෙන තරම් පහළ බැස තිබුණි.

වයස සහ ස්ත්‍රී-පුරුෂ භාවය අනුව බෙදී යන ආකාරය XXIX වන සටහනෙහි දැක් වේ. රෝගීන් ගෙන් සියයට 82.5ක් වයස අවු. 5ට අඩු ළමුන් අතර බවත්, සියයට 13.5ක් වයස අවු. 1ට අඩු ළමුන් අතර බවත්, දක්නා ලදි. මෙයින් සියයට 10.6ක් ඇති වූයේ වයස මාස 6ක් ඉක්මවා සිටි අය අතරේ ය. සියයට 3.1 ක් ඇති වූයේ මාස

6ට අඩු අය අතරේ ය. වයස අවු. 8ට අඩු අය අතරේ සියයට 91.1 ක් රෝගයට ගොදුරු වූහ. රෝගින්ගෙන් සියයට 56.1ක් පිරිමි පක්ෂයෙන් වූ අතර, සියයට 42.2ක් ගැහැණු පක්ෂයේ වූහ. මේ නයින් රෝගින් ගණන දෙස බැලීමේ දී පිරිමි රෝගින් ගැහැණු රෝගින්ට වඩා බෙහෙවින් වැඩි වන බව කැපී පෙනේ.

(iii) මැඩ පැවැත්වීමේ විධි විධාන

රෝගය පැවැතීම වළක්වා ලනු වස් විශේෂ මර්දන විධි විධාන වහාම ක්‍රියාවේ යොදවන ලදි.

ළමා රෝහලේ සහ අනෙකුත් පළාත් බද රෝහල්වල විශේෂ ප්‍රතිකාර පහසුකම් සැලසීමට අමතර ව, ප්‍රතිශක්ති කරණ වැඩ සටහනකට ඉහළින් ම මුල් තැන දී ක්‍රියා කරන ලදි.

රෝගයට ගොදුරුවන ගණනෙහි නැගීම දැන ගන්ට ලැබුන විගස ම, රෝගය පැවැති සෑම පෙදෙසකම වෙසෙන, මාස 3 සිට අවුරුදු 15 දක්වා වූ පහසුවෙන් රෝගයට වසඟ විය හැකි වයස් සීමාවට අයත් සියළුම ළමුන්, (සේබින් වර්ගයේ) ජීවමාන "පෝලියෝ මයිලයිටිස් වයිරස්" එන්නත මුව මාර්ගයෙන් දී ප්‍රතිශක්ති කරණය ඉටු කිරීමට තීරණය කර ගන්නා ලදී.

බ්‍රිතාන්‍යයෙන් ලැබුණ දියර ස්වරූපයෙන් යුත් පළමු එන්නත් බෙහෙත් තොගය, රාජකීය ගුවන් හමුදාවට අයත් අහස් යානාවක් විශේෂයෙන් යොදවා එක්සත් රාජධානියෙන් පිටත් කොට එවූ අතර, එය මාර්තු 18 වනදා ලක්දිවට ළඟා විය. ළමා රෝහලේත්, කොළඹ නගරයේ ඇතැම් පෙදෙස්වලත්, අසල්වැසි පෙදෙස්වලත්, සීමා සහිත පදනමක් මත එන්නත් කිරීම මාර්තු 19 වනදා ඇරඹින. සෝවියට් දේශයෙන් තව තවත් එන්නත් බෙහෙත් ලැබෙන්ට වූ විට, දිවයිනේ සෑම පෙදෙසක් ම ප්‍රතිශක්ති කරණ වැඩ සටහනට ඇතුළත් කරන ලදි. අග්නි-දිග ආසියාතික රටක මෙහෙය වන ලද විශාලතම එන්නත් කිරීමේ ව්‍යාපාරවලින් එකකි, මෙය. මේරටෙහි ඇති මහජන සෞඛ්‍ය සංවිධානයේ සාර්ථකත්වය ආධාර කොට ගෙන දෙපාර්තමේන්තුව ඉක්මණින් ම රෝගය මැඩ පැවැත්වූවා ය. වයස අවු. 5ට අඩු ළමුන් ප්‍රතිශක්ති කරණයෙහි පිහිටුවීමට වැඩ සටහනෙන් ඉහළින් ම මුල් තැන ලැබුණ අතර, සති 4 සිට 8 දක්වා කාලයක් අතරට ඇතුව එන්නත් බෙහෙත් වඩි තුන දීමෙන් මෙම වයස් ගණයේ ළමුන් සියයට 80ක් වත් ප්‍රතිශක්ති කරණයෙහි පිහිටුවීමට සෑම උත්සාහයක් ම දරන ලදි. ප්‍රතිශක්ති කරණය සාර්ථක ලෙසත් යුහුසුළුවත් ගෙන යනු ලැබූ සෑම පෙදෙසක ම, රෝගය හට ගැනීම කැපී පෙනෙන පරිදි අඩු වූ බවක් දක්නා ලදී. ළමා රෝහලට ඇතුළත් කර ගන්නා ලද සංඛ්‍යාව අප්‍රේල් මාසයේ දෙවන සතිය තුළ දී පහළ බසිනු දක්නා ලදි. වාර්තාවී ඇති රෝගීන් සංඛ්‍යාව අනුව දෙවන තැන ලබා සිටි යාපනයෙහි, ප්‍රතිශක්තිකරණ වැඩ සටහන ජූනි 23 වනදා තරමට ව්‍යාප්ත කරන ලදින්, ජූලි මාසයේ 21 වනදායින් අවසන් වන සතියේ දී ඇතුළත් කිරීම් සංඛ්‍යාවෙහි බැසීමක් පෙනුණි. මෙය, රත්නපුර සහ ගාල්ල වැනි අනෙකුත් ප්‍රදේශ වලදී ද දක්නා ලදී.

එන්නත් කිරීමේ වැඩ සටහන ක්‍රියාවේ යොදන ලද්දේ, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සහ පර්යන්ත ඒකක වෛද්‍ය නිලධාරීන් විසින් ළමා සුභ සාධක චිකිත්සාගාරවල, සෞඛ්‍ය ඒකකවල, පර්යන්තික ඒකකවල, පාසැල්වල සහ විශේෂ මධ්‍යස්ථානවල ය. මහජන සෞඛ්‍ය සේවක-මණ්ඩලය මුළු මණින් ම මේ අරබයා යොදනු ලැබූ අතර, එන්නත් බෙහෙත් සියල්ල රැස්කොට තබා ගැනීමේ පහසුකම් සැහෙන තරම් තිබුණා වූ වෛද්‍ය පර්යේෂණ ආයතනය, එන්නත් බෙහෙත් බෙදා හැරීමේ මධ්‍යස්ථානය විය. සිසිල් කරණයන්හි පදමට ශීතොෂ්ණය ලැබෙන තත්ත්වයන් යටතේ එන්නත් බෙහෙත් රැස් කොට තැබීමට වෛද්‍ය නිලධාරීහු විධි විධාන යෙදුහ. අයිස්වලින් අසුරන ලද කට පළල් "තර්මස් ප්ලාස්ක්" නම් බෝතල් විශේෂය තුළ බහා එය මධ්‍යස්ථාන යෙන් මධ්‍යස්ථානයට ගෙන යන ලදී. පත්‍රිකා සහ දර්ශන පත්‍ර (පෝස්ටර්) උපයෝගී කොට ගෙන සෞඛ්‍ය අධ්‍යාපනය මෙහෙයවන ලදි. තම දරුවන් ප්‍රතිශක්තිකරණයෙහි

පිහිටුවා ලන ලෙස මහජනයාගෙන් ඉල්ලන දැන්වීම් තහඩු ද සිනිමාහල්වල දී දක්වන ලදි. එන්නත් ව්‍යාපාරය සාර්ථක කර ගැනීම සඳහා අධ්‍යාපන සහ ආදායම් බලධාරීන්ගේ සහාය ද පතන ලදි. වැඩ කෙරී ගෙන යන අන්දම සහ ව්‍යාපාරයේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙලෙහි වෙනස් කිරීම් පිළිබඳව, වෛද්‍ය නිලධාරීන්ට සහ අනෙකුත් මහජන සෞඛ්‍ය කාර්ය-මණ්ඩලවලට වරින්වර දැනුම් දෙන ලදි. මුවෙන් ගන්නා එන්නත් බෙහෙත් වඩි තුන සති 4 සිට 8 දක්වා කාලසීමාවක් අතරට ඇතුව දීමෙන්, වයස අවුරුදු 5න් පහළ ළමුන් ප්‍රතිශක්ති කරණයෙහි පිහිටුවාලීමේ අවශ්‍යතාවය ගැන විශේෂ අවධාරණය දක්වන ලදි. වයස අවුරුදු 5න් පහළ ජනගහනය මෙතෙකැයි තක්සේරු වී ඇති සංඛ්‍යාවෙන් සියයට 80ක් වත් ප්‍රතිශක්ති කරණයෙහි පිහිටුවා ලීමට සෑම උත්සාහයක් ම දරන ලදි.

ප්‍රතිශක්ති කරණ වැඩ සටහන කලින් කලට සමාලෝචනය කරන ලද අතර, ලැබූ අත්දැකීම් උපයෝගි කොට ගෙන එය වැඩි දියුණු කරන ලදි. ව්‍යාපාරයේ ආරම්භයේ දී එහි වැඩට යොදනු ලැබුවෝ වෛද්‍ය නිලධාරීහු පමණකි. එසේ ද වුවත්, ව්‍යාපාරය ව්‍යාප්ත කිරීමේ අටියෙන් මීට ඇපෝතිකරිවරුන්ගේ සේවය ද ලබා ගන්ට යෙදුණ අතර, මේ වැඩ කටයුතුවල සැලකිලිමත් වන ලෙස මහජන සෞඛ්‍ය හෙදියන්ට සහ මහජන සෞඛ්‍ය වින්නඹුවන්ට ද නියම විය. සියළුම වර්ගවලට අයත් වෛද්‍ය ආයතන එනම් රෝහල්, මැදි බෙහෙත්හල, ශාඛා බෙහෙත්හල්, සහ සෞඛ්‍ය ආයතන ප්‍රතිශක්ති කරණ මධ්‍යස්ථාන ලෙස පාවිච්චි කරන ලදි.

අවුරුදු පතා සිරිත් පරිදි කෙරෙන කටයුත්තක් වශයෙන් මෙලොව එළිය දකින ළමුන් ප්‍රතිශක්ති කරණයෙහි පිහිටුවාලීමට අදහස් කරනු ලැබේ.

සූකිරි විලාසයෙන් යුත් එන්නත් බෙහෙත් වඩි 6,00,000ක් සෝවියට් දේශයෙන් පරිභෝග කරන ලදි. තවද, එක්සත් රාජධානියෙන් වඩි 50,000 ක් ද, ඇමෙරිකා එක්සත් ජනපදයෙන් වඩි 100,000 ක් ද, කැනේඩියානු රජයෙන් වඩි 50,000ක් ද, සපයන ලදි. එන්නත් බෙහෙත් මිලදී ගැනීම සඳහා අවශ්‍ය මුදල් රජය විසින් වහාම නිකුත් කරන ලදි.

ප්‍රතිශක්ති කරණය ලැබූවන් අතර, උණ, බිබිලි සහ පාවනය වැනි සුළු රෝගාබාධ ඇති විය. ප්‍රතිශක්ති කරණය ලැබූ ළමුන් අතර ද, රෝගය හට ගෙන ඇත. ඔවුන් බොහෝ දෙනා රෝගීන් බව දැන ගෙන ඇත්තේ රෝග බීජ පිපිරී යන අවස්ථාවේ දී ය. 1961 සැප්තැම්බර්යේ දී මුඛ මාර්ගික එන්නත් වඩි (සෝවියට්) 25,000 කිට්ටු ප්‍රමාණයක් දෙන ලද කළුතර පුරෝගාමී අරමුණ පෙදෙසේ රෝගීන් කිසිවෙකුත් ගැන වාර්තා නොවී ය.

මෙම ප්‍රතිශක්ති කරණී වැඩ සටහන, ලංකාවේ ක්‍රියාත්මක කරන ලද විශාලතම වැඩ සටහන්වලින් එකකි. වයස මාස 3 සිට අවුරුදු 5 දක්වා සහ 6 සහ 15 දක්වා වූ වයස් ගණවල ළමුන් 21,90,084 ක් පමණ මෙතෙක් ප්‍රතිශක්ති කරණයේ පිහිටුවා ඇත.

වසංගතය මැඩ පැවැත්වීමෙහි ලා ජගත් සෞඛ්‍ය සංවිධානය ද සහාය වූවා ය. එයින් සැපයුන දේ මෙසේය:—

(අ) තද බල ශ්වසන අතුරු ආබාධ ඉසිලීම පිළිබඳව උපදෙස් දීමට කෙටි කාලීන උපදේශකයෙකු,

(ආ) බාල පක්ෂඝාත රෝගීන් පුනරුත්ථාපනය කිරීම පිළිබඳව විශේෂඥතාවයක් ලබාගත් කායික චිකිත්සකයෙකුගේ සේවය,

(ඉ) බොම්බායේ හැප්කින් ආයතනයේ සහ සිංගප්පූරුවේ විශ්ව විද්‍යාලයේ රුකුල් ඇතුව "වයිරස්" විද්‍යානුකූල අධ්‍යයන.

රෝග බිය කඩා වැදීමට හේතුව 1 වන වර්ගයට අයත් බාලක පක්ෂඝාත විෂබීජ බව, වයිරස් විද්‍යාත්මක පරීක්ෂණවල දී හෙළි විය. යාපනෙන් එවන ලද නිදර්ශක වලින් ද මෙය දක්විණ.

(ඉ) සන්නිපාත (ටයිපොයිඩ්) උණ

සන්නිපාත උණ කඩා වැදීම් ගැන වාර්තා නොවූවත්, බොහෝ ප්‍රදේශවලින් රෝගීන් ගැන වාර්තා විය. රෝගීන් 2,875 දෙනෙකුට රෝහල්වලින් ප්‍රතිකාර කරන ලද අතර, රෝගීන් 1,602 දෙනෙක් ගැන දැනුම් දී තිබුණි. රෝගීන් ගැන දැන්වීමේ ක්‍රමය වැඩි දියුණු කරලීම උදෙසා දෙපාර්තමේන්තුව කොතෙකුත් උත්සාහ ගන්නේ වී නමුත්, අඩුවෙන් දැනුම් දීම තවමත් පවතී. සන්නිපාත උණ ප්‍රදේශ වශයෙන් මුල් බැසගෙන තිබෙන ආකාරය ගැන කරුණු උගෙනීමේ ප්‍රයත්නයක දී, රත්නපුර සහ මාතර සෞ. සේ. අධිකාරී කොට්ඨාශවලට අයත් ඇතැම් පෙදෙස් තුළ රෝගය බහුල ලෙස හටගත් බව හෙළි විය. සන්නිපාත උණ පමණක් නොව දිගට ම අල්ලා සිටින සුළු උණ සම්බන්ධයෙන් ද එය එසේ ම විය. මෙකී ගැටළු සම්බන්ධව විශේෂ විමර්ශන පවත්වා ගෙන යනු ලැබේ. සන්නිපාත උණ සහ දිගට ම අල්ලා සිටින සුළු උණ පිළිබඳව දැනුම් දීම්, මෙම වර්ෂයේ දී 3,169 ක් විය.

ප්‍රාදේශිය සම්ේලන වලදී, සන්නිපාත උණ මැඩ පැවැත්වීමේ ගැටළුව ගැන අවධාරණයෙන් යුතුව සාකච්ඡා කරන ලද අතර, වසංගත රෝග විද්‍යා ඒකකය විසින් වරින් වර ක්ෂේත්‍ර සේවක පිරිසට විශෙෂ ගුරුහරුකම් නිකුත් කරන ලදි.

(ඊ) බෝවෙන යකෘත්දාහය

බෝවෙන සුළු යකෘත්දාහය නම් රෝගය හටගැනීම වැඩි වූ බවක් පෙනෙන්ට තිබෙන අතර, රෝගීන් 1,627 දෙනෙකු ගැන වාර්තා විය. රෝගය හටගැනීමේ වැඩිවීමක් කොළඹ, කුරුණෑගල සහ කෑගල්ල සෞ. සේ. අධිකාරී කොට්ඨාශ තුළ දක්නා ලදී.

2. සංවිධානය

වසංගත රෝග විද්‍යාව පිළිබඳ උසස් උගෙනීමක් ලැබීමට පිටත්ව ගිය සහකාර වසංගත රෝග විද්‍යාඥ තැන, එඩින්බරෝ විශ්ව විද්‍යාලයෙන් මහජන සෞඛ්‍ය ඩිප්ලෝමාව ලබා ගත්තේය. හෙතෙම පසු ව, ජගත් සෞඛ්‍ය සංවිධානය විසින් පාවන රෝග විෂයයෙහි සංවිධානය කරන ලද විශේෂ අභ්‍යාස වැඩ සටහනකට සහභාගි වීම් වස් ඇමෙරිකානු එක්සත් ජනපදය බලා පිටත් ෙිය.

3. වැඩ කටයුතු

වසූරි රෝ බිය හට ගැනීමට අමතරව, දිවයින පුරා ප්‍රතිශක්ති කරණ වැඩ සටහන් සංවිධානය කිරීම, ළමා රෝහල්වල බාලක පක්ෂඝාත රෝගීන්ට ප්‍රතිකාර කිරීමේ විශේෂ වාට්ටු සංවිධානය කිරීම සහ පුනරුත්ථාපන විධි විධාන සහ සෞඛ්‍ය අධ්‍යාපනය සංවිධානය කිරීම ඇතුළු බාලක පක්ෂඝාත රෝග බිය මැඩලීමේ කටයුතුවල දෙපාර්තමේන්තුව මුළු කාලයම යොදා නිරත වූවා ය. ජගත් සෞඛ්‍ය සංවිධානයට අයත් පාවන රෝග පිළිබඳ උපදේශක කණ්ඩායම හා සමතැන් දරන ජාතික ප්‍රතිරූපකයා වන වසංගත රෝග විද්‍යාඥ තැන පාවන රෝග සමීක්ෂණවලට සහභාගි විය.

(අ) ජ. සෞ. සං. පාවන රෝග උපදේශක කණ්ඩායම

වසංගත රෝග විද්‍යාඥයෙකුගෙන්, සාක විද්‍යාඥයෙකුගෙන්, පරපෝෂිත විද්‍යාඥයෙකුගෙන් සහ සංඛ්‍යා-ලේඛනඥයෙකුගෙන් සමන්විත මෙම කණ්ඩායම, නිර්දිෂ්ට පෙදෙස්වල පාවන රෝග පිළිබඳ ගැටළු උගෙනීම පිණිස 1962 මාර්තු මාසයේ දී දිවයිනට පා තැබූහ. එඩින්බරෝ විශ්ව විද්‍යාලයේ සාක විද්‍යා පිළිබඳ මහාචාර්ය කෙනෙකු වන මාහාචාර්ය ඊ. කෘක්සන්ක් මහතා, කරුණු හැදෑරීම පිණිස පෙදෙස් තෝරා ගැනීමෙහි ලා මෙම කණ්ඩායමට සහාය විය. දෙපාර්තමේන්තුවේ වසංගත රෝග විද්‍යාඥයා ජාතික ප්‍රතිරූපකයා ලෙස ඉදිරිපත් වූ අතර, වෛද්‍ය

පර්යේෂණායතනයේ නියුක්ත පෝෂණය පිළිබඳ වෛද්‍ය නිලධාරී තැන විසින් පෝෂණය පිළිබඳ සමීක්ෂණය ගෙන යන ලදි. ජාඇල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වසම තුළ පිහිටි හොරපේ නම් ගමත්, කෝට්ටේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වසම තුළ පිහිටි ඔබේසේකර පුරයත්, සමීක්ෂණය සඳහා තෝරා ගනු ලැබිය. තතු හැදෑරීමට මෙම පෙදෙස් තෝරා ගැනීමේ දී මතු සඳහන් කරුණු ගැන සලකා ලබන ලදි.

(i) සේවක-සේවිකාවන්, ඇති නැති බව.

(ii) මහ රෝහලකට සහ වෛද්‍ය පර්යේෂණ ආයතනයට කිට්ටුව නිබීම.

සමීක්ෂණය මේ අංගවලින් සමන්විත විය :—

(i) පරිසරයේ සනීපාරක්ෂාව පිළිබඳ සමීක්ෂණය.

(ii) සාක විද්‍යාත්මක සමීක්ෂණය.

(iii) පෝෂණය පිළිබඳ සමීක්ෂණය.

(iv) පරාපෝෂිත විද්‍යාත්මක සමීක්ෂණය.

(v) සංඛ්‍යා-ලේඛන සමීක්ෂණය—පාවන රෝග පැවැති තරම සහ ඉන් මිය ගිය ප්‍රමාණය.

සමීක්ෂණ සැප්තැම්බර් අවසානය වන විට නිමාවට පත්විය. සාක විද්‍යාත්මක සහ පරපෝෂිත විද්‍යාත්මක කටයුතු වලදී, වෛද්‍ය පර්යේෂණ ආයතනයෙන් සැලසුණ පහසුකම් ප්‍රයෝජනයට ගන්නා ලදි.

මෙම සමීක්ෂණයේ වාර්තාව, මෙම රෝග පිළිබඳ ව ක්‍රියා කිරීමේ දී මහෝපකාරී වනවා ඇත. මෙම අරමුණ දිගට ම ගෙන යාමක් වශයෙන්, රාගම මහ රෝහලේ සහ අංගොඩ උණ රෝහලේ පාවන රෝගවලට ප්‍රතිකාර කිරීමේ විශේෂ ආතුරාල හෙවත් වාට්ටු විවෘත කරන ලදි. කොළඹ ළමා රෝහලේ ද ඇඳන් කිහිපයක් මේ සඳහා විවෘත කරන ලදි. මතු සඳහන් අංග සැපයීමෙන් හොරපේ ගමෙහි සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා වැඩ සටහනක් සකස් කරනු ලැබී ය.

(i) නල මගින් ජලය සැපයීම.

(ii) වැඩිහිටියන්ට වැසිකිළි.

(iii) පාසැල් යාමට පෙර වයසේ ළමුන්ට වැසිකිළි.

කෝට්ටේ ඔබේසේකර පුරය සහ හොරපේ යන දෙ පෙදෙසේ, සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහනක් ද ක්‍රියාවේ යොදවනු ඇත. කොළඹ සෞ. සේ. අධිකාරි ගේ සහ ඒ ඒ වසම් වල සෞ. වෛ. නිලධාරීන් ගේ සහාය ඇතුව මෙම වැඩ කටයුතු සංවිධානය කිරීම, වසංගත රෝග විද්‍යා ඒකකයේ වගකීමක් වනු ඇත. යෝජනා ක්‍රමයට යටත් වූ පෙදෙස්, දිවයිනේ මහජන සෞඛ්‍ය සේවකයින් උදෙසා ප්‍රදර්ශක පෙදෙස් වනවා ඇත.

බෝවෙන සුළු රෝග පිළිබඳ උපදේශක කමිටුව, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ගේ ප්‍රධානත්වයෙන් වසිය තුළදී එක් වරක් රැස් වූවා ය.

තුන් වැදෑරුම් එන්නත මගින් ප්‍රතිශක්ති කරණය සැලසීමේ වැඩ සටහන ක්‍රියාවේ යෙදවීමේදී මතු වන ගැටළු පිළිබඳව තතු හැදෑරීම සඳහා පානදුර සෞඛ්‍ය ඒකකය විසින් අරඹන ලද නියමු යෝජනා ක්‍රමය පානදුරේදී දිගටම ගෙන යන ලද මුත් බාලක පක්ෂාඝාත රෝගය කඩා වැදීම හේතු කොට ගෙන එම කාර්ය අතර මගදී අත්හිටවීමට සිදුවිය.

(ආ) වසූරිය වැළැක්වීමේ එන්නත් කිරීම

වසූරි රෝ බිය හටගත් අවස්ථා තුන හේතු කොට ගෙන, රෝ බිය පැවැති පෙදෙස් වල පමණක් නොව යා බඳ පෙදෙස්වල ද එන්නත් කිරීමේ වැඩ සටහන ව්‍යාප්ත

කරන ලදී. බොහෝ පෙදෙස්වලදී විශාල සමූහයක් එන්නත් කිරීම භාර ගන්නා ලදී. එන්නත් කරනු ලැබූ ගණන මෙසේය :—

පළමු එන්නත	...	...	3,75,599
දෙවන එන්නත	...	...	18,56,130

එන්නත් කිරීම පිළිබඳ ඇතිවන සංකූල හෙවත් පැටලුම් ගැනද තතු හැදෑරීමක් මෙහෙයවන ලදී.

(ඉ) **සන්නිපාත උණෙන් වැළැක්වීමට බෙහෙත් විදීම**

කරන ලද බෙහෙත් විදීම් සංඛ්‍යාව මෙසේය :—

පළමු වඩිය	...	...	1,37,178
දෙවන වඩිය	...	...	1,05,969
ආරක්ෂක වඩිය	...	...	1,08,672

සන්නිපාත උණෙන් වැළැකීමේ බෙහෙත් විදීමෙහි ලා, මහ ජන සෞඛ්‍ය පරීක්ෂක වරුන් ද සහාය වීම හේතු කොට ගෙන, ප්‍රතිශක්ති කරණය වැඩි වැඩියෙන් කිරීමට පුළුවන් කම ලැබුණි. බාලක පක්ෂඝාත ප්‍රතිශක්ති කරණයේ වැඩ සටහන ක්‍රියාවේ යෙදී පැවැති අවස්ථාවේදී, මෙම කාර්යය අත්හිටුවා දමන ලදී.

(ඊ) **සුව කිරීම — අංගොඩ උණ රෝහල**

උණ රෝහලේ වැඩ කටයුතු විශාල වශයෙන් ප්‍රතිසංවිධානය කරන ලද නමුත්, වසූරිය රෝ බිය හට ගැනීම් තුන හේතු කොට ගෙන, අවාසනාවකට මෙන් අවුරුද්ද තුළදී උණ රෝහලට කායෂී බහුල විය. වසූරිය රෝගීන් තෝරා බේරා ගෙන ඔවුන්ට ප්‍රතිකාර කිරීමෙහි ලා වසංගත රෝග විද්‍යාත්මක ඒකකය උණ රෝහල සමග එකමුතු ව කටයුතු කෙළේය. අධ්‍යයන නිවාඩු පිට එක්සත් රාජධානියේ ඕපි වෛද්‍ය නිලධාරී තැන ලිවර්පූල් විශ්ව විද්‍යාලයේ ඩී. පී. එච්. උපාධිය ලබා ගත්තේය. ඔහු දැනට උණ රෝග විෂයයෙහි එම්. ආර්. සී. පී. සඳහා පාඨ මාර්ගයක් හදාරමින් එඩින්බරෝ හි සිටියි. රෝහලේ තනවනු ලබන විද්‍යාගාරය දැනට නිම වීමට ආසන්න ය.

4. **රසායනාගාරය**

සියලු වසූරි රෝගීන්ගෙන් සහ වසූරිය යැයි සැක කටයුතු රෝගීන්ගෙන් ගනු ලැබූ නිදර්ශක පිළිබඳව වඩිරස් විද්‍යාත්මක පරීක්ෂණ පවත්වන ලදී. "සැල්මොනැල්ලා ටයිපි" විෂයයෙහි කරන ලද බැක්ටීරියා පේග් ටයිපින්, වැඩි දුරටත් විමර්ශනය කොට බැලීම සඳහා රෝගීන් පිළිබඳව දිගටම ක්‍රියා කිරීම පිණිස, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සහ සෞඛ්‍ය කාර්යාලයාධිපතීන් වෙත දන්වා යවන ලදී.

බාලක පක්ෂඝාත රෝගීන්ගෙන් ගනු ලැබූ, මල නිදර්ශක, වඩිරස් විද්‍යාත්මක පරීක්ෂණ පිණිස බොම්බායේ හැප්කින් ආයතනයට සහ සිංගප්පූරුවේ බාලක පක්ෂඝාත මධ්‍යස්ථානය වෙත යවන ලදී. යවන ලද නිදර්ශක වැඩි හරියක්ම 1 වර්ගයට අයත් විය.

අංගොඩ උණ රෝහලේ තනවන ලද විද්‍යාගාරය මුළුමනින්ම පාහේ නිමාවට පත්ව ඇති අතර, එම ගොඩනැගිල්ල 1963 දී පාවිච්චියට ගනු ලබනු ඇත.

5. **බෝවිය හැකි සුළු රෝග කඩා වැදීම**

කිය යුතු තරම් රෝ බිය කඩා වැදීමක් නොවී ය.

6. විශේෂ අධ්‍යයන, සමීක්ෂණ සහ පර්යේෂණ

ගලපටලය, කක්කල් කැස්ස සහ පිටගැස්ම යන තුන් රෝගයෙන් වැළැකීමේ තුන් වැදෑරුම් එන්නත ගැන ජනයා කෙතරම් උනන්දු වේදැයි දැන ගැනීම සඳහා පානදුර සෞඛ්‍ය ඒකකයේ මෙහෙයවන ලද නියමු යෝජනා ක්‍රමය දිගටම කරගෙන යන ලද අතර, බාලක පක්ෂඝාත රෝගය කඩා වැදීම හේතු කොට ගෙන මෙම වැඩ සටහන ද සැහෙන තරම් කඩවී ගියේ ය.

වසූරිය එන්නතෙන් පැන නගින අවුල් පිළිබඳව තතු හැදෑරීම් ද දිගටම කරගෙන යන ලදී.

7. ජාත්‍යන්තර නිරෝධායනය

(අ) පොදුවේ

තලේමන්නාරමේ නව නිරෝධායන කඳවුර සහ රෝහල පිහිටුවීම සඳහා වර්ෂාවසානයේදී නිශ්චිත පියවර ගන්නා ලදී. කඳවුර සඳහා අත්පත් කරගන්නා ලද අක්කර හයේ ඉඩමෙහි ගොඩනැගිලි තැනවීම ඇරඹිණ. මන්ඩපම් කඳවුරේ දේපළ වල වටිනාකම ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන මැනවින් ගණන් බලා එම දේපළ වල වටිනාකම පිළිබඳ සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කළේය. ලබන අවුරුද්ද මුල හරියේදී මණ්ඩපම් කඳවුර ඉන්දියානු ආංඩුවට විකුණා දමා තලේමන්නාරමෙහි නව කඳවුරක් පිහිටුවීමට හැකි වනු ඇතැයි බලාපොරොත්තු වනු ලැබේ.

නීති විරෝධී ලෙස මෙරටට රිංගාගත් අය 1,923 දෙනෙක් අල්ලා ගනු ලැබූහ. පසුගිය දෙවෂියේ අල්ලා ගනු ලැබූ සංඛ්‍යා හා සසඳා බලන කල මේ අවුරුද්දේ සංඛ්‍යාව කැපී පෙනෙන අන්දමට පහළ බැස තිබෙන බව පෙනේ.

(ආ) වැඩ කටයුතු

(1) කොළඹ නැව් තොටේ නැව් ගමනා ගමනය

යාත්‍රා 3,124 කට පිටත්ව යාමේ අවසර පත්‍ර දෙනු ලැබිය. මෙයින් 2,014 ක් තෙල් බලෙන් සහ වාෂ්ප බලෙන් යාත්‍රා කරන ඒවා වූ අතර, 1,110 ක් රුවල් යාත්‍රා සහ අනෙකුත් යාත්‍රා විය. මීට අමතරව වෛද්‍ය නිලධාරීන් රැගත් 40 කට ගුවන් විදුලි සංඥා මගින් අවසර දෙන ලදී. මගින් 20,401 දෙනෙක් සෝදිසිය යටතේ තබන ලදහ. මෙයින් 724 දෙනෙක් නියමිත දිනයන්හි පැමිණීමට අපොහොසත් වූහ. මෙම යුතුකම පැහැර හැරියවුන් බොහෝ දෙනෙකු සොයා ගත හැකි විය. ඔවුන්ගෙන් ඇතැමෙකුට නියම කරන ලද දඩ මුදල් රු. 22.50 ක් දක්වා විය.

වසූරියෙන් වැළැකීමේ එන්නත් 7,677 ක්ද, කොලරා වෙන් වැළැකීමේ එන්නත් 6,202 ක්ද, උණ සන්නිපාතයෙන් වැළැකීමේ එන්නත් 90 ක්ද, කහ උණෙන් වැළැකීමේ එන්නත් 510 ක්ද, විදින ලදී. මේ මගින් උපයාගනු ලැබූ ආදායම රු. 30,385.50 ක් විය.

අපිරිසිදු රෙදි සහ ජල නල විෂ බීජ භංග කිරීමේ ගාස්තු වශයෙන් රු. 4,168 ක ආදායමක් එකතු කර ගනු ලැබිය.

පාරු පඩවු 22 කට අයත් දිය බෝට්ටු 66 ක් වර්ෂය තුළදී පරීක්ෂා කරන ලදී. නිකුත් කරන ලද ත්‍රෛමාසික සහතිකවලින් රු. 55.50 ක් උපයා ගන්නා ලදි. දිය බෝට්ටුවලින් සහ ජලකර වලින් කල පරීක්ෂා කිරීම් කරගෙන යන ලදී.

මියන් වද කිරීමේ කටයුතු යළිත් වරක් කොළඹ නගර සභාව විසින් බාර ගන්නා ලදී. කෙසේ වුවත්, කොළඹ නගර සභාවේ මියන් වද කිරීමේ වැඩ සටහන දිගු කිරීමක් පමණකි, මෙය. එහෙත්, මහාමාරිය මුල් බැසගෙන තිබෙන රටවල් හා නිතර ආශ්‍රය කරන වරාය වැනි ස්ථානයක අවශ්‍යතාවයන් ඉටු කිරීමට මෙය ප්‍රමාණවත් නොවේ. වර්ෂය තුළදී නැව්වලට ගොස් දුම් අල්ලන ලද නැව් බඩු, සහල් ගෝනි 57,20,022 කින්ද අනෙකුත් වෙළෙඳ බඩු ගෝනි 1,38,330 කින්ද යුක්ත වූයේය.

එපමණක් නොව, සහල් ගෝනි 3,12,768 ක්ද අනෙකුත් වෙළෙඳ බඩු ගෝනි 4,94,954 ක්ද කපු මිටි 98 ක්ද බත්තල්වලදී දුම් ගැසිල්ලට භාජන විය. මේ කටයුතු සඳහා පාවිච්චි කරන ලද එච්සිඑන් ගෑස් මුළු ප්‍රමාණය හොණ්ඩර 8576/3/8 ක් බර විය. නැව් බඩු දුම් ඇල්ලීමෙන් උපයාගත් ආදායම රු. 2,46,277.03 ක් විය.

මියන් වද කළ බවට දෙන ලද සහතික අළුත් කිරීම අරබයා යාත්‍රා 113 ක් පරීක්ෂා කොට බලන ලද අතර, මියන් වද කිරීමෙන් නිදහස් කිරීමේ සහතික 74 ක් නිකුත් කරන ලදී.

වරාය ප්‍රදේශයේ සනීපාරක්ෂාව ගැන වගකීමට තනි බලධාරියෙකු නොමැති වීම සෞඛ්‍ය කටයුතුවලට අවහිරයක් වී තිබේ. වරාය කොමිෂන් සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක තැන මෙම කාර්‍යයෙහි නිරත වූ අතර, මහජන සෞඛ්‍ය නිලධාරීහු කලින් කලට පරීක්ෂණ පැවැත් වූහ.

කම්කරුවන් දෙදෙනෙකු ගේ සහ කිට විද්‍යා සහායකයෙකු ගේ සහාය ඇතිව වරාය කොමිෂන් සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක තැන විසින් මදුරුවන් වද කිරීමේ කටයුතු ඉටු කරන ලදී. ඊඩිස් සමීක්ෂණ ද මෙහෙය විණ. මෙම කාර්‍යය සඳහා වරාය පෙදෙස කට්ටි 26 කට බෙදන ලදී. වට 12 කදී පරීක්ෂා කරන ලද මුළු ගොඩනැගිලි සංඛ්‍යාව 3,840 කි. මෙයින් 329 ක්, එනම් සියයට 8.6 ක් මදුරුවන් ගෙන් ගහණ බව දැනිණ. එකතු කර ගන්නා ලද මදුරුවන් 1,782 මතු සඳහන් වර්ග වලට වැටෙයි :—

වර්ගය		එකතුවූ ගණන		සියයට ගණන
ඒ.(එස්)ඊජිප්තායි ...	...	461	...	25.8
ඒ.(එස්)ඇල්බොපික්ටස්	...	6	...	4.0
සී. පැටිගන්ස් ...	...	1,282	...	71.9
අනෙක් ...	...	33	...	1.9

කපා බලන ලද සී. පැටිගන්ස් 278 ක ගෙන් 9 ක් බරවා සඳහා නියත බව සොයා ගන්නා ලදී. බෝවීමේ ප්‍රමාණය 3.2 කි. නියත වශයෙන්ම බෝවෙන ස්ථාන වලින් පිළවුන් 1,532 ක් එකතු කර ගනු ලැබිය. එය මතු සඳහන් වර්ගවලට අයත් වෙයි.

වර්ගය		එකතුවූ ගණන		සියයට ගණන
ඒ(එස්)ඊජිප්තායි ...	...	674	...	44.2
ඒ(එස්)ඇල්බොපික්ටස්	...	237	...	15.6
සී. පැටිගන්ස් ...	...	564	...	27.0
අනෙක් ...	...	48	...	3.2

බත්තල් 238 ක් සහ ටග් බෝට්ටු 9ක් පරීක්ෂා කිරීමේදී මදුරුවන් 387ක් අල්ලා ගනු ලැබූහ. ප්‍රතිඵල මෙසේය :—

ඒ(එස්) ඊජිප්තායි	...	...	342
සී. පැටිගන්ස්	...	...	45
අනෙක් වර්ග	...	...	නැත

පාවෙන යාත්‍රාවල බෝවෙන ස්ථාන 788 ක් පරීක්ෂා කරන ලදී. එයින් 9ක් නියත වූ අතර පිළවුන් 50 ක් අල්ලා ගන්නා ලදී. මෙයින් 17 ක් ඒ (එස්) ඊජිප්තායි වර්ගයට ද 29 ක් සී පැටිගන්ස් වර්ගයටද 4 ක් ඒ (එස්) ඇල්බොපික්ටස් වර්ගයට ද අයත් වූහ.

(ii) අනෙක් නොටුපලවල්

තිරිකුණාමලය, ගාල්ල, තලේමන්නාරම, සහ කයිට්ස් නැව් තොට වලදී යාත්‍රා 742 කට නික්ම යාමේ අවසර පත් දෙන ලදී. සුළු තොටපළවල යාත්‍රාවලට ද නික්ම යා මේ අවසර පත් දෙන ලදී.

(iii) මණ්ඩපම් කඳවුර

දුම් නැව්වල සේවකයින් 3,892 දෙනෙක් ඇතුළු මගින් 28,626 දෙනෙකුට ලංකාවට තරණය කිරීමට වෂීය තුළදී අවසර දෙන ලදී. පසුගිය අවුරුද්දේ මෙම සංඛ්‍යාව 27,443 ක් විය. ලාදුරු රෝගය නිසා ප්‍රතික්ෂෙප කරන ලද මගින් දෙදෙනෙක් වූහ. බඩු පොදි 7,497 ක මුළු ගණනක විෂ බීජ තොර කරන ලද අතර, මගින් 905 දෙනෙක් එන්නත් කරනු ලැබූහ. එයින් 74 දෙනෙකුට දෙන ලද්දේ පළමු එන්නත්ය. කඳවුරේ සනීපාරක්ෂාව පවත්වා ගනු ලැබිය. රෝගීහු බිහි දෙර බෙහෙත් හල්වලට 6,218 ගමණක් පැමිණියහ. කඳවුරු පාසැලේ ළමුන් 121 දෙනෙක් ඇතුළත් වී සිටියහ.

(iv) ගුවන් නොටුපොළ සෞඛ්‍ය සේවය

රත්මලාන.—සනීපාරක්ෂාව ඉතාමත් සතුටුදායක අඩියක තබා ගන්නා ලදී. බෙදා හැරීමට පෙර සවයංකාරීව ක්ලෝරීන්වලින් පවිත්‍ර වන නල මගින් සැපයෙන ජලය ප්‍රමාණවත් විය. ඊඩිස් ඊජිප්තායි මර්දනය කිරීමේ විධි විධාන සතුටුදායක ලෙස ක්‍රියාවේ යොදවන ලදී.

කටුනායක.—සලසන ලද සනීපාරක්ෂක පහසුකම් හොඳටම ප්‍රමාණවත් විය. සියළුම ගොඩනැගිලි වලට නවීන පන්නයේ උපකරණ, නල මගින් එන ජලය සහ ජල ප්‍රවාහනය සහිත වැසිකිළි සපයන ලදී. ජාත්‍යන්තර රීති ප්‍රකාර ඊඩිස් ඊජිප්තායි සාර්ථක ලෙස මර්දනය කිරීමේ විධිවිධාන මෙහෙයවන ලදී.

කංකසන්තුරේ.—ගුවන් තොටු පොළේ වැඩ සතුටුදායක ලෙස ඉටු විය.

8. සත්ව රෝග සහ පිස්සු බලු රෝග මර්දනය

බස්නාහිර පළාතේ පිස්සු බලු රෝගය මුලිනුපුටා දැමීමේ වැඩ සටහනට අයත් කාරියක් වශයෙන්, කොළොන්නාව සහ මොරටුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශ වලත් කිරිදිවැ ු සෞඛ්‍ය වසමේත් මහජන සෞඛ්‍ය පරීක්ෂක වරුන් උදෙසා, බල්ලන්ට බෙහෙත් විදීම කර පෙන්වීමේ පඬුකති කිහිපයක් පවත්වන ලදී.

පිස්සු බලු රෝගය සඳහා වෛද්‍ය පර්යේෂණ ආයතනය විසින් මොල 929 ක් පරීක්ෂා කොට බලන්ට යෙදුණ අතර, එයින් 619 ක් රෝග බීජ සහිත බවද 207 ක් රෝග බීජ රහිත බවද ඉතුරු 103 පරීක්ෂණයට සුදුසු නත්තවයක නොවූ බවද සොයා ගන්නා ලදී. වැඩි විස්තර xxxi වන සටහනෙහි දැක්වෙයි. වසු පැටියන්, බළලුන් දෙනුන් සහ නරියන් වැනි අනෙකුත් සතුන්ට ද රෝගය බෝවී තිබෙන බව පෙනේ.

පිස්සු බලු රෝගයෙන් වැළැකීම පිණිස බල්ලන් 15,549ක් එන්නත් කරන ලද අතර, බල්ලන් 12,785ක් විනාශ කරන ලදී. මිනිසුන් 2,513ක මුළු ගණනක්, පශ්චාත්-නිරාවරණ පිස්සු බලු රෝග ප්‍රතිකාරය ලැබූහ. සෞ. සේ. අධිකාරී කොට්ඨාශ යටතේ සංඛ්‍යා 2 වන සටහනෙන් දැක්වේ. දනට ලැබී ඇති සංඛ්‍යා අනුව බලන කල, ප්‍රතිකාර ලැබූ වැඩිම සංඛ්‍යාව ලැබී ඇත්තේ බදුල්ල මඩකලපුව සහ මාතලේ ප්‍රදේශවලිනි. වැඩි විස්තර xxxii වන සටහනේ පෙන්වයි.

(අ) මස් පරීක්ෂා කිරීමේ පාඨ මාර්ග

බදුල්ල සහ නුවර එළිය දිස්ත්‍රික්කවල මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් උදෙසා මස් පරීක්ෂා කිරීමේ අභ්‍යාස පාඨ මාර්ග බණ්ඩාරවෙල දී පවත්වන ලදී. අභ්‍යාසය ලබන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ට ද මහජන සෞඛ්‍ය ශිෂ්‍යයින්ට ද කළුතර දී මස් පරීක්ෂා කිරීම පිළිබඳව ප්‍රදර්ශනාත්මක දේශනා පවත්වන ලදී.

(ආ) ජ. සෞ. සං. උපදේශක

මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය සේවය පිළිබඳ ජ. සෞ. සං. උපදේශක වෛද්‍යාචාර්ය ඩොනල්ඩ් ජේ. ඩින් මහතා 62.2.9 වන දා සිට සති 6ක කාලයක් ඒ්කකයේ සේවය කළේ ය.

(ඉ) ජ. සෞ. සං. අධි. ශිෂ්‍යත්වය

මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය නිලධාරී වෛද්‍යාචාර්ය පී. සී. සී. රත්නතුංග මහතා, එක්සත් ජනපදයේ පශ්චාත් උපාධි උගෙනීම දිගටම ලබා ගැනීම සඳහා ජ. සෞ. සංවිධාන අධි ශිෂ්‍යත්වයක් පිට 62.8.3 වන දා දිවයිනෙන් නික්ම ගියේ ය.

VI වැනි පරිවෙජදය

විශේෂ සේවා

(අ) ක්ෂය රෝග මර්දනය

1. ග්ලානාය

මුදල් වර්ෂය තුළ දී ක්ෂය රෝග මර්දන ව්‍යාපාරයේ අධිකාරිවරයා වෙත රෝගීන් 9,786 දෙනෙකු ගැන වාර්තා වූ අතර ඔවුන්ගෙන් 8,851 දෙනෙක් ප්‍රධාන ක්ෂය රෝග ලේඛනයට ඇතුළත් කරන ලදී. ලේඛනාරූඪ කරන ලද රෝගීන්ගෙන් සියයට 88 දෙනෙක් පුප්ඵුසීය ක්ෂය රෝගීන් වූහ. බස්නාහිර පළාතේ ලියා පදිංචි වූ රෝගීන්ගේ ගණන 3,990 දෙනෙක් වූ අතර මෙම සංඛ්‍යාව මුළු රෝගීන්ගේ ගණනින් සියයට 45ක් වේ. වෙනත් පළාත්වලින් ලියා පදිංචි වී ඇති රෝගීන්ගේ සංඛ්‍යාව මෙසේ ය: දකුණු 1,102, මධ්‍යම 993, සබරගමු 751, වයඹ 664, නැගෙනහිර 504, උතුරු 500, උතුරු මධ්‍යම 197, ඌව 150; ඇතැම් පළාත්වල, විශේෂයෙන් ඌව පළාතේ, රෝගීන්ගේ සංඛ්‍යාවෙන් එම පළාතේ සිටින ක්ෂය රෝගීන්ගේ අනුපාතය පිළිබිඹු නො කෙරේ. මෙසේ අඩුවීමට හේතුවී තිබෙන්නේ එම පළාත්වල රෝගීන් සොයා ගැනීමේ පහසුකම් අඩු වීමේ හේතුවෙනි. කොළඹ නගර සීමාවතුළත් සොයා ගනු ලැබූ රෝගීන්ගේ සංඛ්‍යාව තවමත් අධිකව පවතී. සමාලෝචනයට භාජනවූ කාල සීමාව තුළ දී රෝගීන් 1,382ක් එනම්, සියයට 15.6ක් කොළඹ නගර සීමාව තුළ දී ලියා පදිංචි වී ඇත.

මෙම කාලසීමාව තුළ දී රෝගීන් සොයා ගැනීමේ අනුපාතය ජනගහනයෙන් 10,000 කට 8.7 විය. ලියා පදිංචි වූ රෝගීන්ගෙන් සියයට 61.5ක් පිරිමින් වූ අතර ඔවුන්ගෙන් සියයට 81ක් අවුරුදු 25ට වැඩි වයස් අය වූහ. එහෙත් ඔවුන්ගෙන් වැඩි පිරිස අවුරුදු 25ටත් අතර වයස් සීමාවට අයත් වූහ. අවුරුදු 5–14ටත් අතර වයස් සීමාවට (අනිවාර්‍ය පාසැල් වයසට) අයත් වූවන්ගේ සංඛ්‍යාව 526ක් වූ අතර එය ලියා පදිංචි වූ මුළු රෝගීන්ගේ සංඛ්‍යාවෙන් සියයට 6.9කි.

1962 ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මස දක්වා කාලය තුළ දී පහත දැක්වෙන හේතු නිසා 698 දෙනෙකුගේ නම් ප්‍රධාන ලේඛනයෙන් කපා හරින ලදී. මිය යාමෙන් (333), දෙවරක් ලියා පදිංචිවීමෙන් (224), රෝග විනිශ්චය වෙනස් වීමෙන් (19),

පදිංචිය වෙනස් වීමෙන් පළාත් වෙනස් වීමෙන්, සොයාගත නොහැකි වීමෙන්, දිවයින අතහැර යාමෙන් (5); 1962 සැප්තැම්බර් අවසානයට ලේඛන ගතවී සිටින සංඛ්‍යාව 39,874කි.

2. මරණ අනුපාතය

1961 වර්ෂය තුළ දී ක්ෂය රෝගයෙන් (සියලුම වර්ගවලට අයත්) මිය ගිය අයගේ සංඛ්‍යාව 1,523 දෙනෙකි. මෙම සංඛ්‍යාව 1960 වර්ෂය සඳහා වූ සංඛ්‍යාවට වඩා 96 දෙනෙකුගෙන් අඩුවිය. මෙම රෝගීන් අතුරින් 1,230 දෙනෙකු මිය ගොස් ඇත්තේ සඝන ඉන්ද්‍රිය පද්ධතියේ ක්ෂය රෝගයෙනි. 1960 වර්ෂයේ දී ද සඝන ඉන්ද්‍රිය පද්ධතියේ ක්ෂය රෝගයෙන් 1,234 දෙනෙකු මිය ගොස් ඇති බැවින් හැඟී යන්නේ මරණ සංඛ්‍යාව අඩු වී ඇත්තේ පෙනහැල්ලේ ක්ෂය රෝගයෙන් නොපෙළුන අය අතර බව ය.

1960 වර්ෂයේ දී 16.4ක් වූ මරණ අනුපාතය 1961 වර්ෂයේ දී තවදුරටත් පහත බැසීමෙන් එය ජනගහනයෙන් 1,00,000කට 15ක් වී තිබේ.

3. සේවක මණ්ඩලය

සේවයෙහි යොදවා ඇති 1,687 දෙනෙක් වූ සේවක මණ්ඩලය වෛද්‍යවරු 53 දෙනෙකුගෙන්, හෙදියන් 284 දෙනෙකුගෙන් හා උපස්ථායකයන් 433 දෙනෙකුගෙන් සමන්විතය. වර්ෂය තුළ දී වෛද්‍යවරයින් තිදෙනෙක් වැඩිදුර ඉගෙනීම සඳහා පිටරට ගිය අතර ඊට කලින් පිටරට ගිය වෛද්‍යනිලධාරීන් සිව්දෙනෙක් පශ්චාත් උපාධි ලබා පෙරලා පැමිණිය හ.

4. රෝහල්

ක්ෂය රෝගීන් සඳහා වෙන්වී ඇති ඇඳන් 3,600න්, 3,345ක් ළය රෝහල්වල තබා ඇති අතර ඉතිරිවා මහරෝහල්වලට අයත් ක්ෂය රෝග වාට්ටුවල තබා ඇත.

වර්ෂ 1962 සැප්තැම්බර් මස අවසාන වන විට ළය රෝහල්වලින් හා ක්ෂය රෝග වාට්ටුවලින් ප්‍රතිකාර ලත් රෝගීන්ගේ සංඛ්‍යාව 12,541 දෙනෙකි. මෙයින් 613ක් මිය ගියහ, 8,893 දෙනෙක් රෝහල්වලින් පිට කළහ, 3,135 දෙනෙක් ප්‍රතිකාර ලබමින් පසුවූහ. වෛද්‍ය උපදෙස් නොපිළිගෙන රෝහල්වලින් පිට වූවන්ගේ සංඛ්‍යාව 760 දෙනෙකි.

අංගොඩ මානසික රෝහලේ දී ක්ෂයරෝගීන් 438 දෙනෙකුට ප්‍රතිකාර කරන ලද අතර ඔවුන් අතුරින් 39 දෙනෙක් මිය ගියහ. සෞඛ්‍ය තත්ත්වය යහපත් වීම හේතු කොට ගෙන 41 දෙනෙක් රෝහලෙන් පිටකර යවන ලදි. ක්ෂය රෝගය සඳහා ප්‍රතිකාර ලබන රෝගීන් 344 දෙනෙක් තවමත් සිටිති. හැඳල ලාදුරු රෝහලේ සිටින රෝගීන්ගෙන් 25 දෙනෙක් ක්ෂය රෝගය සඳහා ප්‍රතිකාර ලබාගත් අතර ඔවුන්ගෙන් දෙදෙනෙක් මිය ගියහ. රෝගීන් 7 දෙනෙකුගේ සෞඛ්‍ය තත්ත්වය වැඩි දියුණුවිය.

වර්ෂ 1961 දී නේවාසිකව ප්‍රතිකාර ලැබූ රෝගීන් රෝහලේ නැවතී සිටි කාලය දින 83ක් විය. මේ වර්ෂයේ දී එය දින 82 දක්වා පහළ බැස ඇත.

5. චිකිත්සාගාර

වර්ෂය තුළ දී මන්නාරම, කොළොන්න, චතුපිටිවල හා අක්කරේපත්තු යන ස්ථානවල චිකිත්සාගාර හතරක් අළුතින් ඇරඹිණ. ප්‍රතිකාර ලබා පිට වී ගිය රෝගීන් හා ඔවුන්ගේ ස්පර්ශකයින් සඳහා වූ තවත් ශාඛා චිකිත්සාගාරයක් රාගම ළය රෝහලේ දී ඇරඹින. මඩකලපුවේ ළය චිකිත්සාගාරය වර්ෂය තුළ දී නිමවන ලදී.

මෙම මධ්‍යස්ථාන 59 තුළ දී පළමුවරට පරීක්ෂා කළ රෝගීන්ගේ සංඛ්‍යාව 1,67,487 දෙනෙක් විය. මේ අනුව පරීක්ෂා කිරීමේ අනුපාතය ජනගහනයෙන් 10,000කට 169 දෙනෙක් විය. වැඩිම අනුපාතය බස්නාහිර පළාතේ (283) වාර්තා වූ අතර අඩුම අනුපාතය (31) වාර්තා වූයේ ඌව පළාතෙනි. සොයා ගන්නා ලද පෙනහැල්ලේ ක්ෂය රෝගීන්ගේ ගණන 6,364ක් වූ අතර ඉන් 2,650ක් බස්නාහිර පළාතේ පිහිටුවා ඇති චිකිත්සාගාර 14 න් සොයා ගෙන තිබේ.

6. කරන ලද වැඩ

(අ) රෝගීන් සොයා ගැනීම

රෝගීන් සොයා ගනු ලබන ප්‍රධාන මාර්ගය චිකිත්සාගාර යයි. එතීන් සොයා ගන්නා ලද රෝගීනගෙන් සියයට 98ක් පමණ සොයා ගෙන ඇත්තේ චිකිත්සාගාර වලට පළමු වතාවට පැමිණියවුන් සඳහා කරන ලද පරීක්ෂණ වලිනි. පළමු වතාවට චිකිත්සාගාරවලට පැමිණියවුන්ගෙන් සියයට 3.8කට පෙනහැල්ලේ ක්ෂය රෝගය වැළදී සිටි බැව් සොයා ගත හැකි වී තිබේ. පළමු වතාවට පැමිණි අය අතුරින් රෝගීන් සොයා ගැනීමේ උපරිම අනුපාතය ඌව පළාතෙන් වාර්තාවී ඇති අතර ඊළඟට අනු පිළිවෙලින් නැගෙනහිර හා මධ්‍යම පළාතේ ගිණිය හැකිය. පෙනෙහැල්ලේ ක්ෂය රෝගීන්ව සොයා ගැනීමේ අනුපාතය ජනගහනයෙන් 1,00,000කට 6ක් පමණ වේ.

පරීක්ෂා කරන ලද ස්පර්ශකයන්ගේ සංඛ්‍යාව 21,440 ක් වූ අතර ඔවුන්ගෙන් 258 දෙනෙකුට ක්ෂය රෝගය වැළදී ඇති බැව් සොයා ගනු ලැබිය. ස්පර්ශකයන් පරීක්ෂා කිරීමේ සංඛ්‍යා බස්නාහිර, මධ්‍යම, දකුණු, ඌව හා උතුරු පළාත්වල සැලකිය යුතු අන්දමින් පහළ බැස ඇති අතර, නැගෙනහිර හා උතුරු මැද පළාත්වල එම සංඛ්‍යා අධික වී තිබෙනු දක්නා ලදි.

සමූහ කුඩා ඇක්ස්රේ ඡායාරූප ඒකක මගින් 1,00,563 දෙනෙක් පරීක්ෂා කරන ලදි. ඔවුන්ගෙන් 385 දෙනෙක් පෙණහැල්ලේ ක්ෂය රෝගයට ගොදුරු වී ඇතැයි සැක කරනු ලැබූ අය හෝ ක්ෂය රෝගය වැළදී ඇති අය හෝ වෙති. මුදල් වර්ෂයේ මුල් භාගයේ දී කොළඹ නාගරික සභාවට අයත් වැකන්ද කොට්ඨාශයේ "ඇක්ස්රේ සමීක්ෂණයක්" පවත්වන ලදි. වර්ෂය අවසානයේ දී විකිරණ විද්‍යාඥයා යටතේ පැවති සමූහ වශයෙන් කුඩා ඇක්ස්රේ ඡායාරූප ගැනීමේ මධ්‍යස්ථානය ප්‍රතිසංවිධානය කරන ලදි.

(අ) රෝගීන් සොයා බැලීම

චිකිත්සාගාරවලට පැමිණ ප්‍රතිකාර ලබා ගන්නා ක්ෂය රෝගීන් ගැන සොයා බැලීමේ වගකීම සම්පූර්ණයෙන් ම වාගේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සතුය. එහෙත් කොළඹ නගර සීමාව තුළ නම්, එම රෝගීන් ගැන සෞඛ්‍ය උපදේශකයින් කිපදෙනෙකු විසින් ඔවුන්ගේ ගෙවලට ගොස් පරීක්ෂාකරනු ලැබේ. මේ පිළිවෙල මේ දක්වා සතුටුදායක අන්දමින් ක්‍රියාත්මක වී ඇත. එහෙත් මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයින් පිට පැටවී පැවති බර තරමක් සැහැල්ලු කිරීමේ අභිප්‍රායෙන් ක්ෂය රෝගීන් ගැන සොයා බැලීමේ වගකීම මහජන සෞඛ්‍ය හෙදියක් හා මහජන සෞඛ්‍ය වින්නඹු සේවිකාවත් වෙත ද පවරනු ලැබිය. ආරම්භයේ දී මෙය නියමු යෝජනා ක්‍රමයක් වශයෙන් පොල්ගහවෙල, වරකාපොල, යටියන්තොට, දෙහිඕවිට හා මීරිගම යන සෞඛ්‍ය ප්‍රදේශවලින් ඇරඹිණ.

(ඇ) ප්‍රතිකාරය

ක්ෂය රෝගීන් යයි විනිශ්චිත රෝගීන්ට ආරෝග්‍යශාලාවල නවත්වා ප්‍රතිකාර ගැනීමට හෝ චිකිත්සාගාරයට පැමිණ ප්‍රතිකාර ගැනීමට හෝ සලස්වනු ලැබේ. සාමාන්‍ය වශයෙන්, කෙළවල ක්ෂය රෝග බීජ පවත්නා රෝගීන්, යටත් පිරිසෙයින්,

ඔවුන්ගේ කෙළවල රෝග බීජ නැතිවන තුරු, රෝහලක නැවති ප්‍රතිකාර ගැනීමට සලස්වනු ලැබේ. ඉතාමත් ජනප්‍රිය ප්‍රතිකාරය නම්, රස ඖෂධ යෙදීමය. බහුල වශයෙන් පාවිච්චි කරනු ලබන (ස්ට්‍රෙප්ටොමයිසින්, පී.ඒ.ඇස්. හා අයි.ඇන්.ඒ. එච්.) ඖෂධවලට අමතර වශයෙන් මිල අධික ඖෂධ වන ක්ලොරාම්ෆෙනිකෝල්, සයිලෝසෙරින්, ට්‍රෙස්කැවිල්, කැනාමයිසින්, වයෝමයිසින් හා ක්ලිමයිසින් යන ආදිය ද යොදන ලදි.

(ඇ) බීසීජී එන්නත් කිරීම

තවත් බීසීජී කණ්ඩායම් දෙකක් සකස් කරන ලදි. ඉන් එකක් උණුව පළාතේත් අනෙක කළුතර දිස්ත්‍රික්කයේත් කටයුතු කරයි. කළුතර දිස්ත්‍රික්කයේ සිටින කණ්ඩායම විසින් සිය කටයුතුවලට අමතර වශයෙන් මහජන සෞඛ්‍ය හෙදියන් පුහුණුකිරීමේ වැඩසටහනක් ද ක්‍රියාත්මක කරනු ලැබේ. මඩකලපු දිස්ත්‍රික්කයේ වැඩ කිරීම සඳහා තවත් කණ්ඩායමක් පිහිටුවීමට ක්‍රියා කර ඇත. පෝලියෝ රෝගය පැතිර යාම නිසා බීසීජී එන්නත් කටයුතුවලට බාධා පැමුණුන අතර ගතවූ මාස දෙක හෝ තුන අතර තුර දී එම වැඩ සටහන සෑම පළාතකම තාවකාලිකව නවතා දැමීමට සිදුවිය.

වර්ෂය තුළ දී ටියුබකියුලින් පරීක්ෂණයට භාජන කරන ලද අයගේ සංඛ්‍යා 4,59,966 දෙනෙක් විය. එයින් 3,63,019 දෙනෙක් පරීක්ෂා කරන ලද්දේ ක්ෂෙත්‍ර යන කණ්ඩායම් මගිනි. ඉතිරි සංඛ්‍යාව ප්‍රධාන වශයෙන් රෝග විනිශ්චය සඳහා ළය චිකිත්සාගාරවල දී පරීක්ෂා කරන ලැබූවන් ය. බී.සී.ජී. එන්නත් ලැබූවන්ගේ සංඛ්‍යාව 2,12,546 දෙනෙකි. බී.සී.ජී. ව්‍යාපාරය ඇරඹුණේ 1949 වර්ෂයේ දී ය. 1962 සැප්තැම්බර් මාසය වන විට මෙම ව්‍යාපාරය මගින් 57,35,314 දෙනෙක් ටියුබර්කියුලින් පරීක්ෂණයට භාජන කර 24,69,330 දෙනෙකුට බී. සී. ජී. එන්නත දී තිබේ.

බී.සී.ජී. ව්‍යාපාරය සඳහා යෙදවීම පිණිස ලැන්ඩ්රෝවර් රථ දෙකක් හා උපකරණ කට්ටල 150 ක් යුනෙස්කෝ ආයතනය මගින් ප්‍රදානය කරන ලදී.

(ඉ) තුන් අවුරුදු බීසීජී සැලැස්ම

සමාලෝචනයට භාජනවන කාලසීමාවේ අවසානයත් තුන් අවුරුදු බීසීජී සැලැස්ම සඳහා නියමවූ කාලසීමාවේ අවසානයත් එක් දිනෙකට එළඹේ. 1959 වර්ෂයේ දී අරඹන ලද මෙම වැඩ සටහන අනුව ලංකාවේ තිබෙන සියලු ම පාඨශාලාවල බීසීජී කටයුතු 1959 ඔක්තෝබර් මසින් ඇරඹෙන අවුරුදු තුනක කාලසීමාවක දී නිම කළ යුතුව තිබුණි. එහෙත් කාලසටහන අනුව මෙම කාර්ය ඉටු කළ හැකි වූයේ උතුරු මැද හා දකුණු යන පළාත්වල පමණකි. සෙසු පළාත්වල ද නියමිත දිනට කටයුතු නිම කිරීම සඳහා සෑම උත්සාහයක් ම දරන ලද නමුත් නොවැලැක්විය හැකි හේතූන් නිසා එම කාර්ය ප්‍රමාද විය.

තුන් වස් කාලසීමාවේ දී පාසැල් 4,762 තුළ දී කරන ලද බීසීජී ව්‍යාපාරයට අයත් වැඩ බෙදී යන්නේ පහත දැක්වෙන අන්දමිනි:—දකුණු පළාත 1,017, බටහිර පළාත 814, මධ්‍යම පළාත 791, වයඹ පළාත 652, සපරගමු පළාත 581, උතුරු පළාත 416, උතුරු මැද පළාත 357, නැගෙනහිර පළාත 104, උණුව පළාත 30; මෙම සැලැස්ම යටතේ ටියුබර්කියුලීන් පරීක්ෂණයට භාජනය කළ මුළු පාසැල් සිසුන්ගේ සංඛ්‍යාව 12,04,423 දෙනෙක් වූ අතර, ඔවුන්ගෙන් 7,14,570 කට බීසීජී එන්නත් දෙන ලදි. දැනට සෞඛ්‍ය ප්‍රදේශ 62ක මෙම කටයුතු නිම කර ඇති අතර සෙසු ප්‍රදේශවල කළ යුතු වැඩ කොටස අඩුම කාලසීමාවක් තුළ දී නිමකිරීමට සෑම උත්සාහයක් ම දරාගන යනු ලැබේ. (රූපය 1.)

(ඊ) පුනරුත්ථාපනය

රාගම හා කඳාන ළය රෝහල්වල වෘත්තීය වෛද්‍යකර්ම කටයුතු ඇරඹීම සඳහා වෘත්තීය වෛද්‍යවරයින් දෙදෙනෙක් එම ආයතනවලට පත්කරන ලදී. ඔවුහු සිය කටයුතුවලට අමතර වශයෙන් තලගොල්ලේ පුනර්ජීවන වෘත්ති අභ්‍යාස මධ්‍යස්ථානයට රෝගීන් තෝරා ගැනීම සඳහා වෛද්‍යවරයින්ට ආධාර කරති.

මෙම මධ්‍යස්ථානයට අළුත් රෝගීන් 50ක් බඳවා ගත් අතර 65 දෙනෙක් පිටකර යවන ලදී. වර්ෂ 1962 සැප්තැම්බර් මස අවසානයේ දී මෙම මධ්‍යස්ථානයේ වෘත්තීය පුහුණුවලත් රෝගීන්ගේ සංඛ්‍යාව 60 දෙනෙකි.

(උ) සෞඛ්‍ය අධ්‍යාපනය

සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන යටතේ ප්‍රජා අධ්‍යාපන කටයුතුවලට වැඩි සැලකිල්ලක් දක්වන ලදී. මෙම වැඩසටහන යටතේ ක්ෂය රෝගය හා එහි පැතිරයාම ගැනත් රෝගීන් හඳුනා ගැනීම හා ඔවුන්ට ප්‍රතිකාර කිරීම ගැනත් රජය මගින් සලස්වා ඇති පහසුකම් පිළිබඳ මහජනයාට අවබෝධයක් ලබාදීම සඳහා විවිධ විධාන යොදන ලදී. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ග්‍රාම නායකයන්ගේ ආධාරයද ඇතිව යොදන ලද විවිධ විධානවලට දේශනා පැවැත්වීම, කණ්ඩායම් සමග සාකච්ඡා කිරීම, මහජන රැස්වීම් පැවැත්වීම යන ආදිය ඇතුළත් විය.

ග්‍රාම සංවර්ධන සමිති, ප්‍රජා මණ්ඩල, තරුණ සමාජ, තරුණ ගොවි සමාජ, මහිලා සමිති හා වෙනත් ප්‍රජා සංවිධාන මගින් කරන ලද විශේෂ ආරාධනා අනුව ප්‍රදර්ශන භාණ්ඩ, ආදර්ශ රූප, පත්‍රිකා පොත් පිංචයන් හා සිනමා ප්‍රදර්ශන හැකි සෑම අවස්ථාවකදී ම ලබා දෙන ලදී.

(ඌ) ඇක්ස්රේ සේවා

කුඩා ඇක්ස්රේ ඡායාරූප සමූහ වශයෙන් ගැනීම සඳහා ජංගම ඇක්ස්රේ රථ දෙකක් ඕස්ට්රේලියානු රජය මගින් පරිත්‍යාග කරන ලදී.

බදුල්ලේ හා මඩකලපුවේ පිහිටුවා ඇති ළය චිකිත්සාගාර හැරුණු විට අන් සියලුම ළය චිකිත්සාගාරයකම සහ විරවිල හැරුණු විට අන් සියලුම ළය රෝහලකම ඇක්ස්රේ පහසුකම් ඇත.

(එ) රසායනාගාර සේවා

වැලිසර පිහිටුවා ඇති ප්‍රධාන ක්ෂය රෝග රසායනාගාරය ප්‍රගතිශීලි අන්දමින් දියුණු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් දැන් එයට ශාක විද්‍යාව ජීව විද්‍යාව රසවිද්‍යාව, රුධිර විද්‍යාව ග්ලාන්‍ය ව්‍යවස්ථෙජද වැඩ යන ආදිය සෑම අංශයකටම අයත් කටයුතු බාරගැනීමට හැකිවී තිබේ. එහෙත් මේ රසායනාගාරයේ දී වැඩි වශයෙන් කරනු ලබන්නේ ක්ෂය රෝග ශාක විද්‍යාත්මක කටයුතු යි. අක්මා, ප්ලූරල් බයොප්සි, පැපනිකෝලන් ස්ථේනිං හා පිරියෝඩික් ඇසිඩ් ස්කිප් ස්ථේනිං යන ආදිය විශේෂ ග්ලාන්‍ය ව්‍යවච්ඡේද හා පටක විද්‍යාත්මක කටයුතු ද කරන ලදි. ව්‍යථාවේදය නිදර්ශ කිරීම සඳහා අවශ්‍ය වැදගත් ආදර්ශ තහඩු රාශියක් පිළියෙල කරන ලදි.

මෙම මුදල් වර්ෂය තුළ දී එකූවරම කළ පරීක්ෂණන් 16,112ක් පැවැත්වූ අතර කෙළවල පැවති ජීවානු වගාවන් 3,127 කරන ලදී.

(ඒ) හෙදියන්

වැලිසර පිහිටි හෙදි අභ්‍යාස විද්‍යාලයේ දී හෙදියන් 54 දෙනෙක් සිය පුහුණුව අවසන් කළහ. මෙම පාසලින් මේ දක්වා ලාංකික ශිෂ්‍යාවන් 316 දෙනෙකු හා විදේශීය ශිෂ්‍යාවන් 10 දෙනෙකු පුහුණුව ලබා ඇත. 1962 වර්ෂයේ මැයි මාසයේ දී නව ශිෂ්‍යාවන් 57 දෙනෙකු බඳවා ගන්නා ලදී.

මෙම පාසලේ ගුරුමණ්ඩලයට ප්‍රධාන ආචාරිණීය ඇතුළු ආචාරිණීයන් තිදෙනෙක් සිටිති. ඒ සියලු දෙනම ඉංග්‍රීසි හා සිංහල මාධ්‍යයෙන් ඉගැන්වීමට සුදුසුකම් ලැබුවෝ වෙති.

(ඔ) සමාජ ආධාර

වර්ෂය තුළ දී සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් සියලුම ක්ෂය රෝගීන් සඳහා දී ඇති සමාජ ආධාර මුදල රුපියල් 83,50,525.63 කි.

(ඕ) මුදල්

1961/62 මුදල් වර්ෂය තුළ දී ක්ෂය රෝග නාශක ව්‍යාපාරය මගින් වැය කළ මුළු මුදල රුපියල් 88,77,650කි. මේ සඳහා 1960/61 වර්ෂවල දී රුපියල් 92,16,204ක් ද, 1959/60 වර්ෂවල දී රුපියල් 99,03,775.98ක් ද වියදම් කර ඇත. වැටුප් හා ජීවනාධාර වශයෙන් ගෙවන ලද මුදල රුපියල් 49,95,661කි. මෙය මුළු වියදමෙන් සියයට 56.3කි. වර්ෂය තුළ දී බෙහෙත් ද්‍රව්‍ය සඳහා වැය කළ මුදල රුපියල් 18,49,361 කි. 1960/61 මුදල් වර්ෂය තුළ දී ඖෂධ සඳහා වැය කළ මුදල රුපියල් 23,04,749 කි. මුළු වියදමෙන් සියයට 14.3ක් ආහාර සඳහා වැය කරන ලදී.

(ආ) මැලේරියා මර්දනය

වර්ෂය තුළ දී ලැබූ විශේෂ දියුණුව නම්, මැලේරියාව ජානපදිකව පවත්නා මුළු ප්‍රදේශය තුළ ම එය පැතිර යාමට තිබූ ඉඩ කඩ සියල්ල අසුරා දැමීමය. උතුරුදිග ජානපදික ප්‍රදෙශයේ මැලේරියාව ක්‍රියාකාරීව පවතින බැව් මේ වර්ෂයේ පෙබරවාරි මාසයේ දී අවසානවරට සොයා ගන්නා ලදී. වහා විධි විධාන යෙදීමේ ප්‍රතිඵලයක් වශයෙන් දැන් දිවයිනේ කිසිම පළාතක මැලේරියාව පවත්නා බවක් නොපෙනේ. මෙයින් පෙන්නුම් කරන්නේ ප්‍රහාරක වශයෙන් බෙහෙත් ඉසීම නවත්වා ඒ වෙනුවට පිටතින් පැමිණෙන්නාවූත් හෝ තවදුරටත් ඉතිරිව ඇත්තාවූත් රෝග පැතිර යාම් සොයාගෙන ඒවා නොපමාව නැතිකර දැමීම සඳහා නිරීක්ෂණ කටයුතු පමණක් කෙරෙහි විශ්වාසයක් තබා ක්‍රියා කළ යුතු බවයි.

අන්වීක්ෂ පරීක්ෂණ අනුව ස්ථිර කරනු ලැබූ මැලේරියා රෝගීන් 110 දෙනෙකු 1961 වර්ෂයේ දී සිටි නමුත් මේ වර්ෂයේ දී ඒ සංඛ්‍යාව 47 දෙනෙකු වීමෙන් රෝගීන් ගේ සංඛ්‍යාව තවදුරටත් පහත බැස තිබෙන බැව් පෙනේ.

ජූලි මාසයේ දී අවසාන වරට සොයාගනු ලැබූ රෝගීන් දෙදෙනාට මැලේරියාව වැළඳී ඇත්තේ මාල දිවයින්වල සිට පැමිණි පසු ය. මේ නිසා ඉන් පසුව මාලදිවයින් හි සිට පැමිණි සෑම කෙනෙකුගේ ම රුධිර සැම්පල අන්වීක්ෂ පරීක්ෂණය සඳහා ගැනීමට විධිවිධාන යොදන ලදී.

රෝගීන් සෙවීමේ කටයුතු තවදුරට ප්‍රබල අන්දමින් කිරීමට විධි විධාන යෙදීමේ ප්‍රතිඵලයක් වශයෙන් ගන්නා ලද රුධිර සැම්පල් සංඛ්‍යාව සියයට 21.2 කින් වැඩි විය. කලින් මැලේරියාව පැවති ප්‍රදේශවලින් පරීක්ෂණය සඳහා ලේ සැම්පල් ගැනීම ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් නිර්දේශ කරන ලද ජනගහණයෙන් සියයට 10යේ ප්‍රමාණය ද ඉක්මවා තිබුණි.

සිදුවූ තවත් වැදගත් සිද්ධියක් නම්, සම්පූර්ණ කාර්යාලය වඩා ඉඩපහසුකම් ඇති නාරාහේන්පිටියට ගෙන යාමය. මේ නිසා කලින් පැවති තදබදය මගහරවා ගත හැකි වූවා පමණක් නොව එහි කටයුතු වඩ වඩා ඒකාබද්ධ අයුරිනුත් සෝදිසිය යටතේත් පවත්වා ගෙන යා හැකි වීමය.

කෘමිනාශක ඉසිනු ලබන්නාවූත් නොලබන්නාවූත් ප්‍රදේශවල සිටින මැලේරියා හාරක මදුරුවන් තුළ කෘමිනාශකයන්ට ඔරොත්තු දීමේ ශක්තිය කෙබඳු දැයි සොයා බැලීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ කීට විද්‍යාඥ කණ්ඩායම විසින් ජාතික කීට විද්‍යාඥයා සමග පවත්වන ලද අත්හදාබැලීම් නොනවත්වාම කරගෙන යන ලදී. අවුරුදු ගණන් තුළ දී කෘමිනාශක නොනවත්වාම ඉසින ලද නමුත් ලංකාවේ මැලේරියා හාරක මදුරුවන් වන ඇ. කියුල්සිපේසිස් නමැති වර්ගය ක්ලෝනිකෘත හයිඩ්‍රෝකාබන් කෘමි නාශකයන්ට ඔරොත්තු දීමේ ශක්තියක් ලබා නොමැති බැව් අනාවරණය වී ඇත.

මෙම වැඩසටහන ගැන උනන්දුවක් දැක්වූ එක්සත් ජනපද රාජ්‍යයේ ජාත්‍යන්තර සංවර්ධන දූතමෙහෙය හා ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් දෙන ලද ආධාර නොඋඩවා ලැබුණි.

මනා සංවිධානය හා සාර්ථක ක්‍රියා කාරිත්වය අතින් ලොව පුරා පතල කීර්තියක් ඇති මෙම වැඩ සටහන නිරීක්ෂණය කිරීම සඳහා විදේශීය මැලේරියා විද්‍යාඥයින් හා ඒ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන සෙසු අයද මෙරටට ඇදී ආහ. මොවුන් අතුරෙන් ප්‍රධාන තැනක් ලැබුනේ එක්සත් ජනපද රාජ්‍ය ආධාර දූතමෙහෙය හා ලෝක සෞඛ්‍ය සංවිධානය යටතේ පිරිනමන ලද ශිෂ්‍යත්වය යටතේ පැමිණි අයටය. වර්ෂය තුළ දී මෙම වැඩසටහන නිරීක්ෂණය කිරීම සඳහා විදේශීය අමුත්තන් 19 දෙනෙක් පැමිණියහ.

ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් වෙනත් රටවල වැඩසටහන් නිරීක්ෂණය සඳහා ජාතික මැලේරියා විද්‍යාඥයින් වෙත පිරිනමන ලද ශිෂ්‍යත්ව දෙකක් අවාසනාවකට මෙන් අමාත්‍යාංශය විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

වර්ෂ 1962 සැප්තැම්බර් මස 27 වැනි දින සිට සතියක් පුරා පැවති ඕව්වැනි ආසියාතික මැලේරියා සාකච්ඡා සම්මේලනයට ව්‍යාපාරයේ අධිකාරිවරයාත් එහි ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරිවරයාත් සහභාගි වූහ.

1. නිලධාරි මණ්ඩලය

වර්ෂය තුළ දී නිරීක්ෂක ඕවර්සියර්වරුන් 153 දෙනෙක් ද අන්වික්ෂණ කටයුතු සඳහා ඔවර්සිර්වරුන් 45 දෙනෙක් ද කණිෂ්ඨ ශ්‍රේණි සඳහා 19 දෙනෙක් ද බඳවා ගන්නා ලදී. ඕවර්සියර්වරු 4 දෙනෙක් විශ්‍රාම ලැබූ අතර ප්‍රවාහන පෝර්මන්වරයෙක්, ඕවර්සියර්වරු 32 දෙනෙක් හා කණිෂ්ඨ සේවකයන් 6 දෙනෙක් ව්‍යාපාරය හැර ගියහ. වර්ෂය අවසාන වන විට ඉතිරිව සිටි සේවකයින්ගේ සංඛ්‍යාව 1,013 දෙනෙකි.

2. ගොඩනැගිලි

නාරාහේන්පිටියේ අළුතින් ගෙවැදුනු ගොඩනැගිවල පිළිසකර කටයුතු නිම කරන ලදී. වැඩ පළ විශාල කොට එය නවාංග සම්පූර්ණ කිරීම සඳහා අළුත් යන්ත්‍ර කිපයක් සවිකරන ලදී. ක්ෂේත්‍ර ඒකකයන් සඳහා වූ ගරාජ්-ගබඩා ගොඩනැගිලි 44 ක් පවත්වාගෙන යන ලදී.

3. කාලගුණය

මැලේරියාව පැතිර යන්නාවූත් මුල් බැසගෙන ඇත්තාවූත් කලාපවල වර්ෂය තුළ දී පැවති උෂ්ණත්වය හා තෙතමනය රෝග පැතිරියාමට හිතකර විය. දිවාකාලයේ පැවති තෙතමනය සියයට 60ක් වූ අතර රාත්‍රිකාලයේ තෙතමනය අඩු වැඩි වෙමින් ඊට ඉහළ අංකවලින් පැවතින. සාමාන්‍ය උෂ්ණත්වය පැ. අංශක 75ත් 95ත් අතර පැවතුනි. ඊසානදිග මෝසම්සුළං සමයේ දී රෝගය ජානපදිකව පවතින ප්‍රදේශ පුරා වර්ෂාව පැවතුනි. රෝගය පැතිරෙමින් පවත්නා ප්‍රදේශවල ද නිරිත දිග මෝසම් සුළං කාලයේ දී සාමාන්‍ය ප්‍රමාණයට අධික වූ වර්ෂා පතනයක් ලැබුණි. අධික ලෙස වර්ෂාව නොපැවතියේ පෙබරවාරි, මාර්තු හා ජූලි යන මාසවල දී පමණකි. මේ අනුව මැලේරියාව පැතිරීයාමට හිතකර වූ දේශගුණයක් ඊසාන දිග මෝසම් සුළං වාරයේ දී රෝගය මුල් බැසගෙන ඇති ප්‍රදේශවලත් වර්ෂා පතනය අඩුවූ පෙබරවාරි, මාර්තු හා ජූලි යන මාසවල දැනට රෝගය පැතිරයමින් පවත්නා පෙදෙස්වලත් ඇතිවිය. වර්ෂා පතනය අඩු මාසවල දී රෝගය පැතිර යාමට ආධාර වන්නේ ගංගා හා ඇල දොලවල ජලය ගලායෑම නැවතීමෙන් මදුරුවන් බෝවීමට ආධාරවන වළවල් ඇති වීමෙනි.

4. මැලේරියා ග්ලානාය (ශායනික ලෙස විනිශ්චිත රෝගීන්)

ශායනික ලෙස විනිශ්චිත රෝගීන් 11 දෙනෙකු ගැන රජයේ වෛද්‍ය ආයතන මගිනුත් 3 දෙනෙකු ගැන වතු බෙහෙත්ශාලා මගිනුත් වාර්තා කරනු ලැබිය. මොවුන් අතුරින් එක් අයෙකුට මැලේරියා රෝගය වැළදී පැවති බැව් රුධිර පරීක්ෂණයෙන් හා වසංගත විද්‍යානුකූල විමර්ෂණවලින් තහවුරු විය. XXXV සටහනින් ශායනික රෝගීන් ගැන වාර්තාවූ දිස්ත්‍රික්ක හා පළාත් දැක්වේ.

5. මරණ

වෛද්‍යවරයකු නොවන රෙජිස්ත්‍රාත්වරයකු විසින් එක් මැලේරියා මරණයක් ලියා පදිංචි කරන ලදී. ඒ සම්බන්ධයෙන් කළ විමර්ෂණවලින් එම මරණයට හේතුව මැලේරියාව නොවන බැව් අනාවරණය විය.

6. කරන ලද වැඩ

(අ) කෘමි නාශක ඉසීම

නගරබද පළාත් කීපයක් හැරුණුවිට රෝගය මුල් බැසගෙන ඇති පළාත්වල පිහිටි නිවෙස්වල කෘමි නාශක බෙහෙත් ඉසීම ඒකක 37ක් මගින් නොකඩවා කරගෙන යන ලදී. එහෙත් රෝගය පැතිරයන ප්‍රදේශවල කෘමිනාශක ඉසීම නැවතී පැවතුනි. කෘමි නාශක ඉසීමේ ඒකක විහිදී ඇති ආකාරය 2 සිතියමෙන් දැක්වේ. බෙහෙත් ඉසීම කළ ආකාරය දක්වෙන XXXIX වැනි සටහනෙහි දක්වා ඇත. බෙහෙත් ඉසීමේ යෙදී සිටි කායික මණ්ඩලයට පරිපාලකයින් 87 දෙනෙක් ද රියැදුරන් 14 දෙනෙක් ද බෙහෙත් ඉසින්නන් 241 දෙනෙක් ද අයත් විය. පරිපාලකයින් ගෙන් 23 දෙනෙකු පරිපාලන කටයුතුවලට අමතර වශයෙන් රිය පැදවීම ද කළේ රියදුරු ඕවර්සියර්වරුය. බෙහෙත් ඉසීමේ වාරයක් සාමාන්‍ය මාස 3 සිට 4 දක්වා කාලයකට සීමා වූ නමුත් මැලේරියාව පැතිරයාම අතින් පහත් තත්ත්වයක ඇති ප්‍රදේශවල එම කාලය 6 මාසය දක්වා දීර්ඝ කරන ලදී. ගෙවල් 4,29,978කට ඩිඩිටි 10,84,647 වාරයක් ඉසින ලදී. වසා දමා තිබුණ ගෙවල්වලින් සියයට 14ක ඉඩ ඇති තැන්වලට පමණක් බෙහෙත් ඉසින ලදී. බෙහෙත් ඉසීම ප්‍රතික්ෂේප කළ අයගේ නිවාස සංඛ්‍යාව සියයට 2කි. හේතු රහිතව බෙහෙත් ඉසීමට ඉඩ නුදුන් අයට නඩු පැවරීමේ නිවේදන යැවීමෙන් ඉතා සාර්ථක ප්‍රතිඵල ලැබුණෙන් ඊට පසු ඒ ගෙවල බෙහෙත් ඉසීමට ඉඩ ලැබුණි.

කෘමිනාශක බෙහෙත් ඉසීමේ වාර සීමාව සිව් මසකට නොවැඩි වූ අවස්ථාවල දී වර්ග අඩියකට රසායනික ඩිඩිටි මිලිග්‍රෑම් 50ක් වනසේ ඉසින ලදී. බෙහෙත් ඉසීමේ වාරය සිව් මසකට වැඩි වූ විටත් නව නිවෙස්වලට බෙහෙත් ඉසින විටත් වර්ග අඩියකට මිලිග්‍රෑම් 100ක් වන සේ ඉසින්නට යෙදුනි. වර්ෂය තුළ දී දිය කළ හැකි සියයට 75 ඩිඩිටි රාත්තල් 6,56,541ක් වැය කළ අතර සාමාන්‍ය වශයෙන් එක් ගෙයක් සඳහා රාත්තල් 0.60 ඉසින ලදී.

ඩිඩිටි ඉසීම සඳහා එක් එක් ප්‍රදේශය වෙනුවෙන් වැය කළ මුදල් ප්‍රමාණය අංක XL දරණ සටහනෙන් ප්‍රකාශ කෙරේ. රථවාහන සඳහා වැය කළ මූලික ධනය හැරුණු විට බෙහෙත් ඉසීම සඳහා වැය කළ මුළු මුදල රුපියල් 17,30,416කි. එක් ගෙයක ඩිඩිටි ඉසීම සඳහා වැය වී ඇති මුදල රු. 1.59කි.

(ආ) සෝදිසි කිරීම

නිරීක්ෂක ඒකකයන් නිරීක්ෂක උපඒකක පරිපාලකයන් හා නිරීක්ෂක උප ඒකකයන් 2 සිතියමෙන් දැක්වේ. XXXVI වැනි සටහනකින් මැලේරියා නාශක ව්‍යාපාරය හා වෛද්‍ය ආයතනයන්හි සේවය කරන නිලධාරීන් විසින් සොයාගනු ලැබූ නියම රෝගීන්, නියමිත හා අනියම් නිරීක්ෂණයන් හා වසංගත විද්‍යාත්මක නිරීක්ෂණයන් යන ආදිය පිළිබඳ විස්තර පළවේ.

(i) අනියම් සෝදිසිය

අනියම් නිරීක්ෂණ ක්‍රමය අනුව වෛද්‍යායතන 127කින් හා ඇපොතිකවරුන් භාරයේ පවත්නා කුඩා වෛද්‍යායතන (උප නිරීක්ෂක ස්ථාන) මගින් ලේ සැම්පල් 5,58,074ක් ගන්නා ලදී. මේ ක්‍රමය අනුව සොයා ගන්නා ලද නියම රෝගීන් 12 දෙනෙකි. මේ සංඛ්‍යාව සොයා ගනු ලැබූ රෝගීන්ගේ සංඛ්‍යාවෙන් සියයට 25.53කි. නියමිත රෝගීන්ගෙන් සියයට 50ක් සොයාගනු ලැබුයේ අනියම් නිරීක්ෂණ ක්‍රමය යටතේ ආයතන 111කදී ඇපොතිකරිවරුන් විසින් උණ රෝගීන්

ගෙන් ලේ සැම්පල ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙනි. ඇපොතිකරිවරුන් විසින් ගනු ලැබූ ලේ සැම්පල සංඛ්‍යාව වර්ෂය තුළ දී ගනු ලැබූ මුළු ලේ සැම්පල සංඛ්‍යාවෙන් සියයට 7.4කි. දුර බැහැර පළාත්වල පිහිටි ඇපොතිකරිවරුන් විසින් පාලනය වන රෝහල්වල ලේ සැම්පල ගැනීමේ කාර්ය ප්‍රබල අන්දමින් කිරීමේ ඇති අවශ්‍යතාවය මෙයින් පැහැදිලි වේ.

(ii) **නියම සෝදිසිය**

ක්ෂේත්‍රයෙහි පිහිටුවා ඇති නියම සෝදිසි ක්‍රමයේ උපනිරීක්ෂක සටහන් 177ක් මගින් ලේ සැම්පල 3,71,433ක් ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් නියම මැලේරියා රෝගීන් 4 දෙනෙක් සොයාගනු ලැබිය. නියමිත නිරීක්ෂක ක්‍රමය අනුව සොයාගනු ලැබූ නියම රෝගීන්ගේ සංඛ්‍යාව ඒ ක්‍රමය අනුව සොයාගනු ලැබූ මුළු රෝගීන්ගේ සංඛ්‍යාවෙන් සියයට 8.51ක් වන අතර එය අනියම් නිරීක්ෂක ක්‍රමය අනුව සොයා ගන්නා ලද රෝගීන්ගේ සංඛ්‍යාවෙන් $\frac{1}{3}$ක් වේ.

නියමිත නිරීක්ෂණ කටයුතු උපනිරීක්ෂක ස්ථාන පරිපාලකයින් 14 දෙනෙකුගේ පාලනය යටතේ පැවති අතර එක් පරිපාලකයකු විසින් උපනිරීක්ෂක ස්ථාන 6 බැගින් පාලනය කර ඇත.

(iii) **වසංගත රෝග විද්‍යාත්මක විමර්ශන, අනුගාමික වැඩ හා සමූහ රුධිර සමීක්ෂණ**

සමූහ රුධිර සමීක්ෂණ කටයුතු අවශ්‍ය වූ විට ක්ෂේත්‍රයේ පිහිටි උප නිරීක්ෂක ස්ථානවල ද සහාය ඇති නිරීක්ෂක ස්ථාන 32ක් විසින් පවත්වන ලදි. රුධිර සැම්පල 68,421ක් ගැනීමෙන් නියමිත මැලේරියා රෝගීන් 31 දෙනෙක් සොයාගත හැකිවිය. මෙම සංඛ්‍යාව සොයාගනු ලැබූ මුළු රෝගීන්ගේ සංඛ්‍යාවෙන් සියයට 65.96කි.

සොයාගනු ලැබූ මුළු රෝගීන්ගේ සංඛ්‍යාවෙන් සියයට 8.51ක් වන නියම රෝගීන් 4 දෙනා සොයාගත හැකි වූයේ නියමිත නිරීක්ෂණ ක්‍රමය යටතේ නියෝජිතයන් 177 දෙනෙකු යෙදවීමෙනි. 1961 වර්ෂයේ දී මුළු රෝගීන් ගෙන් සියයට 7ක් සොයා ගත්තේ නියමිත නිරීක්ෂණ ක්‍රමයෙනි. සතුටුදායක පරිදි වෛද්‍යායතන සපයා දී ඇති රටක නියමිත නිරීක්ෂණ ක්‍රමය යටතේ සොයාගෙන ඇති සංඛ්‍යාවට වැඩි සංඛ්‍යාවක් සොයාගත යුතු ය.

(ඇ) රුධිර පරීක්ෂණ හා දූනට සිටින පරපෝෂිත වර්ග

අංක XXXVII දරණ සටහනින් පරීක්ෂා කළ මුළු ලේ තහඩු සංඛ්‍යාව. මැලේරියා පරපෝෂිතයින් සිටි ගණන හා එහි සියයට ප්‍රමාණය හා පරපෝෂිතයින් විසිර සිටින ආකාරය දිස්ත්‍රික්ක හා පළාත් අනුව දැක්වේ. වර්ෂය තුළදී ලේ තහඩු 99,792ක් පරීක්ෂා කර මැලේරියා පරපෝෂිතයන් සහිත ඒවා 65ක් සොයා ගන්නා ලදි. 1961 වර්ෂයේ දී ලේ තහඩු 7,86,307ක් මෙසේ පරීක්ෂා කර පරපෝෂිතයින් සහිත ඒවා 125ක් සොයා ගන්නා ලදි. පරීක්ෂා කරන ලද ලේ තහඩු සංඛ්‍යාව සියයට 21.2 කින් ඉහළ ගොස් ඇති අතර 1961 වර්ෂයේ දී සියයට 0.015ක් ව පැවති මැලේරියා පරපෝෂිතයන් සහිත තහඩු සංඛ්‍යාව තවදුරටත් පහත බැස සියයට 0.006ක් දක්වා පහත බැස තිබේ. මැලේරියා පරපෝෂිතයන් අධිකවම සිටියේ තහඩු 29 කින් පරපෝෂිතයන් සොයා ගත හැකි වූ තමන්කඩුව දිස්ත්‍රික්කයේ හා තහඩු 14ක පරපෝෂිතයන් සිටි කුරුණෑගල දිස්ත්‍රික්කයේත් ය. මේ රෝගීන් සොයා ගනු ලැබුයේ 1962 වර්ෂයේ දී අසුවූ රෝග පැතිරීම් දෙකක් ගැන පරීක්ෂා කිරීමේ ප්‍රතිඵල වශයෙනි. මේ ස්ථාන දෙකේ පැවති රෝග පැතිරීම දැන් සම්පූර්ණයෙන් ම පිටු දැක තිබේ.

පැල්සිපැරම් වර්ගයට අයත් පරපෝෂිතයන් නිසා ගිලන් වූ රෝගීන් 30 දෙනෙක් දිස්ත්‍රික්ක 2කින් ද, වයිවැක්ස් වර්ගයේ පරපෝෂිතයින් නිසා ගිලන් වූ රෝගීන් 27ක් දිස්ත්‍රික්ක 7කින් ද මැලේරියා වර්ගයේ පරපෝෂිතයින් නිසා ගිලන් වූ රෝගීන් 8 දෙනෙක් දිස්ත්‍රික්ක 3කින් ද සොයා ගත හැකි විය. මැලේරියා වර්ගයේ

පරපෝෂිතයන් නිසා ගිලන්වූ රෝගීන් 8 දෙනාගෙන් 6 දෙනෙක් එක් ප්‍රදේශය කින්ම සොයා ගෙන ඇත. පරපෝෂිත වර්ගයන්ගේ ජීවත්වීම හා පැතිර සිටීම අතුරු දහන් වීගෙනයන මැලේරියා රෝග තත්ත්වය හා නොගැලපෙන බවක් නොපෙනේ.

(ඇ) නියත රෝගීන්ගේ පැතිරීම මාසික වශයෙන්

නියත මැලේරියා රෝගීන්ගේ මාසික පැතිරීම දිස්ත්‍රික්ක හා පළාත් යන පිළිවෙලින් මීට අමුණා ඇති ලේඛනයෙහි වේ. 3 වැනි සිතියමෙන් ඒ රෝගීන්ගේ පැතිරීම භූගෝල විද්‍යානුකූලව දක්වා ඇත.

සමාලෝචනයට භාජනව ඇති කාල සීමාව තුළ දී සොයා ගනු ලැබූ නියත රෝගීන්ගේ සංඛ්‍යාව 47 දෙනෙකි. 1961 වර්ෂයේ දී සොයා ගනු ලැබූ නියත රෝගීන්ගේ සංඛ්‍යාව 110 දෙනෙක් වී ඇත. වර්ෂය තුළ දී ඊට ප්‍රථම වර්ෂයට වඩා සියයට 21.2කට වැඩි ලේ තහඩු සංඛ්‍යාවක් පරීක්ෂා කරමින් රෝගීන් සොයා ගැනීමේ කාර්‍ය්‍ය ඉතා ප්‍රබල අන්දමින් කරනු ලැබුව ද සොයා ගත හැකි වූ රෝගීන්ගේ ගණන සැලකිය යුතු සංඛ්‍යාවකින් පහළ බැස තිබීම සතුටට කරුණකි. 1961 අවසාන කාර්තුවේ දී සොයා ගත හැකි වූයේ රෝගීන් 16 දෙනෙකු වුවද මේ වර්ෂයේ පළවූ කාර්තුවේ දී රෝගීන් 21 දෙනෙක් සොයා ගත හැකි විය. එහෙත් දෙවැනි කාර්තුවේ ද මේ ගණන 8 දක්වා පහත බැස තුන්වැනි කාර්තුවේ දී රෝගීන් 2නෙකු පමණක් සොයාගත හැකි විය. මේ රෝගීන් දෙදෙනාට මැලේරියාව බෝවී ඇත්තේ මාලදිවයින්වල දී ය. තමන්කඩු දිස්ත්‍රික්කයේ එක් අළුත් ගේනකින් රෝගීන් 17 දෙනෙක් ද, කෘමි නාශකයන්ට මදුරුවන් ඔරොත්තු දෙන ආකාරය නිශ්චය කිරීම සඳහා කරනු ලබන පරීක්ෂණ සඳහා රෝගහාරක මදුරුවන් ගේ ප්‍රමාණය වැඩි කිරීමේ අරමුණු පිට ඩිඩිටී. ඉසීම නවත්වන ලද කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් රෝගීන් 13 දෙනෙක් ද සොයා ගනු ලැබිය. රෝගීන් ගැවසී ගත් මේ ස්ථාන දෙකේ දැන් රෝග සංක්‍රමණය පිටු දැක ඇති බැවින් මේ වර්ෂයේ ජූනි මාසයේ සිට අළුත් රෝගියකු සොයා ගනු නොහැකි විය. ඉතිරි රෝගීන් 17 දෙනාගෙන් 15 දෙනෙකු දිස්ත්‍රික්ක 7ක් පුරා පැතිර සිටි රෝගය පුනරාවර්තනය වූවන්ය. ඉතිරි රෝගීන් දෙදෙනා මෙහි මුළින් සඳහන් කළ මාලදිවයිනේ දී රෝගය බෝ කරගෙන පැමිණියෝ වූහ.

(ඉ) ප්‍රතිකාරය හා පසු ගමන් වැඩ

ශායතක වූත් ස්පිර කරනු ලැබුවාවූත් සියලුම රෝගීන්ට දිනපතා ගෙවලට ගොස් මූලික ප්‍රතිකාරය වන ඇමෝඩයක්වීන් හා ප්‍රයිමාක්වීන් යන ඖෂධ දෙවර්ගය එක්කර දී පිළියම් කරන ලදි. ඊට පසු දැවුරුද්දක් ගතවනතුරු නිරීක්ෂකස්ථාන භාර නිල ධාරීන් විසින් ඔවුන් ගැන සොයා බලන ලදි. පසු ගමන් කටයුතුවල දී ප්‍රතිකාර ලැබූවන්ගේ රුධිරය මාස් පතා තෙමසක් ගෙන පරීක්ෂා කර බලා මැලේරියා පරපෝෂිතයන් නොමැති බැව් ස්පිර වූ පසු තෙමසකට වරක් හා සමසකට වරක් රුධිරය පරීක්ෂා කර අවුරුදු 2ක් ගතවූ පසු රෝගියාට මැලේරියාව නොමැති බැව් ප්‍රකාශ කරනු ලැබේ.

වැඩිහිටි මැලේරියා රෝගියකුට ප්‍රතිකාර කරන සාමාන්‍ය පිළිවෙල මෙසේය. පළමු දවසේ දී මූලික ඇමෝඩයාක්වීන් මිලිග්‍රෑම් 600ක් ද ඊළඟ දින දෙක තුළ මිලිග්‍රෑම් 400 බැගින් ද දෙනු ලැබේ. රෝගය වැළඳී ඇත්තේ වයිවැක්ස් වර්ගයේ හෝ මැලේරියා වර්ගයේ පරපෝෂිතයින් නිසා නම්, ප්‍රයිමාක්වීන් මිලිග්‍රෑම් 15 බැගින් තවත් දින 14ක් ද fපැල්සිපැරම් වර්ගයේ පරපෝෂියන් නිසා නම්, දින 5ක් ද ප්‍රතිකාරය කරනු ලැබේ. ළමයින්ට වයසට ගැලපෙන පරිදි එම ප්‍රතිකාරයම කෙරේ.

(ඊ) කීට විද්‍යා කටයුතු

මැලේරියා සමූළ නාශක වැඩ සටහන යටතේ කෙරෙන කීට විද්‍යා වැඩ කටයුතු සිරිත් පරිදි කෙරෙන විමර්ශන හා විශේෂ විමර්ශනවලට සීමා විය. සිරිත් පරිදි කෙරෙන විමර්ෂණ රෝග ග්‍රස්ත ප්‍රදේශවල පිහිටි නිරීක්ෂක ඒකක හා කීට විද්‍යා උප ස්ථාන මගින් මෙහෙයවන ලදි. රෝගය පැතිරෙමින් පවතින ප්‍රදේශවල පිහිටි

අතිරේක නිරීක්ෂක භූමි වල කරන ලද පරීක්ෂණ ප්‍රාදේශිය මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් කරන ලදි. මෙම විමර්ෂණ කරුණු දෙකක් බලාපොරොත්තු වන කෘමි නාශක ඉසින ලද රෝග ග්‍රස්ත ප්‍රදේශවල මැලේරියා හාරක මදුරුවන් සිටින ආකාරය නිශ්චය කර ඉසිනු ලැබූ කෘමිනාශකවලින් සාර්ථක ප්‍රතිඵල ලැබී ඇත්දැයි සොයා බැලීමත් රෝගය පැතිර යන ප්‍රදේශවල මදුරුවන්ගේ සංඛ්‍යාව වැඩිවන ආකාරය නිශ්චය කිරීමත් ය. මැලේරියා සමූළ නාශනය අරභයා කරන ලද විශේෂ විමර්ෂණයක් ජාතික කීට විද්‍යාඥයින් ගේ හා ලෝක සෞඛ්‍ය සංවිධානයේ කීට විද්‍යාඥයින් ගේ කණ්ඩායම් මගින් මෙහෙයවන ලදි. මෙහි පරමාර්ථය වූයේ මදුරුවන් කෘමිනාශකයන්ට ඔරොත්තු දීමට පටන් ගෙන ඇද්දැයි සොයා බැලීම හා රෝග හාරක මදුරුවන්ගේ ජීව විද්‍යාත්මක තොරතුරු රැස්කර ගැනීමය. කීට විද්‍යාත්මක වැදගත් කම් සොයා බැලීම සඳහා රැස්කරගත් සෑම ජීවියකුම ජාතික කීට විද්‍යාඥයකු හාරයේ පවත්නා කුරුණෑගල කීට විද්‍යා රසායනාගාරයේ දී පරීක්ෂා කර බලන ලදි.

රෝගය පැතිරයන ප්‍රදේශය තුළ පිහිටි ගෙවල්වලින් සියයට 8ක් අන් ක්‍රමයෙන් ද සියයට 16 ඉසීම ක්‍රමයෙන් ද පරීක්ෂා කිරීමෙන් ඇනෝපිලස් මදුරුවන් සිටි බැව් ස්ථිර විය. එහෙත් අන් ක්‍රමයෙන් එක් ඇ. කියුලිසිපිසි වැඩුණු මදුරුවකු ද ඉසීමේ ක්‍රමයෙන් දෙදෙනෙකු ද අල්ලා ගන්නා ලදි. කෘමි නාශක ඉසින ලද රෝග ග්‍රස්ත ප්‍රදේශවල පිහිටි ගෙවල ඇනෝපිලස් වර්ගයේ මදුරුවන් සිටි ප්‍රමාණය ඉතා අඩු වුවද, අත් ක්‍රමයෙන් 4ක් හා ඉසීමේ ක්‍රමයෙන් 6ක් අල්ලා ගෙන ඇත. ඇ. කියුලිසිපිසිස් වර්ගයේ වැඩුණු මදුරුවන් විශාල සංඛ්‍යාවක් විශේෂයෙන් කිලිනොච්චියේ පිහිටි කෘමිනාශක ඉසිනු නොලැබූ ගෙවලින් අල්ලා ගත හැකි විය. රෝගය පැතිර යන කාලයේ පිහිටි සහාය නිරීක්ෂක ස්ථාන වල දී කරන ලද පිළා සමීක්ෂණ පවත්වන ලදි. ගම්වල පිහිටි මදුරුවන් බෝවිය හැකි ස්ථාන 43,544කින් සහායක නිරීක්ෂණ භූමි 185කින් හා නිරීක්ෂක ඒකක 11කින් අල්ලා ගත හැකි වූයේ ඇ. කියුලිසිපිසිස් වර්ගයේ පිළවුන් 87ක් වුව ද ඇනොපිලීන් පිළවුන් 90,902ක් අල්ලා ගත හැකි වී ඇත. රෝගය පැතිරයන මධ්‍ය කලාපයට අයත් කටාන හා කුරුණෑගල ප්‍රදේශවල ඇති ගංගාවලින් ද රෝග ග්‍රස්තවූ දකුණු කලාපයේ ගොඩකවෙල පිහිටි ගංගා වලින් ද රෝග හාරක මදුරුවන් බෝවන බැව් සොයාගෙන ඇත.

රෝග ග්‍රස්ත ප්‍රදේශයේ රෝග හාරක මදුරුවන්ගේ බෝවීම පුළුල් අන්දමින් පැතිර පැවතුන ද එය සිදුවූයේ වරින්වරය. එහෙත් උතුරු දිග ප්‍රදේශයට අයත් කිලිනොච්චිය, වව්නියාව හා චාවාකච්චේරිය යන තැන්වල මදුරුවන්ගේ බෝවීම ක්‍රමිකව පැවතින. මේ ප්‍රදේශයට අයත් ගම්වල මදුරුවන් බෝවීමට ඉඩ ඇති ස්ථාන 13,259ක් නිරීක්ෂණ හා සහාය නිරීක්ෂක භූමි 67ක් පරීක්ෂා කිරීමෙන් අල්ලා ගත් අනෝfපිලීන් පිළවුන් 32,096 දෙනෙකු අතුරින් මැලේරියා හාරක මදුරු පිළවුන් 1,971 දෙනෙකු සොයා ගත හැකි විය.

ජාතික හා ලෝක සෞඛ්‍ය සංවිධානයේ කීට විද්‍යාඥ කණ්ඩායම් විසින් පහත සඳහන් විමර්ෂණ අරඹන ලදි.

(i) ඩීඩීටී හා ඩියල්ඩ්‍රින් ඉසිනු ලැබුවාවූත් නොලැබුවාවූත් ප්‍රදේශවල සිටින ඇ.කියුලිසිfපේසිස් වර්ගයේ මදුරුවන් හා පිළවුන් තුළ එම කෘමිනාශක වලට ඔරොත්තු දීමේ ශක්තියක් ඇත්දැයි නිගමනය කිරීම.

(ii) රාත්‍රී කාලයේ වසා සිටින ආහාරය ලේ උරාගැනීමට කැමැත්ත දක්වන අය හා නිවාස තුළ ඒ ඒ අවස්ථාවන් හි පවතින ජෙනෝටිරොපික් තත්ත්වයන් වැනි මදුරුවන්ගේ ජීවනය පිළිබඳ කරුණු හැදෑරීම.

(iii) කෘමි නාශක ඉසිනු ලැබුවාවූත් නොලැබුවාවූත් රෝග ග්‍රස්ත හා රෝග කාරක ප්‍රදේශවල පිහිටි තෝරාගනු ලැබූ නිරීක්ෂණ ගම් 4ක සිරිත් පරිදි කෙරෙන විමර්ශණ පැවැත්වීම.

කෘමි නාශකවලට මදුරුවන් තුළ ඔරොත්තු දීමේ ශක්තියක් ලබාගෙන ඇත්දැයි නිශ්චය කිරීම සඳහා කරන ලද පරීක්ෂණ වල දී ඔවුන් තවදුරටත් ඩීඩීටී හා ඩියෙල්ඩ්‍රින්වලට ඔරොත්තු දීමේ ශක්තියක් ලබාගෙන නොමැති බැව් අනාවරණය වී ඇත.

මැලේරියා හාරක මදුරු පිළවුන් සම්බන්ධයෙන් කරන ලද පරීක්ෂණවල දී ඩීඩීටී දශලක්ෂයකින් 0.1ක් ඉසිමෙන් මදුරු පිළවුන් සියයට සියයක් ම මිය යන බැව් සොයා ගන්නා ලදී. මදුරුවන්ගේ ජීවන චරියාව සම්බන්ධයෙන් කළ පරීක්ෂණවල දී ඇ. කියුලිසිපේසිස් වර්ගයේ මදුරුවන් හරකුන්ගේ ලේවලට සියයට 48.9ක් ද මිනිස් ලේ සඳහා සියයට 31.9ක්ද බලු ලේ සඳහා 17.9ක් ද කුරුළු ලේ සඳහා 1.3ක් ද යන පරිදි කැමැත්තක් දක්වන බැව් සොයා ගන්නා ලදී.

දවසේ නොයෙක් කාල සීමාවන්වල දී අල්ලා ගනු ලැබූ මදුරුවන් සම්බන්ධයෙන් කරන ලද ජෙනෝටිරොපික් තත්ත්ව සමීක්ෂණයක දී වැඩි වශයෙන් මදුරුවන් ගංවලට පැමිණෙන්නේ සවස ඉරු බැස යන විට දී බැව් පෙනී ගොස් ඇත. ලේ උරා බීමේ කාර්ය මුලුරැය මුළුල්ලේම සිදුවන නමුත් අලුයම කාලයේ දී එය වැඩි වන්නේය.

බිත්තර සහිත වැඩුනු මදුරුවෝ බීජ දැමීම සඳහා ඉරු බැස යන විට ගෙවලින් පිට වෙති.

කෘමිනාශක ඉසිනු ලැබුවාවූ හා නොලැබුවාවූ පෙදෙස්වල ඇ කියුලිසිපේසිස් මදුරුවන් සිටින ප්‍රමාණය නිශ්චය කිරීම සඳහා එක් එක් රෝග ග්‍රස්ත හා රෝග කාරක කලාපයකට ගම් දෙක බැගින් වනසේ තෝරා ගත් ගම් සතරක දී සිරිත් පරිදි කෙරෙන විමර්ශණයන් මේ වර්ෂයේ ජූනි මස සිට පවත්වන ලදී.

ඇ. කියුල්සිපේසිස් පිළවුන් සොයා ගනු ලැබූ ප්‍රධාන මාර්ග වූයේ මේ කලාප දෙක ටම අයත් ගංගාවන් ය. රෝග ග්‍රාස්ත ප්‍රදේශයේ දී වැඩුනු මදුරුවන්ට වඩා පිළවුන් සොයා ගත හැකිවුව ද රෝග කාරක ප්‍රදේශයේ දී ලැබුණු ප්‍රතිඵල මෙහි අනෙක් පැත්ත විය.

රෝග ග්‍රස්ත ප්‍රදේශයේ කෘමි නාශක ඉසිනු ලැබූ ගෙවල වැඩුණු මදුරුවන් නොසිටිද්දී එම ප්‍රදේශවලින් පිළවුන් වැඩි වැඩියෙන් අල්ලා ගැනීමට හැකිවීම ජනේල දැල් දමා මදුරුවන් ඇල්ලීමේ පරීක්ෂණ, ඔරොත්තු දීම බැලීම හා හානිකර දැයි බැලීමේ පරීක්ෂණ, බාහිර ආරක්ෂක ස්ථාන පරීක්ෂණ හා ප්‍රෙසිපිටින් පරීක්ෂණ යන ආදිය තවදුරටත් කළ යුතුව ඇත. මෙම පරීක්ෂණ නියමිත සැලැස්මක් යටතේ තවදුරටත් කෙරෙනු ඇත.

(උ) සෞඛ්‍ය අධ්‍යාපනය

මැලේරියාව මුළිනුපුටා දමා ඇතැයි යන බහුතර විශ්වාසය නිසා සමූළඝාතක කටයුතුවලට ඇතැම් අංශවලින් ලැබුණු නොසැලකිලිමත් භාවය හා විරුද්ධත්වයන් මැඩලීම සඳහා ව්‍යාපාරයට අයත් සෞඛ්‍ය ශික්ෂක තැන වර්ෂය මුලුල්ලේ ම මහත් උනන්දුවකින් කටයුතු කළේ ය. චිත්‍ර ශිල්පියාගේ සහයෝගය ඇතිව තැනූ සෞඛ්‍ය අධ්‍යාපන භාණ්ඩ දිවයින පුරා පිහිටි ක්ෂේත්‍ර ඒකකයන්ගේ මාර්ගයෙන් බෙදා හරින ලදී. ආදර්ශ රූප හා ප්‍රදර්ශක භාණ්ඩ නිෂ්පාදනය කරන ලදී. ව්‍යාපාරය සහභාගිවූ ලංකා විශ්ව විද්‍යාලයේ සෞඛ්‍ය ප්‍රදර්ශනය සඳහා පොත් පිංචක් පළ කරන ලදී. පෝලියෝ එන්නත් ව්‍යාපාරයේ දී සෞඛ්‍ය ශිෂ්‍යක තැන මහජන අධ්‍යාපන කටයුතු වල හා ප්‍රචාරක කටයුතුවල නිරතවිය. තවද මහරගම දත්හෙදි ඇබැසි විදුහලේ පුහුණුව ලබන දත් හෙදියනට දේශන මාලාවක් පවත්වන ලදී. සෞඛ්‍ය අධ්‍යාපන දෘශ්‍යාධාර කට්ටලයක් හා පත්‍රිකාද, මැලේරියා සමූල නාශක කටයුතු අලලා පිළියෙල කරන ලද ඡායාරූප එකතුත් හා ඒ පිළිබඳ විස්තර වෘත්තාන්තයන් ද ලෝක සෞඛ්‍ය සංවිධානය වෙත යවන ලදී.

(ඌ) ප්‍රවාහනය හා වැඩපළ

මැලේරියා සමූළු නාශක වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා මෙම ව්‍යාපාරය මගින් මෝටර් රථ 114ක් නඩත්තු කෙරේ. මෙම රථවාහන සම්බන්ධයෙන් කරන ලද සියලුම පිළිසකර කටයුතු ප්‍රධාන වැඩ පළේ හෝ ක්ෂේත්‍රයේ සිටින කාර්මිකයින් විසින් කරන ලදි. නවීන උපකරණ රාශියක් වැඩපළෙහි සවිකරන ලදි. එක්සත් රාජධානියේ ආධාර දූත මෙහෙය මගින් ලැබුණු ආධාර යොදවා වැඩ පළ නවාංග සම්පන්න කිරීමේ කටයුතු ඉතා සාර්ථක අයුරින් කරගෙන යන ලදි. වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුවට අයත් වෙනත් රථ 23ක් අලුත්වැඩියා කිරීමට බාර ගනු ලැබිය.

අළුත් රථ 11ක් මිළ දී ගත් අතර පරණ රථ 8ක් පාවිච්චියට අයෝග්‍යයයි තීරණය වූයෙන් විකුණා දමන ලදි.

මෙම වර්ෂයේ ජූලි මාසයේ සිට පුරප්පාඩු වූ ප්‍රවාහන පෝර්මන් තනතුර සම්පූර්ණ කරනු නොලැබුණි. ප්‍රවාහන කටයුතුවල හා වැඩපළේ යහපත තකා මෙම තනතුර නොපමාව සම්පූර්ණ කළ යුතුව ඇත.

7. විදේශීය ආධාර

එක්සත් ජනපද රාජ්‍ය ආධාර දූත මෙහෙය මගින් පිටරටින් මිළ දී ගනු ලබන ද්‍රව්‍ය වන මෝටර් රථ හා අමතර කොටස්, වැඩපළ සඳහා අවශ්‍ය උපකරණ, කෘමිනාශක ඖෂධ, ඉසිමේ ඉපකරණ, ඖෂධ වර්ග, රසායනාගාර උපකරණ හා කාර්යාල බඩු බාහිරාදිය ගැනීම සඳහා මුදල් ඩොලර්වලින් ගෙවන ලදි. සේවකයින්ගේ වැටුප් හා පුළුල් කරන ලද නිරීක්ෂණ වැඩ සටහන සඳහා වැය කිරීම සඳහා එම මුදලින් සියයට 75 ක් ලංකාවේ මුදලින් ගෙවන ලදී. ලංකාවේ මුදල් බවට පරිවර්තනය කළ රුපියල් 1,04,356.42ක මුදල වැයවූ ආකාරය අංක XLI දරණ සටහනෙන් දක්වා ඇත. පුළුල් කරනු ලැබූ නිරීක්ෂක කටයුතු සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් පරිත්‍යාග කළ සියයට 25ක් වූ මුදල ද එම සටහනෙහි ම දක්වා ඇත.

8. වියදම හා වටිනාකම් එක පුද්ගලයකුට

මුළු වර්ෂය සඳහා වැය වූ මුළු මුදල වන රු. 38,10,448.80 අංක XLI දරන සටහනින් දක්වා ඇත. ආරක්ෂා කරනු ලැබූ ජනගහණයෙන් එක් පුද්ගලයකු සඳහා වූ වියදම ශත 58කි.

(ඇ) බරවා රෝග මර්දනය

1. හැටළුව

ඩබ්ලිව්. බ්‍රෑන් ක්‍රෝෆ්ප්ට් නිසා රෝගය බෝවීම ප්‍රධාන හැටළුව ලෙස පැවතීගෙන යේ. ගතවූ වර්ෂවල දී මෙන් මෙම රෝගය දිවයිනේ නිරිත දිග මුහුදුබඩ තීරයට සීමාවී තිබුණ නමුත් වර්ෂය තුළ දී මේ රෝගය පැතුරුණු නව කේන්ද්‍රස්ථානයන් සොයා නොගන්නා ලදී. පසුගිය අවුරුදු පහ තුළ දී මේ රෝගයේ තත්ත්වය XLII වැනි සටහනින් පෙනේ.

පසුගිය වර්ෂ තුන තුලදී "මයික්‍රෝෆයිලේරියා" රෝගය අඩුවැඩි වීමක් නොමැතිව පැවතුණි. ප්‍රදේශයන් අනුව විග්‍රහකර බලන විට "මයික්‍රෝෆයිලේරියා" රෝගය පැතිරීම 1.4% (මීගමුව) සිට 6.9% (ගාල්ල) දක්වා වෙනසක් දැක්විය. පැළියගොඩ (5.2%) වත්තල සහ මාතර (5.1%) වැඩි වෙනසක් දැක්වූ අනිකුත් ප්‍රදේශ වේ.

2. සංවිධානය

බරවා රෝග මර්දනය වැඩි දියුණු කිරීමේ වැඩ සටහනේ පළමුවැනි පියවරේ ක්‍රියා පටිපාටිය රජය මගින් පිළිගෙන ඇති අතර 1962/63 මුදල් වර්ෂය සඳහා කාර්‍ය්‍ය මණ්ඩලය සහ උපකරණ වෙනුවෙන් මුදල් වෙන් කිරීමට කටයුතු සලස්වා ඇත.

(රසායනාගාර සේවා) නියෝජ්‍ය අධ්‍යක්ෂ යටතේ පාලනය වෙමින් පැවති කිට විද්‍යා අංශය 1961 දෙසැම්බර් 1 වැනිදා සිට බරවා රෝග මර්දන ආයතනයට මාරු කරන ලදී. බරවා රෝග මර්දන ව්‍යාපාරයේ කායික මණ්ඩලයට (මයික්‍රෝකොපිස්ට්ස්) ඔවර්සියර්වරු තිදෙනකු ද (පරපෝෂිත මර්දනය) ඔවර්සියර්වරු සිව් දෙනෙකු ද අතිරේක වශයෙන් බඳවා ගන්නා ලදී.

3. කටයුතු

කොළඹ සහ ගාල්ල නගර සභා ප්‍රදේශවල ඒ ඒ නගර සභාව මගින් මේ රෝගය මැඩලීමේ කටයුතු කරනු ලබන හෙයින් දිවයිනේ නිරිතදිග මුහුදු බඩ පළාත් වලට පමණක් මර්දන කටයුතු සීමා විය. කටයුතු සීමා වූයේ :—

(අ) **පරපෝෂිත විමර්ශන සහ පාලනය.**—රෝග උවදුරු ප්‍රදේශයේදී සෑම බරවා මර්දන ව්‍යාපාර මධ්‍යස්ථානවලට ක්‍රමානුකූලව රාත්‍රිකාලයේ දී ලේ සැම්පල් ගැනීමක් පරීක්ෂා කිරීමත් පරපෝෂිත පර්යේෂණවලින් කෙරිණ. ලේ සැම්පල ගෙන පරීක්ෂා කළ මිනිසුන් මුළු සංඛ්‍යාව වූ 1,26,892 අතරෙන් 4,378 දෙනකුට පරජීවය තිබූ රෝගින් වශයෙන් සොයා ගන්නා ලදී. (3.45% ප්‍රමාණය) පරජීවය තිබූ රෝගින්ට නිවෙස්වල දී "ඔයතිල් කාබමැසින්" නමැති බෙහෙත්වලින් ප්‍රතිකාර කරන ලදී. සංඛ්‍යානුකූලව බලන කල "පශ්චාත්-ප්‍රතිකාර" රුධිර ඡායාරූපවලින් පෙනී ගියේ 8,704 අතුරින් 1,268 දෙනකුට නිශ්චිත රෝගය වැළඳී තිබුණ බවයි. (14.5%) නිශ්චිත රෝග සංඛ්‍යාව 1.9 (මීගමුව) සිට 21.6 (ගාල්ල) දක්වා වෙනස් විය. නිශ්චිත රෝගීන් ගේ සංඛ්‍යාව වූ මධ්‍යස්ථාන නම් අම්බලන්-ගොඩ (21.5) මාතර (17.5) දෙහිවල (18.2) සහ කෝට්ටේ (16.7). ප්‍රතිකාර ලැබූ රෝගීන් අතුරෙන් සමහර රෝගීන්ට නිශ්චිතව රෝගය වැළදීමට හේතුවූයේ නොකඩවා සෑහෙන ප්‍රතිකාර ගැනීමට ඔවුන්ට නොහැකිවීම යයි සැකයෙන් තොරව කිව හැක.

මෙම විග්‍රහයේ දී අනාවරණය වූ තවත් සමහර දේවල් නම් :—

(i) රුධිරයෙහි නිශ්චිත රෝගය වයස අවුරුදු 0-9 කාල සීමාවේ දී ඉතාමත් අඩු බව, වයස අවුරුදු 20 සිට ඉහල කාල සීමාවේදී සාමාන්‍යයෙන් අධික බව, ස්ත්‍රී පුරුෂ භාවයේ සැලකිය යුතු වෙනසක් නොවිය.

(ii) බරවා පරජීවය ඇති රෝගීන් සමග අසුරු කරන්නන් තුළ අනිකුත් අයට වඩා රුධිරයෙහි නිශ්චිත රෝගය ඇති බැව් පෙනිණ.

(iii) චිකිත්සාගාරවල ප්‍රතිකාර ලැබූ අය තුල රුධිරයෙහි නිශ්චිත රෝගය ඇත්තේ කලාතුරකිනි. එම හේතුවෙන් චිකිත්සාගාරවල ප්‍රතිකාර ලබන රෝගීන් තුළ රෝගය අඩු බව පෙනිනි.

(iv) චිකිත්සාගාර වල ප්‍රතිකාර ලැබූවන් ගේ ප්‍රතිඵල ඉතාමත්ම සතුටුදායක වේ. ඔවුන් අසුරු කරන්නන් ගේ ප්‍රතිඵලත් එසේමය. එහෙත් රෝග පරජීවය සහිත බරවා රෝගීන් ලැබූ ප්‍රතිකාර වල ප්‍රතිඵල අල්පය.

(ආ) **කිට විද්‍යානුකූල පර්යේෂණ සහ මදුරු පාලනය.**—රෝගය ජැතිර පවත්නා ප්‍රදේශවල ස්ථාන 27 ක කිට විද්‍යානුකූල පර්යේෂණ පවත්වන ලදී. මදුරුවන් (සී(සී) fපැටිගන්ස්) 11,285 ක් එකතු කොට කපා බලන ලදී. මදුරුවන් 183 ක රෝග බෝවීම ඇති බැව් දැනගන්නට ලැබුණි. (රෝග බෝවන ප්‍රමාණය 1.6%) රෝග බෝවීම 0.37 (කෝට්ටේ) සිට 5.8 (වැලිගම) දක්වා වෙනස්ව පැවතුනි. (සී(සී) "fපැටිගන්ස්" හි රෝග බෝවීම වඩියේ මුළුල්ලේම සියළුම ස්ථානවල පාහේ දක්නට ලදී. බරවා රෝග බීජානුනාශක කටයුතුවලට අතිරේකව වැඩිගිය මදුරුවන් මර්දනය කිරීමේ කටයුතු සමන්විත වූයේ සීමිත ප්‍රමාණයකට දෙහිවල ගල්කිස්ස නගර සභා ප්‍රදේශයේත් මාතර නගර සභා ප්‍රදේශයේ සමහර කොටසකත් ගෙවල් දුම් ගැසීමයි." අනිකුත් සෑම ප්‍රදේශවලම රෝග පාලන කටයුතු කරන ලදී.

මදුරුවන් බෝකිරීමේ ස්ථාන 84,911 කට සතිපතා ක්‍රමයට මැලතියන් නමැති තෙල් වර්ගීය ඉසින ලදී. මදුරුවන් බෝවන ස්ථාන 1630 ක් පස් කණ අඩි 20,464 කින් සම්පූර්ණයෙන්ම පුරවා ස්ථිරවම නසාලන ලදී. වැසිකිලි නවීන ක්‍රමයේ වැසිකිළි බවට හැරවීම පිණිස රජයෙන් ආධාර දීමේ ක්‍රමය යටතේ දිය වල සහිත බාල්දි වැසිකිළි 1,032 ක් "ජලමුද්‍රිත" බවට හරවා ඇත.

4. රෝග නිවාරණ කටයුතු

රෝග පැතිර පවත්නා ප්‍රදේශවල පවත්වාගෙන යන විශේෂිත චිකිත්සාගාර 15 කදී රෝගීන් 9,959 දෙනකුට ප්‍රතිකාර කරන ලදී. වර්ෂය තුළදී සොයා ගන්නා ලද නව රෝගීන් 2,718 දෙනකු මෙම සංඛ්‍යාවට අයත්වනවා ඇත. දෙහිවල සහ රත්මලාන චිකිත්සාගාරයේදී ප්‍රතිකාර කරන ලද චිකිත්සාගාරික රෝගීන්, 1,236 විග්‍රහ කර ඇති අයුරු XLIV වැනි සටහනේ දැක්වේ

5. අධ්‍යාපනය

සෑම බරවා රෝග මර්දන ව්‍යාපාර මධ්‍යස්ථානවලට සතියක් තිස්සේ පවත්නා සෞඛ්‍ය අධ්‍යාපනික කටයුතු නැවත නැවත කරන ලදී. මෙම කටයුතු මාලාව උදේ වරුවේ පාසල්වලත් දහවල් වරුවේ ප්‍රජාමණ්ඩලවලත් කතා සහ සාකච්ඡාවලින් ද අනතුරුව සවස් වරුවේ චිත්‍රපට සහ සාකච්ඡාවලින් ද සමන්විත ය. පාසල්වල කථා 100 ක් ද මණ්ඩලවල කථා 104 ක් ද චිත්‍රපට 97 ක් ද පවත්වන ලදී. පේරාදෙනිය විශ්ව විද්‍යාලයේදී ලෝක විශ්ව විද්‍යාල සන්දර්ශනය අරභයා එක් ප්‍රදර්ශනයකුත් කෝට්ටේ ක්‍රිස්තියානි විදුහලේදී තවත් ප්‍රදර්ශනයකුත් පවත්වන ලදී. මේ ආදී වශයෙන් ප්‍රදර්ශන දෙකක් පැවැත්විණ.

විශේෂ වැඩ වූයේ—

(අ) දෙහිවල ගෙවල් දුම් ගැසීම පිළිබඳ ප්‍රචාරක වැඩ;

(ආ) කෝට්ටේ, පැලියගොඩ, රත්මලාන, පානදුර, සහ අම්බලන්ගොඩ වාර්ෂික සෞඛ්‍ය සතිය අරබයා පවත්වන ලද ප්‍රචාරක වැඩ; සහ

(ඇ) මීගමුවේ පැවැත්වූ, සී (සී) "පැටිගන්ස්" බෝවන ස්ථාන විනාශ කිරීමේ ශ්‍රමදාන වැඩ.

බරවා රෝගය එම රෝගය මර්දනය කිරීම ආදිය පිළිබඳව බරවා රෝග ව්‍යාපාරයට අයත් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට ද ඕවර්සියර් වරුන්ටද කම්කරුවන්ටද ඒ අතරම වෛද්‍ය ශිෂ්‍යයින්ටද, ඇපොතිකිරි ශිෂ්‍යයින්ටද, මහජන සෞඛ්‍ය හෙදියන්ටද, මහජන සෞඛ්‍ය ශික්ෂකයින්ටද, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගුරුවරුන්ටද, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ටැලිපෝන් ක්‍රියා කරුවන්ටද දේශනා පැවැත්විණ. රෝගය හට ගැනීමේ හේතු සහ එය මර්දනය කිරීම පිළිබඳ විස්තර දැක්වෙන පත්‍රිකා ද දැන්වීම් පත්‍රයද සකස් කොට බෙදා හරින ලදී.

තවද ස්වදේශීය චිත්‍රපටියක් සකස් කරන අටියෙන් බරවා රෝගය පිළිබඳ විස්තර සහිත "කල්‍යාණී" නමැති කථා පුවතක් ද එයට අදාල උපදෙස් ආදිය ද පිළියෙල කෙරිණ.

6. වෛද්‍ය රසායනාගාර වැඩ

ක්ෂේත්‍රයේදී ලබා ගන්නා ලද ලේ, වැඩුණු මදුරුවන්, පිළුම් ආදිය ඇතුළත් සැම්පල් වර්ගී බරවා මර්ධන ව්‍යාපාරයට අයත් මධ්‍යම රසායනාගාරයේදී පරීක්ෂාකරන ලදී. (පසුව ගන්නා ලද සැම්පල් 8,704 ඇතුලත් වූ) ලේ පරීක්ෂණ 1,35,596 ක් "ඩබ් බැන්-ක්‍රෝෆට්" බෝවීම පිළිබඳව පරීක්ෂා කිරීම පරපෝෂිත විද්‍යාත්මක වැඩවලට අයත් විය. දෙහිවල පර්යේෂණාගාරයේ දී කරන ලද වැඩ වෛද්‍ය පර්යේෂණායතනයේ දී

පරීක්ෂා කරන ලදී. තහඩු 711 ක මුළු ගණනක් පරීක්ෂා කරන ලදුව ඉන් 5 ක් සඳහා පමණක් අදහස් පරස්පර විරෝධී විය. කීට විද්‍යා වැඩවලට අයත්වූයේ මදුරුවන් හඳුනාගැනීම සහ ව්‍යවච්ඡේද කිරීමය. මේ සඳහා මදුරුවන් 11,887 ක් පරීක්ෂා කරන ලදී. මේ ගණනට සී (සී) පැටිගන්ස් 11,285 ක් ද එම් (එම්) යුනිෆෙප්මිස්, එම් (එම්) යුනිලිෆෙපරා, ඒ (ඒ) ඒජිප්ටි, ඒ (ඒ) ඔබ්ටර්බන්ස්, සී (සී) ගෙලිඩස්, සහ ඒ හසිරේනස් 602 ක් ද ඇතුළත්ය. පිලවී 32,501 ක්ද හඳුනා ගැනීම සඳහා පරීක්ෂා කරන ලදී. සී (සී) ට්‍රයිවේනියෝරයිකස්, (සී) (සී) පස්කොසිපෙලස් ආදිය පහසුවෙන් ලබාගත හැකිවූ වගීවලට අයත්ය. නා නා විධ කෘමි නාශක ද්‍රව්‍ය තැක්ක්ලොමොමයිකස් බෝවීම සහ සී (සී) පැටිගන්ස් ජීව කාලය කෙරෙහි මදුරුවන් භාජන වන්නේ කෙසේද යන්න සම්බන්ධව ශේෂිත වැඩ ප්‍රමාණයක් අතිරේක වශයෙන් කරන ලදී.

7. ලබා ඇති දියුණුව

දැනට යොදා ඇති (රෝගය පැතිර පවත්නා ප්‍රදේශයෙහි) කෘමි නාශක ද්‍රව්‍ය වලට මදුරුවන් භාජනවන්නේ කුමණ අන්දමටදැයි සොයා දැනගැනීම මෙම ව්‍යාපාරය මගින් ලබා ඇති දියුණුවලින් එකකි. ඩී. ඩී. ටී. බෙහෙත් ද්‍රව්‍ය සහ අනිකුත් ක්ලොරිනේටඩ් හයිඩ්‍රොකාබන්ස් ආදිය කෙරෙහි (සී) පැටිගන්ස් වඩා බාධක ශක්තියක් දක්වන බැව් පෙනී ගියේය. රෝගය මර්දනය කිරීම සඳහා මදුරුවන් ගේ පිලවී යෙදවීම සම්බන්ධව පර්යේෂණ පවත්වන ලදී. ඒ (එස්) ඒජිප්ටි, (සී) ගැලිඩස් සහ සී (සී) පැටිගන්ස් බෝවෙන වගී තුනක් සොයාගන්නා ලදී. මේ සම්බන්ධව ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිගමනය අපේක්ෂා කෙරේ.

"ලංකාවේ බරවා රෝගය" නමැති අත්පොතක් පිළියෙල කර ඇති අතර ලංකාවේ බරවා රෝග ප්‍රශ්නය සමාලෝචනය කිරීම පිළිබඳ පත්‍රිකාවක් "ජර්නල් ඔප් ද සිලෝන් පබ්ලික් හෙල්ත් ඇසොසියේසන්" නමැති සංගමයෙහි ප්‍රසිද්ධ කිරීම සඳහා යවා ඇත.

8. එක් අයකු සඳහා ගිය වියදම

එක් අයකු වෙනුවෙන් කළ වියදම දළ වශයෙන් ශත 87කි. මෙය පෙර අවුරුදුවලට තරමක් වැඩි වියදමකි. මෙයට හේතු භූත වූයේ කීට විද්‍යා සේවක මණ්ඩලය මර්දන ව්‍යාපාරයට මාරුකිරීමයි.

(ඇ) ලාදුරු රෝග මර්දනය

ලාදුරු රෝගය මැඩ පැවැත්වීමෙහි ලා අවශ්‍ය වන රෝග වැළැක්වීම, සුව කිරීම සහ රෝගීන් පුනරුත්ථාපනය කිරීම යන තුන් අංශය කෙරෙහි සැහෙන තරම් සැලකිල්ල දක්වන ලදි.

රෝගීන්ට කරන ලද ප්‍රතිකාරවල ගුණය සහ එයින් ලැබූ ප්‍රගතිය මැන බැලීම පිණිසත්, රෝග ස්පර්ශකයින් අතුරෙන් අළුත් රෝගීන් සොයා ගැනීම පිණිසත්, දැන ගන්ට ලැබී ඇති රෝගීන් සහ රෝග ස්පර්ශකයින් සියළු දෙනාම පාහේ පරීක්ෂා කර බැලීම අවුරුදු පතා කරන ලදි. එතෙකුදු වූවත්, බාලකපක්ෂගත රෝගය පැතිර ගිය සමයේ දී මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් බාලක පක්ෂගත රෝගය මැඩ පැවැත්වීමෙහි ලා උත්සුකව සිටි හෙයින්, මෙම කාර්යයට බාධා පැමිණියේ ය.

ලාදුරු රෝගය පැවැති තරම

දැන ගන්ට ලැබී ඇති ලාදුරු රෝගීන් ගණන පසුගිය අවුරුද්දේ දී 3,773ක්වූ මුත් එය දැනට 3,966ක් වෙයි. මිය යෑම, සුවය ලැබීම සහ දිවයිනෙන් පිටව යෑම යන හේතු උඩ රෝගීන් 116 දෙනෙකුගේ නම් ලේඛනයෙන් ඉවත් කරන ලදි. වැඩි විස්තර XLVI වන සටහනේ දැක්වෙයි.

රෝගයට ගොදුරුවූ සංඛ්‍යාව අවුරුදු 30-39 වයස් ගණයෙහි වූහ. ඊළඟට වැඩි ම සංඛ්‍යාව 40-49 වයස් ගණයෙහි වූ අතර, තෙ වන තැන හිමි වූයේ අවුරුදු 50-59 වයස් ගණයට ය.

ස්ත්‍රී-පුරුෂ දෙ පක්ෂය අතර රෝගය බල පැවැති අයුරු දැක්වෙන අනුපාතය 2. 9 : 1 ය. එම අනුපාතය වැඩි වශයෙන් කැපී පෙනෙනුයේ 4 : 1 ක්වූ බෝවෙන සුළු රෝග වර්ගයෙහි ය. බෝ නොවෙන සුළු වර්ගයේ එම අනුපාතය 2 : 1 ක් විය.

පළාත් වශයෙන්, ස්ත්‍රී-පුරුෂ වශයෙන් සහ රෝග ප්‍රභේදය වශයෙන් බෙදී යන මුළු රෝගීන් ගණන XLVII වන සටහනේ දැක්වෙයි. (කොළඹ නගර සභා සීමාවේ 562 දෙනෙක් ඇතුළු) රෝගීන් 2,089 දෙනෙකු සිරිමෙන් බටහිර පළාත මෙහි ලා මුල් තැන හිමිකර ගත්තේය. රෝගීන් 587 දෙනෙකු සිටි දකුණු පළාත දෙ වන තැන ලැබී ය.

පළාත් අනුව බෙදී යන ස්පර්ශකයින් මුළු ගණන XLVIII වන සටහනේ දැක්වෙයි.

සෞඛ්‍ය නිලධාරීන්ගේ සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකයින්ගේ සහභාගිත්වය ඇතුව මෙහෙයවන ලද වාර්ෂික සමීක්ෂණයේ දී, ස්පර්ශකයින් සියළු දෙනා ම පාහේ දක්නා ලදි. "කෙයාර්" කිරි සහ රෝග භංග ඩී. ඩී. ඇස්. බෙහෙත් වඩිය දීමට අමතරව, මෝර තෙල් ද සාමාන්‍ය සෞඛ්‍ය තත්ත්වය සහ ඔරොත්තු දීමේ ශක්තිය වැඩි කර ගැනීම සඳහා අවශ්‍ය අනෙකුත් කළමනා ද පාවිච්චි කරණ ලෙසත්, අවශ්‍ය අවස්ථාවල දී ස්පර්ශකයින්ට අවවාද-අනුශාසනා කරන ලදි. රෝග ස්පර්ශකයින් මාස් පතා පරීක්ෂා කොට බැලීමටත්, සෑක කටයුතු යමක් වෙතොත් වාර්තා කිරීමටත්, හැම ගෙදරකින් ම ගෘහ මූලිකයා නොහොත් වෙනයම් වගකිව යුතු පුද්ගලිකයෙකු තෝරා ගන්නා ලදි.

ආයතන ගත රෝගීන්

ආයතනවල නැවැති සිටි රෝගීන් සංඛ්‍යාව, 1962 සැප්තැම්බර් 30 වනදා මෙසේ විය.

හැඳල ලාදුරු රෝහල	...	...	644
මාන්නිවූ ලාදුරු රෝහල	...	...	183
උෂ්ණාභ සෞඛ්‍ය දනවුව	...	...	26
		එකතුව ...	853

තනි කරනු ලැබූ රෝගීන් උදෙසා අවුරුද්ද තුළ දී දරන්ට සිදුවූ මුළු වියදම රු. 16,37.661 කි. එක් රෝගියෙකු වෙනුවෙන් අවුරුද්දක වියදම ඒ අනුව රු. 1,920.00ක් වෙයි.

මිය ගිය තරම

වර්ෂය තුළ දී වාර්තා වූ මරණ 70 අතුරෙන් 27ක් වාර්තා වූයේ, හැඳල සහ මාන්නිවූ යන දෙ පොලේ පිහිටි ආයතනවලින් ය.

අළුත් රෝගීන්

වර්ෂය තුළ දී අළුත් රෝගීන් 309 දෙනෙක් ලේඛණාරූඪ කරනු ලැබූ හ. සමීක්ෂණවල දී සොයා ගනු ලැබූ රෝගීහු සහ රජයේ රෝහල්වල බාහිර අංශවලින් පෞද්ගලික වෛද්‍යවරුන් විසින් සහ සෞඛ්‍ය නිලධාරීන් විසින් එවනු ලැබූ රෝගීහු ද මීට ඇතුළත් වෙති. අළුත් රෝගීන් පිළිබඳ විග්‍රහයක් XLIX වන සටහනේ දැක්වේ.

රෝගයට ගොදුරුවූ වැඩි ම සංඛ්‍යාව 20-29 සහ 30-39 වයස් ගණවල දක්නා ලදි. 0-20 වයස් ගණයේ රෝගීන් 45 දෙනෙක් වූහ. (කොළඹ නගර සභා සීමාවේ 33 දෙනෙකු

ඇතුළුව) බටහිර පළාතේ අළුත් රෝගීන් 153 දෙනෙක් සිටි අතර, දකුණු පළාතේ අළුත් රෝගීන් 40 දෙනෙක් වූහ. රෝගීන් 106 දෙනෙක් බෝවෙන සුළු තත්ත්වයේ වූ අතර, 203 දෙනෙක් බෝ නොවන තත්ත්වයේ වූහ. ස්ත්‍රී-පුරුෂ භේදයෙන් කියතොත්, පිරිමි 232 දෙනෙක් ද ගැහැණු 77 දෙනෙක් ද වූහ.

ප්‍රතිකාරය

ඩී. ඩී. එස්. බෙහෙත වැඩි දෙනාගේ කැමැත්ත දිනා ගත් ඖෂධය වශයෙන් දිගට ම භාවිතයේ යෙදිණ. විකෘති වීම හරිගස්සා ගැනීමේ සහ ඉන් වැළකීමේ කායික ප්‍රතිකාර විධිය සමග ම, හරණීය වණයෙන් වැළැකීමේ සහ නිර්වින්දක අත් පා රැක ගැනීමේ ප්‍රතිකාර සහ අවවාද දීම, සිරිත් පරිදි කෙරෙන ප්‍රතිකාර විධිවල වැදගත් අංගයක් විය. පුනර්නිර්මාණක ශල්‍ය කර්ම ක්ෂේත්‍රයෙහි පුහුණුවක් ලැබීම සඳහා තෝරා ගනු ලැබූ වෛද්‍ය නිලධාරියා මෙරටට පෙරළා පැමිණි පසු, පුනර්නිර්මාණක ශල්‍ය කර්මය, ලබන අවුරුද්දේ දී භාවිතයට ගැනීමට බලාපොරොත්තුවනු ලැබේ. රෙදි විවීම, පා වහන් සෑදීම, රෙදි මැහීම, වඩු වැඩ සහ ගොවිකම් කටයුතු වැනි වෘත්තීය චිකිත්සක පහසුකම් වැඩි වැඩියෙන් දිගට ම සලසන ලදි.

විදේශීය ආධාර (ජ. සෞ. සං.)

පුනර්නිර්මාණක ශල්‍යකර්මය පටන් ගැන්මේ මුල් පියවර වශයෙන්, ලාදුරු රෝගය ගැන විශේෂ අවධාරණයෙන් යුතුව පුහුණුවක් ලැබීම පිණිස වෙල්ලෝර්හි ක්‍රිස්තියානි වෛද්‍ය විද්‍යාලය බලා කායික ප්‍රතිකරුවෙක් (චිකිත්සකයෙක්) පිටත්ව ගියේ ය. ශල්‍ය වෛද්‍යවරයෙකු දැනට තෝරා ගනු ලබා ඇති අතර, ලබන අවුරුද්දේ මුල හරියේ දී පමණ ඔහු මෙම ආයතනය වෙත පැමිණෙනු ඇතැයි බලාපොරොත්තු වනු ලැබේ.

ප්‍රතිකාර චිකිත්සාගාර

දිවයින පුරා නොයෙක් සෞඛ්‍ය කාර්යාලවල, රෝහල්වල සහ බෙහෙත්හල්වල සංවිධානය වූ, ලාදුරු රෝගීන්ට ප්‍රතිකාර කිරීමේ චිකිත්සාගාර 45ක් තිබේ. මධ්‍යම ලාදුරු චිකිත්සාගාරය ඇතුළු මෙම චිකිත්සාගාරවලින් 10ක් මෙහෙයවනු ලබන්නේ ලාදුරු ව්‍යාපාරයේ නිලධාරීන් විසිනි.

සෞඛ්‍ය අධ්‍යාපනය

ලාදුරු මර්ධන ව්‍යාපාරය සමග සහයෝගයෙන් කටයුතු කිරීමේ වැදගත්කම පුද්ගලයින්ට සහ මහජනතාවට වැටහුනොත් මිස, නැත්නම්, ලාදුරු රෝගය තවදුරටත් ගැටළුවක් ව පවතිනවා ඇත. එසේ හෙයින්, පත්‍රිකා, පොත් පිංචයන් සහ කථා මාර්ගයෙන්, සෑම තරාතිරමකට අයත් කෙනෙකුට ම රෝගය පිළිබඳ සැබෑ තතු ඉදිරිපත් කරන ලදි.

පුනරුත්ථාපනය

පුනරුත්ථාපනයට විශාල වැඩ කොටසක් අයත් වෙයි. රෝගීන් ආයතනයට ඇතුළත් කරනු ලැබූ අවස්ථාවේ සිට, සුවය ලබා සිය රක්ෂාවලට සහ පවුල්වලට ඔවුන් නැවත එක් වන තෙක් වූ කාලය මීට ඇතුළත් වෙයි. අවශ්‍ය අවස්ථාවලදී පුනර්නිර්මාණක ශල්‍ය කර්මය ද සහිතව, මනෝ වෛද්‍ය චිකිත්සාව, කායික චිකිත්සාව සහ වෘත්තීය චිකිත්සාව සෑම තැනම දිගටම පවත්වා ගත යුතු වෙයි.

දිගින් දිගට පැවතෙන නිර්වින්දනය සීමා දායක සාධකයක් වන අතර, රෝගියා ගේ අත්පාවලට හානියක් නොවන සේ ඔහුගේ හැකියාවන්ට සැසඳෙන අයුරු රක්ෂාව ලිහිල් කොට සකස් කළ යුතු වෙයි. කායික දුර්වලතාවය හේතුකොට ගෙන

නිතර ම පාහේ, රෝගයට ගොදුරු වූවන් කෙරෙහි ග්‍රාහක විෂම ඵල ඇති කරවයි. රෝගීන් සියළු දෙනාම පුනරුත්ථාපනය කිරීමට හැකි වනු පිණිස, මේ කරුණ ද පිළිගනු ලැබේ.

මුදලින් ආධාර

රෝහල්වලින් පිට කරනු ලැබූ බෝ නොවෙන රෝගීන් සඳහා මුදලින් ආධාර කිරීමේ වැඩ පිළිවෙල යටතේ ලාබ ප්‍රයෝජන ලබන්නන් මුළු ගණන, 1962 සැප්තැම්බර් අවසානයේ දී 397ක් වීමෙන් මුදුන් පෙත්තට ළඟාවිය. රෝගීන්ට මාසයකට රු. 50 ක් ගෙවනු ලබන අතර, දින 10කට වැඩි කාලයක් සඳහා පුනරුත්ථාපනය අවශ්‍ය වන විට සමානුපාතික මුදලක් අඩු කර ගනු ලැබේ. මේ අරබයා රු. 1,98,367.50ක මුදලක් ගෙවන ලදි.

(ඉ) සමාජ රෝග මර්දනය

1. ගැටළු

(i) රෝගය පැවති තරම

සමාජ රෝග ගැටළුව සැම'ත පැතිරී පවත්නට විය. පසුගිය තුන් අවුරුද්ද මුළුල්ලේ ඉහළ නගින්ට වූ, චිකිත්සාගාර කරා පැමිණි බෝවෙන සුළු උපදංශ සහ සුද බිංදුම රෝගීන් සංඛ්‍යාව, මේ අවුරුද්දේ දීත් ඉහළ නගිමින් පැවැතුණි. කොළඹ පිහිටි සමාජ රෝග චිකිත්සාගාරවල දී, බෝවෙන සුළු උපදංශ රෝගීන් 502 දෙනෙක් ද සුද බිංදුම රෝගීන් 2,185 දෙනෙක් ද ප්‍රතිකාර ලබා ඇති අතර, 1961 දී මෙම සංඛ්‍යාව, බෝවෙන සුළු උපදංශ රෝගීන් 484 දෙනෙක් ද සුද බිංදුම රෝගීන් 1957 දෙනෙක් ද යනුවෙන් විය.

මෙහි ඇති සංඛ්‍යාව අනුව එතරම් බැරෑරුම් තත්ත්වයක් නො පෙනෙතත්, "ගැටවර වයසේ උදවිය" අතර සමාජ රෝග හට ගැනීම වැඩි වන බවත් බටහිර රටවලින් අසන්ට ලැබීම, අනතුරු ඇඟවීමක් ලෙස සැලකිය යුතුව ඇත. ප්‍රතිකාර සඳහා පැමිණි රෝගීන් වැඩි ම සංඛ්‍යාව, අවුරුදු 20ටත් 29ටත් අතර වූ වයස් සීමාවේ විය.

ගණිකා සේවයත් සමාජයීය ආර්ත්ථික තත්ත්වයත්, සමාජ රෝග හට ගැනීම වැඩිවීමට හේතුවූ ප්‍රධාන තම සාධක වශයෙන් පවතින්ට විය. තද බල නීති-රීති පැනවීමෙන් ගණිකා සේවය අඩු වී, සමාජ රෝග මර්දනයෙහි ලා එයින් ඉමහත් රුකුලක් ලැබෙනු ඇත. බෝවෙන සුළු උපදංශ රෝගයේ මුල් අවස්ථාවට ලක්ව සිටි රෝගීන්ගෙන් සියයට 80ක් චිකිත්සාගාරයට පැමිණ ඇත්තේ සිය කැමැත්තෙන් නොහොත්, ඇසුරු කළ වුන් ගැන සෝදිසි කර බැලීමේ ප්‍රතිඵලයක් වශයෙනි. මහ ජන සෞඛ්‍ය අධ්‍යාපන කටයුතු ගැන මෙය මොනවට විස්තර කරයි. සුද බිංදුම රෝග යෙහි නොකඩවා නැගීම, බටහිර රටවල ඇති ආකාරය අනුව විය. දැනට පෙනෙන්ට තිබෙන සැපියට නම්, යම් වර්ගයක බලගතු ප්‍රතිශක්ති කරණී ආරක්ෂකයක් (ඉම්යුනෝ-ප්‍රොපිලාක්සිස්) නොමැතිව, මෙම රෝගය කිසිසේත් මැඩ පැවැත් විය නොහැකි ය.

(ii) සමාජීය පිනිවීම

කොළඹ සමාජ රෝග චිකිත්සාගාරයට ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පැමිණි වැඩිම සංඛ්‍යාව කම්කරුවන් අතර විය. උපදංශ රෝගයේ මුල් අවස්ථාවට ගොදුරුවූවන් සියයට 42ක් ද සුදු බිංදුම රෝගයට ගොදුරු වූවන් සියයට 34ක් ද කම්කරුවන් අතර වූහ. ඉකුත් වර්ෂයේ මොවුනතර දක්නා ලද මෙම සංඛ්‍යා මේ අවුරුද්දේ සංඛ්‍යාවලට සමාන වෙයි. ගණිකාවන් අතරේත්, අහම්බෙන් හාදකම් ඇති කරගත් උදවිය අතරේත්, රෝග බෝවෙන මාර්ගය ඉතා ඉහළින් ම විද්‍යමාන විය.

2. සංවිධානය

ව්‍යාපාරයේ සංවිධානයෙහි කිසිදු වෙනසක් නොවීය. මහනුවර, (කටුගස්තොට) යාපනේ, ගාල්ල, රත්නපුර, කුරුණෑගල, බදුල්ල, අනුරාධපුර, මීගමුව සහ හොරණ යන මධ්‍යස්ථානවල පූර්ණකාලීන සමාජ රෝග චිකිත්සාගාර නමයක් සිය කටයුතු ඉටු කළහ. 1962 මැයි මාසයේදී අනුරාධපුර සමාජ රෝග චිකිත්සාගාරයට පූර්ණ කාලීන වෛද්‍ය නිලධාරියෙකු පත් කරනු ලැබිය. චිකිත්සාගාර දෙකක ප්‍රාරම්භක අත්හදා බැලීමකින් පසුව, පිට පළාත්වල පිහිටි සමාජ රෝග චිකිත්සාගාර විමධ්‍යගත කිරීමට තීරණය කර ගන්නා ලදී. 1962 මැයි මාසයේ සිටම, කුරුණෑගල සහ බදුල්ලේ ඇති සියළු පූර්ණකාලීන සමාජ රෝග චිකිත්සාගාරවල, විමධ්‍යගත කිරීමේ අත්හදා බැලීම් කර ගෙන යනු ලැබේ.

3. සම්බන්ධීකරණය

(අ) පළාත් පාලන මණ්ඩල

කොළඹ සහ මහනුවර පූර්ව ප්‍රසව චිකිත්සාගාර මෙහෙයවන නගර සභා සෞඛ්‍ය නිලධාරීන් විසින් එම චිකිත්සාගාරවල ලේඛ්‍යාරූඪව සිටි සියළුම අය විෂයයෙහි සිරිත් පරිදි කෙරෙන පූර්ව ප්‍රසව ලේ පරීක්ෂණ දිගටම කර ගෙන යන ලදී. රෝග බීජ ශරීරගත වූ බවට ලකුණු පහළ කළ අය ගැන සෝදිසි කොට බලා, කොළඹ මධ්‍යම සමාජ රෝග චිකිත්සාගාරයේදී සහ කටුගස්තොට දී ඔවුන්ට ප්‍රතිකාර කරන ලදී.

(ආ) ස්වෙච්ඡා සංවිධාන

ඒ ඒ ප්‍රදේශවල පිහිටි ස්වේච්ඡා සංවිධානවල සහයෝගය ඇතුව, සමාජ රෝග මැඩලීම පිළිබඳ අධ්‍යයන පරිපාටි සහ සමූහ සාකච්ඡා මෙහෙයවන ලදී.

4. මැඩ කටයුතු

රෝගීන් සොයා ගැනීම, රෝග විනිශ්චය, ප්‍රතිකාර විධි සහ අනුගාමික විධි විධාන යනාදි මැඩ කටයුතු වඩා පුළුල් පදනමක් පිට සියළුම පූර්ණ කාලීන සමාජ රෝග චිකිත්සාගාරවල දිගටම කර ගෙන යන ලදී. චිකිත්සාගාරවල ප්‍රතිකාර ලැබූ සියළු අළුත් රෝගීන් පිළිබඳ විග්‍රහයක් L වන සටහනෙහි දිස් වේ.

(I) වැළැක්වීම

සිරිත් පරිදි ගනු ලබන ක්‍රියා විධියක් වශයෙන්, බෝවෙන සුළු උපදංශයට ගොදුරු වූ සියලුම අය වසංගත රෝග විද්‍යානුකූලව සෝදිසි කර බලන ලදී. චිකිත්සාගාරය කෙරෙහි විශ්වාසය තැබූ රෝගීන්ගේ ද සහාය ඇතුව, බෝවෙන සුළු උපදංශ රෝගීන් ඇසුරු කළවුන් කිහිප දෙනෙකු සොයා ගනු ලැබ, ප්‍රතිකාර සඳහා ගෙන එන ලදී. පසුගිය කාලයේ මෙන්ම සිර ගෙවලට රිමාන්ඩ් නිවෙස්වලට සහ බාල අපරාධකරුවන්ගේ අභ්‍යාස පාසැල්වලට ඇතුළත් කර ගනු ලැබූ සෑම දෙනාම, සිරිත් පරිදි ලේ පරීක්ෂණවලට භාජන කරනු ලැබූහ. කොළඹ ගෑහැණු රෝහල්වල, නගර සභාවට අයත් පූර්ව ප්‍රසව චිකිත්සාගාරවල සහ පූර්ණකාලීන සමාජ රෝග චිකිත්සාගාර ඇති සියළු පළාත්බද රෝහල්වල ගැබිනි මව්වරුන් විෂයයෙහි සිරිත් පරිදි ලේ පරීක්ෂණ මෙහෙයවීම දිගටම කරගෙන යන ලදී. පූර්ව ප්‍රසව ලේවල ප්‍රතික්‍රියා ප්‍රතිශතකය LI වන සටහනෙන් පෙනෙන අයුරු 1-3ක් වීමෙන්, එය 1961 අවුරුද්දේ මෙන්ම වීය. "ලීවර් බ්‍රදර්ස්" මහතුන්ගේ ඉල්ලීමක් පිට එහි සේවක-සේවිකාවන් 391 දෙනෙකුගේ ලේ පරීක්ෂා කරන ලදී.

(II) සුව කිරීම

උපදංශ සහ සුද බිංදුම රෝගීන් සියළු දෙනා විෂයයෙහිම කොළඹ සමාජ රෝග චිකිත්සාගාරයේ සිරිත් පරිදි පී. ඒ. එම්. ඖෂධ භාවිතා කරන ලදී. රෝගීන්ට සතියකට වරක් පමණක් චිකිත්සාගාරවලට පැමිණීමට ඉඩ ලැබෙන පිට පළාත්වල සමාජ රෝග චිකිත්සාගාර ස්වල්පයක "බෙන්සතින්" සහ "පෙනිසිලින්" භාවිතයට ගෙන ඇත.

"ට්‍රිපොනීමා පැලිඩම්" පෙනිසිලින් කෙරෙහි දිගටම ප්‍රබල සංවේදීතාවය මදක් අඩු බව පෙනී ගියත්, එම ජීවානුව අනෙකුත් ප්‍රතිජෛවක විශාල සංඛ්‍යාවකට කා වැදීමට ඉඩ තිබෙන හෙයින් එක් එක් රෝගියාට ප්‍රතිකාර කිරීම ගැටළුවක් නොවේ.

පී. ඒ. එම්. ඖෂධය ශරීර ගත කිරීමෙන් අනතුරුව අසංරක්ෂිත ප්‍රහාරයක් අතිවූ දුටු ප්‍රථම අවස්ථාව, කොළඹ සමාජ රෝග චිකිත්සාගාරයේ රෝගී කාන්තාවක් පිළිබඳව දක්නට ලැබිණ. කන්තුක උත්තේජක කිහිපයක් ම ශරීර ගත කරන ලද්දේ වී නමුත්, රෝගියා යළි පණ ගැන්වෙන බවට කිසිදු ලකුණක් නො විය. එසේ ද වූවත්, "පෙනිසිලිනාසේ" (අයි. වී. සහ අයි. එම්. යන දෙවර්ගයම) කුප්පි දෙකක් ශරීර ගත කිරීම හේතුවෙන්, මරණාසන්නව වැදහොත් රෝගියා ඉතාමත් විශ්මය ජනක ලෙස යළි පිබිදුනේ ය. පෙන්සිලින් ප්‍රතිකාරය ඇරඹීමට මත්තෙන් සියළු රෝගීන් පෙන්සිලින් කෙරෙහි දක්වන සංවේදීතාවය අත්හදා බැලිය යුතු යැයි, තීරණය කර ගන්නා ලදි.

5. අධ්‍යාපනික

පිටපළාත් බද ආයතනවල අර්ධ කාලීන සමාජ රෝග චිකිත්සාගාර මෙහෙයවී මෙහිලා වෛද්‍ය නිලධාරීන් සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් පුරුදු-පුහුණු කිරීම ගිය අවුරුද්දේ මෙන්ම කර ගෙන යන ලදි. සේවයේ සිටින්නාවූ සහ පුහුණුව ලබන්නාවූ වෛද්‍ය සහ උපසථමිහක—වෛද්‍ය පිරිස් උදෙසා දේශනා සහ ආදර්ශ සහිත දේශනා මෙහෙයවන ලදි. සමාජ රෝගවලට ලක්වූ රෝගීන් කෙරෙහි දැක්විය යුතු ලීලාව වැඩි දියුණු කර ගැනීම සඳහා සුළු සේවක-සේවිකාවන් සමාජ රෝග පිළිබඳ ව දන්නා තරම් මැන ගැනීම් වස්, කොළඹ මධ්‍යම සමාජ රෝග චිකිත්සාගාරයේ දී, සුළු සේවක-සේවිකාවන් උදෙසා සාකච්ඡා පාඨ මාලාවක් මෙහෙයවන ලදි.

6. රසායනාගාර වැඩ

උපදංශය සඳහා (සමාජ රෝග පර්යේෂණ රසායනාගාර) ස.රෝ.ප.ර. පරීක්ෂණ සහ අනෙකුත් අනුදක්න (අන්වීක්ෂන) වැඩ කොළඹ, මහනුවර (කටුගස්තොට), යාපනේ, රත්නපුර සහ කුරුණෑගල රසායනාගාරවල පවත්වන ලදි. බදුල්ලේ සහ ගාල්ලේ රසායනාගාරවල ස.රෝ.ප.ර. පරීක්ෂණ 1962 ජනවාරියේ දී ඇරඹින. කලින් වෛද්‍ය පර්යේෂණ ආයතනයේ දී සිරිත් පරිදි කරන ලද සමාජ රෝග මස්තු විද්‍යාත්මක වැඩ සියල්ල, 1962 ජනවාරි 1 වන දා සිට මධ්‍යම සමාජ රෝග චිකිත්සාගාර බද රසායනාගාරයට භාර දෙන ලදි. ඒ සඳහා අමතර කාර්ය—මණ්ඩල ය ද සපයන ලදි. දිනකට පැටවුණ වැඩ ප්‍රමාණය නිදර්ශක 450ටත් 500ටත් අතර විය. ගොනෙකුකුසයන් වැඩිමේ සී. එස්. එෆ්. ක්‍රමය මත "වාසමාන්" ප්‍රතික්‍රියාව වෙනුවට, ඉතා පහසුවෙන් පිළියෙල කළ හැකි සුළු මාධ්‍යයක්, උඩ සමාජ රෝග පර්යේෂණ රසායනාගාර පරීක්ෂණ, ගැහැණු ආශ්‍රිතයින් සහ ගැටළු සහිත රෝගීන් කෙරෙහි සුදු බිංදුම විනිශ්චය කිරීම පිණිස සිරිත් පරිදි කෙරෙන්නක් වශයෙන් කර ගෙන යනු ලැබේ.

වගා කිරීම සඳහා පිට පළාත්වලින් ගොනොකුකුස බීජ පිටත් කර එවනු පිණිස "ස්ටුවර්ට්" ප්‍රවාහන විධිය භාවිතයට ගන්නා ලදි. ස.රෝ.ප.ර. පරීක්ෂණවලින් දිවයින පුරාම එකාකාර ප්‍රතිඵල ලබා ගැනීමට හැකි වනු පිණිස, මධ්‍යම රසායනාගාර යේ දී මද්දක මස්තු පිළියෙල කරන ලදුව, ස.රෝ.ප.ර. පරීක්ෂණ මෙහෙයවන සියළු ම රසායනාගාරවලට එය මාස් පතා බෙදා හරින ලදි. කරන ලද රසායනාගාර වැඩ LII වන සටහනේ දිස් වෙයි.

(ඊ) මානසික සෞඛ්‍යය

අවුරුද්ද තුළ දී සිදුවූ වැදගත් දෙයක් නම්, 1962 අප්‍රේල් මාසයේ දී පශ්චාත්-මූලික මනෝ-වෛද්‍ය හෙදකම් පාඨ මාර්ගය පටන් ගැන්මයි. මෙම පාඨ මාර්ගය සඳහා පොදු-හෙදියන් දස දෙනෙක් (උපාධිධර හෙදුන් 8 දෙනෙක් සහ සොයුරියන්

2 දෙනෙක්) තෝරා ගනු ලැබූ අතර, ශායනික පුහුණුව සඳහා ඔවුහු අවුරුද්ද අග හරියේ දී මුල්ලේරියාව රෝහලට යවනු ලැබූහ. ඔවුහු තම ශායනික පුහුණුව මුල්ලේරියාව රෝහලේ දී හදාරමින් සිටිත්. මනෝ-වෛද්‍ය හෙදකමට පිවිසෙන නව මාර්ග පිළිබඳ ඇති උනන්දුව මෙම පුහුණුව හේතුකොට ගෙන වැඩි වී ඇත.

අංගොඩ සහ මුල්ලේරියාව මානසික රෝහල්වල වාට්ටු නිලධාරීන් දෙදෙනෙක් ද කලින් අංගොඩ වැඩ කළ තවත් කෙනෙක් ද, මනෝ-වෛද්‍ය කර්මය විෂයයෙහි පශ්චාත් උපාධි අභ්‍යාසය සඳහා තෝරා ගනු ලැබ සැප්තැම්බර් මාසයේ දී එක්සත් රාජධානිය වෙත පිටත් කරන ලදහ. පසුගිය වසිවල පාලන වාර්තාවල කියූ පරිදි, මානසික රෝහලට ලෙඩුන් ඇතුළු කිරීමේ ස්වේච්ඡා සහ තාවකාලික ක්‍රම දිගට ම ජනප්‍රිය වී පැවතුණි.

කරන ලද වැඩ

ප්‍රතිකාර

නිවර්තන කලාපීය මානසික ඖෂධ වගී පහළ වීමෙන් පසුව, මානසික ආබාධ සඳහා ඒවා අවුරුද්දක් පාසා වැඩි වැඩියෙන් භාවිතා කරනු ලැබේ. කලින් අවුරුදුවල ක්ලොරොමසින් (පැරගැක්ටිල්) සහ පෙසර්පසින් පමණක් ලබා ගත හැකිව තිබුණ අතර, මානසික රෝහල්වල සහ කොළඹ මහ රෝහලේ චිකිත්සාගාරවල රෝගීන්ට ඒවා සැහෙන තරම් නියම කරන ලදි. නූතන ඖෂධ වර්ග පාවිච්චි කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, මානසික රෝහල්වල ආතුරාල (වාට්ටු) වල මුහුණුවරෙහි අමුතු වෙනසක් ඇති වී තිබේ. මෙම ආතුරාලවල සොසාව තරමක් අඩු වී තිබෙන බවත්, රෝගීන් සහයෝගය දෙන බවත් දක්නට ලැබේ. නිදන්ගත මානසික ආබාධ කෙරෙහි මෙම ඖෂධ වර්ග විශේෂිත චිකිත්සක ගුණයක් ඇති කරවන හෙයින්, ප්‍රතිකාරය සඳහා වැඩි වැඩියෙන් මානසික රෝගීන් ගැනීම මෙහි ලා සැලකිය යුතු විශේෂ අංගයෙකි.

ප්‍රෝඩාසික රෝගීන්ගෙන් වැඩි දෙනා විපාට ප්‍රේණික නම් වර්ගයට අයත් වන්නේය. නිදන්ගත රෝගයක් බවට හැරෙමින් මානසික රෝහලේ ආතුරාලවල රැඳී පවත්නා රෝග වර්ගය මෙයයි. නිවර්තන කලාපීය අළුත් ඖෂධ වර්ග වැඩි වැඩියෙන් වෙළෙඳ පොළෙහි දක්නට ලැබුණි. (මේවායින් වැදගත් තැනක් හිමි වනුයේ ට්‍රිප්‍යුපෙරසින් හෙවත් ස්ටෙලසින්වලට ය.) විශෙෂයෙන් ම විපාට ශ්‍රේණික වර්ගයට ප්‍රයෝජනවත්වන එය 1959යේ සිට ම පාහේ මනෝ-වෛද්‍ය චිකිත්සාගාර වලත් මානසික රෝහලේ සිටින රෝගීන් කෙරෙහිත් පාවිච්චි කරනු ලැබේ.

මළානික සභාවයේ රෝගවලට ප්‍රතිකාර කිරීමෙහි ලා මළානික බව නැති කිරීමේ ඖෂධ කිහිපයක් දැන් තිබේ. වෝසයිලිඩ්, මාප්ලාන්, හැඩොල්සින් යනාදී වැනි වූ මොනා-ඇමයිනෝ ඔක්සිකරණ නිෂේධක වර්ගයට අයත් ඖෂධ මුලදී තිබුණි. චිකිත්සාගාරමය අත්හදා බැලීම් සඳහා ඖෂධ වෙළෙඳ සමාගම් විසින් මෙම ඖෂධ වර්ග මානසික රෝහලට දෙන ලදුව ඒවා පාවිච්චි කොට බලන ලදි. මළානික කම නැති කිරීම සඳහා පාවිච්චි කරන ලද තවත් ඖෂධයක් නම් ටොප්‍රනිල්ය. මෙය බොහෝ ඖෂධ වර්ග අතුරෙන් ඉතාමත් සාර්ථක ඖෂධය විය. මළානික කමට ප්‍රතිකාර විශයෙන් ඖෂධ වර්ග පාවිච්චි වෙයි. මෙම ඖෂධ වර්ගවල වටිනාකම වනුයේ, රෝගියෙකුට දිය යුතු විදුලි ප්‍රතිකාර ගණන මෙයින් අඩුවීම යි.

ලාගක්ටිල් පෙති 923,823ක් සහ ලාගක්ටික් විදින බෙහෙත් කොපු 20,109ක් වර්ෂය තුළ දී පාවිච්චි කරන ලදි. ප්‍රතිකාර විධිවලින් ඉතාමත් ජනප්‍රිය ප්‍රතිකාරය වශයෙන් විදුලි ආක්ෂේපයිය චිකිත්සාව දිගට ම භාවිතයේ යෙදිණ.

ඉන්සියුලින් ආරක්ෂක චිකිත්සාව

තෝරාගනු ලැබූ ඇතැම් රෝගීන් විෂයයෙහි මෙම විධිය ද භාවිතා කරන ලදි.

වෘත්තීය චිකිත්සාව

අළුත් ගොඩනැගිල්ලක් එක් කිරීමෙන් වෘත්තීය චිකිත්සා අංශය අවුරුද්ද තුළ දී විශාල කරන ලදි.

පසුගිය වාර්තාවල සඳහන් කරන ලද සියළු ම කටයුතු කරගෙන යන ලදි. පේෂකර්ම උපදේශිකාවන් නොමැති කම නිසා ටික කලකට වසා දමා තිබුණ පේෂකර්ම මධ්‍යස්ථානය, අර්ධ-කාලීන පෙශකර්ම උපදේශිකාවක් පත් කිරීමෙන් අනතුරුව වර්ෂය තුළ දී යළි විවෘත කරන ලදි. කුඹල් වැඩ සහ සම් වැඩ පිළිබඳ උපදේශකයින් සේවයට ගැනීම සඳහා වර්ෂය තුළ දී ප්‍රතිපාදන සලසන ලද අතර, මෙම කාර්යය නොබෝ කලකින් ඇරඹීමට බලාපොරොත්තු වනු ලැබේ.

මනෝ-වෛද්‍ය සමාජ වැඩ

වර්ෂය මුල දී, සම්පූර්ණ අභ්‍යාසය ලැබූ මනෝ-වෛද්‍ය සමාජ සේවකයින් 3 දෙනෙක් ද පුහුණුව ලබන්නන් දෙදෙනෙක් ද වූහ.

නිපුණත්වය ලබා ඇති මනෝ-වෛද්‍ය සමාජ සේවකයාගේ මග පෙන්වීම ඇතුව, පුහුණුව ලබන සේවකයින් දෙදෙනා අංගොඩ මානසික රෝහලේ සහ කොළඹ මහ රෝහලේ චිකිත්සාගාරවල සේවය කළහ. මෙම පුහුණුව ලබන මනෝ-වෛද්‍ය සමාජ සේවකයින්ගෙන් එක් අයෙක්, කොළඹ ක්‍රම ශිෂ්‍යත්ව පරීක්ෂාව යටතේ අභ්‍යාසය සඳහා 1962 සැප්තැම්බර් මාසයේ දී එක්සත් රාජධානිය කරා යවනු ලැබී ය.

අනෙක් තැනැත්තා, ආයතනයේ තමාගේ වැඩට අමතර ව, සමාජ සේවා ආයතනයේ පාඨ මාර්ගයක් හදාරයි.

මනෝ විද්‍යාත්මක සේවය

සතියකට උදැසන පහක් අංගොඩත්, සවස වරුවල දී කොළඹ මහ රෝහලේ මනෝ-වෛද්‍ය චිකිත්සාගාරවල සහ රිජ්වේ රෝහලේ ළමුන්ට මග පෙන්වීමේ චිකිත්සාගාරවලත්, සම්පූර්ණ පුහුණුවෙන් නිපුණ මනෝවිද්‍යාඥයෙක් වැඩ කෙළේ ය. බුද්ධි පරීක්ෂණය, පුද්ගල භාවය පරීක්ෂා කිරීම, වෘත්තීය මාර්ගෝපදේශය සහ අදහස් මුදුන්පත් කර ගැනීම පිළිබඳ පරීක්ෂණයක කාර්යයන් සඳහා මනෝ-වෛද්‍යවරු මෑ වෙත රෝගීන් එවත්. හෙදි ඇබෑසි විදුහලේ දීත්, පශ්චාත් මූලික හෙදකම් පාසැලේ දීත්, කායික චිකිත්සක පාසැලේදීත්, සමාජ සේවා ආයතනයේ දීත්, ඈ දේශනා පවත්වන්නීය.

අංගොඩ මානසික රෝහලට ඇතුළත් කරන ලද "ක්‍රොමිනරි" නම් මානසික රෝගයෙන් පෙළෙන අය විෂයයෙහි සමාජීය විමර්ශනයක දී, ඇය ද සාමාජිකයෙකු ලෙස ඊට සහභාගි වූවා ය.

බාහිර රෝගීන් සේවය

අංගොඩ සහ මුල්ලේරියාව මානසික රෝහල්වල මනෝ-වෛද්‍යවරු මනෝ-වෛද්‍ය චිකිත්සාගාර 4ක් ද, අපස්මාර චිකිත්සාගාර 2ක් ද, නහබු චිකිත්සාගාරයක් ද කොළඹ මහ රෝහලේ දී පවත්වන්නාහ. රිජ්වේ රෝහලේ මෙහෙයවෙන ළමුන්ට මග පෙන්වීමේ චිකිත්සාගාරයකට ද මනෝ වෛද්‍යවරයෙක් සහභාගිවෙයි. පැලවත්තේ රෝහලේ මනෝ වෛද්‍යවරයා නාගොඩ රෝහලේ මනෝ-වෛද්‍ය චිකිත්සාගාර දෙකක් පවත්වමින්, ළමුන් සහ වැඩිහිටි උදවිය යන දෙගොල්ලන්ම එහි දී පරීක්ෂා කොට බලයි.

අපරාධ වැඩ පිළිබඳ ව ක්‍රියා කරන මනෝ-වෛද්‍ය තෙමේ සිපිරි ගෙයි රෝහලේ දී චිකිත්සාගාර දෙකක් පවත්වයි.

මහ රෝහලේ මනෝ-වෛද්‍ය අංශ

වර්තමාන මනෝ-වෛද්‍යකර්මය අනුව එය පොදු වෛද්‍ය කර්මය සමග හැකි පමණ දුරට එකට ඇදීමට වැර වඩන හෙයින්, රෝගීන්ට මුල් අවස්ථාවල දී ම පොදු

රෝහල්වලින් ප්‍රතිකාර ලබා ගත හැකි හෙයින්, මානසික රෝහල්වල ඇඳන් සඳහා ඇති තෙරපීම අඩු කළ හැකි වෙයි.

එසේ හෙයින්, මහනුවර, ගාල්ල සහ යාපනේ මහ රෝහල්වල මනෝ-වෛද්‍ය වාට්ටු ඇරීමට තීරණය කරන ලදී. එසේ ද වුවත්, හිටි හැටියේ ම මනෝ වෛද්‍යවරයින් අඩු පාඩුවීම හේතු කොට ගෙන, මෙම කාර්යය ඇන හිටීමට ඉඩ තිබේ.

මුල්ලේරියාව රෝහල

මෙම රෝහල ඒකක දෙකකින් යුක්ත වෙයි. රෝගීන් 144 දෙනෙකුත් පමණ සිටින I වන ඒකකය ප්‍රධාන වශයෙන් දරුණු මානසික ආබාධවලට ප්‍රතිකාර කිරීම සඳහා වෙයි.

II වන ඒකකයේ දැනට රෝගීන් 284 දෙනෙක් සිටිත්. එයින් වැඩි හරිය කල් අල්ලා සිටින (නිදන්ගත) රෝගීහුය. ලබන මුදල් වර්ෂයේ දී,-මදක් දරුණු රෝගීන් සහ නිදන්ගත රෝගීන් 500 දෙනෙක් පමණ අංගොඩ රෝහලෙන් මාරු කිරීමට අදහස් කරනු ලැබේ.

පැලවත්ත රෝහල

වැඩ කළ හැකි ශරීරවලින් යුත් කල් අල්ලා සිටින රෝගීන් සඳහා වෙන්වූ රෝහලක් මෙන් මෙය දිගට ම පැවතෙයි. එහි රෝගීහු ගොවිකමෙහි යොදවනු ලබත්. එහි රෝගීන් 293 දෙනෙක් පමණ සිටිත්. බෙල්ජියමේ ගිල් අත්හදබැලීමට සමාන අයුරකින් මෙම රෝහල ග්‍රාම ජනපදයක් බවට හැරවීමට අදහස් කරනු ලැබේ. මෙසේ කිරීමෙන්, කල් අල්ලා සිටින රෝගියෙකුට පුනරුත්ථාපනය වීමටත්, ජන සමාජයට නැවත ගමන් කිරීමටත්, වැඩි වැඩියෙන් ඉඩ කඩ ලැබෙන්නේ ය.

කිරි පට්ටිය

ගොවිකම් සහ සතුන් ඇති කිරීමේ අධ්‍යක්ෂ තැන විසින් පත් කරන ලද කමිටුවේ නිර්දේශ හැකි හැම විටෙක ම ක්‍රියාවේ යොදවා ඇති අතර, ලැබෙන කිරි ප්‍රමාණය වැඩි කර ගැනීම සඳහා මෙම නිර්දේෂ මුළුමනින් ම පිළිපැදීමට බලාපොරොත්තුවනු ලැබේ.

පට්ටියේ එළදෙනුන් 55ක් සමග සතුන් 109ක් සිටියහ. එම සතුන් සියයට 100ක් ම පාහේ පට්ටියේ ම බෝ වූවන් ය. වර්ෂය තුළ දී ලැබුණ කිරි ප්‍රමාණය පයින්ට් 103,943කි. එයින් ලැබූ මුදල රු. 54,570.11කි. පසුගිය අවුරුද්දේ කිරි ප්‍රමාණය පයින්ට 130,205ක් වූ අතර වටිනා කම රු. 68,357.10ක් විය. මෙසේ අඩුවීමට හේතුව, පසුගිය අවුරුද්දේ දෙනුන් 63ක් සිටි අතර මේ අවුරුද්දේ දෙනුන් අඩු වී යාමයි.

වඩාත් විද්‍යාත්මක පදනමක් මත පට්ටිය දියුණු කිරීමට නම්, ගොඩනැගිල්ල විශාල වශයෙන් දියුණු කළ යුතු වෙයි.

(උ) නීති වෛද්‍ය කටයුතු

පසුගිය කාලයේ දී මෙන්, වඩා වැදගත් වූ ද අසීරුවූ ද නඩු හබවලදී, පළාත්බද අධිකරණ විසින් ද, පොලීසිය විසින් ද, නීති පති දෙපාර්තමේන්තුව විසින් ද අධිකරණ වෛද්‍ය නිලධාරී තැනගේ සහාය පතන ලදී. පිට පළාත්වල වෛද්‍ය නිලධාරීහු සහ පළාත් බද අධිකරණ වෛද්‍ය නිලධාරීහු ද අසීරු නඩු සම්බන්ධයෙන් අධිකරණ වෛද්‍ය නිලධාරියාගේ උපදෙස් සෙවූහ.

නීති-වෛද්‍ය කාර්යාංශය විසින් අත ගසන ලද වැදගත් මිනී මැරුම් නඩු අතර, කෑගල්ලේ කඳු බෑවුමේ මිනී මැරුම් නඩුව සහ කුරුණෑගල, කරකුට්ටන් කරන ලද දරුවන් පිළිබඳ නඩුව ද විය.

කරන ලද වැඩ

වර්ෂය තුළ දී කරන ලද නොයෙක් විදියේ වැඩ කටයුතු පිළිබඳ විස්තරාවලියක් මෙහි මතු දැක්වේ.

(අ) පශ්චාත් මරණ පරීක්ෂණ

(ක) දිවි නසා ගැනීම් පිළිබඳ මුළු නඩු ගණන			76
(i) කැපීම් සහ පිහියා ඇනුම්	...	...	25
(ii) මොටට ආයුධ	...	...	36
(iii) වෙඩි පහරවලින් ලත් තුවාල සහ පිපිරීම්		...	6
(iv) තදබල ලෙස හුස්ම හිරිවීම්		...	4
(v) පිලිස්සීම් ...	...	...	1
(vi) වෙනත් හේතු	...	...	4
(කා) මාරක අණතුරු මුළු ගණන	...	...	232
(i) පාර තොටේ සහ දුම්රිය අනතුරු		...	146
(ii) රක්ෂාවේ නොසැලකිල්ල හේතු කොටගෙන සිදුවන අනතුරු	...	...	1
(iii) දියේ ගිලීම්	...	...	16
(iv) අකුණු වැදීම්	...	...	3
(v) විදුලි සැරය වැදීම්	...	...	3
(vi) වෙනත් (පිලිස්සීම්, වැටීම් යනාදියෙන් ගෙදර දෙරේදී සිදුවූ අනතුරු)	...	...	63
(කි) දිවි නසා ගැනීම්			46
(i) වසකීම් ...	...	...	18
(ii) තදබල හුස්ම හිරවීම්—			
එල්ලීමෙන්	...	...	13
දියේ ගිලීමෙන්	...	...	13
(iii) දුම්රියට අසුවීම්	...	...	7
(iv) වෙඩි තබා ගැනීම්	...	...	නැත
(v) නියුණු ආයුධ	...	...	නැත
(vi) පිලිස්සීම්	...	...	2
(vii) වැටීම් ...	...	...	2
(viii) වෙනත්	...	...	1
(කී) විවිධ			332
(i) ස්වාභාවික හේතු	...	...	285
(ii) අපරාධ සහගත ගස්සාව	...	...	1
(iii) ස්වාභාවික ගස්සාව	...	...	2
(iv) බිළිදුන් මැරීම්	...	...	1
(v) අජීවක දරු උපත්	...	...	1
(vi) කටයුතු වැරැදියාමෙන් විපත්		...	13
(vii) අවිනිශ්චිත	...	...	29
			686

අසිරු පශ්චාත්-මරණ පරීක්ෂණ මෙහෙයවන ලෙස පිට පළාත්වල මහේස්ත්‍රාත් වරුන්ගෙන් ඉල්ලීම් විසි හයක් අධිකරණ වෛද්‍ය නිලධාරියාට ලැබිණ. මෙයින් හය කදී මිනී වළෙන් ගොඩගැනීමට සිදුවිය.

(ආ) තුවාළ කිරීම්

	තදබල	තද බල නොවන	එකතුව
(i) මුවහත් ආයුධවලින් සිදුවූ	294 ...	828 ...	1,122
(ii) මොට්ට ආයුධවලින් සිදුවූ	1,482 ...	6,120 ...	7,602
(iii) වෙඩිපහරවලින් සිදුවූ	29 ...	— ...	29
(iv) බෝම්බ, පිපිරීම සහ පිළිස්සීම්වලින්	40 ...	— ...	40
(v) පාර තොටේ අනතුරුවලින් සිදුවූ තුවාළ	362 ...	1,505 ...	1,867
(v) රක්ෂාවේ යෙදී සිටියදී අනතුරුවලින් සිදුවූ තුවාල ...	— ...	60 ...	60
	2,207	8,513	10,720

(ඉ) අනෙකුත් පරීක්ෂණ

(i) ඊනියා තනිස් කිරීම	42
(ii) ඊනියා ගප්සා කිරීම	8
(iii) ඊනියා කීමත්ව හැසිරීම	1,160
(iv) ඊනියා වසදීම	312
(v) ඊනියා අස්වාභාවික අපරාධ	60
(vi) බල්ලන් සපාකෑම	70
(vii) ඊනියා පහරදීම	926
(viii) වයස යනාදිය පිළිබඳ	86
	2,664

නීති-වෛද්‍ය පර්යේෂණාගාර සෝදිසි

1. මතු සඳහන් ඉදිරිපත් කරන ලද දේවල් මෙම පර්යේෂණාගාරයේ දී පරීක්ෂාකොට බලන ලදී.

(අ) ග්ලාන ඖතික වේදය	248
(ආ) මූත්‍රා—ගෙමැඩි පරීක්ෂාව	3
(ඉ) ලේ වර්ග කිරීම	4
(ඊ) ආරක්ෂණය	44
(උ) ඇටැකටු සහ වලෙන් ගොඩගත් මිනී ...	37
(ඌ) පැල්ලම් යනාදිය	5
(එ) ආලිප්ත (තැවරීම්)–යෝනි යනාදියෙන් ...	48
(ඒ) කෙස්-ලොම් යනාදිය	21
(ඔ) රෙදි වස්ත්‍ර යනාදිය	—
(ඕ) ආවුධ යනාදිය	—

මෙයින් වැඩි හරියක් එවනු ලැබුවේ පිටපළාත්වලිනි. නීති-වෛද්‍ය කෞතුකාගාරය උදෙසා නිදර්ශක 44ක් සකස් කරන ලදි.

සංස්කරණ පාඨ මාර්ග

අධිකරණ වෛද්‍ය කටයුතුවල නිරතවී සිටින විවිධ නිලධාරීන්ට, අධිකරණ වෛද්‍ය කටයුතු විෂයයෙහි සංස්කරණ පාඨ මාර්ග දහහතක් දෙන ලදි.

ජටපළාත්වල අධිකරණ වෛද්‍ය කටයුතු සම්බන්ධයෙන් කරන ලද වැඩ මෙහි මතු විස්තර වශයෙන් දක්වේ :—

මිනීමැරුම්*

	ගණන
(අ) කැපීම් සහ පිහියා ඇතුම්	264
(ආ) මොට්ට ආයුධ	125
(ඉ) වෙඩි පහර තුවාළ සහ පිපිරීම්	76
(ඊ) පිළිස්සීම්	18
(උ) වසදීම්	63
(ඌ) අවිනිශ්චිත තීන්දු	41
(එ) අනෙක්	71
එකතුව ...	658

මාරක හදිසි අනතුරු

(අ) පාර තොටේ අනතුරු	299
(ආ) දුම්රියට අසුවීම්	47
(ඉ) රක්ෂාවේ විපත්ති දයකත්වය සමග ගැනෙන අනතුරු	67
(ඊ) අවිනිශ්චිත තීන්දු	22
(උ) පිළිස්සීම් යනාදියෙන් ගෙදරදොරේ සිදුවන අනෙකුත් අනතුරු	101
එකතුව ...	536

දිවි නසාගැනීම්

(අ) වසබීම	212
(ආ) තදබල හුස්ම හිරවීම	
(i) එල්ලීම	168
(ii) දියේ ගිලීම	153
(ඉ) දුම්රියට අසුවීම	15
(ඊ) වෙඩිපහර වැදීම	21
(උ) මුවහත් ආයුධ	17
(ඌ) අවිනිශ්චිත තීන්දු	25
(එ) අනෙක්	14
එකතුව ...	717

අනෙක් දේවල්

(අ) කෘමි නාශක ද්‍රව්‍ය	30
(ආ) ගප්සා කිරීම	12
(ඉ) අවිනිශ්චිත තීන්දු	25
(ඊ) ස්වාභාවික හේතු	725
එකතුව ...	792
මුළු එකතුව...	2,703

* අධිකරණ වෛද්‍ය නිලධාරීන් විසින් සහ රජයේ රෝහල් භාරව සිටින නිලධාරීන් විසින් සපයන ලද වාර වාර්තා වලින් ය.

තුවාළ කිරීම්

	තදබල	තදබල නොවන	එකතුව
තියුණු ආයුධවලින් සිදුවූ ...	1,027	6,730	7,775
මොටට ආයුධවලින් සිදුවූ ...	2,762	26,312	29,074
වෙඩිපහරවලින් සිදුවූ ...	185	227	412
බෝම්බ සහ පිපිරීම්වලින් ...	36	92	128
පිළිස්සීම්වලින් ...	157	1,326	1,483
මගතොටේ අනතුරුවලින් සිදුවූ ...	584	3,011	3,595
දුම්රිය අනතුරුවලින් සිදුවූ ...	36	79	115
රක්ෂාවේ අනතුරුවලින් සිදුවූ ...	194	3,280	3,474
අනෙකුත්	217	8,758	8,975
එකතුව ...	5,198	49,815	55,013

අනෙක් පරීක්ෂණ

	එකතුව
ඊනියා තනිස් කිරීම ...	177
ගප්සා කිරීම	269
ඊනියා බිමත්කම ...	2,633
වස විස දීම	864
සිහිමදකමින්	558
අනෙක්	724
එකතුව ...	5,225

සම්පිණ්ඩනය

	එකතුව
පශ්චාත් මරණ පරීක්ෂණ ගණන	2,703
තුවාළ කිරීම් ගැන පරීක්ෂණ ගණන	55,013
අනෙකුත් පරීක්ෂණ ගණන	5,225
එකතුව ...	62,941

(ඌ) පිලිකා රෝගය

පිළිකා ආයතනයට ඇතුළත්වීම සඳහා දිනෙන් දින ලෙඩුන්ගේ සංඛ්‍යා වැඩිවෙමින් පවතින නිසාත්, ඇඳන් නොමැති ලෙඩුන් නිසා ඇතිවෙන අප්‍රසන්න භාවය හැකි තරමින් නාතරකරලීම සඳහාත් දැනට ඇති ලෙඩුන්ගේ ඇඳන් සංඛ්‍යාව වැඩි කරලීමට සිදුවිය. එසේම ඇඳන් දෙකක් අතර ඇති ඉඩකඩ ප්‍රමාණය අනුවෙමින් ඇඳන් සංඛ්‍යාව 216 සිට 243 දක්වා අගෝස්තු මාසයේ දී වැඩි කල අතර එම සංඛ්‍යාව ඔක්තෝබර් මාසයේ 254 දක්වා වැඩි කරන ලදී. මෙතරම් ඇඳන් සංඛ්‍යාවක් වැඩි කළේ වී නමුදු ලෙඩුන්ගේ තදබදය හේතුකොට ගෙන ඇඳන් නොමැතිව පවා ලෙඩුන් භාරගැනීමට සිදුවිය. පසුගිය වසරවල මෙන් මේ වසරේද ගිලන් රථ රෝගීන් සඳහා පාර ඉදිරිපිට පිහිටා ඇති පිළිකා සමාජ නේවාසිකාගාරය ඉඩදීමෙන් පිලිකා ආයතනයේ වෙන්නට තිබූ තදබදය බොහෝදුරට මග හැරුණි. විකිරණ චිකිත්සක වැඩ කටයුතු මෙම ආයතනයෙන් එසේම කරගෙන යෑමට නම් නොබෝකලකින් අඩු ගණනේ ඇඳන් සංඛ්‍යාව 500ක් දක්වාවත් වැඩි කළ යුතු ය. මෙම කරුණු ඉටුකිරීම වස් ප්‍රාථමික පිළිවෙතක් වශයෙන් හෝමාගම හා මීගමුවේ රෝහල් දෙකක් ගොඩ නැංවීමට සැලකිල්ල යොමුවී තිබේ.

ලංකාවෙන් පිළිකා රෝගය මුලින් උපුටා දැමීමටත්, සෑම වර්ගයකටම අයත් පිළිකා රෝගීන්ට ප්‍රතිකාර කිරීමටත් විකිරණ චිකිත්සක අංශය ප්‍රතිකාර කිරීමෙහිලා, මධ්‍යස්ථානයක් වශයෙන් කටයුතු කරගෙන යනු ලැබේ. කොළඹ මහ රෝහලේ ප්‍රධාන වශයෙන් පහසුකම් සළසා ඇත්තේ අමාරු තත්ත්වයක පසු නොවන හා අමාරු තත්ත්වයක පසුවෙන නමුත් රෝහලට ඇතුලත්වීමට තරම් නුවුමනා හා සහන දායක ප්‍රතිකර්මය ලබාගැනීමෙන් සුවයක් ලබාගත හැකිවූ ලෙඩුන්ට ප්‍රතිකාර කිරීම සඳහා ය.

පසුගිය වසර මෙන් මෙම ආයතනය ලෙඩුන්ගෙන් පිරී ඉතිරී ඇති හෙයින් කොෂ් ල්වි අංශයෙන් ප්‍රතිකාර ගැනීමට උවමනාවූ ලෙඩුන් සඳහා පොරොත්තු ලේඛනයක් නැවතත් ලබාගැනීමට සිදුවී තිබේ.

චිකිත්සාගාර

මෙම ආයතනයට ලෙඩුන් බාරගනු ලබන්නේ මහරගම හා අනිකුත් මධ්‍යස්ථාන වල පවත්වන චිකිත්සාගාර මගිනි. ඉරුදිනයක් හැර සෑම දිනකම උදේවරුවේ විකිරණ චිකිත්සාගාරයන් පවත්වනු ලැබේ. ශල්‍ය හා ස්ත්‍රී චිකිත්සාව සම්බන්ධයෙන් ඇති චිකිත්සාගාරයන් සතියකට දෙවරක් පැවැත්වේ. මෙම ආයතනයේ පවත්වනු ලබන මෙම චිකිත්සාගාරවලට අමතර වශයෙන් කොළඹ මහ රෝහලේ සතියකට තුන්වරක් ද, යාපනය හා මහනුවර මහ රෝහල්වල වරින්වර සෙනසුරාදා දින වල උපදේශක චිකිත්සාගාර පවත්වාගෙන යනු ලැබේ. පිටපළාත්වල ඇති මෙම චිකිත්සාගාර පවත්වනු ලබන්නේ මෙම ආයතනයෙන් යවනු ලබන විකිරණ චිකිත්සකයෙකු විසිනි. 1963 වසර ඉකුත් වන්නට පෙර තවත් චිකිත්සාගාරයක් ගාල්ලු මහ රෝහලේ දී පටන්ගැනීමට කටයුතු සලස්වා තිබේ.

මෙම පර්යන්ත චිකිත්සාගාර මෙම චිකිත්සාගාර පැවැත්වෙන රෝහල් වල සේවයේ යෙදී සිටින විශේෂඥයින්ට උපදේශක චිකිත්සාගාර මෙන් පවත්වා ගෙන යාමට වඩා මෙම චිකිත්සාගාර මගින් රෝගය ඉතා ඉක්මනින්සොයා දැන ගැනීමේ මධ්‍යස්ථාන වශයෙන් ක්‍රියා කළ හැක. එසේම පිළිකා ආයතනයෙන් සුව කිරීමට හැකිවේ යයි හැගෙන රෝගීන් සොයා බලා, තෝරාගැනීම මෙම චිකිත්සාගාර මගින් පිළිවන.

පිටපළාත්වලින් බොහෝ රෝගීන් මහරගම පිළිකා ආයතනයට ඇදී එන හෙයින් පිටපළාත්වල තව තවත් චිකිත්සාගාර විවෘත කිරීම සුදුසු යැයි නිශ්චය කර ඇත.

මෙම වසර තුල සෑම චිකිත්සාගාරයකටම ප්‍රතිකාර ලබාගැනීමට පැමිණිය වුන්ගේ සංඛ්‍යාව වැඩිවී තිබේ. මහරගම චිකිත්සාගාරයන් ගෙන් ප්‍රතිකාර ලත් සම්පූර්ණ ගණන 8,053කි. මහනුවර 450ක් වන අතර යාපනයේ ප්‍රතිකාරලත් අය 1,153කි.

	මහරගම	මහනුවර (චිකිත්සාගාර 25 ක් පවත්වන ලදී)	යාපනය (චිකිත්සාගාර 25 ක් පවත්වන ලදී)
අලුත් රෝගීන්	2,075 ...	200 ...	253
නැවත පරීක්ෂා කිරීමට පැමිණි රෝගීන්	5,992 ...	250 ...	882
සම්පූර්ණ ගණන	8,067 ...	450 ...	1,135

කාර්යමණ්ඩලය

රෝග නිදාන විද්‍යා රසායනාගාරය මගින් එදිනෙදා කටයුතු හා ඔවුන් වෙත දෙනු ලබන අමතර විශේෂ වැඩ කටයුතු පවා කරගෙන යනු ලැබේ. අධික ලෙස වැඩ කටයුතු වැඩිවීම් නිසා මෙම රසායනාගාරයේ කාර්මික මණ්ඩලයට 1961 දී කාර්මික විද්‍යාඥයෙකු ද සුළු සේවක මණ්ඩලයට ද කුලීකරුවකු පත් කරන ලදි. ටියුබර්

රෝග නිධාන විද්‍යාව සම්බන්ධයෙන් විශේෂ පුහුණුවක ලත් මෙම ස්ථානය භාර රෝග නිධාන විද්‍යාඥ විසින් මෙම ආයතනයේ පටක රෝග නිධාන වැඩ සම්බන්ධ යෙන් ද නිරතවී සිටිත්.

බොහෝ කලක් තිස්සේ උවමණාවී තිබූ බී. එච්. ආර්. උපකරණ ද මෙම රසායනාගාරයට ලබාදී තිබේ. තයිරෝ-ටොක්සික් රෝගීන් සඳහා දිය යුතු අයිසෝටෝප් ප්‍රතිකාරය මෙම ආයතනය මගින් දෙනු ලබන අතර මෙම රෝගීන් සම්බන්ධයෙන් කලයුතුවූ පරීක්ෂා කරගෙන යෑමට මෙම ආයතනයෙන් කිරීමට නොහැකි වී තිබේ.

මණ්ඩලීය නොරතුරු

මොස්කව් නුවර පවත්වන ලද VIII වැනි ජාත්‍යන්තර පිළිකා සම්මේලනයට ලංකා නියෝජිතයා වශයෙන් විකිරණ චිකිත්සා භාර (කාර්මික) දෙස්තර එච්. කේ. ජී. ප්‍රනාන්දු මහතා සහභාගිවිය.

මෙම ආයතනයේ ශල්‍ය වෛද්‍යවරයාත් සම්බන්ධව කොළඹ රෝහලේ ප්ලාස්ටික් ශල්‍ය වෛද්‍ය වරයා කටයුතු කරන අතර ප්ලාස්ටික් ශල්‍ය විද්‍යාව උවමනාවූ රෝගීන්ට ප්‍රතිකාර කරන ලදි.

මෙම ආයතනයේ ශල්‍ය කර්ම කරන ස්ථානය වායු සමනය කිරීම පිණිස රුපියල් 35,000 ක් වෙන් කර ඇති නමුත් ස්ථාපනය කිරීමෙහි වැඩ කටයුතු විදුලි දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාද කර තිබේ.

විකිරණ ක්‍රියාකාරි අයිසොටෝප් හා අයිසොටෝප්ස් රසායනාගාරය

විකිරණ ක්‍රියාකාරි අයිසොටෝප්ස් ලබාගැනීම පසුගිය වසරේ මෙන්ම අපහසු විය. රු. 500 ක වටිනාකම ඇති අයිසොටෝප් හැම ඇණවුමක් ගුවන් මගින් විකිරණ චිකිත්සක (කාර්මික) ඔහුට හා බෙහෙත් ගබඩාධිකාරිවත් ගෙන්වීමට අවසර ඉල්ලා කරන ලද යෝජනාවට දෙපාර්තමේන්තුවේ ද සහයෝගය ලැබූ නමුත් භාණ්ඩාගාරයේ අනුමැතිය නොලැබිණි. සමහර අවස්ථාවල දී ප්‍රමාදය සති 5-4 ට වඩා වෙනු ඇත. මෙය සෑම අංශයකටම වඩා නොමනා අවලක්ෂණ අංගයක් වී ඇත.

අයි.ඒ.ඊ.ඒ. විකිරණ භෞතික විද්‍යාඥ දොස්තර ඩී. ජී. ආර්නොට් මහතා විසින් අයිසොටොප් රසායනාගරයේ ගොඩනැගිම වෙනස්කිරීම සම්බන්ධයෙන් නිර්දේශ කර ඇත.

මෙම වෙනස් කිරීම් අනුමත කර ඇති අතර ඉතා මැතකදී වැඩ පටන් ගැනීමට රජයේ වැඩ දෙපාර්තමේන්තුව බලාපොරොත්තුවෙයි. මෙම රසායනාගාරය වායු සමණය කිරීම ඉක්මනින් සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වෙයි.

විකිරණ විද්‍යාරක්ෂක සේවය

විකිරණ විද්‍යාරක්ෂක සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ උපදේශක දොස්තර ඩී. ජී. ආර්නොට් මහතා 1961 දෙසැම්බර් මාසයේ දී ලංකාවට පැමිණෙන ලදි. ඔහු මෙහි පැමිණෙන ලද්දේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ විදුලි රශ්මි සේවයේ යෙදී සිටින්නන් වෙනුවෙන් පිල්ම් බැඩ්ජ් මොනිටරින් සේවයක් ආරම්භ කිරීමට ය. දොස්තර ආර්නෝට් මහතා මෙහි පැමිණෙන විට පිල්ම් හෝල්ඩර්ස් සහ සකස් කිරීමේ අංශය තුළ පිළිම් බැඩ්ජ් මොනිටරින් සේවය සඳහා කටයුතු කිරීම පිණිස අනිකුත් උපකරණ මෙහිවිය. දොස්තර ආර්නෝට් මහතා විසින් මෙහි එන විට

එංගලන්තයේ විකිරණ විද්‍යා සේවය විසින් පාවිච්චියට ගනු ලබන වර්ගයේ පිලිම හෝල්ඩර්ස් 500 ක් හා කොඩැක් වර්ගයේ සකස් කිරීමේ අංශයක් ඔහු විසින් රැගෙන එන ලදි.

අයිසොටෝප් හා රේඩියම් රසායනාගාර සහ ඒ අවට ඇති කාමර ගොඩනැගී ඇති පිළිවෙල තරමක වෙනස් කිරීමක් අවශ්‍ය වී තිබේ. මේ අංශයේ තිබෙන කාමර තුනක් විකිරණ විද්‍යාරක්ෂක සේවය සඳහාත් තව එකක් වැඩ පළකටත් පාවිච්චියට ගනු ඇත. එසේ ම නව සැලැස්ම පෙන්නුම්කර රජයේ වැඩ දෙපාර්තමේන්තුව වෙත සැලැස්මවල් භාරදී ඇති අතර මේ සම්බන්ධයෙන් අවශ්‍ය මුදල් ද වෙන්කර දී ඇත. නව සැලැස්ම අනුව වැඩ කටයුතු ඉක්මණින් කෙරෙනු ඇත.

ආරක්ෂිත සේවයේ උවමනා දේවල් ගැනීම සඳහා වැඩපළකට අවශ්‍යමවූ දෑ පමණක් මෙහිදීම ලබාගන්නා ලදි. අනිකුත් උපකරණ සඳහා ඇනවුම් යවා තිබේ.

මහ රෝහලේ ඇති එක්ස්රේ රශ්මි යන්ත්‍ර ඔයල්ලම වාගේ වැස්සීම සඳහා පරීක්ෂා කළ අතර පිළිකා රෝහල, මහරෝහල, වැලිසර ළය රෝහල ආදී ස්ථාන පිල්මි බැඩ්ජ් මොනිටරින් සේවය විසින් සේවය කිරීමට අරඹන ලදී.

පිළිකා මර්දනය සඳහා ප්‍රචාරක වැඩ සහ පුහුණුවීම්

ස්ත්‍රී චිකිත්සාව හා පිළිකා ප්‍රතිකර්ම ආයතනයෙහි මසක පුහුණුවක් සඳහා නේවාසික ප්‍රසව විද්‍යාඥයින් යැවීමට කටයුතු පිළියෙල කොට තිබෙන අතර දැනට මත් නිලධාරීන් දෙදෙනකු පුහුණුවීමක් ලබාගෙන ඇත. මෙම පුහුණුවීමේ පරිපාටියේ හා වෛද්‍ය නිලධාරීන් විසින් පිළිකා රෝගය සම්බන්ධයෙන් කෙටි පාඨමාලා ප්‍රතිකාර කිරීම යන දෙකම වැඩ පිළිවෙලේ කොටසක් වශයෙන් ආරම්භ කරන්නට යෙදුනහොත් පිළිකා රෝගය ඉක්මණින් සොයා දැනගැනීමට හැකිවන අතර පිළිකා උවදුරෙන් බේරීමට ද පුළුවන්වනු ඇත.

මෙම වැඩ පිළිවෙලෙහි කොටසක් වශයෙන් මහජන සෞඛ්‍ය නිලධාරීන් හා හෙදියන් සඳහා උපදෙස් මාලාවක් ආරම්භ කරන හැක.

කරන ලද වැඩ

මෙම ආයතනයෙහි සෑම අංශයකම වැඩ පෙරට වඩා වැඩිවී තිබේ. රෝගීන් 2,175 විකිරණ චිකිත්සා ප්‍රතිකාර ලැබූ අතර, ඉන් 522ක් ප්‍රතිකාර ලබා ඇත්තේ කොබෝල්ට් චිකිත්සා අංශයෙහි ය. 73 දෙනෙකු විකිරණ අයිසටෝප් ප්‍රතිකාරය ද, 1,055ක් ගැඹුරු ඇක්ස් රේ රශ්මි ප්‍රතිකාරය ද ලබා ගන්නා ලදී. වැඩි වශයෙන් පාවිච්චි කරන ලද අයිසටෝප් වර්ගය නම් රේඩියෝ ඇක්ටිව් අයිඩින් අයිසටෝප් වර්ගයයි.

ශල්‍ය වෛද්‍ය හා ස්ත්‍රී චිකිත්සක අංශය මගින් 810 දෙනෙකුට ශල්‍යකර්ම කර ඇති අතර 536 දෙනෙකු රේඩියම් දෙන ලදී.

පසුගිය වර්ෂයේ වැඩ මෙන් දෙගුණයකින් රෝග නිධාන විද්‍යා රසායනාගාරයේ වැඩ අධික වී ඇත. කරන ලද වැඩවල විස්තරයක් මේ සමග අමුණා ඇත.

දීර්ඝ කිරීම්

ස්ත්‍රී චිකිත්සක පිළිකා රෝගීන් සඳහා ඇඳන් 42ක වාට්ටුවක් ගොඩනැඟීමට කරන ලද යෝජනාව පිළිගෙන ඇත.

ගාල්ලේ පර්යන්ත චිකිත්සාගාරයක් පිහිටුවීම 1963 ජනවාරි මස මැද හරියේ දී සම්පූර්ණ කරනු ඇත.

VII වන පරිවෙජ්දය

වෛද්‍ය පර්යේෂණ ආයතනය

වර්ෂය තුළදී පර්යේෂණ ක්ෂේත්‍රයෙහි ලා බොහෝ කාරණා මුදුන් පත් කර ගනු ලැබූ අතර, රෝහල් උදෙසා, සිරිත් පරිදි කෙරෙන රෝග විනිශ්චක රසායනාගාර වැඩ කටයුතු මහත් සම්භාරයක් භාර ගන්නා ලදී.

වර්ෂයේ මූල හරියේදී කඩා වැදුන වසූරිය රෝග වසංගත සමයේ දී වයිරස් අංශය විසින් කරන ලද ඉමහත් වැඩ කොටස ගැන විශේෂයෙන් සඳහන් කළ යුතුව තිබේ. විශේෂ රෝග විනිශ්චක කටයුතු කරන ලෙසත්, සමූහ වශයෙන් එන්නත් කිරීම් සඳහා එස පැවවුන් ගේ වසා සපයන ලෙසත්, කරන ලද සියළුම ඉල්ලීම් සම්පූර්ණ යෙන් ඉටු කරන ලදී. එපමණක් නොව, බාලක පක්ෂාඝාත රෝග වසංගතය මැඩ පැවැත්වීමෙහි ලා එම රෝගයෙන් වැළැකීමේ මුඛ මාර්ගික එන්නත් බෙහෙත් රැස් කොට, තබා ගැනීමත්, බෙදා හැරීමත් එම අංශය විසින් ඉතාමත් සාර්ථක ලෙස ඉටු කරන ලදී.

ආයතනයේ සංවිධානයෙහි ඇති වූ ප්‍රධාන වෙනස් වීමක් නම්, 1961 දෙසැම්බර් මාසයේ දී කීට විද්‍යා අංශය මහජන සෞඛ්‍ය පාර්ශ්වය යටතේ ඇති බරවා මර්දන ව්‍යාපාරයට පවරා දීමයි. එම අංශයේ ප්‍රධාන අරමුණ වූයේ, බරවා මර්දන ව්‍යාපාරය විසින් කර ගෙන යනු ලැබූ මර්දන කටයුතු වල සාර්ථකත්වය බැලීමේ විමර්ශන මෙහෙය වීම හෙයිනි, මෙම ක්‍රියාව ඉතාමත් අවශ්‍ය මෙන්ම උචිත ක්‍රියාවක් බව සලකන ලදී. එතෙකුදු වුවත්, කීට විද්‍යා පර්යේෂණ නිලධාරියා යටතේ හුදෙක් පර්යේෂණ ඒකක යක් පිහිටුවා ගැනීම පිණිස නිලධාරීන් කිහිප දෙනෙක් ආයතනයේ රඳවා ගනු ලැබූ හ.

කායික මණ්ඩලය

රෝග නිධාන විද්‍යාව ගැන එක්සත් රාජධානියේ දී පශ්චාත්-උපාධි ශික්ෂණ යක් සාර්ථක ලෙස හදාරා හමාර කළ, වෛද්‍යාචාර්ය එස්. සිවලිංගම් මහතා, අවුරුද්ද අවසාන හරියේදී පෙරළා පැමිණ, රෝග නිධාන කාර්යාංශය භාර නිලධාරියා වශයෙන් යළිත් රාජකාරි භාර ගත්තේ ය.

නිලධාරීන් දෙදෙනෙකු ගේ මහහු සේවය ආයතනයට නොලැබී ගියේ ය. වයිරස් අංශය භාරව සිටි වෛද්‍යාචාර්ය කේ. බී. ජී. ස්ටෝර්ක් මහතා ජනවාරි මාසයේදී විශ්‍රාම ගත් අතර, ඖෂධ විද්‍යා අංශය භාරව සිටි වෛද්‍යාචාර්ය ඒ. එස්. අවුවිස්කූන් මහතා ජිනීවාහි ජ. සෞ. සංවිධානයේ පත්වීමක් භාර ගැනීම පිණිස පෙබරවාරියේ දී විශ්‍රාම ලැබී ය.

කාර්ය මණ්ඩලයට එකතු වූයේ එක් නිලධාරියෙකු පමණි. එනම් ඖෂධීය විද්‍යා අංශයට වෛද්‍ය නිලධාරියෙකු එකතු වීම සි.

පශ්චාත්-උපාධි අභ්‍යාසය සහ අධි ශිෂ්‍යත්වය

වෛද්‍යාචාර්ය බී. ඒ. වී. පෙරේරා සහ ඒ. සතාසිවම් මහතුන්, පිළිවෙලින් ඖෂධීය විද්‍යාව සහ සාක විද්‍යාව පිළිබඳ සිය පශ්චාත්-උපාධි අධ්‍යයන පාඨ මාලා හදාරමින් එක්සත් රාජධානියේ පසු වූහ.

ලංකා තේ පර්යේෂණ ආයතනය මගින් ප්‍රදානය කරන ලද පර්යේෂණ ශිෂ්‍යත්වි යක් බාර ගැනීමට එක්සත් රාජධානිය කරා යා හැකි වන පරිදි, වෛද්‍යාචාර්ය ආර්. එල්. වික්‍රමසිංහ මහතාට අගෝස්තු මාසයේ වැටුප් රහිත අවුරුදු දෙකක නිවාඩුවක් දෙන ලදී.

"වයිරස් රසායනාගාර ශිල්පායතනය" මැයෙන් මාර්තු මස සිංගප්පූරුවේදී පැවැත් වුණ පාඨ මාලීයකට වෛද්‍යාචාර්ය වයි. ඊ. එම්. බ්‍රෝගියර් මෙනෙවිය සහභාගි වූ අතර,

"ආසාදනයේ නෛසර්ගික මධ්‍ය කේණ" මැයෙන් වෛද්‍ය විද්‍යාව පිළිබඳ සෝවියට් ශාස්ත්‍ර පීඨය විසින් අගෝස්තු සහ සැප්තැම්බර් මාසවල දී මොස්කව් නුවර සහ ලෙනින් ග්‍රෑඩ් නුවර පැවැත් වුණ පාඨ මාලාවකට වෛද්‍ය ඩබ්. ඒ. සමරවික්‍රම මහතා සහභාගි වී ය.

ඉඩ කඩ

පෙර කටු ගේ පිහිටි කාමරය "වසිරස්" රසායනාගාරයක් ලෙස ප්‍රයෝජනයට ගත හැකි වන සේ හරවා ගන්නා ලදී. වායු සමීකරණය හැරුණ විට, අවශ්‍ය අනෙකුත් වෙනස් කිරීම් සියල්ලම පාහේ නිමාවට පත් කරනු ලැබී ය. "සැල්මොනැල්ලා" ඇංශයට, අධික වී ඇති වැඩ සම්භාරය අහිබවා ගත හැකි වනු පිණිස, වෙනස් කිරීම් සහ අළුත් කොටස් එකතු කිරීම් විශාල වශයෙන් කරන ලදී. ස්වභාවික නිෂ්පාදන ඵල රසායනා විද්‍යාත්මක වැඩ කටයුතු සඳහා වූ දෙවන රසායනාගාරයට උවමනා බඩු මුට්ටු සපයන ලද අතර, ඇතැම් වැඩ කොටස් ඉක්මණින්ම අවසන් වේ යැයි බලා පොරොත්තු වනු ලැබේ. පෝෂණ වේදී රසායනාගාරයේ වෙනස් කිරීම් ද වර්ෂය තුළ දී නිමාවට පත් වී ය.

වැඩ කටයුතු

මෙම වාර්තාව, 1961 ඔක්තෝබරයේ සිට 1962 සැප්තැම්බරය දක්වා වූ මුදල් වර්ෂය උදෙසා වන හෙයින්, 1961 ලිත් වර්ෂය සඳහා වූ පසු ගිය වාර්තාවට ඇතුළත් වුණු මාස තුනක් ද මීට ඇතුළත් වෙයි.

විවිධ අංශවලින් කෙරුණ වැඩ කටයුතු පිළිබඳ ලුහුඬු විස්තරයක් මෙහි මතු සඳහන් වෙයි.

සාක විද්‍යාව (සාමාන්‍ය)

උගුරු සහ අනෙකුත් ද්‍රව වාත්තු පරීක්ෂා කිරීම සඳහා ආ ඉල්ලීම් පෙර අවුරුදුවලට වඩා අඩු විය. මෙයින් පෙනී යන්නේ, එම වැඩ කටයුතු සමහරක් තමන් විසින්ම ඉටු කර ගැනීම පිණිස විශාල රෝහල් බඳ රසායනාගාර වලට ප්‍රමාණවත් ලෙස කාර්ය මණ්ඩලය ද ලැබී උපකරණවලින් ද පිරිපුන් වී ඇති බව යි. සියල්ලම එකතු ආලිප්ත 6,738ක් පරීක්ෂා කරන ලද අතර, එයින් 408ක් ගලපටල රෝගය පිළිබඳ නිසැක ලකුණු දැක් වී ය.

මුත්‍රා නිදර්ශක 1,648ක්, ලේ 797ක්, සැරව සහ සුසුම් නලගත දියර 1,170ක්, කෙල 1,657ක්, සහ කොඳු ඇට දියර 1403ක් රෝපණය කිරීම මීට අයත් විය. ක්ෂය රෝග සාක්ෂි සෙවීමේ එකම අදහස ඇතුව පරීක්ෂා කරන ලද නිදර්ශක ගණන 3047 කි. එයින් 74 ක රෝග බීජ තිබූ බව ඔප්පු විය. මීට අමතරව ගොනෝකොකුල් ආසාදනය අරබයා කරන ලද පරීක්ෂණ ගණන 52 කි. ලාදුරු අරබයා 80ක්; පිටගැස්ම අරබයා 30 කි; "ස්ටැපිලෝකොකල්" අන්ත්‍ර පුරිනත් දාහය අරබයා 6 කි.

සියල්ලම එකතුව ගත් කල පරීක්ෂා කරන ලද නිදර්ශක ගණන 13,831ක් වෙයි.

ඉහත කී දේ හැරුණ විට, නිදර්ශක 2320ක් සම්බන්ධයෙන් සූක්ෂම ජීවී සංවේදනා පරීක්ෂණ කරන ලදී.

රෝහල් වල ඇති තද පිඬනයෙන් යුත් විෂ බීජ නාශක යන්ත්‍රවල කාර්යක්ෂම භාවය ගැන අත්හදා බැලීම් 26 වරක් කරන ලදී.

මව්වරුන් ගේ රෝහලක නව බිළිඳු පිටගැස්ම රෝගයක් පැතිරෙන්නට වූ අතර, ඒ ගැන සෝදිසි කර බැලීමේ දීත්, එය මැඩ පැවැත්වීමෙහිදීත්, මෙම අංශය ඊට සහාය විය.

පූයජනක අවෘතදෘහයෙන් පෙළෙන මාරාන්තික රෝගියෙකුගෙන් ඉතා දුර්ලභ වගීයේ "ලිස්ටිරියා මොනසයිටොජීනිස්" මුල් වරට වෙන් කර ගන්ට ලැබීම විශේෂ යෙන් සඳහන් කළ යුතු දෙයක් වෙයි. පළ කරවීම පිණිස ඒ ගැන විස්තර අඩංගු පත්‍රිකාවක් පිළියෙල කර ගෙන යනු ලැබේ.

මාල දිවයිනේ නියුක්ත ජ. සෞ. සං. උපදේශක වෛද්‍යාචාර්ය එච්. නීමාර් මහතාට අවශ්‍ය පහසුකම් එහි නොතිබි හෙයින්, ඔහු උදෙසා "එම්. ලෙප්‍රෑ" සොයනු පිණිස දුට පැල්ලම් ගණනාවක් ද පරීක්ෂා කරන ලදී.

සාක විද්‍යාව (ආහාර, ජලය සහ ලෙප්ටොස්පයිරොසියා ව) සහ දිලිර විද්‍යාව

(අ) වසියේ දී පරීක්ෂා කරන ලද ආහාර නිදර්ශික මුළු ගණන 1551ක් විය. එයින් 25ක් අසතුටුදායක තත්ත්වයක විය. (සැල්මොනැල්ලා බෝවීමේ සාක්ෂි සෙවීම පිණිස 1407ක් ඇතුළු) වේලාපු පොල් නිදර්ශික 1478ක් ද, පිටි 21ක්ද, ටින් කෑම 28ක්ද, විවිධ වගී 26ක්ද, මෙම නිදර්ශික වලට අයත් විය.

පෞද්ගලික සහ රජයේ තැන්වලින් පරීක්ෂා කිරීම සඳහා ගත් ජල නිදර්ශික මුළු ගණන 252 කි. එයින් 180ක් අසතුටුදායක බව පෙනී ගියේය.

(ආ) 1960 දී අරඹන ලද "මුලක් දැනගන්ට නැති ජ්වර රෝගය" හට ගැනීම පිළිබඳ සමීක්ෂණයේ ප්‍රතිඵල නිමාවට තීන්දු කොට, අනෙකුත් සේවකයින් ගේ ද උදව් උපකාර ඇතුව පළ කරවන ලදී. (1962 ලංකා වෛද්‍ය සංග්‍රහය.)

"ලෙප්ටෝස්පයිරොසියාව" හැඳින ගැනීමේ රසායනාගාර වැඩ දිගටම කර ගෙන යන ලද අතර, ලේ, මස්තු යනාදි නිදර්ශික 124ක් පරීක්ෂා කරන ලදී.

(ඉ) පසු ගිය කාලයේ දී මෙන්, දිලීර විද්‍යාව පිළිබඳ වැඩ බොහොමයක් කරන ලද්දේ, කොළඹ මහ රෝහලේ චර්ම චිකිත්සාගාරය උදෙසා ය. පරීක්ෂා කරන ලද නිදර්ශක ගණන 721 කි. අනෙකුත් මාර්ගවලින් ලැබී පරීක්ෂා කරන ලද ගණන 102 කි.

අනෙකුත් ද්‍රව්‍ය වලින්ද—කොඳු ඇට ද්‍රව, සැරව, කෙල—නිදර්ශික 41ක් එයාකාර යෙන්ම පරීක්ෂා කරන ලදී.

"කුර්වල්රියා ලුනාටා" නිසා හටගත් දුර්ලභ වගීයේ දිලීර වල්කි දාහ රෝගියෙකු ගැන ද ඥෝදිසි කර බලන ලදී.

ජව-රසායන විද්‍යාව

නිපදවන ලද "ට්‍රයිමැතිලේන්" සාවධානය සම්බන්ධව මාළුන් පිරිහීම ගැන කරුණු උගෙනීමේ කටයුතු, පෝෂණ අංශයේ සමීක්ෂණයකට අයත් වූ පූර්ව-පාඨශාලා දරුවන් ගේ සහ මව් වරුන් ගේ ලේ ධාතු පිළිබඳව ඥෝදිසි කිරීම් කිහිපයක් කාර ගැනීමට සිදු වූ නිසා, ටික කලකට අත් හිටුවීමට සිදු විය.

කොන් කරන ලදුව වාතී කරන ලද, කුණු වෙමින් පැවැති ජීවී දෙකෙහි ශාරීරික විද්‍යාව ගැන කරුණු හදාරන ලදී.

සිරිත් පරිදි කෙරෙන එදි නෙදා වැඩ කටයුතු ප්‍රමාණය පසු ගිය වසීවලට වඩා කැපී පෙනෙන අන්දමින් නැගී තිබුණ බවත් දැක්විණ. මුළු මනින් ම ලේ, කොඳු ඇට ද්‍රව, යනාදී සෑම්පල් 13,282ක් ගැන වාතී සපයන ලදී. මෙයින් එක් කරුණක් පිළිබිඹු වෙයි. එනම්, විශේෂයෙන් විශේෂඥ චිකිත්සාගාර නිලධාරීන් පත් කර ඇත්තා වූ ද මෙතෙක් රසායනාගාර පහසු කම් දියුණු වී නැත්තාවූ ද රෝහල් වලින්, ජීව රසායන විද්‍යානුකූල විමර්ශන සඳහා ලැබෙන ඉල්ලුම් ගණන එන්ට එන්ට වැඩි වන බව සි.

කීට විද්‍යාව

කලින් වාතී කළ පරිදි, කීට විද්‍යා අංශය හුදු පර්යේෂණ ඒකකයක් විය. එසේද වුවත්, ජාත්‍යන්තර තත්ත්වය අනුව, කහ උණ වැළැක්වීම සඳහා, තොටුපළ ඊඩිස්

ඊජිප්තුයි පවතින ප්‍රමාණය මැන ගැනීමේ කටයුතු දිවයින පුරාම කරගෙන යන ලදී. හැරන්, ගාල්ලේ සහ කොළඹ තොටු පොළ වල මී මැකි (සෙනොප්සිලා චියොපිස්) සමීක්ෂණ ද කරගෙන යන ලදී.

"මැන්සෝනියා යුනිපෝමිස්" වර්ගීය සපා කෑමේ හැසිරෙන ආකාරය සහ වයස ගැන, කෝච්චියේ අසල අග්ගොනදී කර ගෙන ගිය අධ්‍යයන නිමාවට පත් කරන ලදී. නිර්දිෂ්ටයේ ප්‍රධාන අංගයට වැඩි සවිස්තර වූ විග්‍රහ උවමනා වන අතර, ඇතැම් නිශ්චිත තීරණ මතු විය. ඒ මෙසේ ය. මැන්සෝනියා යුනිපෝමිස් සපන්නේ රෑ කාලයේ දී ය. 19-00 සිට 20-00 වන පැය දක්වා ඇති කාලයද, 02-00 සිට 03-00 වන පැය දක්වා ඇති කාලය ද යනුවෙන් සපා කෑමේ උත්සන්න හෝරා දෙකක් වෙයි; ඉතාමත් බාල ගැහැණු සතුන් මෙන්ම දින 10 දක්වා වයස් ගත වූවන් ද යක දෙගොල්ලන්ම මීට අනුකූල වෙයි, ඉතා මහළු ගැහැණු සතුන් රාත්‍රියේ පෙරයම දී සපාකන බව පෙනේ.

"ක්‍යුලෙක්ස් පැටිගන්ස්" වර්ගයේ වයස් සංයෝගය සහ මේරීමේ වේගය ගැන කරුණු උගෙනීම දිගටම කරගෙන යන ලදී. නිසර්ගයෙන්ම "වුචුරේරියා බැන්ක්‍රොප්ටි" බෝවී තිබෙන "ක්‍යුලෙක්ස් පැටිගන්ස්" වර්ගයේ වයස් නිර්මානය ගැන ප්‍රාරම්භක ලිපියක් පළ කරවන ලදී. (ජ. සෞ. සං. සංග්‍රහයෙහි (1962) 27, 637.)

සත්ව සහ මිනිස් බරවා රෝග කාරක මදුරුවන් විෂයයෙහි අත්හදා බැලීම අනුසාර යෙන් කරුණු උගෙනීමේ කටයුතු දිගටම ගෙන ගිය අතර, ලංකාවේ මදුරුවන් ගේ තර සිරුරෙහි සත්ව බරවා බීජ වැඩීම් පළමු වරට වාර්තා විය. ("මැන්සෝනියා ක්‍රැසසිප්ස්සේ නර සිරුරෙහි සත්ව බරවා බීජ වැඩීමේ නිසර්ග ආසාදනය" ඩබ්. ජේ. නයිල්ස් (1962) ප්‍රාදේශීය ලේකම් ගේ නිවර්තන කලාපීය වෛද්‍ය සඟසථානාවය 56, 437).

"හයිකැනස්" සහ "බාබිරොස්ටිස්" වර්ගවලට අයත් "ඇනොපිලිස්" කාණ්ඩයේ මදුරුවන්, ලංකාවේ සහ අග්නිදිග ආසියාවේ රටවල් කිහිපයක මැලේරියා සහ බරවා බීජ කාරකයින් යැයි සැක කොට ඇත. ලංකාවේ ඇතැම් වර්ගවල ගති පැවතුම් නැළුන සොයා බැලීම් අවශ්‍ය හෙයින්, ඒ අරබයා කටයුතු කරගෙන යනු ලැබේ. ලාබාල අවස්ථා ගැන කරුණු දැන ගන්නට ලැබුණු පසු නව වර්ගයක් ලෙස නම්කොට හඳුන්වා දීම පිණිස. "බාබිරොස්ට්‍රිස්" කාණ්ඩයට අයත් එකකු රඳවා ගනු ලැබ සිටී.

"ස්කාරා බයිසිස්" විෂයයෙහි කරුණු උගෙනීමෙහි ලා රෝගීන් විශාල සංඛ්‍යාවක් සෝදිසි කරන ලද නමුත් බඩවැලේ උපද්‍රව ඇති කොට පිටව යන්නේ කුරුමිණියන් දැයි යන වග මෙතෙක් නිශ්චිත වශයෙන් ඔප්පු කිරීමට පොහොසත් වී නැත.

කෘමීන් කෘමි නාශක ද්‍රව්‍ය ගැන දක්වන සංවේදනාවය ගැන කිව යුතුව ඇත්තේ, "ඊඩිස් ඊජිප්තායි" සහ "සයිමැක්ස් හෙමිප්ටෙරස්" ඇඳ මකුණන් සම්මත කෘමි නාශක ද්‍රව්‍ය කෙරෙහි දක්වන සංවේදනා මට්ටමේ පොදු සීමාව නියම කර ගැනීමේ අටියෙන් ඔවුන් රසායනාගාරයේ රාශි භූත කිරීමට යත්න දරන ලදී.

පෝෂණය

විවිධ කටයුතු වලදී ගෙවී යන මූලස්ථ ආරාධිත්ති සීඝ්‍රතාවය සහ ශක්ති ප්‍රමාණය මැන ගැනීම අරබයා ගෙන ගිය දීර්ඝ කාලීන පර්යේෂණ යෝජනා ක්‍රමයේ කටයුතු දිගටම කරගෙන යන ලදී. අවුරුද්ද අවසන් වන විට, පුද්ගලයින් 350 කට ආසන්න ගණනක් සෝදිසි කොට තිබුණි. ස්ත්‍රී-පුරුෂ භෙදය ආශ්‍රයෙන් විවිධ වයස් ගණ සඳහා සෑහෙන තරම් සංඛ්‍යා ලබා ගැනීම පිණිස, තව බොහෝ දෙනෙක් උවමනා කෙරේ. මෙම යෝජනා ක්‍රමයේ ඇති ප්‍රධාන තම අසීරු කම නම් සිය කැමැත්තෙන් ඉදිරිපත් වන අය ලබා ගැසීම යි.

පානදුර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි වසමේ තැන් තැන් වලින් තෝරාගනු ලැබූ ආදර්ශ ළමුන් 1,282 කින්, පූර්ව-පාඨශාලා වයසේ ළමුන් ගේ සෞඛ්‍ය තත්ත්වය ගැන ද, පෝෂණ තත්ත්වය පිළිබඳ සමීක්ෂණ ගැන ද, ලේ අඩු කම (රක්තහීනතාව) සහ

බඩ වැලේ පරපෝෂිතයින් ඔවුන් අතර බල පවත්වන තරම ගැන ද, ඔවුන් ගේ පාරිසරික සහ ජීවන තතු ගැන ද, කරුණු හැදෑරීමට පත් කරනු ලැබූ කමිටුවේ වැඩ සම්බන්ධයෙන් කිව යුතුව ඇත්තේ, එහි වැඩ 1962 ජූලි මාසයේ දී අවසන් වූ බවයි. එහිදී පෙනී ගිය කරුණු අඩංගු ලිපියක් සකස් කරගෙන යනු ලැබේ. අඩු පාඩු තැන් හදා ගැනීමේ කරුණු හඳුරීමක් වශයෙන්, මෙම වසමට අයත් මොරොන්තුඩුව නම් ගමෙහි ආහාර පිළිබඳ සමීක්ෂණයක් මෙහෙයවන ලදී.

අවුරුදු හතරෙන් හතරට කෙරෙන අනුගාමික තතු හැදෑරීමක් විලස, වීරකෝන්ගම නම් ගමෙහි සමීක්ෂණයක් කරන ලදුව, එයින් ලැබුණ නිර්දිෂ්ටයන් පෙර අවුරුදු වලදී කළ ආකාරයට ම විග්‍රහ කරන ලදී.

දෙහිවල-ගල්කිස්ස පෙදෙසෙන් ගත් ආදර්ශ ජනගහනයක් අතර "ගැබිනි අවස්ථාවේ ලේ හිඟ කම කෙතෙක් දුරට පැවතියේද යන වගත් එහි ස්වභාවය කවරේද යන වගත් ගැන කරුණු හැදෑරීම දිගටම කෙරිණ. ඊට සමාන තවත් කරුණු හදාරුවක් බණ්ඩාරගම දී ඇරඹිණ. මෙකී හැදෑරීම භාර ගත්තා ලද්දේ, මාතෘ ආරක්ෂාව සහ ළමා සෞඛ්‍යය පිළිබඳ උපදෙස් කාරක සභාව උදෙසාය.

බිලිඳුන්ට ආහාර දීම පිළිබඳ පත්‍රිකා දෙකක් සහ මව් වරුන් ගේ අහරවලට පිළිබඳ පත්‍රිකා දෙකක් සඳහා සමානුපාත වන ලෙස, ඒකාබද්ධ පාඨශාලා සෞඛ්‍ය කාරක සභාවට අයත් පෝෂණ පත්‍රිකා කාරක සභාවට ආධාර දෙන ලදී.

පාචන රෝග පිළිබඳව ජ. සෞ. සං. හදාරු කණ්ඩායම විසින් හොරපේ ගම සහ කෝට්ටේ සෝදිසි කර ගෙන යනු ලැබූ ළමුන් ගේ පෝෂණ තත්ත්වය මැන ගැනීම සඳහා එම කණ්ඩායමට ද ආධාර දෙන ලදී.

ග්‍රාම සංවර්ධන කටයුතු වලට අනතුරුව මතු කාලයේ දී ඇති වන වෙනස් වීම් මැන ගැනීමේ පදනම් රේඛාවක් සලසා ගැනීම අරබයා, පරණගම, ගොරකදෙනිය සහ බොරගල යන ගම්වල ළමුන් ගේ පෝෂණය ගැන කරුණු හදාරන ලදී.

විශේෂ පුහුණුව ලත් පාඨශාලා වෛද්‍ය නිලධාරීන් ගේ සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් ගේ වාර්තාවලින් පාසැල් ළමුන් ගේ පෝෂණ තත්ත්වය අවුරුදු පතා මැනීම දිගටම කරගෙන යන ලද අතර, එහි වාර්තා මහජන සෞඛ්‍ය සේවා අංශයට ඉදිරිපත් කරන ලදී.

රෝහල් අහරවටයෙහි ප්‍රමාණවත් කම ගැන වාර්තා කිරීම පිණිස පත් කරන ලද විශේෂ කාරක සභාව උදෙසා, රෝහල් අහරවටයේ ප්‍රමාණවත් කමෙහි අගය නැවත විමසා බැලීම අළුතෙන් කරන ලද වැඩකි. රෝහල් බොහොමයකට ගොස්, අහරවට පරීක්ෂා කළ අතර, කෑම චක්‍ර ආශ්‍රයෙන් අහරවට උපලේඛන විග්‍රහ කරන ලදී.

උපදෙස් තකා තමා වෙත යොමු කරන ලද පෝෂණය පිළිබඳ විවිධ ගැටළු සම්බන්ධයෙන්, සෞඛ්‍ය සේවයේ ඉතුරු කොටසත් අනෙකුත් දෙපාර්තමේන්තු වලටත් මෙම අංශය මහත් සේ උදව් කළා ය.

අධ්‍යයන අංශයෙන් බලන කල, වෛද්‍ය අංශයේ විවිධ වර්ගවලට අයත් නිලධාරීන් ටත්, වෛද්‍ය නොවන අනෙකුත් සමිති සමාගම් වල සහ සංවිධාන වල උදවියටත්, පෝෂණය පිළිබඳ දේශනා මුසු පාඨ මාර්ග දෙන ලදී. එ පමණක් නොවේ. ගුවන් විදුලිය මගින් කතා පැවැත්වීමෙන් අධ්‍යාපන යෝජනා ක්‍රම වලට සහාය වුන අතර, "ඔබේ එළවළුවල ඇති විටමින්" යන මැයෙන් ලිපියක් ද ලියන ලදී.

පරාපෝෂිත විද්‍යාව

නිවර්තන කලාපිය "කොසිනෝfපිලියා" පිළිබඳ කරුණු හැදෑරීම් වර්ෂය අවසාන වන විට මුළුමනින්ම පාහේ අවසන් විය. එක් එක් කරුණු පිළිබඳව චිකිත්සාගාර මය, රක්ත විද්‍යානුකූලව, වස්තු විද්‍යානුකූලව සහ රශ්මි විද්‍යානුකූලව විභාග කරන ලද අතර, "ඔයතිල්-කාබමසින් සයිට්රේට්" විවිධ වඩි වැඩිවෝරුවල භාවිතය වන අන්දම වාර්තා ගත කරන ලදී.

කුකුල් පැටවුන් තුළ ප්‍රවන්ඩ සහ අප්‍රවන්ඩ "ටොක්සොප්ලාස්මා ගෙන්ඩයි" හැසිරෙන ආකාරය ගැන සෝදිසිය දිගටම පවත්වාගෙන යන ලදී. "ටොක්සොප්ලාස්ටොසියාව" ගැන වැඩි දුරටත් කරුණු හැදෑරීමත් සහ බල්ලන් සහ බළලුන් තුළ රෝගය හටගත් තරම පිළිබඳ කරුණු හැදෑරීමත් ඇරඹිණි. වල්මියන් තුළ "ටොක්සොප්ලාස්ටොසියාව" හටගත් අයුරු පිළිබඳ කලින් කර ගෙන ගිය හදාරුව අවසන් කරන ලදී.

බරවා බිජ වර්ගයන් රසායනාගාර සතුන්ගේ සිරුරුවලට ඇතුළත් කිරීමේ ගැටළුව පිළිබඳව සහ එම බෝවීම සතුන් කෙරෙහි බලපාන අයුරු පිළිබඳ අත්හදා බැලීම් දිගටම පවත්වාගෙන යන ලදී.

"නෙමටෝඩ්" නම් පරාපෝෂිතයින් ගැන කිය යුතුව තිබෙන්නේ, එහි පරපෝෂිතයින් කෙරෙහි රසායනාගාරයේ සතුන්ගේ ප්‍රතිශක්ති කර විද්‍යානුකූල හැරීම ගැන දිගටම සෝදිසි කරගෙන යන ලද අතර, නගර වැසියන් අතර "නෙමටෝඩ්" පරපෝෂිත ආසාදනය බල පැවැත්වූ තරම පිළිබඳව සමීක්ෂණයක්, අනුබද්ධ කරුණු හැදෑරීමක් අරඹන ලදී.

"ප්ලාස්මොඩ්ටා-න්‍යුක්ලියාරේ" නම් පරාපෝෂිතයින් රසායනාගාර තත්ත්වයටතේ තහවුරු කිරීම පිණිස ඔවුන්ගේ හැසිරීම වටහා ගැනීම අරබයා කුකුල් පැටවුන්ට බෝකිරීමේ අත්හදා බැලීම් සාර්ථක ලෙස මුදුන් පත් විය. ඊට අමතරව, මතු සඳහන් පරාපෝෂිත පිඩක රසායනාගාරය තුළ පවත්වා ගනු ලැබිය:—මියන් තුළ "ප්ලාස්මෝඩියම් බර්ජෙස්", හික්මියන් තුළ "ප්ලාස්මෝඩියම් විනෙකෙයි", මියන් සහ හික්මියන් තුළ අප්‍රවණ්ඩ "ටොක්සොප්ලාස්මාගොන්ඩයි" පිඩක, ලිහිල් කරන ලද "බොයෙත්" සහ "ඩෘලෝසෙ" මාධ්‍ය තුළ "එන්ටයිබා හිස්ටලිටිකා," "ට්‍රයිකොමනාස් හොමින්ස්", සහ "බොංස්තිඩියම් කොලයි" සිරිත් පරිදි කෙරෙන කටයුතු රාශියක් ඉටු කරන ලදී. ඇම්බා, ඩිම්බ සහ කොෂය සඳහා පරීක්ෂා කරන ලද අසුචි නිදර්ශක ගණන 3,004 කි. ඇම්බා වඩන ලෙස කරන ලද විශේෂ ඉල්ලීම් ගණන 189ක් විය. "ඇන්කිලොස්ටොමසොසියා" ව්‍යාපාරයෙන් ලැබුණු සංඛ්‍යාව 161ක් වීමෙන් එය පසුගිය අවුරුද්දට වඩා බොහෝ සෙයින් අඩු විය. "ටොක්සොප්ලාස්මොසියාව" හඳුනා ගැනීම් වස්, කොදු ඇට ද්‍රව්‍ය නිදර්ශක 2ක් සහ ලේ නිදර්ශක 21ක් පරීක්ෂා කොට බලන ලදී. මැලේරියා පරාපොෂිතයින් බැලීමට 51ක් ද, සූක්ෂම බරවා ජීවීන් බැලීමට 83 ද ලේ පටල ගන්නා ලදී. හරස්කුමයට විමසා බැලීමක් වශයෙන් බරවා මර්දන ව්‍යාපාරයෙන් ලැබී පරීක්ෂා කරන්ට යෙදුණ ලේ පටල ගණන 110ක් විය.

රෝග නිධාන විද්‍යාව

"ඇනිරොස්කලිරොසියාව" සම්බන්ධයෙන් කුව බිලය විසින් කරනු ලබතැයි සිතිය හැකි කෘත්‍යය පිළිබඳව කරුණු හැදෑරීම දිගටම කරගෙන යන ලදී. කුව බිලයේ කතී ව්‍යයන් කෙරෙහි ප්ටලාකාර-අන්තශරද නමැති අඩස්සි කරුවන් ක්‍රියා කරන අන්දම නිගමනය කර ගැනීම අරබයා විමර්ශන ද අරඹන ලදී.

සාමාන්‍යයෙන් ලක් වැසියන් තුළ පවතින රක්ත විද්‍යානුකූල සථාවරයන් නිගමනය කිරීම අරබයා වූ විමර්ශන දිගටම කරගෙන යන ලදී.

බාර ගන්නා ලද එදි නෙදා වැඩ කොටස පසුගිය අවුරුද්දේ වෙන්ම විය. විවිධාකාර පරීක්ෂණ ඉමහත් ගණනක් බාර ගන්නා ලද නමුත්, ඉන් වැඩි හරියක් වූයේ, ගැබිනි බව සඳහා මූත්‍රා පරීක්ෂාවත් ගෙමැඩි පරීක්ෂාවත් ය. මෙම ක්ෂෙත්‍රයෙහි ලා, ඖතික රෝග නිධාන විද්‍යාව පිළිබඳව ද සැහෙන වැඩ කොටසක් කරන ලදී. මීට අමතරව ආයතනයේ අනෙකුත් අංශ උදෙසා පරීක්ෂණ විශාල සංඛ්‍යාවක් ද කරන ලදී.

ඖෂධීය විද්‍යාව

චිකිත්සක ගුණයන්ගෙන් සුසැදියැයි කියන, ආයුර්වේද වෛද්‍ය කර්මයෙහි ලා පාවිච්චියට ගනු ලබන, පැළෑටි වර්ග ක්‍රමවත් ලෙස සෝදිසි කර බැලීම සඳහා පමණක්, කරන ලද පර්යේෂණ කටයුතු ප්‍රධාන වශයෙන් සීමා විය. වෙළෙඳාම

අතින් වටිනා කමක් ඇති ඇතැම් පැළෑටි වර්ගද පරීක්ෂා කරන ලදි. විසබුලිය, හොර, දෙරණ, වෙනි වැල් සහ සමදරා යන වර්ගවල ස්ථවික සංඝටක වෙන් කොට, එම සංඝටක හුවා ගන්නා ලදි. එහිදී පෙනී ගිය කරුණු, මෙම පරිවේෂදය අවසානයේ එන පරිශිෂ්ටයේ දැක්වෙන ප්‍රකාශනවල සඳහන් වේ.

මුළු මනින්ම මධ්‍යසථ "කෙටොස්ටෙරොයිඩ්"—17 සහ "හෙටොජෙනික්-සෙටරොයිඩ්"—17 සඳහා පරීක්ෂා 121 කින්, එදිනෙදා වැඩ සමන්විත විය.

රසායනාගාරයේ වැඩ සඳහා ඖෂධ සංයෝග ලිටර් 4000ක් ද, සිරුරට විදීමෙන් පාවිච්චි කිරීම සඳහා පෙරන ලද "පයිරොජන්"-මුක්ත සංයෝගය ලිටර් 200ක් ද, සිරුරට විදීම පිණිස සාමාන්‍ය සේලයින් සහ අනෙකුත් සංයෝග ලිටර් 11ක් ද, ඖෂධ වර්ග අංශය විසින් පිළියෙල කෙරිණ.

සැල්මොනෙල්ලා-ෂිගෙල්ලා

කරන ලද වැඩ වලින් වැඩිම කොටස එදිනෙදා කටයුතු වලට අදාල රෝග විනිශ්චක පරීක්ෂණ විය. පර්යේෂණ වැඩ මීට සම්බන්ධ වන කාර්‍යීයන්ට පමණක් සීමා විය.

වර්ෂය තුළ දී සැම්පල් 17,096ක් පරීක්ෂා කරන ලද අතර, සැල්. ටයිපි සඳහා එයින් 692ක් ද, "ඒ" සැල්. පැරටයිපි සඳහා 73ක් ද, අනෙකුත් සැල්මොනෙල්ලා වර්ග සඳහා 3ක් ද, නියමිත බව පෙන්විය.

මීට අමතරව, අසූචි වලින් සැම්පල් 8,521ක් ද, මුත්‍රාවලින් 61ක් ද, අනෙකුත් ද්‍රව්‍ය වලින් 14ක් ද පරීක්ෂා කරන ලද අතර, ඒවායින් විවිධ වර්ග 28 කට අයත් වූ සැල්මොනැල්ලාවන් 453ක් වෙන් කර ගන්නා ලදි.

ලංකාවේ පළමු වරට සැල්මොනැල්ලා හයක් තනිකර ගන්ට ලැබීම සැලකියයුතු සිද්ධියකි. එසේ තනිකර ගන්නා ලද සැල්මොනැල්ලා හය මෙසේය:—සැල්-ග්ලොස්විරස් සැල්-ගූර්ලයිවි, සැල්-ජාවා, සැල්-නෙහංගා, සැල්-ඕරියන් සහ සැල්. පොමෝනා.

ෂිගෙල්ලා 252 වරක් තනිකරන ලදුව ඒවා විවිධ වර්ග 10කට අයත් විය. එයින් ඉතාමත් පොදු එවුන් නම් ෂිගෙල්ලා ප්ලික්ස්නේරා 2 සහ ෂිගෙල්ලා සොන්නෙයි වර්ග වෙයි.

මහජන සෞඛ්‍ය කටයුතු උදෙසා, සුවය ලබන්නාවූ සහ රෝහල් වලින් නික්මුනා වූ සන්නිපාත රෝගින්ගෙන් අසූචි නිදර්ශක පරීක්ෂා කරන ලද අතර, එම පරීක්ෂණ 494 කින් 45 ක් නියත බව පළ කළේය. බීජ හාරක අවස්ථාව දැනගනු පිණිස, 1961 මාර්තු මාසයේදී රත්නපුර, අයගම පැතිර ගිය සන්නිපාත රෝගයට ගොදුරු වූවන් ගෙන් කලින් කලට පරීක්ෂණ පවත්වන ලද අතර, 18 මාසයක් අවසානයේදී එක් රෝගියෙකු දිගටම සැල්-ටයිපි මෝචනය කරන බව පෙනිණ.

ව්‍යාප්තනක "එස්චරිකියා කොලි" සඳහා බිලිඳුන් ගේ අසූචි සැම්පල් ක්‍රමවත් ලෙස පරීක්ෂා කරන ලද අතර, විවිධ වර්ග 7 කට අයත් "ඒ-කොලි" 13ක් සොයා ගනු ලැබිය.

වසංගත රෝග විද්‍යා හැදෑරීම් උදෙසා, සැල්. ටයිපි පීඩක 651ක් "පේජ් ටයිප් කරන" ලද අතර, 319ක් "ඒ පේජ්" වර්ගයේ බවත්, 201ක් ඊ 1 බවත්, එකක් බී 1 බවත්, හඳුනා ගනු ලැබූ අතර 130ක් විශ්ලේෂී කරන ලදි.

මස්තු විද්‍යාව

විවිධ රාශි වලට අයත් ලාංකිකයින් අතර ලේ වර්ග, රක්ත රංජක වර්ග සහ මෝචනක තත්ත්වය හැදෑරීම පිළිබඳ පර්යේෂණ වැඩ සටහන, පෙර කී පරිදි වෛද්‍ය චාර්ය ආර්. එල්. වික්‍රමසිංහ මහතාගේ වෙන්ව යාමත් සමග නවතා දමන්ට සිදු විය.

මධ්‍යම සමාජ රෝග චිකිත්සාගාරයේ රසායනාගාරයට සෘක විද්‍යඥයෙක් පත් කිරීමත් සමග, රජයේ ආයතනවලින් ලැබෙන ස.රෝ.ප.ර. පරීක්ෂණ සියල්ල 1962

ජනවාරියේදී එම රසායනාගාර වලට මාරු කිරීමෙන්, එදිනෙදා කටයුතු ලෙස කර ගෙන ආ රෝග විනිශ්චක කටයුතු සැහෙන තරමකට අඩු කරගන්නා ලදි. මුල් මාස තුනේදී කරන ලද ස.රෝ.ප.ර. පරීක්ෂණ හැරුණ විට, අවුරුද්ද තුළදී, පරීක්ෂණ 19,000කට කිට්ටු ගණනක් කරන ලදි. එස්. ඒ. ටී. පරීක්ෂණ මුළු ගණන 14,600කට කිට්ටු විය.

තවද, දෙපාර්තමේන්තුව එස්. ඒ. ටී. ඇන්ටිජන් පිළියෙල කොට, සෞඛ්‍ය සේවයට අයත් අනෙකුත් රසායනාගාර වලට බෙදා හැරී ය.

(සෘක) එන්නත්

රටට අවශ්‍ය ටී. ඒ. බී. සහ ප්‍රති-කොලරා එන්නත් ප්‍රමාණය සම්පූර්ණයෙන්ම මෙම අංශයෙහිදී පිළියෙල කරන ලදී. නිකුත් කරන ලද එන්නත් සම්භාරය දළ වශයෙන්, ටී. ඒ. බී. ලීටර් 330 ක් ද ප්‍රති-කොලරා එන්නත් ලීටර් 22 ක් ද විය. ස්වයං ජනිත එන්නත් රාශි හතරක් ද පිළියෙල කැරිණ. ඖෂධ වගී අංශයේ නිශ්පාදන සෑම්පල් 72 ක් පිළිබඳව වන්ධ්‍යතා පරීක්ෂණ ද කරගෙන යන ලදී.

වයිරස් විද්‍යාව

(අ) පිස්සු බලු රෝග හෙවත් රහස අංශය

පිස්සු බලු රෝගයේ සාක්ෂි සොයා ගනු පිණිස, සතුන් ගේ මොල පරීක්ෂා කිරීමට රෝග විනිශ්චක කටයුතු සීමා වූ අතර කෙළින්ම ගනු ලැබූ සුවයන් වලින් බිජ විරහිත බව පෙනෙන විට ජීව විද්‍යානුකූල පරීක්ෂණ කෙරේණ. සියල්ලම එකතු වූ විට, විවිධ සතුන් ගේ මොල (වැඩි වශයෙන් බල්ලන්ගේ) 929 ක් පරීක්ෂා කරන ලදී. එයින් 619 ක් නියත බව පෙන්වූ අතර 103 ක් පරීක්ෂා කිරීමට තරම් සුදුසු තත්ත්වයක නොවී ය.

මිනිසුන්ට එන්නත් කිරීම සඳහා රටට අවශ්‍ය වන ප්‍රති-රහස එන්නත් බෙහෙත් සියල්ලම අංශයෙන් සැපයුණ අතර, එය ලීටර 1,416 කින් පමණ යුක්ත විය.

(ආ) වැක්සිනියා-වැරියෝලා

වසූරිය රෝගීන් යැයි සැක කරන ලද අයගෙන් කෙලින්ම ස්‍රාවයන් ලබා ගෙන, වැඩෙන කුකුල් පැටව් කළලයන්ගේ "කෝරියෝ-ඇලන්ටොයිපික්" පටල මත වසිරස වෙන් කිරීමෙන් පරීක්ෂා කරන ලද නිදර්ශක ගණන 206 කි. එන්නත් කිරීම සඳහා නිකුත් කරන ලද වසු පැටවුන්ගේ වසා ප්‍රමාණය, වසංගතය හට ගැනීම නිසා 55 ලක්ෂයක් වීමෙන්, මීට පෙර නිකුත් කළ ප්‍රමාණයට වඩා එය වැඩි විය.

අළුත් වයිරස් රසායනාගාරය උපකරණ අතින් සම්පූර්ණ නැතත්, සතුන්ගෙන් පටන් ගන්නා රෝග පිළිබඳ වැඩ සමග පටක වැඩිමේ වැඩ සුළු වශයෙන් ආරම්භ කරන ලදී.

අභ්‍යාසය

(අ) වෛද්‍ය පර්යේෂණාගාර කාර්මික විද්‍යාඥ පාසැල

වර්ෂය සඳහා පාසැල වැඩ කටයුතු ඉතා සතුටුදායක වී ය.

වර්ෂය මුලදීම තම ප්‍රහුණුව ආරම්භ අළුත් සිසුන් 24 දෙනෙක් සිටියහ. වර්ෂය අවසානයේදී අවසාන විභාගයෙන් සාමාර්ථය ලැබූ 20 දෙනෙක්, තම එක් අවුරුදු සීමා වාසික අභ්‍යාස කාලයට පා තැබූහ. අසමත් වූ අපේක්ෂකයින්, මාස තුනකින් නැවත විභාගයට තැබීමට නියමිත සි.

පසුගිය අවුරුද්දේ දී ඇතුළත් වුණ සිසු කැල අතුරෙන් විභාගයෙන් සමත් වූ 20 දෙනා මෙහි පෙනෙන අවුරුද්ද තුළදී සිය සීමා වාසික කාලය ආරම්භ්හ. අසමත්වූ සිසුවන් සිව් දෙනා මාස තුනක්-හතරක් ඇවැමෙන් සිය විභාගය සම්පූර්ණ කළහ. මෙම සිසු කැලට පිටස්තර අය ද තිදෙනෙක් වූහ. ලංකා විශ්ව-විද්‍යාලයයෙන් දෙදෙනෙක් ද පළාත් පාලන සේවයෙන් එකෙක් ද යනුවෙන් වූහ, ඔවුහු.

(ඉ) සංස්කරණ පාඨ මාලා

පිට පළාත් වල පිහිටි රසායනාගාර වලින් කැඳවූ කාර්මිකඥයින් පස් දෙනෙකුට, ජීව-රසායන විද්‍යාව විශේෂ කොට ඇති සති දෙකක සංස්කරණ පාඨ මාලා ලබා දෙන ලදී.

වැඩ පොළ සහ නඩත්තු කිරීමේ අංශය

වැඩපොළ සහ නඩත්තු කිරීම් අංශය, වෙන වෙනම ඒකක දෙකක් ලෙස දිගටම පැවතිණ. ආයතනයේ ම උවමනාවන් කෙරෙහි වැඩ පොළ නිරත වූ අතර, නඩත්තු කිරීමේ අංශය අනෙකුත් රසායනාගාර වලින් එන වැඩෙහි නිරත විය.

උපකරණ පිළියම් කිරීම් සහ නඩත්තු කිරීම්, යනුවෙන් එන වැඩ කොටස් 696 ක් ද ආයතනයේ උවමනාවන් සඳහා වඩු වැඩ මහත් රාශියක් ද වැඩ පොළෙන් ඉටු වූ අතර, උපකරණ 84 ක් සහ අනුදක්න 165 ක් පිළියම් කිරීම නඩත්තු කිරීමේ ඒකකය මඟින් ඉටු කරන ලදී.

සත්තු නිවස

අත්හදා බැලීම් සඳහා ගන්නා වූ සතුන් ඉල්ලා එවීම් සියල්ල මුළු මනින් ම සපුරාලිය නොහැකි වූයෙන්, ජනවාරි මාසයේ දී සත්තු නිවස ප්‍රති සංවිධානය කරන ලදුව පර්යේෂණ නිලධාරියෙකු යටතට පත් කරන ලදී.

හික්මියන් මහත් රැසක් ඇති කිරීම ගැන ප්‍රමුඛත්වය දී ක්‍රියා කරන ලදුව, එය සැප්තැම්බර් මාසයේ දී මුදුන් පත් කර ගත හැකි විය. දැන් අනෙකුත් සතුන් සම්බන්ධයෙන් ක්‍රියා කරනු ලැබේ. ඉඩ කඩ මඳවීම ප්‍රධාන බාධකයක් වශයෙන් පැවතුණ හෙයින්, ඉඩ කඩ සපයා ගැනීම සඳහන් සතුන් ගාල් කිරීමේ වෙනස් කම් දැනට කරගෙන යනු ලැබේ.

VIII වැනි පරිවෙජදය

පාරිසරික සෞඛ්‍ය සංරක්ෂණය

(අ) ඒ සෞඛ්‍ය සංරක්ෂණය

1. හැටළුව

රෝග වැළැක්වීමේ ඇති වැදගත්කම, විශේෂයෙන් පූර්ව පාඨශාලා වයස් ළමුන්ගේ සෞඛ්‍ය සංරක්ෂණයේ ඇති වැදගත්කම සළකා වර්ෂය තුළ දී පාරිසරික සෞඛ්‍ය සංරක්ෂණයෙහි ලා විශේෂ සැලකිල්ලක් දක්වන ලදී. වර්ෂය තුළ දී 3,89,314 දෙනෙකුට කොකුපණු ප්‍රතිකාරය දෙන ලදී.

2. සංවිධානය

පරිසරයේ සෞඛ්‍ය සංරක්ෂණය ප්‍රධාන වශයෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් සතු වගකීමකි. අවුරුද්ද තුළ දී නව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයින් 38 දෙනෙක් පත් කෙරිණ.

3. වැඩ කටයුතු

(අ) ජල සම්පාදනය

කුරුණෑගල පාරිසරික සෞඛ්‍ය යෝජනා ක්‍රමයේ වැඩ නිමවීමෙන් පසු එම කටයුතු දිවයිනේ සමහර ප්‍රදේශවල ආරඹන ලදී. දැනට වැඩිකිළි තැනවීම සඳහා දෙනු ලබන ආධාර ක්‍රමය යටතේ ජල සම්පාදනය සඳහා ද මුදල් වෙන්කර ඒ වැඩ ක්‍රමය "පාරිසරික සෞඛ්‍ය සංරක්ෂණ ආධාර ක්‍රමය" යනුවෙන් නම් කිරීමට අදහස් කර ඇත.

නාගරික ප්‍රදේශවල වතුර නිසා වැළඳෙන රෝග මර්දනය කිරීම සඳහා කොතෙකුත් දේ කළ යුතුව තිබෙන අතර ගම්බද ප්‍රදේශවල ළිං, ඇලදොල හා වැව් පොකුණු වැනි අනාරක්ෂිත ස්ථාන වලින් ජලය ගැනීම එසේම පැවතුනි.

(ආ) මිනිස් මළ මූත්‍ර බැහැර කිරීම

බරවා රෝග මර්දනය කිරීම යටතේ බාල්දි වැසිකිළි ජලමුද්‍රිත වැසිකිළි බවට පත් කිරීම සඳහා රුපියල් 60ක ආධාර මුදලක් ගෙවීමේ ක්‍රමය එසේම පැවතුනි.

ගම්බද ප්‍රදේශවල වැසිකිළි තැනීම සඳහා ගෙවන ලබන රුපියල් 25 ආධාර මුදල් ගෙවීමේ ක්‍රමය නොනවත්වා පවත්වාගෙන යනු ලැබූ අතර ඒ ක්‍රමය යටතේ වර්ෂය තුළ දී රුපියල් 3,80,054ක් වැය කරන ලදී.

(ඇ) හදිසි අනතුරු

ලංකාවේ සිදුවූ මරණ අතුරින් විශාල සංඛ්‍යාවකටම හේතුවූයේ හදිසි අනතුරුයි. හදිසි අනතුරු වැලැක්වීමේ අන්තර් දෙපාර්තමේන්තු කමිටුවේ කටයුතු අඛණ්ඩව පැවතින. අනතුරුවලින් බේරීමේ හෙල්මට් මෙරට ගෙන්වීමේ දී අයකරන ආනයන ගාස්තු අඩු කරන ලෙස මෙම කමිටුව මගින් කරන ලද නිර්දේශය මුදල් ඇමතිතුමා විසින් පිළිගන්නා ලදී. තවද මෝටර් බයිසිකල් අනතුරුවලදී වැඩි වශයෙන් මරණයට ගොදුරුවන්නේ හිසෙහි ඇති වන තුවාල කරණකොට ගෙන බැවින් සෑම මෝටර් බයිසිකල් පදවන්නකු විසින් ම පැළඳිය යුතු බැව් ද නිර්දේශ කරන ලදී. අනතුරු වැළැක්වීමේ ලංකා සංගමය මගින් මෙහෙයවන ලද සාකච්ඡා සභාවකට මෙම දෙපාර්තමේන්තුව සහභාගි වූවා පමණක් නොව දිළිඳු අය අතර ආරක්ෂක ලාම්පුද බෙදා දෙන ලදී.

4. නිවාස

රටේ පවත්නා නිවාස හිඟය ගැන සළකා කිසියම් ගෙයක් පදිංචියට අයෝග්‍යයයැයි නිර්දේශ කිරීමේ දී පරීක්ෂාකාරී වන ලෙස දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් ඉල්ලා තිබේ.

වතු ගෙවල් පේළිවල සනීපාරක්ෂාවත් යෝග්‍යතාවයත් වැඩි දියුණු කිරීමේ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම ගැන දෙපාර්තමේන්තුව එකඟ විය.

(ආ) ආහාර හා ඖෂධ පාලනය

නියමිත බලධාරීන් විසින් ආහාර හා ඖෂධ පණත (216 වැනි අධිකාරය) හා ඒ යටතේ පනවන ලද රෙගුලාසි ක්‍රියාත්මක කිරීම අත්නොහිටවා කරගෙන යන ලදී.

(අ) ආහාර පාලනය

පනත යටතේ බල්ය පැවරෙන අධිකාරීන්වන පලාත් පාලන අධිකාරීන් විසින් ආහාර පාලනය හා සම්බන්ධ කටයුතු කරගෙන යන ලදී. වර්ෂය අවසාන වීට මෙම කටයුතු නාගරික සභා 7ක් උපනගර සභා 18ක් හා සුළු නගර සභා 2ක් විසින් ක්‍රියාත්මක කරන ලදී.

ආහාර වර්ග විශ්ලේෂණය කිරීම කරන ලදී. කොළඹ හා මහනුවර යන නගර සභා විසින් කරන ලද විශ්ලේෂණවල සම්පිණ්ඩනයක් LXI දරන සටහනින් දක්වා ඇත. ඊට පළමු වර්ෂවල දී මෙන් ම කිරි, කොපි (කුඩු) සරක්කු කුඩු, තුනපහ කුඩු කහකුඩු, විනාකිරි, පොල් තෙල් හා තලතෙල් ද විශාල වශයෙන් බාලකර තිබෙනු සොයා ගන්නා ලදී. ආනයනය කිරීම සීමා කිරීමත් සමගම මෙරටේ දී ආහාර වර්ග වඩ වඩා

බාල කිරීමට පටන් ගෙන තිබෙන බැව් පෙනේ. කරුණු මෙසේ හෙයින් පාරිභෝගික සින්ගේ යහපත සළකා, ගත හැකි එකම පියවර නම් නිතර නිතර ආහාර සැම්පල් ගෙන විශ්ලේෂණය කර වීම ය.

(ආ) ආහාර පාලනය

ආහාර හා ඖෂධ පණත ක්‍රියාත්මක කරනු ලබන පලාත් පාලන ආයතනවලට උපදෙස් දීමේ කටයුතු වලට අමතර වශයෙන් ආහාර හා ඖෂධ පාලක නිලධාරීන් පස් දෙනෙකු විසින් එම කටයුතු ප්‍රාදේශීය අයුරින් කරගෙන යන ලදි.

ගෘහඖෂධ ලේඛනයට ඇතුළත් වූ ඖෂධ හැර සෙසු බෙහෙත් වර්ග විකුණන වෙළෙඳුන් 1708 දෙනෙකුට ඒ සඳහා බලපත් නිකුත් කරන ලදි. ආහාර හා ඖෂධ රෙකුලාසි උල්ලංඝනය කරන ලද වෙළෙඳුන්ට ඖෂධ විකිණීම සඳහා බලපත්‍ර නො ලබා සිටීම නිසා අධිකරණය ඉදිරියට පත් කරන ලදි.

වර්ෂය තුළ දී, බලපත්‍රයකින් ආරක්ෂිත වූ හිමිකම් සහිත ඖෂධ වර්ග සමහරකින් සැම්පල් ගෙන විශ්ලේෂණය කර බැලීමේ දී ඒ වායේ ලේබලයන්හි සඳහන් ද්‍රව්‍ය එසේම පැවති බැව් අනාවරණය වී ඇත.

(ඇ) උපදේශක කමිටුව

ආහාර හා ඖෂධ පිළිබඳ උපදේශක කමිටුවේ කටයුතු අඛණ්ඩව පැවතින. එම පණත ක්‍රියාත්මක කිරීමෙහි ලා ගතයුතු තීරණයන් ගැනීමේ දී එම සාමාජිකයන් විසින් ඉටු කරන ලද සේවය අගය කළ හැකි ය. කමිටුව විසින් සළසන ලද සේවය ස්තුති පූර්වකව මෙහි ලා සඳහන් කරනු ලැබේ.

(ඈ) නීති සම්පාදනය

(1) වර්ෂ 1961 හා අංක 8 දරණ ආහාර හා ඖෂධ රෙකුලාසි 1962 වර්ෂයේ ජූනි 1 වැනි දින සිට ක්‍රියාත්මක විය. මෙම රෙකුලාසි වලින් කිරි ආහාර වර්ග, බිළිඳු හා ළමා ආහාර වර්ග, මෝල්ට් කිරි වර්ග, යොදය රහිත පිටි කිරි යන දේවල සම්මත තත්ත්වය ආරක්ෂා කිරීම හා ලේබල කිරීම පාලනය කෙරේ. එහෙත් ළමා ආහාර ලේබල් කිරීම පමණක් තරමක් දුරට වෙනස් වේ.

(2) ආහාර වර්ග නිෂ්පාදනය සඳහා ගනු ලබන වර්ණ රහිත යොදය හළ පිටි කිරි ආනයනය කිරීමට ඉඩ දෙනු සඳහා වර්ෂ 1951 හා 1955 සහ අංක 2 දරන ආහාර හා ඖෂධ රෙගුලාසි වැඩිදුරටත් සංශෝධනය කෙරින.

3. දේශීය ඖෂධ නිෂ්පාදනය, ඇගිරීම හා විකිණීම සම්බන්ධ රෙගුලාසි ඉදිරි වර්ෂයේ දී කමිටුව මගින් පිළිගැනීම සඳහා පිළියෙල කොට ඇත.

(ඉ) මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශය

මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ වැඩ කටයුතු කොළඹ, කුරුණෑගල, මහනුවර, හාල්ල හා යාපනය යන ප්‍රාදේශීය කාර්යාල මගින් තවදුරටත් නොකඩවා කරගෙන යන ලදි. දැනට වෙන් කර ඇති ප්‍රදේශ නැවත වෙන් කිරීමේ කාර්‍යය සාර්ථක නොවූ වත් අනුරාධපුරයේ හා මඩකලපුවේ ප්‍රාදේශීය කාර්‍යාල ගොඩනැගීමට අවශ්‍ය රජයේ ඉඩම් ලබා ගැනීම නිසා ඒ සම්බන්ධයෙන් කිසියම් දියුණුවක් දක්නට හැකි විය. දැනට ඇති ප්‍රාදේශීය කාර්යාල සඳහා ලබා ගෙන ඇති ඉඩකඩ ප්‍රමාණවත් නොවන බැවින් වඩා යහපත් ගොඩනැගිලි පහසුකම් ලබා ගැනීමට උත්සාහ දරා ගෙන යයි. පස් අවුරුදු සැලැස්ම අනුව මේ ප්‍රදේශයන් ගේ සංඛ්‍යාව ද සෞඛ්‍ය සේවා අධිකාරි

වරුන්ගේ ප්‍රදේශ සංඛ්‍යාවට සැසඳෙනු වස් වැඩි කිරීමට යෝජනා කර ඇත. එකමුතු කිරීමේ හා ප්‍රතිසංවිධානය කිරීමේ කමිටු වාර්තාව අනුව මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ පහත දැක්වෙන ප්‍රතිපත්ති තවදුරටත් ක්‍රියාත්මක කරන ලදි :—

(අ) දූනට ඇති වෛද්‍ය ආයතන සඳහා ජල සම්පාදනය, නල මඟින් කසළ බැහැර කිරීම හා මතුපිට කානු දැමීම යන කාර්‍යයන් සඳහා සැලසුම් පිළියෙල කිරීම් හා ගොඩනැගීම්.

(ආ) සියලුම නව වෛද්‍ය ආයතන වල නල මඟින් කසළ බැහැර කිරීම සඳහා රජයේ වැඩ දෙපාර්තමේන්තුව මඟින් පිළියෙල කරනු ලබන සැලැස්ම අනුමත කිරීම.

(ඇ) ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉන්ජිනේරුවරයා විසින් පිළියෙල කරන ලද සැලැස්ම හා නියමයන් අනුව නගර සඳහා මතුපිට කානු ක්‍රම තැනීම.

(ඈ) පාරිසරික සෞඛ්‍ය වැඩ සටහනක් දිවයින පුරා, ඉතා ප්‍රබල අන්දමින් ක්‍රියාත්මක කිරීම.

නිලධාරීන්

මෙම අංශයේ එතෙක් පැවති ඉංජිනේරුවරුන්ගේ පුරප්පාඩු සපුරා ලීමට නොහැකි වූ අතර තවත් ජ්‍යෙෂ්ඨ ඉන්ජිනේරුවරයකු විශ්‍රාම ලැබීම නිසා තවත් පාඩුවක් සිදු විය. අර්ධ කාර්මික වූ තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාවක් ද සම්පූර්ණ කිරීමට ඇත. මෙම තනතුරු සඳහා අයදුම්පත් කැඳ වූ නමුත් සුදුසුකම් ඇති අපෙක්ෂකයෝ ඉදිරිපත් නොවූහ.

කරන ලද වැඩ

(I) රසායනාගාර වැඩ

රසායනාගාර නිලධාරීන්ගේ වැඩ, ප්‍රධාන වශයෙන් ජලයේ ඉතිරිවන ක්ලෝරීන් පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණ, ක්ලෝරීන් අවශ්‍යතාවය ඇස්තමේන්තු කිරීම ආතංචක මාත්‍රාව සකස් කිරීම හා ක්ෂාරිය ප්‍රමාණය බැලීම වැනි පාලන කටයුතුවලට සීමාවිය.

ඇතැම් අවස්ථාවල සංවර්ධනය කිරීම සඳහා තෝරා ගෙන ඇති ජල මාර්ග වලින් ගත් වතුරෙහි ඇති ඝන භාවය, ලවණතාවය, දුර්ගණ්ධය, බොර පාට වීම යකඩ හා පී. එච් ප්‍රමාණය නිශ්චය කිරීමේ පරීක්ෂණ පවත්වන ලදි.

(II) උපදේශක කටයුතු

වතුවල නිවාස හා සනීපාරක්ෂක වැඩ, කසළ බැහැර කිරීම හා වෙනත් එවැනි ප්‍රශ්න සම්බන්ධ උපදේශක කටයුතු රාශියක් නිමවන ලදී. 1961/62 වර්ෂය තුළ දී රජයේ දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන හා පෞද්ගලික අංශ සඳහා පිඹුරු පත් 925ක් පමණ පිළියෙල කෙරිණ.

(III) විශේෂ යෝජනා ක්‍රම

ලෝක සෞඛ්‍ය සංවිධානයේ හා එක්සත් ජාතීන්ගේ හදිසි ළමා අරමුදලේ ආධාර ඇතිව 1956 වර්ෂයේ දී කුරුණෑගල ඇරඹූ පරිසර සෞඛ්‍ය යෝජනා ක්‍රමය තවදුරටත් පවත්වා ගෙන යන ලදී. දේශීය සැලැස්මක් අනුව සකස් කරන ලද සෘජු හා පැතලි වර්ගයේ වැසිකිළි පෝච්චි හා ගල්වලට අමතර වශයෙන් මෙම යෝජනා ක්‍රමය මඟින් ළමයින් සඳහා වූ වැසිකිළි පෝච්චි හා වැසිකිළි ගල් ද සකස් කරන ලදී. මේ සම්බන්ධයෙන් කරන ලද අත්හදාබැලීම් වල දී ඒවා ඉතාමත් ජනප්‍රිය වී තිබෙන බැව් දක්නා ලදී.

1961/62 තුළ පරිසර සෞඛ්‍ය ක්‍රමය යටතේ නිපයූ දේවල්

නිමවන ලද වැසිකිළි සංඛ්‍යාව	...	1546
සකස් කළ සිමෙන්ති පයිප්ප සංඛ්‍යාව	...	437
සකස් කළ වැසිකිළි ගල් සංඛ්‍යාව	...	1952
සකස් කළ පැනැලි පෝච්චි සංඛ්‍යාව	...	2438
සකස් කළ සෘජුවළ පෝච්චි සංඛ්‍යාව	...	20
නිමවන ලද ළිං (පොම්ප රහිත) සංඛ්‍යාව	...	20
නිමවන ලද පොම්ප සහිත ළිං සංඛ්‍යාව	...	118

සමාලෝචනයට භාජන වූ කාලය තුළ දී පරිසර සෞඛ්‍ය කටයුතු පහත දැක්වෙන පළාත්වලට ද පතළ කර යවන ලදි.

ගාල්ල සෞ. සේ. අධි. කොට්ඨාශය	...	අවිත්තාව
කොළඹ සෞ. සේ. අධි. කොට්ඨාශය	...	ඉහලගම කටගෙවත්ත
කුරුණෑගල සෞ. සේ. අධි. කොට්ඨාශය	...	මානක්කුළම, පුකුළම, පොරමුල්ල

IX වැනි පරිවෙජ්දය

මහජන සෞඛ්‍ය අධ්‍යාපනය

1. හැඳින්වීම

වර්ෂය තුළදී ජාතික සෞඛ්‍ය අධ්‍යාපන වැඩ පිළිවෙල තවදුරටත් වැඩි දියුණු විය. එතෙක් පවත්වා ගෙන යන ලද වැඩ සටහන් වැඩි දුරටත් ශක්තිමත් කරන ලද, අතර අළුත් වැඩ සටහන් රාශියක් ඉදිරිපත් කරන ලදි.

සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන්වල දී ප්‍රජා සංවර්ධන ක්‍රම වඩ වඩා ප්‍රතිඵලදායි වන අන්දමින් උපයෝගි කරගනු ලැබිය. මේ ක්‍රම විශෙෂයෙන් පිහිට කරගනු ලැබුයේ ඒකක ක්‍රමය යටතේ කෙරෙන පාරිසරික සෞඛ්‍ය වැඩ කටයුතු වල දී ය. ප්‍රජා සංවර්ධන මාධ්‍යයක් වන වැඩ කඳවුරු ක්‍රමය ඉතාමත් ජනප්‍රිය වී ඇතිවා පමණක් නොව බොහෝ මහජන සෞඛ්‍ය කටයුතු සඳහා එම ක්‍රමය උපයෝගි කර ගන්නා ලදි. වැසිකිළි තැනීම, කැළිකසළ බැහැර කිරීම, වල්බිහි වී ඇති ස්ථාන පිරිසිදු කිරීම, ජලය රැඳුණු තැන් හා ගොහොරුබිම් පිරවීම යන ආදි නොයෙක් මහජන සෞඛ්‍ය කටයුතු සඳහා ශ්‍රම ශක්තිය නමැති මිනිස් බලවේගය වැඩ කඳවුරු ක්‍රමය යටතේ මෙහෙයවනු ලැබිය.

සෞඛ්‍ය අධ්‍යාපනය පිළිබඳ උප අංශය ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ජාතික සේවා අංශය සමග එකමුතුව ජාතික සේවා නියමු යෝජනා ක්‍රම මෙහෙයවනු ලැබිය. මෙම අංශය විශේෂයෙන් සහභාගි වූයේ නෙළුව, වදුරුස්ස හා පැලවත්ත යන ජාතික සේවා නියමු යෝජනා ක්‍රමයන්ට ය. මීට සමාන අන්දමින් මෙහෙයවනු ලැබූ පාඨ ශාලාවලට හා ප්‍රජාවනට අයත් පාරිසරික සෞඛ්‍ය සංවර්ධන වැඩ සටහන්වලට ශිෂ්‍ය ස්වේච්ඡා සේවකයෝ ඉතා උනන්දුවෙන් සහභාගි වූහ.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා අධ්‍යාපන දෙපාර්තමේන්තුව සමග පැවති එකමුතුකම තවදුරටත් වැඩි දියුණු විය. ප්‍රාදේශිය, දිශා හා පාඨශාලීය යන අයුරින් පාඨශාලා සෞඛ්‍ය කමිටු සෞඛ්‍ය සේවා අධිකාරී කොට්ඨාස බොහොමයක පිහිටුවනු ලැබිය. පාඨ ශාලා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සෞඛ්‍ය සංවර්ධනය කිරීමේදීත් පාඨශාලා සෞඛ්‍ය ප්‍රශ්න විසඳීමේ දීත් දැනට වැඩි වගකීම ඉසිලීමේ හැකියාවක් ගුරුවරුන්ට ලබා දීම සඳහා සාකච්ඡා සම්මේලන පවත්වන ලදි.

වර්ෂය තුළ දී අරඹන ලද අළුත් වැඩ සටහනක් නම්, වෛද්‍ය ආයතනවල දී අරඹන ලද සෞඛ්‍ය අධ්‍යාපන පාඩම් මාලාවයි. ග්‍රාමීය රෝහල් හා මාතෘ නිවාස වල පවත්වන ලද මෙම සෞඛ්‍ය අධ්‍යාපන වැඩ පිළිවෙල විශාල වෛද්‍යායතන සමහරකට ව්‍යාප්ත කරන ලදි. දිවයිනේ පිහිටි සියලුම ප්‍රධාන රෝහල්වල විශේෂ සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් පිළියෙල කර ඇත.

මෙම දෙපාර්තමේන්තුව මගින් ගනු ලැබූ ඉතා වැදගත් පියවරක් නම්, ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව, ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුව, කෘෂි කර්ම දෙපාර්තමේන්තුව, සමුපකාර දෙපාර්තමේන්තුව, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව හා අධ්‍යාපන දෙපාර්තමේන්තු මගින් පවත්වාගෙන යන ප්‍රජා සංවර්ධන වැඩ සටහන් එකඳිතු කිරීම සඳහා ඉදිරිපත් වී කටයුතු කිරීමය. මූලික පියවරක් වශයෙන් මෙම දෙපාර්තමේන්තුවල වැඩ සටහන් එකමුතු කිරීමේ කාර්ය ඉතා සාර්ථක අයුරින් කෙරිණ. ඉදිරි කාලයේ දී නොයෙක් රජයේ දෙපාර්තමේන්තු යටතේ සේවය කරන නිලධාරීන්ට වඩ වඩා සහයෝගයෙන් යුතුව ක්‍රියා කිරීමට ඉඩ ලැබෙනු ඇතැයි විශ්වාස කෙරේ. මෙම වැඩ සටහනේ දී අනුගමනය කෙරෙන්නේ ඔවුනොවුන්ගේ සහයෝගය ඇතිව මහජන ප්‍රශ්න විසඳා ගැනීමට මග පෙන්වීම හා උපදෙස් දීම සඳහා සියලුම රජයේ නිලධාරීන් කණ්ඩායම් වශයෙන් ක්‍රියා කිරීමට පුහුණු කිරීමය.

ජාතික ප්‍රතිශක්ති කරණ ව්‍යාපාරය, ළමා වැසිකිළි තැනීමේ ක්‍රමය, ගෙදර දොරේ අනතුරු වැළැක්වීම, පෝෂණය පිළිබඳ අධ්‍යාපනයක් දීම, දන්ත සෞඛ්‍ය අධ්‍යාපනය හා පාඨශාලා සෞඛ්‍ය අධ්‍යාපනය යන විෂයයන් යටතේ සෞඛ්‍ය අධ්‍යාපන කටයුතු රාශියක් සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි.

විශේෂ ව්‍යාපාරවල කෙරෙන සෞඛ්‍ය අධ්‍යාපනයෙහිලා ක්ෂය රෝග නාශක ව්‍යාපාරය, සමාජ රෝග නාශක ව්‍යාපාරය, මැලේරියා නාශක ව්‍යාපාරය හා බරවා රෝග නාශක ව්‍යාපාරය යටතේ පවත්නා සෞඛ්‍ය අධ්‍යාපන කටයුතු තවදුරටත් ප්‍රබල කරනු ලැබිය. බරවා රෝග නාශනය පිළිබඳ දරන ලද විශේෂ උත්සාහයන් හි දී ප්‍රජා සංවර්ධන ක්‍රම යොදාගනු ලැබිය. මාතර ප්‍රදේශයේ දී විශේෂ නියමු යෝජනා ක්‍රම අරඹන ලදි.

දූනට පේන තෙක් මානයේ පවත්නා මැලේරියාව මුළිනුපුටා දැමීම පිළිබඳ ඉලක්කය ඇල්ලීමේ බලාපොරොත්තුවෙන් මැලේරියාව සම්බන්ධයෙන් කරන ලද ප්‍රචාරක ව්‍යාපාරය වඩාත් ප්‍රබල කරන ලදි.

ලංකා මහිලා සමිති, ලංකා රතු කුරුස සංගමය, සෞඛ්‍යදාන ව්‍යාපාරය, ලංකා පවුල් සංවිධාන සංගමය, ජාතික ක්ෂය රෝග මර්දන සමිතිය, ලංකා පිළිකා සංගමය, ජාතික අමද්‍යප ව්‍යාපාරය හා වෙනත් එවැනි ස්වේච්ඡා සංවිධාන සමඟ ඉතා සහයෝගයෙන් කටයුතු කරන ලදි.

2. නිලධාරි මණ්ඩලය

සෞඛ්‍ය හා අධ්‍යාපන දෙපාර්තමේන්තුවලට උපදෙස් දීම සඳහා ඇමෙරිකා එක්සත් ජනපද රාජ්‍යාධාර දූතමෙහෙය විසින් දෙන ලද උපදේශකයා වන පිලිප් ආර්. රයිලි මහතා රජය සමඟ පැවති ඔහුගේ සිව් අවුරුදු කොන්ත්‍රාත්තුව අවසාන කිරීමෙන් පසු දිවයිනෙන් බැහැරව යන ලදි.

3. ගොඩනැගිලි හා ඉඩකඩ

කොළඹ ද සේරම් පෙදෙසේ පිහිටි සෞඛ්‍ය අධ්‍යාපන භාණ්ඩ නිෂ්පාදනාගාරය පැරණී ඇස් රෝහලේ කොටසකට ගෙන යන ලදි. සාකච්ඡා සඳහා ශාලාවක්, කථා ශාලාවක් හා ශබ්ද කාන්දු නොවන සිනමා ශාලාවක් සඳහා ඉඩකඩ ලබාදීම ඇති කරනු ලැබේ.

4. උපකරණ හා භාණ්ඩ

සෞඛ්‍ය අධ්‍යාපනය සඳහා වෙන්කරන ලද රුපියල් 25,000 ක මුදල ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍රයේ පිහිටි සෞඛ්‍ය අධ්‍යාපන ඒකක යන්ට අවශ්‍ය සෞඛ්‍ය අධ්‍යාපන භාණ්ඩ

මිළ දී ගැනීම සඳහා වැය කරන ලදි. ඇමෙරිකානු රුපියල් අරමුදල යටතේ ලැබුණු රුපියල් 47,000 ක මුදල සෞඛ්‍ය අධ්‍යාපන පුහුණුව ලබාදීම හා දේශීය සෞඛ්‍ය අධ්‍යාපන භාණ්ඩ නිෂ්පාදනයෙහි ලා ඉමහත් සේ ප්‍රයෝජනවත් විය.

5. කරන ලද වැඩ

(අ) ප්‍රජා සංවිධාන ක්‍රමය යටතේ කෙරෙන මහජන සෞඛ්‍ය කටයුතු හා ප්‍රජා සංවර්ධන කටයුතු මහජනයා සමග උරෙනුර ගැටී කළ යුතු වැඩ කොටසක් වශයෙන් දැන් පිළිගෙන ඇති හෙයින් තම තමන්ගේ ප්‍රජා ප්‍රශ්න විසඳා ගැනීම සඳහා අවශ්‍ය වන මගපෙන්වීම හා උපදෙස් මහජනයාට ලබා දෙන ලදි.

මාතර ප්‍රදේශයේ දී නගරය තුළ බෝවන බරවා මදුරුවන් විනාශ කිරීම සඳහා රාහුල විද්‍යාලයට අයත් සමාජ සේවා පෙරමුණ මාර්ගයෙන් ශ්‍රමදාන වැඩ කඳවුරක් සංවිධාන කරන ලදි. මෙම ව්‍යාපාරය සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් 500 ක් පමණද ස්වේච්ඡා සේවක ගුරුවරුන්ද සහභාගි වූහ. පාරිසරික සෞඛ්‍ය සංවර්ධන ශ්‍රමදාන කඳවුරු බතිගම, දික්වැල්ල, අතුරලිය, හා මිරිස්ස යන ස්ථානවල ද සංවිධාන කරන ලදි.

මෙම වැඩ කඳවුර මගින් කරන ලද ප්‍රධාන කාර්යයන් වූයේ වැසිකිළි වළවල් කැපීම, නිවෙස් අසළ වල්බිහිවී ඇති ස්ථාන පවිත්‍ර කිරීම, පාරවල් සකස් කිරීම හා වෙනත් ප්‍රජා පහසුකම් සැලසීමයි.

කළුතර ප්‍රදේශය තුළ ප්‍රජා සංවර්ධන යෝජනා රාශියක් අරඹන ලදි. මෙහිදී ආදර්ශ මධ්‍යස්ථානයට ඇති කුඹල්ගම, ප්‍රජා සංවර්ධන නියමු යෝජනා ක්‍රම ගැන විශේෂයෙන් සඳහන් කළ යුතුය. කුරුණෑගල ප්‍රදේශය තුළ නියමු යෝජනා ක්‍රම රාශියක් සංවිධානය කරන ලදි. මෙම යෝජනා ක්‍රම වලදී සිදුවූ විශේෂ මෙහෙය නම්, අසල් වැසි ගම්වල සිටින ග්‍රාම නායකයන්ට ද ප්‍රජා සෞඛ්‍ය සංවර්ධන ක්‍රම පිළිබඳ පුහුණුවක් ලබා දීමය. වදුරුස්සේ පිහිටි ජාතික සේවා නියමු යෝජනා ක්‍රමය යටතේ ද සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහනක් මෙහෙයවන ලදි.

මඩකලපුව ප්‍රදේශයේ දී මූලික පියවරක් වශයෙන් සමන්තුරේ හා පොතුවිල් යන ආදායම් පාලක නිලධාරිවරුන්ගේ පුරෝගාමිත්වය ඇතිව සංවිධානය වූ ප්‍රජා සංවර්ධන යෝජනා ක්‍රමයන් යටතේ ග්‍රාම නායකයන්ට ඉතා පුළුල් අන්දමේ පුහුණුවක් ලබා දෙන ලදි. පාරිසරික සෞඛ්‍ය යටතේ සංවිධානය කළ ඒකක ක්‍රමය සාර්ථක කර ගැනීම සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් 22කුට ආධාර කරන ලදි. පොතුවිල් හා වාලේච්චේන යන ගම්වල ප්‍රජා සංවර්ධන ආදර්ශ නියමු යෝජනා ක්‍රම දෙකක් ඇරඹිණ.

කොළඹ ප්‍රදේශයේ දී ක්ෂේත්‍රයෙහි සිටින නිලධාරීන් විසින් වෙනත් දෙපාර්තමේන්තු වලට අයත් නිලධාරීන් සමග එකමුතුව කටයුතු කරනු දැක්ම සඳහා සෑම උත්සාහයක් දරන ලදි. වර්ෂය තුළ දී හොරපේ ප්‍රජා සංවිධාන ක්‍රමය හා අත්තනගල්ලේ ප්‍රජා සුභසාධක යෝජනා ක්‍රමය මෙහෙයවන ලදි. දළුගම පිහිටි ග්‍රාම සංවර්ධන ආධුනික යෝ කොච්චිකඩේ දී සංවිධානය කරන ලද ශ්‍රමදාන වැඩ කඳවුරට සහභාගි වූහ.

කෑගල්ල ප්‍රදේශයේ නොයෙක් තරාතිරම්වලට අයත් මහජන සෞඛ්‍ය සේවකයන්ට ප්‍රජා සංවර්ධන වැඩ කටයුතු පිළිබඳ අවබෝධයක් ලබා දෙන ලදි. පාරිසරික සෞඛ්‍ය වැඩ සටහන් අවසාන වූ පසු ඒ කටයුතු ප්‍රදර්ශනය කිරීම සඳහා ක්ෂේත්‍ර දින සංවිධානය කරන ලදි. කටුගහ, ලැසියගේන, ඉහළ තල්දූව, ගොඩිගමුව, ඇඳුරාපොත හා ගල්බොක්ක යන ස්ථානවල දී සංවිධානය කළ එම වැඩ සටහන් ඉතා සාර්ථක විය.

මාතලේ ප්‍රදේශයේ දී පොළොන්නරුව සෞඛ්‍ය කොට්ඨාශයට අයත් ග්‍රාම නායකයන් සඳහා දෛනික නේවාසික සාකච්ඡා සම්මේලනයක් පවත්වන ලදි. හිඟුරක්ගොඩ මූලික අධ්‍යාපන යෝජනා ක්‍රමයේ දී පැවැත්වුන මෙම සාකච්ඡා සම්මේලනයේ දී ඒකක ක්‍රමය යටතේ කෙරෙන ප්‍රජා සංවර්ධන කටයුතුවල දී පැන නගින ප්‍රශ්න පිළිබඳ සාකච්ඡා කරන ලදි. මාතලේ, දඹුල්ල හා රත්තොට යන ප්‍රදේශවල ද දිනක දී පැවැත්වුණ එවැනිම සාකච්ඡා සම්මේලන සංවිධානය කරන ලදි.

යාපනය ප්‍රදේශයේ දී ඒකක ක්‍රමය යටතේ සෞඛ්‍ය අධ්‍යාපන කටයුතු කරන ලදි. මෙහිදී ප්‍රජා සංවිධානවලට විශේෂ තැනක් දෙනු ලැබිය. කුලමන්ගල් ගුරුදෙගුරු සමිතිය විසින් සංවිධානය කරන ලද තෙල්ලිපලේ හා කුලමන්ගල් පාරිසරික සෞඛ්‍ය යෝජනා ක්‍රමයන් යාපනයේ සී. ඇන්. ඒ. පී. ටී. ශාඛාව විසින් සංවිධානය කළ කොකු විල්හි ක්ෂය රෝග මර්දන ව්‍යාපාරයන් මීට අයත් වේ.

අනුරාධපුර ප්‍රදේශයේ දී ග්‍රාම සංවර්ධන, ගෘහ කර්මාන්ත, කෘෂිකර්ම, අධ්‍යාපන හා වාරිමාර්ග යන දෙපාර්තමේන්තුවල සහාය ඇතිව ඒකාබද්ධ ප්‍රජා සංවර්ධන යෝජනා ක්‍රමයක් ඇරඹින. මෙම යෝජනා ක්‍රමය සාර්ථක වූයේ උක්ත දෙපාර්තමේන්තුවලට අයත් නිලධාරීන් ගෙන් ලැබුණ සහයෝගය නිසාය. මෙම යෝජනා ක්‍රමය යටතේ කරන ලද ප්‍රධාන කාර්යයන් වූයේ ඉඩම් නොමැත්තන්ට ඉඩම් ලබාදීම, ගෙවතු පිළි යෙල කිරීම, කෘෂිකාර්මික ක්‍රම වැඩි දියුණු කිරීම, මාර්ග, කුඩා වැව් හා වාරිමාර්ග තැනීම හා ප්‍රතිසංස්කරණය කිරීම, ප්‍රජා මණ්ඩල සකස් කිරීම හා පුස්තකාල හා විශ්‍රාම පහසු කම් සැලසීමත්ය. ග්‍රාම සංවර්ධන සමිති මගින් සංවිධානය කරන ලද කාරියන්කුලම, කහපත්විලගම, බණ්ඩාරපුලියන්කුලම, කම්මල්කුලම, උකුලන්කුලම, එළියවිදුල්වැව, යන්තරිගම, නවදැවැව, නොච්චිකුලම, යන නියමු යෝජනා ක්‍රමත් මහිලා සමිතියේ පුරෝගාමිත්වය පිට සංවිධානය කළ තඹුත්තේගම යෝජනා ක්‍රමයත් කාන්තා සමිති මගින් සංවිධානය කරන ලද කරච්චිකුලම් යෝජනා ක්‍රමයත් විශේෂයෙන් සඳහන් කළ යුතුය.

ප්‍රජා සංවර්ධන කටයුතුවලින් වැඩි කොටසක් නිම කරන ලද්දේ ශ්‍රමදාන වැඩ කදවුරු ක්‍රමයෙනි. මෙම ක්‍රමය යටතේ සංවිධාන කරන ලද වැදගත් කටයුත්තක් නම් පොසොන් උත්සව සමයේ දී අනුරාධපුර ශුද්ධ නගරය පිරිසිදු කිරීමේ ව්‍යාපාරයක් පැවැත්වීමයි.

වවුනියා ප්‍රදේශයේ කරන ලද වැදගත් කාරියක් නම්, ග්‍රාම නායකයන් පුහුණු කිරීමය. තෙදිනක් තුළ පැවති මෙම නේවාසික සාකච්ඡා සම්මේලනයට වවුනියා දිස්ත්‍රික්කයේ තිබෙන සියලුම ග්‍රාම සංවර්ධන සමිතිවලින් සාමාජිකයන් දෙදෙනා බැගින් සහභාගි වූහ. පාරිසරික සෞඛ්‍ය යටතේ කෙරෙන ඒකක ක්‍රමය සාර්ථක කර ගැනීම සඳහා එය විපුල ප්‍රයෝජනවත් විය. ප්‍රජා සංවර්ධනය යටතේ මෙම කොටි ඝාශයේදී කරන ලද නවතම කාර්ය නම්, සියලුම ස්වේච්ඡා සංවිධානවලට අයත් සාමාජිකයින්ගෙන් සමන්විත සෞඛ්‍ය සංවර්ධන සභා පිහිටුවීමය.

පුත්තලම් ප්‍රදේශයේ දී ප්‍රජා සංවර්ධන කටයුතු ඇරඹුයේ, ග්‍රාම නායකයන් පුහුණු කර ගැනීමෙන් පසුව ය. මාදම්පේ පිහිටි ග්‍රාම සංවර්ධන මධ්‍යස්ථානයේ දී ස්වේච්ඡා ග්‍රාම නායකයන් පුහුණු කිරීමට සහාය විය.

ප්‍රජා සංවිධාන කටයුතු කෙරෙහි ඉමහත් උනන්දුවක් දක්නට ඇති බැවින්, අනාගත සංවර්ධනයේ දී ප්‍රජා සංවර්ධන මාර්ගයන් කෙරෙහි විශ්වාසය තැබිය හැකි බැව් පෙනේ.

(ආ) වෛද්‍යායතනවල සෞඛ්‍ය අධ්‍යාපනය

ග්‍රාමීය රෝහල් හා මාතෘ නිවාස බොහොමයක සෞඛ්‍ය අධ්‍යාපන කටයුතු ක්‍රමානුකූලව පවත්වා ගෙන යන ලදි. පළමුවෙන් ආයතනවල සේවය කරන වින්නඹු සේවිකාවන්ට සෞඛ්‍ය අධ්‍යාපනය පිළිබඳ පුහුණුවක් දීමෙන් පසු මාතෘ හා ළමා සෞඛ්‍යය, පෝෂණය, ළමයින්ට වැළඳෙන බෝවන රෝග යන විශේෂ ප්‍රශ්න අලලා කෙරෙන වැඩ සටහන් ද බිළිඳුන් නෑවීම හා ඔවුන්ට ආහාර දීම, ළමයින්ගේ ඇදුම් පිළියෙල කර ගැනීම, මලපහ කිරීමට පුරුදු කිරීම වැනි කටයුතු ප්‍රදර්ශනය කර පෙන්වීම කරන ලදි.

මහජන සෞඛ්‍ය නිලධාරී මණ්ඩලය විසින් ළය චිකිත්සාගාර 11 ක දීත් ළය රෝහල් 6 ක දීත් සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදි. මෙම වැඩ සටහන් වලට ප්‍රධාන වශයෙන් ඇතුළු කරන ලද්දේ රෝග මර්දනය හා වැළැක්වීමත් ප්‍රතිකාර ගැනීමට නියම කර එය නොකඩවා ප්‍රතිකාර ලබා ගැනීමේ ඇති වැදගත් කමත් අලලා කෙරෙන කණ්ඩායම් සාකච්ඡා, ප්‍රදර්ශන හා දේශනා යනාදිය පැවැත්වීමය.

කුරුණෑගල දී ළමා වාට්ටුවක සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහනක් ක්‍රියාත්මක කරන ලදි. සෙසු ප්‍රදේශවල මුළුතැන් ගෙවල පවිත්‍ර තාවය පිළිබඳ පන්ති පවත්වන ලදි. මේ සම්බන්ධයෙන් විශාල දියුණුවක් මඩකලපු ප්‍රදේශයේ දක්නට ලැබුණි. එම ප්‍රදේශයට අයත් රෝහල්වල කණිෂ්ඨ සේවකයින්ට පෞද්ගලික ස්වස්ථතාවය, බෝවන රෝග මර්දනය හා සනීපාරක්ෂාව පිළිබඳ අධ්‍යාපනයක් දීම සඳහා තොරතුරු සැපයීමේ මධ්‍යස්ථාන පිහිටුවීමට විධිවිධාන යොදන ලදි.

වර්ෂයේ අවසාන භාගයේ දී මාතර රෝහලේ දී ඉතා ප්‍රබල අන්දමේ සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහනක් ක්‍රියාත්මක කරන ලදි. එම වැඩ සටහන සාර්ථක ලෙස කරගෙන යාම සඳහා අවශ්‍ය ආයතනික සේවක සේවිකාවන් පුහුණු කිරීමේ කාර්ය්‍යය මහජන සෞඛ්‍ය හෙදියන් විසින් බාර ගන්නා ලදි.

රිජ්වේ ආර්යා ළමා රෝහලේ සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන සඳහා සියලු විධිවිධාන යොදා ඇත. මෙම කටයුතු ලබන වර්ෂයේ දී ඇරඹෙනු ඇත. දිවයිනේ පිහිටි සියලුම ප්‍රාදේශීය රෝහල්වල සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහනක් ඇරඹීම සඳහා ද අවශ්‍ය සැලසුම් නිම කර ඇත.

(ඇ) පාඨශාලා සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන්

පාඨශාලාවල සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් පවත්වා ගෙන යාම සඳහා ගුරු වරුන්ට දිය යුතු උපදෙස් හා සහාය සෞඛ්‍ය අධ්‍යාපන ක්ෂේත්‍ර නිලධාරීන් විසින් දෙන ලදී. පාඨශාලා සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමෙහිලා ගුරුවරයා සතු වගකීම පිළිබඳ අවබෝධයක් ඔවුන්ට ලබාදීම වැදගත් කාර්‍යයකි. පාඨශාලා සෞඛ්‍ය ප්‍රශ්න පිළිබඳ ගුරුවරුන්ට අවබෝධයක් ලබා දී ඒ ප්‍රශ්න ප්‍රජා සංවිධානවල ආධාර යෙන් විසඳා ගත හැකි අයුරු පෙන්වා දීම සඳහා සෞඛ්‍ය ප්‍රදේශ රාශියකම සාකච්ඡා සම්මේලන පවත්වන ලදී. මඩකලපු දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය හා අධ්‍යාපන දෙපාර්ත මේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලවල නිලධාරීන්ගේ සහයෝගය ඇතිව ගුරුවරුන්ගේ ප්‍රයෝජනය සඳහා මාර්තු මාසයේ දී ප්‍රජා සෞඛ්‍ය අධ්‍යාපන සාකච්ඡා සම්මේලනයක් පවත්වන ලදී.

බදුල්ල ප්‍රදේශයේ දී පවත්වන ලද පාඨශාලා සෞඛ්‍ය සාකච්ඡා සම්මේලනයට ද ප්‍රාදේශීය පාඨශාලා සෞඛ්‍ය කමිටුවේ පුරෝගාමිත්වය ලැබිණ. පාඨශාලා නිහක ප්‍රධානාචාර්‍යවරු හා වෙනත් නියෝජිතයෝ මෙම සාකච්ඡා සම්මේලනයට සහභාගි වූහ.

(ඈ) ජාතික ඒකාබද්ධ පාඨශාලා සෞඛ්‍ය සභාව

ජාතික ඒකාබද්ධ පාඨශාලා සෞඛ්‍ය සභාව තවදුරටත් බලවත් වීමෙන් දෙපාර්ත මේන්තු දෙකටම අයත් වැදගත් කටයුතු ආරම්භ කිරීමේ හැකියාවක් ලත් ඒකාබද්ධ ජාතික බලවේගයක් බවට පත් කැරිණ.

සභාවේ රැස්වීම් මාස් පතා පැවැත්විණ. මේ සභාව මගින් කළ ප්‍රධාන වැඩ කටයුතු අතර ප්‍රදේශ හා දිශාබද්ධ පාඨශාලා සෞඛ්‍ය කමිටු පිහිටුවීමය. (මෙම කමිටු දිවයින පුරා පැතිර සිටි) පාඨශාලා දන්ත චිකිත්සාගාර සංවිධානය කිරීම, පාඨශාලා වෛද්‍ය වාර්තා ප්‍රතිශෝධනය කිරීම, පාඨශාලා සෞඛ්‍ය සේවය සඳහා අත්පොතක් පිළියෙල කිරීම, පාඨශාලා ගුරුවරුන් ගේ ඇක්ස් කිරණ ඡායාරූප ගැනීමට පිළියෙල කිරීම, පාඨශාලා දිවාභෝජන වැඩසටහන වැඩි දියුණු කිරීම, පාඨශාලාවල සනීපාරක්ෂාව දියුණු කිරීමට

විධිවිධාන යෙදීම, පාඨශාලාවල දී පැතිරයන බෝවන රෝග වැළැක්වීමට කටයුතු කිරීම, පාඨශාලා සෞඛ්‍ය තරඟ හා දන්ත සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන් පිළියෙල කිරීම යනාදිය මේ සභාව මගින් ඉටු කරන ලද වැදගත් මෙහෙවරයන්ය.

(ඉ) ගුරු ඇබැසි විදුහල්වල සෞඛ්‍ය අධ්‍යාපනය

සෑම ගුරු විද්‍යාලයකම සෞඛ්‍ය අධ්‍යාපන කටයුතු ක්‍රමානුකූලව කෙරින.

රත්මලානේ පිහිටි භික්ෂු අභ්‍යාස මධ්‍යස්ථානයේ දී විශේෂ සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහනක් ක්‍රියාත්මක විය. මෙම ආයතනය භික්ෂූන් වහන්සේලා පුහුණු කරන ප්‍රධාන පෙළේ අභ්‍යාස මධ්‍යස්ථානයකි. මෙහි පුහුණුව ලබන භික්ෂූන් වහන්සේ විසින් පසුව පිරිවෙන්වල වගකිවයුතු ස්ථාන උසුලනු ලැබේ. භික්ෂූන්වහන්සේලා සහභාගිවන ප්‍රජා සංවර්ධන වැඩ සටහන්වලදී මේ පුහුණුව මහෝපකාරීවනු ඇත.

(ඊ) ජාතික සේවා ව්‍යාපාරය

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ අළුතින් පිහිටුවන ලද ජාතික සේවා ව්‍යාපාරයට මෙම දෙපාර්තමේන්තුව ආධාර කරන ලදි. මේ වැඩ සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයකු හා ඇපෝතිකරිවරයකු මුදා හරින ලද අතර අපේ සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරිවරයාගේ සේවය අඩකාලීන වශයෙන් අඛණ්ඩව ලැබිණ. පැලවත්ත, නෙළුව, කළුබෝපිටිය හා වදුරුස්ස යන නියමු යෝජනා ක්‍රමවල පැවැත්වූ සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන්වලට මෙම දෙපාර්තමේන්තුවේ සහයෝගය හා උනන්දුව නොඅඩුව පිරී නමන ලදි.

(උ) වතුවල සෞඛ්‍ය අධ්‍යාපනය

බදුල්ල, රත්නපුරය, මාතලේ, මහනුවර, කළුතර හා ගාල්ල යන වැවිලිකර දිස්ත්‍රික්කවල සෞඛ්‍ය අධ්‍යාපන යෝජනාක්‍රම රැසක් සංවිධානය කෙරින.

බදුල්ලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි වරයාගේ කොටසට අයත් වතු දහහතරක සේවය කරන වතු ඇපෝතිකරිවරුන් හා දිස්පැන්සර්වරුන් සඳහා සෞඛ්‍ය අධ්‍යාපන අභ්‍යාස පාඨ මාර්ගයක් මේ වර්ෂයේ මුල් භාගයේ දී ඇරඹිණ. මෙම වැඩසටහනට පාරිසරික සෞඛ්‍යය, මාතෘ හා ළමා සෞඛ්‍යය, ක්ෂය රෝග මර්දනය හා සෞඛ්‍ය අධ්‍යාපනය යන විෂයයන් ඇතුළු කරන ලදි. වැඩ සටහනට කණ්ඩායම් සාකච්ඡා, දේශනා, ප්‍රදර්ශන හා චිත්‍ර පට ප්‍රදර්ශන ද ඇතුළත් විය. මෙවැනි වැඩසටහන් බදුල්ල ප්‍රදේශයේ සෙසු කොට්ඨාශවල ද පැවැත්විනි.

මෙම වැඩසටහනේ ප්‍රතිඵලයක් වශයෙන් මේ ප්‍රදේශයේ වතුවල ද සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් ඇරඹීමට පහසුවිය. සීමාසහිත නමුණුකුල තේවතු සමාගමේ කන්න වැරැල්ල වත්තේත් පස්සර පිහිටි පස්සර වතුයායේත් විශේෂ සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් පවත්වන ලදි.

කුරුණෑගල හා පුත්තලම යන සෞඛ්‍ය කොට්ඨාශවල පිහිටි පොල් කපන මෝල්වල ද සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක විය. මේ සම්බන්ධයෙන් පොල් මෝල් හිමියන්ගෙන් ලැබුණු සහයෝගය ආදර්ශවත් වූ අතර එම වැඩසටහන් සාර්ථක වූයේ ඔවුන්ගෙන් ලැබුණු සහයෝගය නිසා බැව් සඳහන් කළ යුතු ය.

වැවිලිකරු සංගමයට අයත් වෛද්‍ය නිලධාරීන් විසින් තම පාලනය යටතේ පවත්නා වතුවල දී කරන ලද සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් සාර්ථක කර ගැනීමෙහි ලා දෙන ලද සහයෝගය දිරිගන්වන සුළුවන අතර මෙහි දී සඳහන් කළ යුතු ය.

(ඌ) පෝලියෝ අධ්‍යාපන වැඩසටහන

පෝලියෝ වසංගතය පැතිර ගිය සමයේ දී සෞඛ්‍ය අධ්‍යාපන අංශය මගින් සෞඛ්‍ය අධ්‍යාපනමය වූත්, ප්‍රචාරකමය වූත් මහා ව්‍යාපාරයක් පවත්වන ලදි. මේ සඳහා ගුවන් විදුලිය, පුවත්පත් හා චිත්‍රපට යනාදිය ඇතුව සෑම සමූහ අධ්‍යාපන මාධ්‍යයක්ම

උපයෝගී කරගනු ලැබිය. කොළඹ, කළුතර, ගාල්ල, මහනුවර හා යාපනය යන සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කොට්ඨාශ වල දී පෝලියෝ රෝගය පිළිබඳ අධ්‍යාපන වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලද අතර විශේෂ සෞඛ්‍ය අධ්‍යාපන භාණ්ඩ, පත්‍රිකා හා පෝස්ටර් පිළියෙල කරන ලදි.

(එ) ගෙදර දොරේ අනතුරු වැළැක්වීම

ගෙදරදොරේ දී සිදුවන අනතුරු වැළැක්වීම සඳහා වැඩසටහනක් පිළියෙල කිරීමට දෙපාර්තමේන්තුව උනන්දුවිය. ගෙදර දොරේ දී සිදුවන අනතුරු ගැන නිවේදනය කිරීම අවශ්‍යතාවයක් බවට පත් කළ අතර එය පාරිසරික සෞඛ්‍ය කටයුත්තක් ලෙස පිළිගන්නා ලදි.

මේ යටතේ කළ වැදගත් කටයුත්තක් ලෙස සඳහන් කළ හැක්කේ ආරක්ෂා සහිත ලාම්පුවක් පිළියෙල කිරීමේ පියවර ගැනීමයි. අමාත්‍යාංශයේ විශේෂ කමිටුව මගින් කලින් අනුමත කරන ලද ලාම්පුව නිෂ්පාදනය කිරීම සඳහා ග්‍රාම සංවර්ධනය හා ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුව වෙත පවරන ලදි. පළමුවෙන් මෙම ලාම්පු 60,000ක් නිෂ්පාදනය කර විවිධ සේවා සමුපකාර සමිති මගින් බෙදාහැරීමට අදහස් කරන ලදි. එහෙත් දෙපාර්තමේන්තුව මගින් වර්ෂය තුළදී නිෂ්පාදනය කරන ලද්දේ ලාම්පු 10,000කි. ලාම්පුවලින් 5,000ක් ප්‍රදර්ශන කටයුතු සඳහා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් මිළයට ගන්නා ලදි. මෙම ලාම්පුවලින් සැහෙන සංඛ්‍යාවක් නියමු යෝජනා ක්‍රම සඳහා ප්‍රයෝජනයට ගනු ලැබූ නමුත් ආරක්ෂක ලාම්පුවක් වශයෙන් ගෙවල් දී භාවිතයට ගැනීමට තරම් සුදුසු තත්ත්වයකින් නොමැති බැව් පිළිගෙන ඇත. විශාල වශයෙන් නිෂ්පාදනය කිරීම සඳහා වෙනත් ආරක්ෂක ලාම්පුවක් සකස් කිරීම සඳහා විධි විධාන ගෙන ඇත. මේ ආදර්ශය මුදුන් පමුණුවා ගැනීමේ අභිලාෂයෙන් ග්‍රාම සංවර්ධන හා ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුව, පරිවාස හා ළමා සංරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, ජාතික සේවා අංශය, ලංකා ෂෙල් සමාගම, ලංකා රතුකුරුස සංගමය, කොළඹ වෙළෙඳ සංගමය, කණිෂ්ඨ වෙළෙඳ සංගමය, අනතුරු වැළැක්වීමේ ලංකා සංගමය, ලංකා විද්‍යාත්මක හා කර්මාන්ත පර්යේෂණායතනය යන සංස්ථාවල නියෝජිතයින් ගෙන් සමන්විත කමිටුවක් පත් කරන්නට යෙදුනි.

(ඒ) 1962 සෞඛ්‍ය සති උත්සවය

සෞඛ්‍ය සතිය සම්පූර්ණයෙන් ම මහජන සංවිධානයක් බැවින් සමස්ත ලංකා සෞඛ්‍ය සතිය යන්න මහජන සෞඛ්‍ය සතිය යනුවෙන් නම් කරන ලදි. මෙම උත්සවය "පවුලේ සෞඛ්‍ය සුභ සාධනය" යන මාතෘකා පාඨය යටතේ සංවිධානය කරන ලද මෙම සතිය ජූනි, 4 දා සිට 10 දා දක්වා කාලය තුළ දිවයින පුරා පැවැත්විණ. පිරිසිදු කිරීමේ ව්‍යාපාරය, පාරිසරික සෞඛ්‍ය, පෝෂණය, ගෙදොර දොරේ අනතුරු හා ක්ෂය රෝගය වැළැක්වීම යන විෂයයන් සතියේ ඒ ඒ දිනවල මාතෘකා විය. ලෝක සෞඛ්‍ය දිනයේ මාතෘකා පාඨය වූ "අන්ධ භාවය වැළැක්වීම" ජූනි මස 7 වැනි දින කටයුතු සඳහා යොදා ගනු ලැබීය.

සෞඛ්‍ය සතිය සඳහා විශේෂ පෝස්ටර්, පත්‍රිකා, වෙනත් සෞඛ්‍ය අධ්‍යාපන භාණ්ඩ නිෂ්පාදනය කළ අතර, ගුවන් විදුලි වැඩසටහන්, පුවත්පත් අතිරේක මහජන රැස්වීම් හා සංදර්ශනද පවත්වන ලදි. මයිකල් ගුණරත්න පලිහ තරහයෙන් 1961 වර්ෂය සඳහා වූ හොඳම සෞඛ්‍ය සති උත්සවය පැවැත්වූ කෝට්ටේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශයට අයත් සෞඛ්‍ය සති උත්සව කමිටුව විසින් ජයග්‍රහනය කරන ලදි. නාවලපිටියේ සෞඛ්‍ය සති උත්සව කමිටුවට හා මාතලේ සෞඛ්‍ය සති උත්සව කමිටු වලට දෙවැනි හා තුන්වැනි තැන් ලැබින. 1962 වර්ෂයේ දී පැවැත්වූ සෞඛ්‍ය සති උත්සවයේ දී ජයග්‍රහක කමිටුවට අභියෝග පලිහ ප්‍රදානය පලිහ ප්‍රදානය කරන ලදී.

(ඔ) ස්වේච්ඡා සංවිධානවල සෞඛ්‍ය අධ්‍යාපනය

(I) ලංකා පවුල් සංවිධාන සංගමය

අවශ්‍ය වූ පෝස්ටර්, පත්‍රිකා හා වෙනත් සෞඛ්‍ය අධ්‍යාපන භාණ්ඩ සපයා දීමෙන් සෞඛ්‍ය අධ්‍යාපන අංශය දිගින් දිගටම සහාය විය.

දරුවෙකු ලැබීමේ කාලසීමාව සකස් කිරීම පිළිබඳ ප්‍රායෝගික කරුණු අලලා භාෂා තුනෙන්ම පිළියෙල කළ විශේෂ පත්‍රිකාවක් රජයේ මුද්‍රණාලය මගින් මුද්‍රණය කරවා සංගමයට දෙන ලදි. කොළඹ හා තදාසන්න ප්‍රදේශවල පවත්වන ලද පවුල් සංවිධාන රැස්වීම්, සාකච්ඡා සම්මේලන වලදී චිත්‍රපට ප්‍රදර්ශනය කිරීම සඳහා සෞඛ්‍ය අධ්‍යාපන අංශය ආධාරවිය.

(II) ලංකා අමද්‍යප සමිතිය

1961 නොවැම්බර් මස 19 වැනිදා සිට 25 දා දක්වා පැවැත්වූ ලංකා අමද්‍යප සමිතියේ ලංකා අමද්‍ය සතිය සැලසුම් කිරීමට හා සංවිධානය කිරීමට ආධාර විය. මද්‍යපානයෙන් වැළකීම සඳහා පිළියෙල කළ පත්‍රිකාවක් භාෂා තුනෙන්ම මුද්‍රණය කොට ග්‍රාම සංවර්ධන සමිති, හා මහිලා සමිති අතරත් දිවයිනේ පිහිටි සියලුම පාසල් අතරත්, බෙදා හරින ලදි. මෙම ව්‍යාපාරයේ දී දෙපාර්තමේන්තුව මගින් කරන ලද්දේ බීමත් කමේ විපාකය හා නා නා මාදිලියේ විෂ මත්පැන් පානය නිසා විය හැකි අයහපත පිළිබඳ අධ්‍යාපනයක් දීම ය.

මෙම සතිය තුළ දී මහජන රැස්වීම්, චිත්‍රපට ප්‍රදර්ශන හා කණ්ඩායම් සාකච්ඡා සංවිධානය කරන ලදි.

(III) ලංකා පිළිකා සංගමය

1961 ලංකා පිළිකා සතිය නිමිත්තෙන් "පිළිකා රෝගයේ අනතුරු සංඥා හත" නමැති පෝස්ටරය සහ "පිළිකා රෝගය පිළිබඳ ඔබ දැන සිටියෙහි ද" යන පත්‍රිකාව පිළියෙල කරන ලදි.

(IV) සමාජ සේවා ආයතනය

විශේෂයෙන් සමාජ සේවා ආයතනයේ ප්‍රහුණු කිරීමේ වැඩ සටහන්වලට සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ආධාර කරන ලද දෙපාර්තමේන්තුවට අයත් නිලධාරීන් සංඛ්‍යාවක් මෙම ආයතනයේ බාහිර කථිකාචාර්යවරුන් ලෙස කටයුතු කරති.

(V) සෞඛ්‍ය දාන ව්‍යාපාරය

වෛද්‍යාරක්ෂාව සැලසීමේ ජාතික ව්‍යාපාරයක් බවට පත්වූ ස්වේච්ඡා සෞඛ්‍ය දාන ව්‍යාපාරයට අයත් වෛද්‍යාධාර දීමේ කටයුතුවලට සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් ඖෂධ වර්ග හා ගමනා ගමන පහසුකම් වැනි නොයෙකුත් විධියේ ආධාර දෙන ලදි. මෙම ව්‍යාපාරයට පළමුවරට රජය මගින් රුපියල් 10,000ක ආධාර මුදල් ද පරිත්‍යාග කරන ලදි.

(VI) වෙනත් ස්වේච්ඡා සංවිධාන

ලංකා රතුකුරුස සමිතිය, සාන්ත ජෝන් ගිලන්රථ හමුදාව, සමාජ සේවා පෙරමුණ, ලංකා ක්ෂය රෝග මර්දන සමිතිය හා මහිලා සමිතිය වැනි නොයෙකුත් ස්වේච්ඡා සංවිධාන වල අධ්‍යාපන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ද මෙම දෙපාර්තමේන්තුවේ සහාය ලැබිණ.

(ඕ) විශේෂ ව්‍යාපාර හා විශේෂ යෝජනා ක්‍රමවල සෞඛ්‍ය අධ්‍යාපනය

(I) ක්ෂය රෝග මර්දන ව්‍යාපාරය

වර්ෂය තුළ දී හොරණ රජයේ රෝහලේ, වැලිසර ළය රෝහලේ හා පුත්තලමේ ළය රෝහලේ සිටින නොයෙක් ශ්‍රේණිවලට අයත් සේවකයන්ට සෞඛ්‍ය අධ්‍යාපන පුහුණුවක් ලබා දෙන ලදි. වැලිසර රෝහලේ දී සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් 30ක කණ්ඩායමකට සේවා පුහුණුවක් ලබා දෙන ලදි. දළුගම පිහිටි ග්‍රාම සංවර්ධන අභ්‍යාස මධ්‍යස්ථානයේ දීත් බස් කොන්දොස්තරවරු 182 දෙනෙක් සඳහා ලංගම වේරහැර අභ්‍යාස මධ්‍යස්ථානයේ දීත්, කොළඹ ප්‍රදේශයේ ග්‍රාම නායකයන් පුහුණු කිරීමේ දීත් සෞඛ්‍ය අධ්‍යාපන කටයුතුවල යෙදුනි.

ඉතා වැදගත් කාර්යයක් වූයේ දිවයිනේ පිහිටි නා නා ගුරු අභ්‍යාස විද්‍යාලවල පුහුණු වූ ගුරුවරුන් සඳහා සෞඛ්‍ය අධ්‍යාපන පුහුණුවක් ලබා දීමයි.

දිවයිනේ පිහිටි ළය චිකිත්සාගාර 11කදීත් ළය රෝහල් 6කදීත් නිතිපතා සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන් පැවැත්විණ. මීට අමතර වශයෙන් බීසීජී හා ඇම්. ඇම්. ආර්. ඒ්කයන් සමග ප්‍රචාරක වැඩ කටයුතුවලට ද සහභාගි විය.

(II) මැලේරියා නාශක ව්‍යාපාරය

ව්‍යාපාරය යටතේ කරන ලද වැදගත් සෞඛ්‍ය අධ්‍යාපන කටයුතු වශයෙන් මැලේරියාව සමූළු නාශනය කෙරෙන සටන සඳහා අවශ්‍ය සිතියම්, සටහන් හා පත්‍රිකා පිළියෙල කිරීම සහ සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන් මෙහෙයවීමය.

(III) බරවා රෝග නාශක ව්‍යාපාරය

බරවා රෝගය මර්දනය කිරීමෙහි ලා මහජනයා සහභාගි වියයුතු ආකාරය කෙබඳු ද යන්න පෙන්වා දෙනු පිණිස පාසල්වල හා මහජනයා අතර සෞඛ්‍ය අධ්‍යාපන වැඩ කටයුතු මෙහෙයවනු ලැබිය. කෝට්ටේ, පැලියගොඩ, රත්මලාන, පානදුර හා අම්බලන්ගොඩ යන නගරවල ඇති බරවා රෝග මර්දන වැඩ සටහන් සඳහා විශේෂ සෞඛ්‍ය අධ්‍යාපන කටයුතුවල නිරතවිය. මාතර හා මීගමුව, යන ප්‍රදේශවල විශේෂ බරවා රෝග මර්දන ශ්‍රමදාන වැඩ කඳවුරු පවත්වන ලදි. ඉදිරි වර්ෂයේ දී වැලිගම නගරයේ දී කිරීමට ඇති එවැනිම වැඩ සටහනක් සඳහා සැලසුම් කරන ලදි.

(IV) සමාජ රෝග නාශක ව්‍යාපාරය

සමාජ රෝග නාශක ව්‍යාපාරයේ සේවයේ යෙදී සිටින වෛද්‍ය නිලධාරීන්, මහජන සෞඛ්‍ය පරීක්ෂකයින්, මහජන සෞඛ්‍ය හෙදියන්, වෛද්‍ය රසායනාගාර කාර්මිකයන් හා වෙනත් ශ්‍රේණිවලට අයත් නිලධාරීන් සඳහා සමාජ රෝග නාශනය පිළිබඳ සෞඛ්‍ය අධ්‍යාපන පුහුණුවක් ලබා දෙන ලදි.

ග්‍රාම සංවර්ධන අභ්‍යාස මධ්‍යස්ථාන, ගොවිකම් පාසැල්, සමුපකාර පාසල්, වතුපිටිවල බාලපරාධකරුවන් පුහුණු කිරීමේ පාසල, ලංගම පුහුණු කිරීමේ මධ්‍යස්ථානය, යුද්ධ හමුදා අභ්‍යාස මධ්‍යස්ථාන හා ගුරු විද්‍යාලය කීපයක ද අධ්‍යාපන වැඩ සටහන්වලට සමාජ රෝග මර්දනය හා වැළැක්වීම ද එකතු කරන ලදි.

ප්‍රධාන සමාජ රෝග චිකිත්සාගාරයේ හා පළාත් බද චිකිත්සාගාරවල දී ද සෞඛ්‍ය අධ්‍යාපන කටයුතු කරන ලදී. වරාය සංයුක්ත මණ්ඩලය, කොළඹ වරාය කොමිසම, කොළඹ නගර සභාව, ලංකා ගමන්නා ගමන මණ්ඩලය හා ස්වේච්ඡා සංවිධානවල ආධාර ඇතිව සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන් මෙහෙයවන ලදී.

(V) ලේ බැංකුවල සෞඛ්‍ය අධ්‍යාපනය

කොළඹ මහරෝහලට අයත් ලේ බැංකුව යටතේ කරන ලද වැදගත් ම සෞඛ්‍ය අධ්‍යාපන මෙහෙයුමකි, ලේ දන්දීමට මහජනයා උනන්දු කිරීම සඳහා ප්‍රචාරක කටයුතු මෙහෙයවීමය. ලේ බැංකු සේවය පිළිබඳ තොරතුරු සැපයෙන පත්‍රිකා කීපයක් බෙදා හැරීම සඳහා මුද්‍රණය කරන ලදි.

(VI) කුරුණෑගල පරිසර සෞඛ්‍ය යෝජනා ක්‍රමය

සෞඛ්‍ය ප්‍රශ්න ගැන මහජනයාට අවබෝධයක් ලබාදී ඒ ප්‍රශ්න විසඳා ගැනීම සඳහා මහජන සහයෝගය යෝජනා ක්‍රමයේ වැඩ කටයුතුවල දී ලබාගැනීමේ ප්‍රධාන අරමුණ ඇතිව ඉතා පුළුල් සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහනක් මෙහෙයවනු ලැබිය. ප්‍රජා-සංවිධාන ක්‍රමය අනුව යෝජනා ක්‍රමයට අයත් නිලධාරීන් සමග උරෙනුර ගැටී වැඩ කිරීමේ වගකීම මහජනයා වෙත පවරන ලදි.

(ක) සෞඛ්‍ය අධ්‍යාපන අංශය වැඩ සටහන්

(I) ග්‍රාම සේවකයින් පුහුණු කිරීම

අභ්‍යාස වැඩ සටහන්වල දී සම්බන්ධතා නිලධාරීන් වශයෙන් කටයුතු කළ සෞඛ්‍ය ශික්ෂකයින්ගේ ප්‍රයෝජනය සඳහා නිර්දේශ පත්‍ර හා උපදෙස් මාලාවක් ඇතුළු අංග සම්පූර්ණ අභ්‍යාස වැඩසටහනක් සෞඛ්‍ය අධ්‍යාපන අංශය මගින් පිළියෙළ කරන ලදී. ඔවුන්ගේ පුහුණුව ඇරඹෙන්නේ ලබන වර්ෂයේ දී ය.

(II) කළුතර සෞඛ්‍ය අධ්‍යාපන පුහුණුව

කළුතර දී කෙරෙන පුහුණු කිරීමේ වැඩසටහන්වලට සෞඛ්‍ය අධ්‍යාපන ද විෂයයක් වශයෙන් පිළිගන්නා ලදි. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයින්, මහජන සෞඛ්‍ය හෙදියන්, මහජන සෞඛ්‍ය වින්නඹු සේවිකාවන් සේවයට බඳවා ගැනීමට පළමුවෙන් දෙනු ලබන පුහුණුවත් වෛද්‍යවරුන්ගේ කණ්ඩායම්වලට, සෞඛ්‍ය කාර්යාලයාධිපතීන්ට හා මහ ජන සෞඛ්‍ය හෙදියන්ට, සේවයට ඇතුළුවීමෙන් පසු දෙනු ලබන පුහුණුවත් මේ ගණයට වැටේ. මේ සෑම පුහුණුවකදීම සෞඛ්‍ය අධ්‍යාපනය හා මූලික සමාජ විද්‍යාව පිළිබඳ පන්ති වාර සැහෙන ගණනක් පැවැත්වේ.

(III) හෙදි ඇබෑසි විදුහල්වල සෞඛ්‍ය අධ්‍යාපනය

දිවයිනේ පිහිටි හෙදි ඇබෑසි විදුහල්වල දී දෙනු ලබන මූලික අධ්‍යාපන වැඩ සටහන්වල නිර්දේශ පත්‍රවල සෞඛ්‍ය අධ්‍යාපනය ගැන වැඩි අවධානයක් යොමු විය. ආධාර හෙදියන් පුහුණු කිරීමේ වැඩ සටහන්වලට ද සෞඛ්‍ය අධ්‍යාපනය එකතු කරන ලදි. කොළඹ පශ්චාත් මූලික හෙදි ඇබෑසි විදුහලේ දී පැවැත්වුන ළමා රෝග පිළිබඳව දෙනු ලබන පශ්චාත් මූලික අභ්‍යාස වැඩ සටහනේ දී සෞඛ්‍ය අධ්‍යාපන විෂයෙහි ලා පුළුල් පාඨමාර්ගයක් නිර්දේශ කෙරින.

(IV) ග්‍රාම නායකයින් සඳහා ග්‍රාම සංවර්ධන අභ්‍යාස මධ්‍යස්ථානවලදී හා කෘෂිකර්ම පාසල්වල දී කෙරෙන සෞඛ්‍ය අධ්‍යාපනය

ප්‍රාදේශීය ග්‍රාම සංවර්ධන අභ්‍යාස මධ්‍යස්ථාන 10කදී ග්‍රාම සංවර්ධන කටයුතු සඳහා පුහුණු කරනු ලැබූ ග්‍රාම නායක නායිකාවන් සඳහා නිති පතා සෞඛ්‍ය අධ්‍යාපන පන්ති පවත්වන ලදි.

කෘෂිකර්ම පාඨශාලාවල පැවැත්වෙන කෘෂිකර්ම පාඨමාර්ගයන්හි දී ද මෙවැනිම සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන් සංවිධානය කර ක්‍රියාත්මක කරන ලදී.

(ග) සෞඛ්‍ය අධ්‍යාපන භාණ්ඩ

සියලුම සෞඛ්‍ය අධ්‍යාපන භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන සෞඛ්‍ය අධ්‍යාපන භාණ්ඩ නිෂ්පාදන අංශය දැන් වඩා ඉඩකඩ ඇති පරන ඇස් රෝහල් ගොඩනැගිල්ලේ පිහිටා ඇත. එහිදී කරන ලද වැදගත් කටයුතුවල සම්පිණ්ඩනයක් පහත පළවේ :—

(I) ප්‍රදර්ශන

නිෂ්පාදනාංශය පුත්තලම, මඩකලපුව, වව්නියාව, කෝට්ටේ හා මාතලේ පවත්වන ලද ප්‍රදර්ශනවලට සහභාගි විය. නිදහස් සමරු උත්සවය නිමිත්තෙන් අනුරාධපුරයේදී "ආහාරය හා සෞඛ්‍ය" යන විෂය යටතේ පවත්වන ලද ප්‍රදර්ශනයන් "පෝෂණය" යන මාතෘකාව යටතේ ලංකා විශ්ව විද්‍යාලයේ දී පවත්වන ලද ප්‍රදර්ශනයන් මෙම අංශය මගින් සංවිධානය කරන ලදී. නොවැම්බර මාසයේ මහනුවර දී පැවැත්වූ ලෝක සෞඛ්‍ය සංවිධානයේ හෙද පරිපාලනය මාතෘකා කොට පවත්වන ලද සම්මන්ත්‍රණ ශාලාව සැරසීමටත් තොරතුරු මධ්‍යස්ථානය පිහිටුවීමටත් මෙම ආයතනය සහභාගිවිය.

(II) ඡායාරූප අංශය

ප්‍රදර්ශන හා වෙනත් ප්‍රචාරක කටයුතු සඳහා අවශ්‍ය වූ ඡායාරූප හා "කටවුට්ස්" සියල්ලම නිෂ්පාදනය කරන ලද්දේ ඡායාරූප අංශය මගිනි. පෝලියෝ ව්‍යාපාරය සඳහා පිළියෙල කරන ලද ප්‍රචාරක ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම වැදගත් කාර්යෙකි. චිත්‍රපට ෆිනි විදකයන් 250ක් හා දිවසිනේ නොයෙකුත් සිනමාහල්වලදී පෙන්වීම සඳහා පරාවර්තන ෆිනිවිදකයන්ද පිළියෙල කරන ලදී. මිලිමීටර් 16 කෙටි චිත්‍රපට කීපයකුත් ජාතික සේවා ව්‍යාපාරය සඳහා මිලිමීටර් 16 චිත්‍ර පටයකුත් අත්හදා බැලීමක් වශයෙන් නිපදවන ලදී.

(III) සිනමා කාර්මිකයාගේ වැඩපළ

ක්ෂේත්‍රයේ පිහිටි ඒකකයන් සඳහාවූ ජනරේටර්, සිනමා උපකරන, මහජන ආමන්ත්‍රණ උපකරණ හා ටේප් රෙකෝඩර් යන ආදිය සියලුම උපකරණ ප්‍රතිශංස් කරනය කරන ලද්දේ මේ වැඩපලේදීය. මේ උපකරන පෞද්ගලික ව්‍යාපාර මගින් කරවා ගත්තෙහි නම් ඒ සඳහා රජයට විශාල මුදලක් වැය කිරීමට ඉඩ තිබුණි. වෂිය සඳහා වූ වියදම ලැබිස්තු දෙස බලන විට මෙම අංශයේ දී කරන ලද පිළියෙල කරගත් වැඩවලින් රජයට රුපියල් 15,003.90ක් ඉතිරිකර දී තිබේ.

(IV) මූර්ති හා චිත්‍රශිල්පිය වැඩ

විශේෂයෙන් ප්‍රදර්ශන භාණ්ඩ නිෂ්පාදනයේදී ඉවහල් වන චිත්‍ර හා මූර්ති ශිල්පිය අංශයේ වැඩ සතුටුදායක අන්දමින් පැවතින.

(V) චිත්‍රපට වැඩ සටහන

දීර්ඝ කාලීන පාවිච්චිය සඳහා එක්සත් ජනපද රජයේ ප්‍රවෘත්ති අංශය මගින් ඉල්ලා ගත් චිත්‍රපට 200ක් පමණ මෙම අංශයේ පාවිච්චිය සඳහා යොදවන ලදී. මීට අමතර වශයෙන් එක්සත් රාජධානියේ ප්‍රවෘත්ති සේවය හා කැනේඩියානු තානාපති කාර්යාලයෙන් චිත්‍රපට ලැබින.

චිත්‍රපටාලය තවදුරටත් වැඩිදියුණු කළ අතර, වටපණු උවදුර නමැති චිත්‍රපටයක් රජයේ චිත්‍රපටි අංශය ලවා පිළියෙල කරවා ගන්නා ලදී. මෙම චිත්‍රපටය මිලිමීටර් 16 ප්‍රමාණයට කුඩා කරවා ගැනීම සඳහා එක්සත් රාජධානිය වෙත යවන ලදී.

(VI) වඩු පට්ටලය

අවශ්‍ය ප්‍රදර්ශන භාණ්ඩ, කටවුට් හා සෙසු ප්‍රදර්ශක මෙවලම් නිෂ්පාදනය කිරීම වඩු වැඩ අංශයේ වගකීමකි. තවද විවෘත කිරීමේ උත්සව හා දෙපාර්තමේන්තුව හා සම්බන්ධ අනෙකුත් උත්සවවල කටයුතු ද වඩු අංශය මගින් කෙරින.

(ව) ප්‍රචාරක වැඩ

(I) ගුවන් විදුලි වැඩසටහන

දැනට මුහුණ දිය යුතුව ඇති සෞඛ්‍ය ප්‍රශ්න අළලා පිළියෙල කළ කථා, සාකච්ඡා හා චිත්‍රාංග ගුවන් ගත කරන ලදී. අවුරුද්දේ පළමු කාර්තුවේ දී විනාඩි 15ක් ගත්තාවූ වැඩසටහන් සති පතා පවත්වන ලදී. අවුරුද්දේ දෙවැනි කාර්තුවේ සිට වෙනත් අමාත්‍යාංශ වලින් ඉදිරිපත් කළ සංවර්ධන වැඩසටහන් සඳහා කාලය දීම්වස් මෙම වැඩසටහන් සති දෙකකට වරක් වනසේ පකා හරින ලදි.

නා නා චිකිත්සාගාර ගැනත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් සළසා ඇති වෛද්‍ය පහසුකම් ගැනත් තොරතුරු සපයා කරන ලද මෙම කථා මාලාව අසන්නන්ට ප්‍රයෝජනවත් වූ බැව් ඔප්පු විය. පෝලියෝව, ගෙදර දොරේ අනතුරු, ක්ෂය රෝගය, බරමා රෝගය හා මැලේරියාව යන විෂයයන් යටතේ ගුවන් විදුලි සාකච්ඡා පවත්වන ලදී. මෙම සාකච්ඡාවලදී ඒ ඒ විශේෂ ව්‍යාපාර මගින් කරනු ලබන වැඩ කටයුතුවලට ප්‍රසිද්ධියක් දෙනු ලැබිය. සෞඛ්‍ය වැඩසටහන් ප්‍රාණවත් කිරීම සඳහාත් අසන්නන් වැඩි සංඛ්‍යාවක් ආකර්ෂණය කරවා ගැනීමත් සඳහා "කිරි", "ජලය" හා "පලා' යන විෂයයන් යටතේ චිත්‍රාංගයන් ගුවන් ගත කෙරිණ.

පෝෂණය හා දැනට ඇති ආහාර ප්‍රශ්නය පිළිබඳ විශේෂඥයකු ලවා කථා මාලාවක් පවත්වන ලද අතර මේ කථා මාලාව පාඨකයන්ගේ ප්‍රයෝජනය තකා ගුවන් විදුලි සඟරාවේද පළ කරවිනි. විශේෂයෙන් වසංගත පැවති අවස්ථාවලත්, සෞඛ්‍ය සති උත්සවවලදීත් ලංකා ගුවන් විදුලි සේවය මගින් දෙන ලද නොමසුරු සහයෝගය මෙහිලා සඳහන් කළ යුතුය.

රජයේ සංවර්ධන කටයුතු අළලා පිළියෙල කරන ලද විශේෂ ගුවන් විදුලි වැඩ සටහන් සැප්තැම්බර් මාසයේ සිට ගුවන් ගත කැරිනි. සෑම අමාත්‍යාංශයකටම මෙවැනි ගුවන් විදුලි වැඩසටහන් දෙසතියකට වරක් පැවරිනි. සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පෝලියෝ රෝගය, මැලේරියාව, සෞඛ්‍ය අධ්‍යාපනය, පෝෂණය, සමාජ රෝග, පාරිසරික සෞඛ්‍ය හා පිළිකා රෝගය යන විෂයයන් යටතේ ලබා ඇති දියුණුව අළලා විශේෂ ගුවන් විදුලි වැඩ සටහන් කෙටුම්පත් කර දෙන ලදී.

(II) සැපත—ත්‍රෛමාසික ප්‍රකාශනය

වර්ෂය තුළදී ත්‍රෛමාසිකව නිකුත් කෙරෙන සැපත සිංහල සඟරාව නොකඩවා පළ කැරිනි. වෛද්‍යවරුන් හා විශේෂඥවරුන් විසින් සපයන ලද නා නා රෝග හා ඒවායේ ලක්ෂණ හඳුන්වා දුන් ලිපි හා පෝෂණය, පාරිසරික සෞඛ්‍යය හා මහජන සෞඛ්‍යය යන ආදී විෂයයන් අළලා පිළියෙල කරන ලද ප්‍රයෝජනවත් ලිපි එහි පළ කරන ලදී. සාමාන්‍ය මහජනයාගේ ප්‍රයෝජනය සඳහා පළ කරනු ලබන මෙම සඟරාව ගම්බද ජනයා අතර ඉතා ජනප්‍රිය වී ඇති බැව් එහි පිටපත් ඉල්ලා එවනු ලබන ලිපිවලින් පෙනේ. මෙම සඟරාව පුළුල් අන්දමින් බෙදාහැරීමේ වැඩ පිළිවෙලක් සකස් කරගෙන යමින් පවතී.

(III) සුව පුවත්

මාසික වශයෙන් පළ කෙරෙන මෙම ප්‍රවෘත්ති සංග්‍රහය දෙපාර්තමේන්තුවේ සේවය කරන්නන්ගේ ප්‍රයෝජනය සඳහා පිළියෙල වන්නකි. දෙපාර්තමේන්තුව පිළිබඳ පැදගත් සිදුවීම් මෙහි පළ කරන ලද අතර, දෙපාර්තමේන්තුව සහභාගිවන ජාතික කටයුතු පිළිබඳ තොරතුරුද එහි පළ කෙරෙනි.

(IV) සුඛමනී

සුවපුවත් සංග්‍රහයේ දෙමළ ප්‍රවෘත්ති සංග්‍රහය මාස්පතා පළ කෙරෙනී. දෙපාර්ත මේන්තුවේ තොරතුරුවලට අමතර වශයෙන් සෞඛ්‍ය ප්‍රශ්න පිළිබඳ වැදගත් ලිපිද මෙහි පළ කෙරේ. මෙය දකුණු ඉන්දියාවේ පවා ජනප්‍රියව ඇත.

(V) ලක්සිරි

වර්ෂයේ අවසාන කාර්තුවේදී ඇරඹුන ලක්සිරි නමැති ත්‍රයිමාසික සඟරාව ප්‍රධාන වශයෙන් ජාත්‍යන්තරව බෙදාහැරීම සඳහා කාලයක් තිස්සේ සඟරාවක් නොමැතිව සිටිමේ පාඩුව මහ හැරිනි. එහි පළවන ලිපිවලින් විශේෂ සෞඛ්‍ය වැඩ සටහන්, යෝජනා ක්‍රම, පර්යේෂණ, සෞඛ්‍ය ප්‍රශ්න, සෞඛ්‍ය කටයුතු අතින් ලබා ඇති දියුණුව පිළිබිඹු කෙරේ.

(VI) පුස්තකාල ප්‍රවෘත්ති

තෙමසකට වරක් නිකුත් කරනු ලබන "පුස්තකාල ප්‍රවෘත්ති" මගින් පුස්තකාල යට එකතුවූ අළුත් වැදගත් පොත් හා සඟරා ගැනත් දැනුම් දෙනු ලැබූ අතර පුස්තකාල අංශය යටතේ සිදුවන එදිනෙදා දියුණුව පිළිබඳ තොරතුරුද සමාජිකයන් අතට පත් කරන ලදී.

(VII) වෙනත් ප්‍රකාශන

සෞඛ්‍ය අධ්‍යාපන අංශය මගින් අළුත් පොත් පත් හා සඟරාවලින් උපුටාගත් කොටස්, බෝවන රෝග පිළිබඳ තොරතුරු හා වසංගත රෝග පුවත් යන ප්‍රකාශන නිතිපතා නිකුත් කරන ලදී. "පලා වර්ග" පිළිබඳ පත්‍රිකාවක් සෞඛ්‍ය සතිය තුළදීත්, "විෂ මත්පැන්" පිළිබඳ පත්‍රිකාවක් අමද්‍යප සතිය තුළදීත් පළ කරන ලදී. පෝලියෝ වසංගතය ඇතිවූ අවස්ථාවේදී බෙදාදීම සඳහා විශේෂ පත්‍රිකාවක් පළ කැරින.

ජාත්‍යන්තර අමුත්තෝ

ලෝක සෞඛ්‍ය සංවිධානයේ කෙටිකාලීන උපදේශිකාවක් හා සෞඛ්‍ය අධ්‍යාපනය පිළිබඳ මහා ප්‍රාඥවරියක් ද උතුරු කැරොලිනා විශ්ව විද්‍යාලයේ සෞඛ්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රධානියා වන ලුසී මේගන් දොස්තර මහත්මිය 1961 ඔක්තෝබර් මාසයේ දී දිවයිනට සැපත්විය. කොළඹ, කුරුණෑගල, අනුරාධපුරය, මාතලේ හා මහනුවර යන ස්ථානවල පිහිටි සෞඛ්‍ය අධ්‍යාපන යෝජනා ක්‍රම රාශියක් ඇ නැරඹුවාය.

සෝවියට් සමූහාණ්ඩුවේ, කෝමි ජනරජයේ සෞඛ්‍ය අමාත්‍ය වෙ. මොඩියානොව් මහතා වෛද්‍ය පරපෝෂිත විද්‍යාව හා ඖෂධකලාපිය රෝග පිළිබඳ ප්‍රධාන ආයතනයේ මහාචාර්ය ඇන්. ඇන්. ප්ලොට්නිකොව් මහතා හා සෝවියට් සමූහාණ්ඩුවේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ වසංගත රෝග හා පරපෝෂිත විද්‍යාව පිළිබඳ විශේෂඥ ඩී. ඩී. සීලින් දෙස්තර මහතාත් 1961 වර්ෂයේ අවසාන භාගයේ දී ලංකාවට පැමිණියහ. ඔවුන්ගේ සංචාරක වැඩසටහනට වෛද්‍ය පර්යේෂණාතනය, කොළඹ නගර සභාව, මැලේරියා, බරවා රෝග හා සමාජ රෝග නාශක ව්‍යාපාරයන් ද ඇතුළත් විය.

ඉන්දියාවේ පිහිටි ලෝක සෞඛ්‍ය සංවිධානයේ අග්නිදිග අධ්‍යාපනික කාර්යාලයේ සෞඛ්‍ය අධ්‍යාපන උපදේශකවරිය වන ඇන්. ජේ. මුවර් මෙනෙවිය 1962 වර්ෂයේ මාර්තු මාසයේ දී ලංකාවට පැමිණියාය.

එක්සත් ජනපද රාජ්‍යාධාර දූත මෙහෙය යටතේ ක්ෂේත්‍ර කටයුතු අධ්‍යයනය සඳහා පැමිණි තායි සෞඛ්‍ය උපදේශකයින් වන සෝංස්මාම්රංඩි, හා සමූරායි සීලකේලි යන මහතුන් දෙදෙනා කළුතර, ගාල්ල, කොළඹ කුරුණෑගල, පුත්තලම, අනුරාධපුරය, මාතලේ හා මහනුවර යන සෞඛ්‍ය කොට්ඨාස නැරඹුහ.

සිරියානු ජනරජයෙන් පැමිණි මාන්හල් කටාඩ් ඔමාර් හා fපරිඩ් පාහන් අහාබ් යන මහතුන් ලංකාවේ සෞඛ්‍ය අධ්‍යාපන කටයුතු නැරඹුහ. ඔවුහු කළුතර සෞඛ්‍ය ඒකකය හා කොළඹ සෞඛ්‍ය කොට්ඨාශයේ සෞඛ්‍ය අධ්‍යාපන යෝජනා ක්‍රම නැරඹුහ.

(ට) පොත්ගුල් සේවය

දෙපාර්තමේන්තුවට අයත් පුස්තකාල සේවය මෙහෙයවන්නේ ප්‍රධාන කාර්යාලයේ ඇති පොත්ගුල මගිනි. දෙපාර්තමේන්තුවට අයත් ආයතනවල ද තවත් පුස්තකාල 63ක් පිහිටුවා ඇත.

සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කොට්ඨාශ 15 තුළම සෞඛ්‍ය අධ්‍යාපන පුස්තකාලය බැගින් පිහිටුවා ඇත. මේ පුස්තකාලය වල ප්‍රධාන වශයෙන් ඇත්තේ ක්ෂේත්‍රයේ දී මෙම විෂය සඳහා ව්‍යාප්ත වන නිලධාරීන්ගේ ප්‍රයෝජනය පිණිස අවශ්‍ය මහජන සෞඛ්‍ය හා ඊට අදාල විෂයයන් අලලා පළ කළ පොත් පත් ය. ප්‍රාදේශිය හා වෙනත් විශාල වෛද්‍ය ආයතනවල සේවය කරන විශේෂඥ වෛද්‍යවරුන් හා සෙසු නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා ද පොත්පත් සපයා දී ඇත. විශේෂ ව්‍යාපාරවලට අයත් පුස්තකාල සඳහා මුද්‍රිත පොත්පත්වලට අමතර වශයෙන් ඒ ඒ ව්‍යාපාරයන්ට අයත් විශේෂ විෂයන්ට අදාලවන පොත් පත් සපයා දී ඇත. සියලුම හෙද අභ්‍යාස විද්‍යාල හා වෙනත් පුහුණු කිරීමේ ආයතනවල පුහුණුවන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ප්‍රයෝජනය සඳහා එම ස්ථානවල පුස්තකාල පිහිටුවා ඇත.

දෙපාර්තමේන්තුව මගින් පිහිටුවා ඇති පුස්තකාලවල සේවය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට නොමිලයේ ලැබේ. ප්‍රධාන කාර්යාලයේ පිහිටි පුස්තකාලය මගින් දෙපාර්තමේන්තුවේ සිටින සියලුම නිලධාරීන්ගේ අවශ්‍යතාවයන් සපුරාලන අතර වෙනත් පුස්තකාල මගින් ඒ ඒ ආයතනවලට අයත් නිලධාරීන්ගේ අවශ්‍යතාවය සම්පූර්ණ කෙරේ.

ප්‍රධාන පුස්තකාලය විශේෂ පුස්තකාලයක් වශයෙන් පැවැත්වෙන අතරම දෙපාර්තමේන්තුවට අයත් සෙසු පුස්තකාලවල කටයුතු ද ඒකාබද්ධ කරයි. මෙම පුස්තකාලය මගින් පිටපළාත්වල සිටින නිලධාරීන්ට තැපැල් මගින් පොත්පත් ලබා ගැනීමට ද ඉඩ සලසා ඇත.

1961 වර්ෂයේ දී පුස්තකාලයට ස්ථිර පුස්තකාලයාධිපති වරයකු පත්කරන ලදි. ඔහුට සී. අයි. ඇස්. අයි. ආර්. ආයතනයේ පුස්තකාලයේ දී පුස්තකාල කටයුතු පිළිබඳ කෙටිකාලීන පුහුණුවක් ලබාදෙන ලදී.

පුස්තකාලයේ සිට පොතක් කියවීමේ පහසුකම් අංශයක් ප්‍රධාන පුස්තකාලයේ ඇති කිරීමට යෝජනා කර ඇත. මේ අනුව ඉඩකඩ හා මුදල් තිබෙන ප්‍රමාණයට සරිලන සේ නවාංගයන් ගෙන් අනූන කියවීමේ අංශයක් පිහිටුවනු ඇත.

දැනට ඇති පුස්තකාල සේවයේ පරිපාලනය ගැන සොයා බලා එය වැඩි දියුණු කිරීමේ යෝජනා ඉදිරිපත් කිරීම සඳහා පුස්තකාල කමිටුවක් පත් කරන ලදි.

ප්‍රධාන පුස්තකාලය අළුත් පොත් 264ක් එකතු කොට ආයතනවල පිහිටි වෙනත් පුස්තකාලවලට ද පොත් සපයන ලදි. එතෙක් කරගෙන ආ අයුරින් සියලුම පුස්තකාලයන්ට කාල නියමයෙන් පළවන සඟරා ආදිය සපයා දෙන ලදි. මේ අංශයෙන් ලා ඇලකිය හැකි වැදගත් දියුණුවක් නම් සිංහල පොත් 116ක් හා දෙමළ පොත් 56ක් පුස්තකාලයට එකතු කිරීමයි.

අරපරෙස්සම සඳහාත් පළාත් බදව සේවය කරන නිලධාරීන්ට පුස්තකාල පහසුකම් සපයා දීම සඳහාත් නවාංගයන් ගෙන් අනූන වෛද්‍ය පුස්තකාලයන් සෑම ප්‍රාදේශිය ආරෝග්‍ය ශාලාවකම පිහිටුවීමට වැඩ පිළිවෙලක් සංවිධානය කර ඇත. 1962-63 වර්ෂවල දී මෙම ක්‍රමය යටතේ පළමුවෙන් මහනුවර, රත්නපුරය, යාපනය, ගාල්ල හා බදුල්ල යන රෝහල්වල පුස්තකාල පිහිටුවීමට විධි විධාන යොදා ඇත. මුදල් ලැබෙන පරිදි මෙවැනි පුස්තකාල සෙසු ප්‍රාදේශිය රෝහල්වල ද ප්‍රගතිගාමී අන්දමින් සංවිධානය වනු ඇත.

X වැනි පරිවෙජදය

අභ්‍යාස පරිපාටි

නොයෙක් වර්ගවලට අයත් නිලධාරීන් පුරුදු පුහුණු කිරීම වඩාත් ව්‍යාප්ත පදනමක් මත දිගට ම කරගෙන යන ලදි.

1. වෛද්‍ය නිලධාරීන්

නොයෙක් විශේෂඥතා විෂයෙහි එතෙර දී පුහුණු කරවීම සඳහා, දෙපාර්තමේන්තු ශිෂ්‍යත්ව පරිපාටිය යටතේ වෛද්‍ය නිලධාරීන් 16 දෙනෙක් තෝරා ගනු ලැබූහ. එයින් දස දෙනෙක් 1962 දී දිවයිනෙන් පිට ව ගිය අතර, එක් අයෙක් ඉවත් වී ඇත. සෙසු අය ද 1963 දී පිටත්ව යනවා ඇත.

නිලධාරියාගේ වියදමෙන් එතෙර දී පුහුණුව ලැබීමේ පශ්චාත් උපාධි පරිපාටිය යටතේ, I වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් වීමේ සුදුසුකම් ලබා ගනු පිණිස වෛද්‍ය නිලධාරීන්ට මාස 14 ක නිවාඩුවක් දෙනු ලැබේ. මෙම පරිපාටිය යටතේ නිර්වින්දක ශාස්ත්‍රය, චක්ෂු විද්‍යාව, ව්‍යථවේදය, මහජන සෞඛ්‍ය සහ පොදු ශල්‍ය කර්මය යන විෂයවලින් පුරුදු පුහුණු කරවීම පිණිස නිලධාරීන් 11 දෙනෙකු තෝරා ගනු ලැබූහ. මෙයින් නිලධාරීන් 9 දෙනෙකු දිවයිනෙන් පිට ව ගොස් ඇති අතර, නිලධාරීන් 2 දෙනෙක් තම නිවාඩුව ලබා නො ගත්හ.

ලංකා විශ්ව විද්‍යාලයේ "පෝස්ට් ග්‍රැජුවේට්" පාඨ මාර්ගය ගැන කිය යුත්තේ, 1963. 1. 1 වනදා වෛද්‍ය විද්‍යා පීඨයෙහි ඇරඹෙන ලංකා ඒ. ටී. එම්. සහ එච්. පාඨ මාර්ගය හදාරනු පිණිස දෙන ලද පශ්චාත් උපාධි නිවාඩුව නිලධාරීන් 6 දෙනෙකු විසින් භාර ගන්නා ලද බව යි.

2. දන්ත ශල්‍ය වෛද්‍යවරයන්

වර්ෂය තුළ දී අරඹන ලද අළුත් පාඨ මාර්ග කිසිත් නො වී ය.

3. හෙදකම

(අ) හෙද ශිෂ්‍යාවන්

මෙහි ඇලලෙන කාල සීමාව තුළ දී පුහුණුව සඳහා හෙද ශිෂ්‍යාවන් 446 දෙනෙකු ඇතුළත් කර ගන්නා ලදහ. එම කාලය තුළ දී ම, හෙද ශිෂ්‍යාවන් 356 දෙනෙකු අභ්‍යාස පාඨශාලාවලින් නික්ම අවුත් මාණ්ඩලික හෙදියන් විලස ද, 54 දෙනෙකු ක්ෂය රෝග සහාය හෙදියන් විලස ද පත්වීම් ලැබූහ.

(ආ) පශ්චාත්-උපාධි පාඨමාර්ග

(1) **මාවටු සොයුරියන්**—මාණ්ඩලික හෙදියන් 25 දෙනෙක් 62.4.4 වනදා සිට පුහුණුව ඇරඹූහ. ඔවුන් තම පුහුණුව 1963 ඔක්තෝබරයේ දී නිමාවට පත් කරනවා ඇත.

(2) **ශික්ෂකයින්**—මාණ්ඩලික හෙදියන් 11 දෙනෙක් ශික්ෂකයින් ලෙස පුහුණු වීම 63.4.4 වන දා ඇරඹුහ. ඔවුන් 1963 මැයි මාසයේ දී නිපුණත්වය ලබනවා ඇත.

(3) **ළමා රෝග හෙදකම**—මෙහි එන කාලයේ දී හෙදියන් 34 දෙනෙක් ළමා රෝග හෙදකම් පාඨ මාර්ගය සාර්ථක ලෙස අවසන් කළහ.

(4) **මනෝ වෛද්‍ය හෙදකම**—අංගොඩ මානසික රෝහලේ නියුක්තව සිටින හෙද පිරිසෙන් 10 දෙනෙක්, මනෝ වෛද්‍ය හෙදකම විෂයයෙහි පුහුණුවීමේ එක් අවුරුදු පාඨ මාර්ගයක් 62.4.4 වනදා ඇරඹුහ.

(ඉ) අධි ශිෂ්‍යත්ව

කොළඹ හෙදකම් විදුහලේ නියුක්තව සිටි ශික්ෂිකාවක්, ළමා රෝග පිළිබඳ 18 මාසයක පාඨ මාර්ගයක් හැදෑරීම පිණිස 62.9.20 වනදා කැනඩාව බලා පිටත්ව ගියා ය.

4. හෙද සහායක-සහායිකාවන්

මෙහි ඇලලෙන කාල සීමාව තුළ දී, පුහුණුව සඳහා ශිෂ්‍ය හෙද සහායක-සහායිකාවන් 435 දෙනෙක් ඇතුළත් කර ගන්නා ලදහ. ඔවුන් සිය පුහුණුව 1963 දී අවසන් කරනවා ඇත.

5. මහජන සෞඛ්‍ය හෙදකම

මහජන සෞඛ්‍ය හෙද ශිෂ්‍යාවන් 18 දෙනෙක් අවුරුද්ද තුළ දී කළුතර සෞඛ්‍ය ඒකකයේ දී අභ්‍යාසයක් හැදෑරූහ. තවත් 20 දෙනෙකුට ද සොයිසා ගැහැණු රෝහලේ දී ආයතන බද වින්නඹු කර්මය විෂයයෙහි පුහුණුවක් දෙන ලදි.

මහජන සෞඛ්‍ය හෙදියන් 9 දෙනෙක් උදෙසා අගෝස්තු මාසයේ දී ප්‍රතිසංස්කරණ පාඨ මාර්ග සංවිධානය කරන ලද අතර, පරිපාලක මහජන සෞඛ්‍ය හෙදියන් 10 දෙනෙකු උදෙසා මාතෘ සහ ළමා සෞඛ්‍ය පිළිබඳ විශේෂ පාඨ මාර්ගයක් ද ඇරඹුණි.

මීට අමතර ව, කොළඹ, මහනුවර, ගාල්ල, කුරුණෑගල, රත්නපුර සහ යාපනේ පිහිටි හෙදකම් පාසැල්වල ශිෂ්‍යාවන් උදෙසා මහජන සෞඛ්‍ය හෙදකම විෂයයෙහි ක්ෂේත්‍ර නිරීක්ෂණ සහ දෙසුම් සලසා දෙන ලදි. කොළඹ හෙදකම් පාසැලේ පශ්චාත් මූලික ළමා රෝග ශිෂ්‍යාවන් 30 දෙනෙකු උදෙසා පාඨ මාර්ග 6ක් සලසා දෙන ලදි.

6. වින්නඹුවන්

වින්නඹු ශිෂ්‍යාවන් 306 දෙනෙක් ආයතන බද අභ්‍යාසය හැදෑරූ අතර, 279 දෙනෙක් ක්ෂේත්‍ර අභ්‍යාසය හැදෑරූහ. මීට අමතර ව, සඳලංකා සමූපාකාර රෝහලේ ශිෂ්‍යාවන් දෙදෙනෙකු උදෙසා ද අභ්‍යාසය සලසා දෙන ලදි.

මහජන සෞඛ්‍ය වින්නඹුවන් උදෙසා ප්‍රතිසංස්කරණ පාඨ මාර්ග 6ක් සලසා දෙන ලදි. එයින් පහක් කළුතර සෞඛ්‍ය ඒකකයේ දී පැවැත්වුණ අතර වින්නඹුවන් 97 දෙනෙක් ඊට සහභාගි වූහ. අනික් පාඨ මාර්ගය යාපනයේ දී පැවැත්වුණ අතර වින්නඹුවන් 4 දෙනෙක් ඊට සහභාගි වූහ.

7. මහජන සෞඛ්‍ය පරීක්ෂකයින්

මහජන සෞඛ්‍ය ශිෂ්‍යයින් පුරුදු පුහුණු කිරීම

1961 දී අභ්‍යාසයේ යෙදුණ මහජන සෞඛ්‍ය ශිෂ්‍යයින් අතුරෙන් 27 දෙනෙක් 1962.1.1 වන දා සිට මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් ලෙස පත් කරනු ලැබූහ. මහජන සෞඛ්‍ය ශිෂ්‍යයින් 40 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් 1962 දී තෝරාගනු ලැබූ අතර, මෙම නිලධාරීහු 1962 මාර්තු 5 වන දා තම පුහුණුව ඇරඹූහ. මෙම නිලධාරීන් උදෙසා රාජකීය සෞඛ්‍ය සමාගමේ අවසාන විභාගය 1962 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල දී පවත්වනු ඇත. එයින් සාමාර්ථය ලබන අපේක්ෂකයින් මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් ලෙස පත් කිරීමට පෙර, සීමාවාසිකයින් ලෙස තවත් තුන් මාසයක පුහුණුවක් ඔවුන් ලබනවා ඇත.

8. වෛද්‍ය පර්යේෂණාගාර කාර්මික විද්‍යාඥයින්

1961 ඔක්තෝබර් සිට බඳවා ගනු ලැබූ පුහුණුව ලබන්නන් 24 දෙනා තම පළමු අවුරුදු පුහුණුව ඇරඹුහ. අවුරුද්දක ශාස්ත්‍රීය දේශනා සහ ප්‍රායෝගික වැඩ සම්පූර්ණ කළා වූ ද, විභාගය සාමක ලෙස අවසන් කළා වූ ද පුහුණුව ලබන්නන් 24 දෙනා, වෛද්‍ය පර්යේෂණ ආයතනය ඇතුළු කොළඹ පිහිටි තොයෙක් ආයතනවල දී 1961 ඔක්තෝබර මාසයේ සිට තම සීමාවාසික කාලය ඇරඹුහ.

1961 ඔක්තෝබර මාසයේදී සීමාවාසික කාලය අවසන් කළ 18 දෙනෙකුගෙන් යුක්ත පුහුණුව ලබන්නන් පිරිසක් තොයෙක් ආයතනවලට පත් කරනු ලබූහ.

9. විකිරණ ශිල්පින්

62. 1. 1 වන දා සිට විකිරණ ශිල්පින් ලෙස පුහුණුව දීම සඳහා අපෙක්ෂකයින් 5 දෙනෙක් තෝරා ගනු ලැබූහ. තම දැවුරුදු පුහුණු කාලසීමාව අවසන් කළ ශිෂ්‍යයින් 10 දෙනා, 1961 නොවැම්බරයේ දී පැවැති එම්. එස්. ආර්. විභාගයකට පෙනී සිටියහ. මෙම විභාගයේ දී 8 දෙනෙක් සමත් වූ අතර, ඔවුහු 62.1.1 වනදා සිට විකිරණ ශිල්පින් ලෙස පත්වීම් ලදහ.

10. කායික චිකිත්සකයින් (හෙවත් ප්‍රතිකරුවන්)

1961 මාර්තු 15 වන දා සිට තම පුහුණුව ඇරඹූ කායික චිකිත්සක පුහුණුව ලබන්නන් 20 දෙනාගෙන් 14 දෙනෙක් 1961 ඔක්තෝබර 4 වනදා පැවැති ප්‍රාරම්භක විභාගයට පෙනී සිටීමට ඉඩ ලැබූහ. සෙසු අයගේ පැමිණීම දුර්වල හෙයින්, විභාගයට පෙනී සිටීමට ඔවුහු ඉඩ නොලද්දෝය. පුහුණුව ලබන්නන්ගෙන් 4 දෙනෙක් පළමු වතාවේ දී ම සමත් වූ අතර, 8 දෙනෙක් පසු වතාවල දී සමත් වූහ. සෙසු අයගේ සේවය නවත්වන ලදි.

11. ඇපෝතිකරිවරුන්

දැවුරුදු අභ්‍යාස පාඨ මාර්ගය සඳහා ලංකා වෛද්‍ය විද්‍යාලයීය සභාව විසින් අපෙක්ෂකයින් 64 දෙනෙක් බඳවා ගනු ලැබූහ. වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුවට පත් කරනු ලැබූ ඇපෝතිකරිවරුන් ගණන 51 කි.

1960 මාර්තුවේ සඳහන් වෙන පළමුවන සංස්කරණ පාඨ මාර්ගය, 62.1.4 වන දා සිට මාස තුනක කාල සීමාවක් නිස්සේ පවත්වන ලදි. තෝරා ගනු ලැබූ ඇපෝතිකරිවරුන් ගණනක් උදෙසා බලපත්‍ර ලත් පුද්ගලික වෛද්‍යවරයෙකු උදෙසා ඩිප්ලෝමා පාඨ මාර්ගයක් මෙහෙයවීමේ පරිපාටියක් සකස් කිරීම දැන් අවසාන අවදියේ කෙරී ගෙන යයි.

12. හෙසජ්ජකයින් (හෙවත් ඖෂධ කරුවන්)

එක් අවුරුදු පුහුණුව සඳහා ලංකා වෛද්‍ය විද්‍යාලයීය සභාව විසින් අපෙක්ෂකයින් 24 දෙනෙක් බඳවා ගනු ලැබූහ. පුහුණුව සඳහා අනුමත කරන ලද රෝහල්වල දී, හෙසජ්ජක අතවැස්සන් 18 දෙනෙක් පුහුණුව ලැබූහ.

XI වැනි පරිවෙජ්දය

පාලනය සහ සේවක සංඛ්‍යාව

1. පාලනය

භාණ්ඩාගාරයේ සංවිධාන සහ ක්‍රම අංශයේ අනුග්‍රහය සහ මග පෙන්වීම ඇතුව, සෞඛ්‍ය සේවා අධිකාරීන් සහ රෝහල් ලේකම්වරුන් උදෙසා අභ්‍යාස පාඨ මාලාවක් මෙහෙයවිණ. කළමනාකාර අරමුණු, මානව සම්බන්ධතාවය සහ පාලනතන්ත්‍රයට අත්‍යාවශ්‍ය මූල ධර්ම යන කරුණුවලට සම්බන්ධ විවිධාකාර පළල් විෂය තලයක් එම පාඨ මාර්ගයට ඇතුළත් වීය.

2. රාජ්‍ය භාෂාව

මාගේ 1961 වාර්තාවේ සඳහන් කළ පරිදි, රජයේ භාෂා ප්‍රතිපත්තිය ප්‍රගතිශීලී ලෙසත් යුහුසුළුවත් ක්‍රියාවට නැඟීම අරබයා දෙපාර්තමේන්තුව විසින් නිසි පියවර ගන්නා ලදී. මේ සම්බන්ධයෙන් යම් යම් දුෂ්කරතාවයන්ට මුහුණ දීමට දෙපාර්තමේන්තුවට සිදු විය. ඊට හේතුව, රාජ්‍ය භාෂාවේ ප්‍රවීණත්වයක් ඇති නිලධාරීන් සෑහෙන තරම් පිරිසක් නොසිටීම සහ සිංහල වයිප් ගැසීමේ යන්ත්‍ර අඩු පාඩු වීම යි.

එකී දුෂ්කරතාවයන් මධ්‍යයේ වුවද, ප්‍රගතිය කරා පියවර නැඟීමේ ගමන් වේගය එකාකාරවම තබා ගෙන ඇත.

3. සේවක-සංඛ්‍යාව

අනුමත කරන ලද සේවක-සංඛ්‍යාවේ තත්ත්වය වර්ෂාවසානය වන විට මෙසේ විය :—

		අනුමත කරන ලද සංඛ්‍යාව
(අ)	වෛද්‍ය සේවා	24,610
(ආ)	මහජන සෞඛ්‍ය සේවා	5,565
(ඉ)	රසායනාගාර සේවා	869
(ඊ)	සම්බන්ධතා සේවා	761

වෛද්‍ය නිලධාරීන්ගේ සහ හෙදියන් ගේ ශ්‍රේණිවල බල පැවැති හිඟය දිගටම තිබීමෙන්, දෙපාර්තමේන්තුව පිට පැවරී ඇති වගකීම් ඉටු කිරීමේ දී දෙපාර්තමේන්තුවට මුහුණ දීමට සිදුවන දුෂ්කරතාවයන් තව තවත් දියුණු නියුණු විය.

4. වෘත්තීය සංගම්

ස්වාමි-සේවක සම්බන්ධතාවය නහා ඔටුවිමෙන්, ආරාවුල්, දුක්ගැනැවිලි ආදිය කඩිනමින් බෙරුම් කර ගැනීමේත් අටියෙන්, වෘත්තීය සංගම්වලින් කියාපාන කරුණු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම පිණිස පැහැදිලි එකාකාර ක්‍රියා මාර්ගයක් පන වන ලදී. මෙම ක්‍රියා මර්ගය යටතේ, ප්‍රශ්නවලට තුඩු දුන් කරුණු නිරාකරණය කර ගැනීමේ අටියෙන් වෘත්තීය සංගම් නියෝජිතයින් හමුවී ගැටළු ගැන සාකච්ඡා කිරීම පිණිස සතියේ දින වරුවක් වෙන් කර ගන්නා ලෙස සෞඛ්‍ය සේවා අධිකාරීන්ට සහ විශේෂිත ව්‍යාපාර ප්‍රධානයන්ට නියම විය.

5. ස්ථාන මාරු

ස්ථාන මාරු පිළිවෙල කරන ලද්දේ, දෙපාර්තමේන්තුවේ සහ කාර්ය-මණ්ඩලයේ යහපත මෙනෙහි කරමින් සංස්ථාපිත මූල ධර්මයන් පදනම් කොට ගෙන ය. සුළු සේවක මණ්ඩලයට අයත් ස්ථාන මාරු ක්‍රියාත්මක කරන ලද්දේ, අවස්ථාවට ගැලපෙන පරිදි, සේවකයින් යම් ස්ථානයක අවුරුදු 10 ක් හෝ ඊට වැඩි ගණනක් හෝ සේවය කොට තිබුණ විට ය. ලිපිකාර සේවා ගැන කිය යුතුව තිබෙන්නේ, එක් ස්ථානයක අවුරුදු 4 ක් නොහොත් ඊට වැඩි කාලයක් සේවය කොට තිබුණාවූ නිලධාරීහු අවශ්‍ය අවස්ථාවලදී මාරු කරනු ලබූහ. ස්ථාන මාරුවලට විරුද්ධව ඉදිරිපත් කරන ලද මැසිවිලි හාර ගෙන නිසි පරිදි සලකා බැලූ අතර, ඒවා යුක්ති යුක්ත අවස්ථාවලදී වෙනස් කරන ලදී.

XII වැනි පරිවෙජදය

සෞඛ්‍ය සභාව

විවේචනයට භාජනවූ වර්ෂය අවසානයේදී පහත සඳහන් අය සෞඛ්‍ය සභාවේ සාමාජිකයෝ වූහ :—

සභාපති :—

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, වෛද්‍යාචාර්‍ය ඩබ්ලිව්. ඒ. කරුණාරත්න.

(වෛද්‍ය සේවා) නියෝජ්‍ය සෞඛ්‍ය අධ්‍යක්ෂ වෛද්‍යාචාර්‍ය වී. ටී. හේරත් ගුණරත්න.

(මහජන සෞඛ්‍ය සේවා) නියෝජ්‍ය සෞඛ්‍ය අධ්‍යක්ෂ වෛද්‍යාචාර්‍ය පී. රාජ සිංහම්.

(රසායනාගාර සේවා) වැඩ බලන නියෝජ්‍ය සෞඛ්‍ය අධ්‍යක්ෂ වෛද්‍යාචාර්‍ය ඩී. බී. ගුණසේකර.

දකුණු කොළඹ රෝහලේ වෛද්‍ය නිලධාරී වෛද්‍යාචාර්‍ය ටී. පී. ජේ. ප්‍රනාන්දු.

කොළඹ මහ රෝහලේ ශල්‍ය වෛද්‍ය වෛද්‍යාචාර්‍ය පී. ආර්. අන්තොනිස්.

මීගමුවේ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී වෛද්‍යාචාර්‍ය පී. වී. ද කෲස්.

කොළඹ ද සොයිසා සූතිකාගාරයේ ප්‍රසව විද්‍යාඥ වෛද්‍යාචාර්‍ය පී. ආර්. තියාගරාජා.

කොළඹ මහරෝග්‍යශාලාවේ වෛද්‍ය විද්‍යාඥ වෛද්‍යාචාර්‍ය ඕ. ආර්. මැඩොන්සා.

වෛද්‍යාචාර්‍ය ජේ. හිලරි ගුණවර්ධන.

වෛද්‍යාචාර්‍ය ලුසියන් ගුණසේකර.

මහාචාර්‍ය ජී. එච්. කුරේ.

ලේකම් :—

පී. සත්‍යනාදන් මහතා.

වෛද්‍යාචාර්‍ය එස්. ආරියරත්නම් 62.3.1 වැනි දින සිට රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී. එම පුරප්පාඩුව සඳහා 62.4.30 වැනි දින සිට වෛද්‍යාචාර්‍ය පී. වී. ද කෲස් පත්කරන ලදී. වෛද්‍යාචාර්‍ය ජී. ආර්. හැන්ඩි 1962.5.4 වැනි දින සිට රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා අතර ඒ වෙනුවට වෛද්‍යාචාර්‍ය ඕ. ආර්. මැඩොන්සා 1962.5.4 වැනි දින සිට පත් කෙරින. සෞඛ්‍ය සේවා පනත සංශෝධනය වීමෙන් සෞඛ්‍ය සභාවේ සාමාජිකත්වය තවත් සාමාජිකයින් දෙදෙනෙකුගෙන් වැඩි විය. මෙම ස්ථාන දෙක පිරවීම පිණිස රජයේ සේවයෙන් විශ්‍රාම ලත් වෛද්‍යාචාර්‍ය ජේ. හිලරි ගුණවර්ධන සහ ලංකා විශ්ව විද්‍යාලයේ මහාචාර්‍ය ජී. එච්. කුරේ පත් කරන ලදී.

වර්ෂය තුළදී සම්පූර්ණයෙන් රැස්වීම් පහක් පවත්වා ඇත. 1962.7.25 වැනි දින පැවැත්වූ රැස්වීමේ දී වෛද්‍යාචාර්‍ය පී. ආර්. තියාගරාජා වෛද්‍ය ආයතනවල රාජකාරියට නොපැමිණීමේ ප්‍රශ්නය ගෙනහැර පෑවේය.

මේ රැස්වීමේදී මහරගම පිළිකායතනයට ඒකකයක් මිළයට ගැනීමේ ප්‍රශ්නය ද ඉදිරිපත් කෙරින.

1962.8.29 වැනි දින පැවැත් වූ ඊළඟ රැස්වීමේදී ඇදුම චිකිත්සාගාරය, කොළඹ මහා රෝහලේ විශේෂ චිකිත්සාගාරයක් වශයෙන් පැවැත්විය යුතුයයි ද එය එසේ නම්, කුමන වෛද්‍ය නිලධාරියා විසින් එහි කටයුතු කළ යුතු ද යන්න සලකා බලන ලදී. මෙම ප්‍රශ්නය පරීක්ෂා කොට සභාවට වාර්තාවක් සපයන ලෙස අනුකාරක සභාවක් පත් කරන ලදී.

මහාරෝග්‍යශාලාවේ චිකිත්සාගාරවලට බලපාන එදිනෙදා ප්‍රශ්නයන් ගැන සොයා බැලීමටත් පෝමියුලලි කමිටුවේ කටයුතු සම්බන්ධව තොරතුරු ලබා ගැනීමටත් අනුකාරක සභාවට බලය පවරා ඇත.

XIII වැනි පරිවෙජ්දය

ප්‍රවාහන සේවය

පවත්නා ප්‍රවාහන සේවයට පොක්ස් වාහන් ගිලන්රථ 28ක් ද, ලැන්ඩ්රෝවර් 10ක් ද ජංගම එක්ස්රේ යුනිට් 2ක් ද ජීප් රථ 6ක් ද කාර්ගෝ පර්සනල් කැරියස් 3ක් ද ලොරි 2ක් ද වැඩිපුර සපයන ලදි.

පෝක්ස් වාහන් ගිලන් රථ 28 හැරුණුකොට අනිකුත් සියල්ලම "යුඑස්ඕඑම්" සහ එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා අරමුදල යටතේ ලත් ආධාර වේ.

වර්ෂය ආරම්භයේ දී අයෝග්‍ය වාහන 25ක් අඛලන්වූ වාහන වශයෙන් විකුණන ලදී.

ලබා ඇති වාහන වඩාත් පරීක්ෂාකාරීව පාවිච්චි කරණු දැක්මේ පරමාර්ථය ඇතිව රියදුරන්ට වාහන නියෝජිතයන්ගෙන් ද පොලිසියේ ප්‍රවාහන අංශයෙන් ද විශේෂ උපදෙස් ලැබිණ. වාහනයන් පවත්වා ගැනීම පිළිබඳව නියෝජිතයන්ගෙන් උපදෙස් ලැබුණු අතර පොලිසියේ ප්‍රවාහන අංශය මගින් රියදුරන්ගේ ධාවනය, මාර්ග නීති රීති සම්බන්ධ ව පරීක්ෂාකොට සෑම රියදුරකු සඳහා වාර්තාවක් සපයන ලදි.

ප්‍රවාහන සේවය වැඩි දියුණු කිරීම් වස් වැඩිපුර ගිලන්රථ, ජංගම බෙහෙත්හල්, දන්ත සේවා වෑන්රථ, සහ ලොරි ලබන වර්ෂයේ දී මිළයට ගැනීමට වේ.

මනා ලෙස සංවිධානය වූ ප්‍රවාහන සේවයක් ඇති කිරීමේ කාර්‍යය රියදුරන් විසින් රථවාහන පරීක්ෂාකාරිව පාවිච්චි කිරීමත් පවත්වා ගැනීමත් යන කාරණා මත රැඳේ. මේ පරමාර්ථය පෙරදැරිකොට ගෙන හැකිතාක් ප්‍රතිඵල ලබා ගැනීමේ අරමුණින් නදින් පරීක්ෂාකාරීව සිටී.

XIV වැනි පරිවෙජ්දය

ජාත්‍යන්තර සම්මේලන

ජගත් සෞඛ්‍ය සභාවේ 15 වන සභා වාරය, සමාජික ජාතීන් 105ක් සහභාගි වීමෙන් 1962 මැයි 25 වන දා ජිනීවාහිදී පැවැත්විණ. ලක්දිව වෙනුවෙන් සභාවාරයේ දී පෙනී සිටියේ, බ්‍රිතාන්‍යයේ සිටින ලංකා මහ කොමසාරිස් (ප්‍රධාන නියෝජිතයා) තැන්පත් ගරුතර ආර්. එස්. එස්. ගුණවර්ධන මහතා සහ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඒ. කරුණාරත්න මහතා ය.

(i) සභාවේදී විද්‍යාත්මක සාකච්ඡාවට භාජනවූ ප්‍රධානතම මාතෘකාව වූයේ "මහජන සෞඛ්‍ය ක්‍රම සම්පාදනයෙහි ලා මානසික සෞඛ්‍ය වැඩ සටහන්" ය. සාමාජික රටවලින් සහභාගි වූ 160 දෙනෙකු සිටි කණ්ඩායම් අටකින් මෙම මාතෘකාව සවිස්තරව සලකා බැලිණ. ඉන් එක් කණ්ඩායමක මුලසුන හෙබවූයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනය.

(ii) සාකච්ඡාවට භාජනය වූ අනෙකුත් මාතෘකා අතර විශේෂ වැදගත් කමක් හිමි වූයේ, මැලේරියා මුලිනුපුටා දැමීමේ දියත පතර වැඩ සටහන, වසූරිය මුලිනුපුටා දැමීමේ වැඩ සටහන, වෛද්‍ය පර්යේෂණ වැඩ සටහන, ලංකාවට විශේෂයෙන් ප්‍රයෝජනවත් වන, "එල් ටෝර් විල්රියෝ" ඇ හේතුවෙන් පිලිපයින් දුපත්වල හටගත් කොලරා රෝගය විමසා බැලීම සහ ජාත්‍යන්තර නිරෝධායනය පිණිස පත් කරන ලද කමිටුවේ වාර්තාව යනාදී මාතෘකාය.

(iii) ඉතා වැදගත් පුවතක් නම් විධායක මණ්ඩලයට සාමාජිකයෙකු නම් කිරීමේ අති විශාල ඡන්ද සංඛ්‍යාවකින් ලංකාව තෝරා ගනු ලැබීම යි. මෙහිදී රටවල් 102ක් සහභාගිවී ඡන්දය දුන් අතර එයින් ඡන්ද 96ක් ලංකාවට ලැබුණි.

2. අග්නිදිග ආසියාව උදෙසා වූ ජගත් සෞඛ්‍ය සංවිධානයේ දේශාන්තර කමිටුවේ පහළොස් වන සභා වාරය 1962 සැප්තැම්බර් 18 වනදා සිට 24 වනදා තෙක් ඉන්දියාවේ නව දිල්ලියේදී පැවැත්විණ. මීට ලංකාව වෙනුවෙන් සහභාගි වූයේ, (මහජන සෞඛ්‍ය සේවා) නියෝජ්‍ය අධ්‍යක්ෂ, වෛද්‍යාචාර්ය පී. රාජසිංහම් මහතා සහ ජල සම්පාදන සහ ජලප්‍රවාහණ අධ්‍යක්ෂ සී. රාසයියා මහතා ය.

(i) මෙම සභාවාරයේදී විද්‍යාත්මක ලෙස සාකච්ඡාවට භාජනය වූ කරුණ වූයේ, "ප්‍රජා වගීයාට ජලය සැපයීම" යි. මෙම සාකච්ඡා පවත්වන ලද්දේ ලංකාවේ නියෝජිතයෙකු වන සී. රාසයියා මහතා මුලසුනේ සිටියදී ය. මෙහිදී එළඹි අවසාන තීරණය වූයේ, මෙම දේශයේ වෙසෙන ප්‍රජා වගීයාගෙන් ඉතා විශාල කොටසකට නල මගින් එන ආරක්ෂා සහිත ජලය ප්‍රමාණවත් ලෙස දැනට නො සැපයෙන බවත් ඒ හෙයින්, සෞඛ්‍ය තත්ත්වය බලවත් අනිටු විපාකවලට ලක් වන බවත් ය. ප්‍රජාවට පවිත්‍ර ජල සම්පාදන නොමැතිවීම හේතු කොට ගෙන ප්‍රජා වගීයන්හි ආර්ථික, කර්මාන්තයීය සහ සමාජයීය දියුණුවට පහරක් වදියි. ඉදිරියේදී වැඩි වියහැකි ජන ගහණය ගණන් ගෙන දැනට පවතින තත්ත්වය අනුව සලකා බලන කල, අවුරුදු පහළොවක් ඇතුළතදී සතුටුදායක තත්ත්වයක් ඇතිවීමට නම්, දැනට ජල සැපයෙන ආකාරය තව අට ගුණයකින් දියුණු කළ යුතු වේ.

(ii) සාකච්ඡාවට භාජනය වූ විශේෂ උනන්දුවක් දැක්විය යුතු අනෙක් කරුණු නම් ආහාර පාන බාල කිරීම සහ කෙළසීම, කසළ සහ කැත කුණු එකතු කිරීම සහ බැහැර කිරීම සහ මැලේරියා මුලිනුපුටා දැමීමේ වැඩ සටහන අරබයා ලේ පටල බාහිරව පරීක්ෂා කිරීම යනුයි.

3. සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී පී. ගනේවත්ත මහතා, සෞඛ්‍ය අධ්‍යාපනයේ ජාත්‍යන්තර සංගමය සහ ජගත් සෞඛ්‍ය සංවිධානය විසින් එකමුතුවී එක්සත් ජන පදයේ පිලඩෙල්පියාවෙහි 1962 ජූනි 30 වනදා සිට ජූලි 7 වන දා, තෙක් මෙහෙයවන ලද ජාත්‍යන්තර සෞඛ්‍ය අධ්‍යාපන සම්මේලනයට සහභාගි විය. 1962 ජූලි 8 වනදා සිට 1962 ජූලි 17 වන දා තෙක් පිලඩෙල්පියාවෙහිම පැවැති, සෞඛ්‍ය සේවකයින් ගේ පශ්චාත්-උපාධි අභ්‍යාසය පිළිබඳ ජ.සෞ. සං. ශාස්ත්‍රීය සාකච්ඡාවකට ද ඔහු ලංකා නියෝජිතයා ලෙස සහභාගි වූයේ ය.

මෙම නිලධාරියා, 1963 ජූලි මාසයේදී, වැඩ කඳවුරු ක්‍රම සහ ශිල්ප න්‍යාය පිළිබඳව අභ්‍යාසයකට ද යුගෝස්ලෝවියාවේදී සහභාගි විය. මෙම අභ්‍යාස වැඩ සටහන, මෙම නිලධාරියා අඩ-කාලීනව වැඩ කරන ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අළුත පිහිටුවන ලද ජාතික සේවා ශාඛාව විසින් පුරන ලද්දකි.

4. අට වැනි ජාත්‍යන්තර පිළිකා සම්මේලනය 1962 ජූලි 22 වන දා සිට ජූලි 28 වන දා දක්වා මොස්කො නුවර පවත්වන ලදී. ලංකාව වෙනුවෙන් ඊට සහභාගි වූයේ, මහරගම පිළිකායතනය භාර විකිරණ චිකිත්සක වෛද්‍යාචාර්ය එච්. කේ. ටී. ප්‍රනාන්දු මහතා ය. එම සම්මේලනය සංවිධානය කරන ලද්දේ පිළිකා විරෝධී ජාත්‍යන්තර සංගමයේ මෙහෙයවීම යටතේ ය.

5. ජ.සෞ.සං. විසින් සංවිධානය කරන ලද 4 වන ආසියානු මැලේරියා සම්මේලනය 1962 සැප්තැම්බර් 27 වනදා සිට ඔක්තෝබර් 3 වනදා දක්වා (පිලිපයින්හි) මැනිලා නුවර පවත්වන ලදී. මැලේරියා නාශක ව්‍යාපාරයේ අධිකාරී වෛද්‍යාචාර්ය ටී. විශ්ව ලිංගම් මහතා සහ එම ව්‍යාපාරයේ නිලධාරී වෛද්‍යාචාර්ය එෆ්. ඒ. වික්‍රමසිංහ මහතා ලංකා නියෝජිතයින් ලෙස සහභාගි වූහ.

මැලේරියා මුලිනුපුටා දැමීමේ ඝියළු විධි සාකච්ඡාවට භාජනය විය. ජාතික මැලේරියා මර්දනය හා මැලේරියා විද්‍යාඥ තැන විසින් ද, ජ.සෞ. සංවිධානයෙන් නම් කරන ලද උසස් පාලක නිලධාරියෙකු විසින් ද මෙහෙයවන ලද මැලේරියා මුලිනුපුටා දැමීමට අදාළ විද්‍යාත්මක සහ පාලක සහ ප්‍රතිපත්ති පිළිබඳ කරුණු විෂයයෙහි සාකච්ඡාවලට සහභාගි වීමට ද ලංකා නියෝජිතයින්ට අවස්ථාව ලැබිණ.

6. ජගත් සෞඛ්‍ය සංවිධානය විසින් මෙහෙයවන ලද දකුණු සහ නැගෙනහිර ආසියාව උදෙසා, පෝෂණ කමිටුවේ පස්වන සභා රැස්වීම, 1962 ඔක්තෝබර් 8 වනදා සිට 21 වනදා තෙක් ඉන්දියාවේ හයිදරාබාදයේදී පැවැත්විණ. වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ වෛද්‍යාචාර්ය ඩී. බී. ගුණසේකර මහතා ලංකා නියෝජිතයා ලෙස සහභාගි විය.

පොෂණ වැඩ සටහන් භාවිතයට ගෙන වැඩ කිරීම පිළිබඳ සාකච්ඡාවලට සහ ක්ෂේත්‍ර යෝජනා ක්‍රම රාශියක් විෂයයෙහි ශාස්ත්‍රීය ගමන්වලට සහභාගිවීමේ අවස්ථාවද වෛද්‍ය ගුණසේකර මහතාට ලැබිණ.

7. 1961.9.8 වන දා සිට 1961.10.7 වන දා තෙක් සෝවියට් රාජ්‍යයේ පැවැති සමාජ රෝග පිළිබඳ සංචාරක ශාස්ත්‍රීය සාකච්ඡා මුළුවට, සමාජ රෝග මර්දන ව්‍යාපාරයේ අධිකාරිනිය සහභාගි වූවා ය. 1961 ඔක්තෝබර් 4 වන දා සිට නොවැම්බර් 10 වන දා තෙක් ඉන්දුනීසියාවේ බන්දුන්හි පැවැති පරංගි රෝග පිළිබඳ දේශාන්තර සම්මේලනයටද ඇය සහභාගි වූවාය.

XV වැනි පරිච්ඡේදය

සුභ සාධනය

දෙපාර්තමේන්තුවේ නානා ආයතනයන්හි සුභ සාධක කාරක සභාවන්ගෙන් සමන්විත වූ දෙපාර්තමේන්තුවේ සුභසාධක සංවිධානය මගින් කායර්මණ්ඩලයේ සාමාජිකයින්ට වැඩිමනත් පහසුකම් සලසා දෙන ලදී. මෙම සමිතිවල සුභසාධක පහසුකම් සඳහා භාණ්ඩාගාරයෙන් ලත් රුපියල් 40,000 මුදලින් ආයතනයන්ගෙන් සමහරකට අංග සම්පූර්ණ පහසුකම් සලසා දී ඇති අතර අනිකුත් ආයතනයන්ට අත්‍යාවශ්‍ය උපකරණ සපයා දී ඇත. සමිති 50ක් පමණ අංග සම්පූර්ණ පහසුකම් ලබා දී ඇත. හෙදි නිවාසවලට අභ්‍යන්තර ක්‍රියා සඳහා පහසුකම් සලසන ලදී. සුභසාධක පහසුකම් සලසන ලද ඝියලුම ආයතනවල කායර්ී මණ්ඩලයේ අපහසුකම් බොහොමයක් මගහරවන ලදී. ප්‍රධාන කාර්යාලයේ සුභසාධක කාරක සභාව මගින් වඩා හොඳ පහසුකම් සලසා දීම සඳහා අරමුණුකර ඇතත් ඉඩකඩ නොමැති හෙයින් ඒ ගැන කටයුතු ඇරඹීමට නොහැකි විය.

ක්‍රීඩා

කාසල් වීදියේ පිහිටා ඇති සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා සමාජය මගින් සාමාජිකයින්ට පහසුකම් සලසාදීමේ කායර්ී පවත්වා ගෙන යනවා ඇත. සාමාජිකයින් අතර බොහෝ සෙයින් ජනප්‍රියවූ ටැනිස්, ක්‍රිකට්, බිලියඩ්, වේබල් ටැනිස්, කෑඩ් ක්‍රීඩා සහ කැරම් ක්‍රීඩා සමාජ එක්රැස්වීම්වලට අතිරේක වශයෙන් සංවිධානය කෙරින. මේ ක්‍රීඩා සම්බන්ධව වාර්ෂික තරග පවත්වා ජයග්‍රහකයින්ට තෑගි ප්‍රදානය කරන ලදී. වර්ෂය තුළ දී සෙල්ලම්පිටිය සම කරන ලදී. ක්‍රීඩා මන්දිරය ප්‍රතිසංස්කරණය කෙරින.

සුභ සාධනය

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සුභ සාධක සමිතිය එහි තත්ත්වය තහවුරු කර ගන්නා ලද අතර ගණන් වර්ෂය අවසානයේ දී සියේට 4½ක ලාභයක් සාමාජිකයින්ට පෙන්වා දෙන ලදී. ආපදාවන්ට මුහුණ පෑ අයට ණය දීමෙන් මුදල් අතේ ඉමහත් සහනයක් ගෙන දෙන ලදී.

XVI වැනි පරිවෙජ්දය

ගොඩනැගිලි

දෙපාර්තමේන්තුවේ වෛද්‍ය ගොඩනැගිලි උදෙසා ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ 168 ශීර්ෂ, 5 වැය ශීර්ෂය යටතේ මේ වර්ෂය සඳහා රුපියල් 13,943,815ක මුදලක් ඇස්තමේන්තුවල සපයන ලදී. මේ මුදලින් රුපියල් 59,46,333ක මුදලක් ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව මගින් වැය කරන ලදි. අඩුවෙන් වැය කිරීමට හේතු වූයේ :—

(1) සමුපකාර සංගම් මගින් කරන ලද වැඩ සමූහයක් ප්‍රමාද කිරීම.

(2) පිටරටින් ගෙන්වන ලද සමහර ගොඩනැගිලි උපකරණවල හිඟය.

(3) විදුලිය වැඩ නිමකිරීමේ ප්‍රමාදය.

(4) ඔසවනයන් සවිකිරීමේ ප්‍රමාදය.

(5) දෙපාර්තමේන්තුවේ අයදුම් පරිදි වෙනස් කිරීම් හේතුවෙන් කොන්ත්‍රාත් වැඩ නිම නොකිරීම.

(6) විදුලිය දෙපාර්තමේන්තුව මගින් පිටතින් විදුලිය සැපයීමේ කටයුතු ප්‍රමාද කිරීම.

(7) ශල්‍යාගාර වායු සමණය කිරීමේ කටයුතු විදුලිය දෙපාර්තමේන්තුව මගින් ප්‍රමාද කිරීම.

(8) ප්‍රතිශෝධිත ඇස්තමේන්තු අනුමත කිරීමේ ප්‍රමාදය.

(9) සැලැස්ම සහ වියදම් ප්‍රමාණ සකස් කිරීමේ ප්‍රමාදය.

(10) ඇතැම් කොන්ත්‍රාත්වල කාලසීමා ඉකුත්වීමෙන් දමුල් ඉතුරුවීම.

(11) සුදුසු ටෙන්ඩර්කරුවන් සොයා ගැනීමේ දුෂ්කරතාව නිසා මුදල් ඉතිරිවීම.

(12) ඇස්තමේන්තු ප්‍රතිශෝධිත කිරීමේ ප්‍රමාදය.

(13) ඇතැම් කොන්ත්‍රාත්කරුවන් වැඩ ආරම්භ කිරීම ප්‍රමාද කිරීම.

(14) භූමි භාග වෙනස් කිරීම නිසා මුදල් ඉතුරුවීම.

එබැවින්, ඌණ මුදල් වැය කිරීම දෙපාර්තමේන්තුවේ විෂය ඉක්මවා සිටි හේතූන් නිසා වේ.

වෛද්‍ය ගොඩනැගිලිවලට ප්‍රධාන වශයෙන් ජල සැපයීම, කසල කානු සැපයීම සහ උපකරණ වෙනුවෙන් 127 ශීර්ෂය 5 වැය ශීර්ෂය යටතේ රුපියල් 40,64,217 මුදලක් සපයන ලදී.

උපකරණ සඳහා වැය වූ මුදල රුපියල් 1,666,613 කි. වෛද්‍ය ගොඩනැගිලි වලට ජලය සැපයීම, කසල කානු සැපයීම යනාදිය වෙනුවෙන් සපයා ඇති මුදලින් මෙම ශීර්ෂය යටතේ ඇති සියළුම උප ශීර්ෂයන් සඳහා ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු විසින් රු. 10,16,672.07 මුදලක් වැය කරන ලදී.

ජලය සැපයීම සහ කසල කානු සැපයීම සඳහා ඌණ මුදලක් වැය කිරීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ :—

(අ) මු. ෙර. 912 යටතේ වෙනස් කිරීම් ලබාගැනීමට ප්‍රමාද වීම.

(ආ) සමුපකාර සංගම්වලට වැඩ පැවරීමේ දී ඇතිවූ ප්‍රමාද.

(ඇ) ඇස්තමේන්තුවලට මුදල් සැපයීමට ප්‍රමාදවීම.

(ඈ) කලට වේලාවට වැඩ නිම කිරීමට කොන්ත්‍රාත්කරුවන්ට නොහැකිවීම.

ආණ්ඩුවේ වැඩ අධ්‍යක්ෂ විසින් භාරගන්නා ලද ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩ වලින් සහ ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු විසින් භාරගන්නා ලද කසල කානු සැපයීමේ වැඩවලින් නිමාවට පත්වූ වැඩ ගැනත් නිමාවට පත්වෙමින් පැවතෙන වැඩ ගැනත් විස්තර 1 වැනි පරිශිෂ්ඨයෙහි දැක්වේ.

XVII වැනි පරිවෙජ්දය

මුදල්

1961-62 වර්ෂයේ දී වැය ශීර්ෂය යටතේ රුපියල් දස ලක්ෂ 142.9ක මුදලක් දෙපාර්තමේන්තුව මගින් වැය කරන ලදී. 1960-61 වර්ෂයේ දී ද වැය වූ යේ රුපියල් දසලක්ෂ 142.9 කි. දෙවසර තුළ සමහර අංකයන් යටතෙහි වැයවූ ප්‍රමාණයන්හි වෙනස පහත දැක්වේ :—

	වැඩිවීම රුපියල් (දසලක්ෂ)	අඩුවීම රුපියල් (දසලක්ෂ)
පෞද්ගලික දීමනා	2.9	—
විදුලිය බලය	.15	—
යුනිපොම් හිලව්වට යුනිපොම් සහ දීමනා ...	.05	—
ආහාර	.2	—
ප්‍රවාහණ	—	.2
බෙහෙත් ද්‍රව්‍ය වර්ග ...	—	2.5
වෙනත් භාණ්ඩ සහ සැපයීම් ...	—	.2
ක්‍රියාකරවීමේ වියදම් ...	—	.2
ප්‍රධාන වියතියදම් ...	—	.2
	3.3	3.3

2. (අ) එක් එක් ශීර්ෂයන්, සේවාවන් හා ප්‍රධාන වියදම් යටතේ වැය කරන ලද වියදම් පහත දැක්වේ :—

	1961/62 නියම වියදම	*1961/62* නියම වියදම
වැය ශීර්ෂ 1 සහ 4 :		
ඒකාබද්ධ සේවාවන් ...	... 34,02,697	... 34,43,161
වෛද්‍ය සේවාවන් ...	... 10,95,03,518	... 10,86,46,084
මහජන සෞඛ්‍ය සේවාවන් ...	... 2,29,05,393	... 2,40,12,086
රසායනාගාර සේවාවන් ...	... 34,63,419	... 34,64,650
වැය ශීර්ෂ 4 :		
අඩුකිරීම් ...	... 17,28,228	... 16,64,533
වැය ශීර්ෂ 2 :		
සම්මාදම් මුදල් ...	... 1,79,308	... 1,17,965
වැය ශීර්ෂ 5 :		
ප්‍රධාන වියදම් ...	... 16,56,074	... 14,83,927
	14,28,38,637	14,28,32,406

නව ගොඩනැගිලි, අළුතින් කොටස් යා කිරීම් හා ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම් සහ ඒවා නඩත්තු කිරීම් සම්බන්ධව වැය වූ ප්‍රමාණය පහත පළවේ :—

	1960/61 වර්ෂය තුළදී වැය	*1961/62* වර්ෂය තුළදී වැය
ශීර්ෂය 127	රු.	රු.
සෞඛ්‍ය දෙපර්තමේන්තුව—වැය ශීර්ෂ 5 ප්‍රධාන වියදම්	71,34,894	59,18,763
ශීර්ෂය 168		
රජයේ වැඩ දෙපාර්තමේන්තුව වැය ශීර්ෂ 3 පාලන කටයුතු ප්‍රධාන වියදම් උප ශීර්ෂ 8, ගොඩනැගිලිවලට අළුතින් කොටස් යා කිරීම සහ අළුත්වැඩියා කිරීම අංක 2 වෛද්‍ය ගොඩනැගිලි	1,51,312	2,30,022
ශීර්ෂය 168		
රජයේ වැඩ දෙපාර්තමේන්තුව ශීර්ෂය 2, පාලන වියදම්, උප ශීර්ෂ 14 ගොඩනැගිලි නඩත්තුව අංක 3 වෛද්‍ය ගොඩනැගිලි නඩත්තුව	7,81,321	7,61,593
මුළු ගණන ...	80,67,527	69,10,378

(ආ) විදේශීය ආධාර

විදේශීය රාජ්‍යයන් ගෙන් ලැබුණ ආධාර මුදල් සහ 1962 සැප්තැම්බර් අග දක්වා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් එම මුදලින් කළ වියදම පිළිබඳ විස්තර දැක්වෙන ලැයිස්තුවකි පහත පළ වන්නේ.

1961.9.30 තෙක් ලැබූ මුළු ආධාර රු.	**1961.9.30 තෙක් කළ වියදම්** රු.	ආධාර දුන් අය	**1962.9.30 තෙක් ලැබූ මුළු ආධාර** රු.	**1962.9.30 තෙක් කළ වියදම්** රු.
